படையிலே, எந்த அரசியல் அமைப்பிலே ஒரு நாடு தனது பொருளாதாரத் திட்டத்தை வளர்க்கின்றதோ அந்த அடிப்படையிலேதான் அந்த நாடு வளர முடியும். எனவே, இன்றைய சூழ்நிலையிலே, அரசாங்கம் ஏற்படுத்தும் எந்தத் திட்டமும் வெற்றிகரமாக முடிவதற்கு வாய்ப்பில்லை என்றுதான் கூற வேண்டும். ஏனெனில் பலதரப்பட்ட கட்சிகள் பலதரப்பட்ட அரசியற் கொள்கைகள் ஆகியவற்றால் மக்களும் பலதரப்பட்ட கோணங்களில் பிரிக்கப்பட்டு இருக்கின்றார்கள். எனவேதான் தேசிய ஒற்றுமை என்று கூறும்போது அது உண்மையாக பொருளாதார வளர்ச்சியின் அடிப்படையில் வளர்ந்த ஒரு ஐக்கியமாக இருக்க வேண்டும். அப்பொழுதுதான் நாம் வெற்றிபெற முடியும், பொருளாதாரத்தில்.

இன்னொரு பிரச்சினைபற்றியும் நான் இங்கு கூற ஆசைப்படுகிறேன். அதாவது வேலையில்லாத் திண்டாட்டம். இந்த வேலையில்லாத் திண்டாட்டத்தை நீக்குவதற்கு எத்தனையோ முயற்சிகள் இந்த நாட்டில் எடுக்கப்பட்டும் இந்தப் பிரச்சினை இன்னும் தீர்க்கப்படவில்லை. வேலையில்லாத் திண்டாட்டம் வளர்ந்து கொண்டு வருகின்றது. வளர்ந்து வருகின்ற வேலையில்லாத் திண்டாட்டத்தை இந்த அரசாங்கம் தீர்க்காத பட்சத்தில் வாலிபப் புரட்சியால் இந்த நாட்டில் ஒரு மாறுதல் ஏற்படுமென்று நான் கருதுகிறேன். பிரான்ஸ் நாட்டிலே எப்படி டி கோல் கவிழ்க்கப்பட்டாரோ, இந்தோனேஷியாவிலே சுகர்னோ எப்படி வீசப்பட்டாரோ அதே நிலை, இந்த நாட்டில் வளர்ந்து வரும் வேலையில்லாத் திண்டாட்டத்தை நோக்கும் பொழுது, இந்த நாட்டுக்கும் ஏற்படாமல் இருக்க முடியாது. அது மட்டுமல்ல. நமது அண்டைய நாடாகிய இந்தியாவை எடுத்துக் கொள்ளும் பொழுது அங்கும் கூட அந்தப் புரட்சி வலுவுற்று வருகிறது. எங்கும் வேலையில்லாத் திண்டாட்டம் ஏற்பட படித்த வாலிபர்கள், படியாத வாலிபர்கள் எல்லாரும் ஒன்றுபட, ஒரு அரசாங்கத்தினுடைய ஆட்சிப்பொறுப்பை அறுத்தெறியக் கூடிய அளவுக்கு அவர்களுடைய புரட்சிகள் அமைந்து வருகின்றன என்பதை நான் குறிப்பிட விரும்புகிறேன்.

இன்று உணவு உற்பத்தியில் அதிகப்படியான வெற்றி கிட்டி இருக்கிறதென்றால், ஏழை மக்களுக்குக் கொடுக்கப்படுகிற ஒரு கொத்து அரிசியை ஏன் இரண்டு கொத்தாகக் கொடுக்க முடியாது என்று கேட்க ஆசைப்படுகிறேன்.

**සී. රාජදුරෛයි මයා. (මඩකලපුව පළමු වන මන්ත්‍රී)**
*(திரு. சி. இராஜதுரை—மட்டக்களப்பு முதல் முதலாம் அங்கத்தவர்)*
**(Mr. C. Rajadurai—First Batticaloa)**
நீங்கள் கொடுப்பீர்களா?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது)*
**(Mr. A. L. Abdul Majeed)**
நாங்கள் ஆட்சிக்கு வந்தால் நிச்சயமாகக் கொடுப்போம்.

கௌரவ சபாநாயகரவர்களே, தேசாபிமானம் நமக்கு அவசியம். தேசாபிமானமில்லாவிட்டால் எதையுமே சாதிக்க முடியாது. தேசாபிமானம் வேண்டுமென்று கௌரவ கற்குடா பிரதிநிதி மட்டுமல்ல, நமது நாட்டின் பிரதமர் கூட அடிக்கடி கூறி வருகிறார். தேசாபிமானத்தை எப்படிப் பெறுவது? உண்மையான தேசியத்தை எப்படி நாம் அறிவது?

தேசிய ஒற்றுமையுடன் தேசாபிமானத்தை நிலை நிறுத்துவதற்கு இந்த நாட்டில் வாழும் சிறுபான்மை மக்களின் மூலாதார உரிமையைக் கணிக்கக் கூடிய சூழல் ஏற்பட வேண்டும். தமிழரசுக் கட்சிக்காகவோ, தமிழ்க் காங்கிரஸ் கட்சிக்காகவோ சிறுபான்மை மக்களின் மூலாதார உரிமைகளைக் கணிக்க வேண்டியது அவசியமில்லை. பெரும்பான்மை மக்கள், அவர்களாகவே உணர்ந்து சிறுபான்மை மக்களின் மூலாதார உரிமைகளை வழங்குவார்களேயானால் நிச்சயமாக இந்த நாட்டிலே தேசியம் வளரும் என்பதில் சந்தேகமில்லை.

பின்தங்கிய நாடுகளிலே பொருளாதார வளர்ச்சி ஏற்படுவது மிகவும் அவசியம். இன்று வெளிநாட்டுச் செலாவணி பற்றிப் பேசுகிறோம். பொருளாதாரத்திலே முன்னேற்றமில்லாவிட்டால், நமது மத்தியில்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.]

தயக்க உணர்ச்சி இருக்குமாக இருந்தால் எந்தத் திட்டங்களையும் வெற்றிகரமாக நிறைவேற்ற முடியாது.

இன்னும் ஒரு முக்கியமான கருத்தைக் கூற விரும்புகிறேன். இன்று இந்த நாட்டிலே இருக்கிற அரசியல் கட்சிகள் வெளி நாடுகளுடைய தயவில் தங்கி இருக்கக் கூடாது. வெளி நாட்டில் இருக்கும் அரசியல் கொள்கைகளின் அடிப்படையில் அல்லது வெளி நாடுகளில் இருக்கும் அரசியல் அமைப்பைப் பின்பற்றும் முறையில் நாம் நமது கட்சி முறையை ஏற்படுத்த வேண்டியது அவசியம் இல்லை. ஜனநாயகம் என்று கூறினால், சோசலிசம் என்று கூறினால் நமது மக்களின் நிலைக்கேற்ற விதத்தில் அக்கொள்கைத் திட்டங்களை அமைத்துக் கொள்ள வேண்டும். இந்த நாட்டுக்கு இறக்குமதி செய்யப்பட்ட அரசியல் திட்டம் தேவையில்லை. இந்த நாட்டுக்கு எங்கோ, எந்த நாட்டிலோ இருக்கும் அரசியல் தத்துவம் தேவையில்லை. நமது நாட்டின் சூழலுக்கு ஏற்ற விதத்தில், நமது நாட்டு மக்களின் அபிலாசைகளுக்கு ஏற்ற விதத்தில் அரசியல் திட்டங்களை மாற்றியமைக்க வேண்டும்.

இந்த விடயத்தில் உள்ளூராட்சி அமைச்சர் கௌரவ பிரேமதாச அவர்களைப் பாராட்ட விரும்புகிறேன். உண்மையாக வாலிப உள்ளம் கொண்ட அமைச்சர் நிச்சயமாகவே இந்த நாட்டில் ஒரு மாறுதல் ஏற்பட வேண்டும். இந்த நாட்டில் வாழுகிற மக்கள் மத்தியில் ஒரு மாறுதலை மக்கள் விரும்பும் முறைப்படி ஏற்படுத்த வேண்டும் என்ற ஆர்வம் கொண்டவர் என்பதில் சந்தேகமில்லை. இந்தக் கருத்தை அமைச்சர் பிரேமதாச அவர்களைப் பற்றிய இந்தக் கருத்தை—நான் இந்தச் சபையிலே மாத்திரமல்ல, எல்லா இடங்களிலும் வலியுறுத்திக் கூறி வருகிறேன். கௌரவ பிரேமதாசா அவர்களுடைய கொள்கைப்படி இந்த நாட்டில் திட்டங்கள் உருவாக்கப்படுமாக இருந்தால் நான் நினைக்கிறேன், கௌரவ சபாநாயகரவர்களே, அதி விரைவில் பொருளாதார சுதந்திரத்தை நாம் அடைய முடியும் என்று.

ஆனால், இந்த நாட்டிலே நாலரை ஆண்டு காலமாகத் தேசிய அரசாங்கமென்ற போர்வையிலே நடாத்தப்பட்ட ஆட்சியிலே இந்த நாட்டின் முக்கியமான தேவைகள் பூர்த்தி செய்யப்படவில்லை. இந்த நாட்டிலேயிருக்கின்ற வேலையில்லாத்திண்டாட்டம் தீர்க்கப்படவில்லை. உயர்ந்துவருகின்ற வாழ்க்கைச் செலவு குறைக்கப்படவில்லை. வீட்டுப்பிரச்சினை தீர்க்கப்படவில்லை. எனவே, இந்த அரசாங்கம் பின்பற்றுகின்ற கொள்கை மாற்றப்பட வேண்டும். இந்த மாற்றம் ஏற்படுமாக இருந்தால் நிச்சயமாகப் பொருளாதார சுதந்திரத்தையடைய முடியுமென்றே நான் கருதுகிறேன். இந்த நாட்டிலே வர்க்கப்பேதமற்ற ஒரு சோஷலிச ஆட்சி வேண்டும். வர்க்கப் பேதமற்ற சோஷலிச ஆட்சியிலேதான் பொருளாதார சுதந்திரத்தை அடைய முடியும்.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)
*(திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)

What about the I. S. F.?

**ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.**
*(ஜனாப் ஏ. எல். அப்துல் மஜீது)*
(Mr. A. L. Abdul Majeed)

The I. S. F. is not a political party. It is only a political front.

பின்தங்கிய நாடுகள் ஒவ்வொன்றும் சோஷலிச அடிப்படையிலேதான் முன்னேறியிருக்கின்றன. இந்தியாவிலே இன்று ஒரு புரட்சி ஏற்பட்டுக்கொண்டு வருகிறது. இந்தியப் பிரதமர் ஸ்ரீமதி இந்திராகாந்தி சோஷலிச ஆட்சியை நூற்றுக்கு நூறு வீதம் நம்புகின்றார். அதில்தான் இந்தியாவின் விடுதலை இருக்கிறதென்று கருதுகிறார். அதனால்தான் அந்தப் புரட்சியை அவர் அங்கே ஏற்படுத்தியிருக்கின்றார். அதே போலத்தான் இந்த நாட்டிலும் ஒரு சோஷலிச ஆட்சிமூலம் இந்நாட்டு மக்களின் தேவைகளைப் பூர்த்தி செய்ய முடியுமென்று எங்கள் தலைவியார் திருமதி ஸ்ரீமாவோ பண்டாரநாயக்கவின் தலைமையில் கம்யூனிஸ்ட் கட்சி, சமசமாசக் கட்சி ஆகிய இரு அரசியல் கட்சிகளிலுமிருக்கின்ற பாண்டித்தியமடைந்தவர்கள் ஒன்று சேர்ந்து இயங்குகின்றார்கள். அந்தச் சோஷலிசப் புரட்சி நிச்சயமாக இங்கு வெற்றியளிக்குமென்பதில் எங்களுக்குச் சந்தேகமில்லை. எனவே, சபாநாயகரவர்களே, நான் ஏற்கனவே கூறியதுபோல தேசிய ஒற்றுமையின் அடிப்படையில் இந்த நாட்டின் வளர்ச்சிக்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கான திட்டங்களை வகுத்துச் செயற்படுத்தினால் இந்த நாட்டில் பொருளாதார சுபிட்சம் ஏற்படும் என்பதில் சந்தேகமில்லை.

පූ. භා. 11.19

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒளிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම ප්‍රකාශ කළ පිළිදී අපේ ගරු මුදල් ඇමතිතුමා විසින් විශේෂ වාර්තාවක් පිහිටුවා තිබෙන බව ප්‍රථමයෙන්ම සඳහන් කරන්න ඕනෑ. නිදහස ලැබීමෙන් පසුව යම් ආණ්ඩුවක අවුරුදු 5 ක්ම මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරමින් අයවැය වාර්තා 5 ක් ඉදිරිපත් කිරීමේ වාසනාව අපේ ගරු මුදල් ඇමතිතුමාට ලැබුණ බව ප්‍රකාශ කරන්න ඕනෑ. මෙය ඉතා විශිෂ්ඨ වාර්තාවක් බව දෙපක්ෂයේම සිටින කවුරුත් පිළිගන්නවා ඇති. ඒ ගැන එතුමාට ප්‍රශංසා කරන අතරම මෙවැනි විශිෂ්ඨ වාර්තාවක් පිහිටවූ මුදල් ඇමතිවරයාට 6 වැනි අයවැය ලේඛනයත් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කිරීම සාධාරණ බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා මයා.) හිනා වෙන්නේ එතුමාගේ සතුටත් ප්‍රකාශ කිරීමක් වශයෙන් වෙන්න ඕනෑ. මන්ද? අවුරුද්දක්වත් මුදල් ඇමති ධුරයේ කටයුතු කිරීමට බලාපොරොත්තු වුණ එතුමාට 6 මාසයකින්ම එය අත්හැර දමන්න සිදු වුණා. එසේ සිදු වූයේ එතුමාගේ වරදකින් නොවෙයි. එතුමා මුදල් සෙවීමට පිටරට ගොස් ආපසු එන විට ආණ්ඩුවත් අවසාන වී තිබුණා. ඒ නිසා එතුමා කල්පනා කරනවා ඇති මගේ ප්‍රාර්ථනාව සාධාරණ ප්‍රාර්ථනාවක් ය කියා.

ගරු කථානායකතුමනි, මා පළාත් පාලන ඇමති ධුරය භාර ගෙන අදට හරියටම මාස 11 ක් ගත වෙනවා. ඒ පුද්ගලික කාරණය මෙසේ සඳහන් කිරීමට සිදු වීම ගැන මා තමුන්නාන්සේගෙන් සමාව ඉල්ලනවා. මා එසේ සඳහන් කළේ මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිප දෙනෙකු විසින් මගේ අමාත්‍යාංශය ගැන සඳහන් කොට යම් යම් ප්‍රශංසාත්මක අදහස් ප්‍රකාශ කරන්න යෙදුන නිසයි. මුත්තුර් ගරු මන්ත්‍රීතුමා (ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.) ඇතුලු කිහිප දෙනෙකු විසින්ම ප්‍රශංසා කරන්න යෙදුනා.

මා මේ කාරණය සඳහන් කළේ යම් ප්‍රශංසාවක් මට ලැබුණා නම් ඒ පිළිබඳ තනි හිමිකාරයා මා පමණක් නොවන බව ප්‍රකාශ කරන්නයි. ගරු අගමැතිතුමා ඇතුලු රජයෙනුත් උභය පාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන්ගෙනුත් ලැබුණ අවවාද අනුශාසනා, අදහස් උදහස් අනුවයි මා කටයුතු කළේ. මගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් ලැබුණ සහයෝගය, කුමන පක්ෂයකට අයිති වුණත් පළාත් පාලන ආයතනවලින් ලැබුණ සහයෝගය, උදව් උපකාර, මහජනයාගෙන් ලැබුණ ධෛර්යය, පුවත්පත්වලින් ලැබුණ උදව් උපකාර ආදී සියල්ලක්ම මේ ප්‍රශංසාව ලැබීමට හේතු වුණා. ඒ නිසා මේ හැම කොටසකටම මේ ගෞරවය හිමි විය යුතුයි. ඒ මන්ද? මහජනයා සමග ඉතාම කිට්ටුවෙන් කටයුතු කළ යුතු අමාත්‍යාංශයක් තමයි මගේ අමාත්‍යාංශය. එසේ කටයුතු කිරීමේදී මහජනයාගේ සහයෝගය ඉතාමත් අවශ්‍යයි. මේ මාස 11 ඇතුළත මේ රජයේ ප්‍රතිපත්ති අනුව පළාත් පාලන ආයතන විසින් පළාත් පාලන කටයුතුවල ප්‍රගතියේ යම්කිසි වේගයක් ඇති කරවීමට අපි උත්සාහ කළා. පසුගිය අයවැය ලේඛනය සකස් කරන කාලයේදී මා පළාත් පාලන ඇමතිවරයා වශයෙන් නොසිටි බව තමුන්නාන්සේ දන්නවා ඇති. කොයි තරම් වේගයකින් ගමන් කරන්නට බලාපොරොත්තුවෙන් සිටියත්, ඒ සඳහා අවශ්‍ය සැලසුම් පිළිබඳ වැඩ කටයුතු ඇතුළු නොයෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍ය මුදල් ප්‍රතිපාදනය කර ගන්නට හැකියාවක්, අවස්ථාවක්, පසුගිය වර්ෂයේදී මට තිබුණේ නැහැ. ගිය අවුරුද්දේ සැප්තැම්බර් මස 16 වැනිදා මා පළාත් පාලන ඇමති පදවියේ වැඩ භාර ගන්න විට එම අමාත්‍යාංශයේ මුදල් යෝජනා ප්‍රතිපාදනය වී සම්මත වී හමාරයි. කෙසේ වෙතත්, තිබුණු ඒ රාමුව තුළ යම් යම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

වෙනස්කම් කරන්නට පුළුවන්කමක් යම් ආකාරයකින් තිබුණා නම් ඒවා කර ගැනීමට ප්‍රථම මා කල්පනා කෙළේ රටේ හැම දිස්ත්‍රික්කයකටම ගොස් මහජන නියෝජිතයන් වන මේ ගරු සභාවේ මන්ත්‍රීවරුනුත්, පළාත් පාලන ආයතනවල ප්‍රධානීනුත් හමු වී අදාළ ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීම ඉතාමත් අවශ්‍ය බවයි. මාස අටක් ඇතුළත ලංකාවේ දිස්ත්‍රික්ක 22 ටම ගොස්, අවශ්‍ය සාකච්ඡා පවත්වා, ඒ ඒ උදවියගේ අදහස් උදහස් දැනකියාගෙන, ඉදිරි වර්ෂය තුළදී අනුගමනය කරන්නට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ සඳහා මේ අයවැය වාර්තාවෙන් මුදල් වෙන් කරවාගෙන තිබෙන බව ඉතාමත් සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි. ගරු අග්‍රාමාත්‍යතුමන්, අමාත්‍ය මණ්ඩලයත්, ක්‍රම සම්පාදක අමාත්‍යාංශය මෙන්ම මුදල් අමාත්‍යාංශයත්, මගේ යෝජිත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල් ඔවුන්ට හැකි පමණින් සෑහෙන ප්‍රමාණයකට ලබන මුදල් වර්ෂය තුළදී වැය කිරීම සඳහා වෙන් කර තිබෙන බව මගේ වැය ශීර්ෂ දෙස බලන විට පෙනී යනවාට කිසිම අඩමානයක් නැහැ.

ගරු කථානායකතුමනි, අපේ පළාත් පාලන ආයතනවල වැඩ කටයුතු සාර්ථක ලෙස කරගෙන යෑම සඳහා ඉතාමත් අවශ්‍ය පියවරවල් කිහිපයක් ගත යුතුව තිබෙන බව අප කවුරුත් පිළිගන්නවා. දැනට අපේ පළාත් පාලන ආයතන මගින් කෙරෙන සේවය පුළුල් අන්දමින් කරන්නට තිබෙන විශාලම බාධාව මුදල් නැතිකමයි. අවශ්‍ය මුදල් ලබා ගැනීමට පළාත් පාලන ආයතනවලට තිබෙන ඉඩකඩ, ආදායම් මාර්ග, සීමාසහිතයි. ඒ නිසා අලුත් අය මාර්ග පළාත් පාලන ආයතනවලට ලබා දීම පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ නොයෙක් කොමිෂන් සභා මගින් නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. මෑත කාලයේ—මගේ හිතේ හැටියට අවුරුදු 10 කට පමණ පෙර—පත් කරන ලද චොක්සි කොමිසමත් ඒ ගැන නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඊට පසු පත් කරන ලද කොමිෂන් සභා ගණනාවක් මගිනුත් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා ඉතාමත් අවශ්‍ය පියවර ගැනීම සඳහා විධිවිධාන මා විසින් යොදනු ලැබ තිබෙන බව ප්‍රීතියෙන් සඳහන් කරන්නට කැමතියි.

ගරු අගමැතිතුමාගේ විශේෂ ඉල්ලීම පරිදි, කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා දැනට යෝජනා ක්‍රමයක් සකස් කරගෙන යනවා. රජයට තිබෙන සමහර ආදායම් මාර්ග පළාත් පාලන ආයතනවලට හැරවීමයි ඒ යෝජනාවල පරමාර්ථය. සමහර ආදායම් මාර්ග මුළුමනින්ම හෙවත් සියේට සියයක්ම හරවන්නට පුළුවන් වෙනවා ඇති. ඒ අතර, ඇතැම් අය මාර්ග සියේට 75 කිනුත්, තවත් ඒවා සියේට 50 කින් නැත්නම් 25 කිනුත්, ආදී වශයෙන් ඒ ඒ විෂයයන් සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවලට හරවන්නට පුළුවන් වේතැයි කල්පනා කරනවා. මේ ගැන සතුටුදායක වැඩ පිළිවෙළක් දැනටමත් සකස් කරගෙන යන බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. ඒ පියවර ලංකා පළාත් පාලන ඉතිහාසයේ ඉතාමත් වැදගත් හැටියට සැළකෙන බවට මා තුළ කිසිම සැකයක් නැහැ. එය ඓතිහාසික සිද්ධියක් වෙනවා ඇති.

පළාත් පාලන ආයතනවලට මුදල් තිබුණු පලියටම ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක ලෙස කරන්නට පුළුවන්කමක් නැහැ. ඒ සඳහා වෙනත් නොයෙක් කරුණු උපයෝගි කර ගත යුතු වෙනවා. නීතිරීති මගින් ඒ සඳහා අවශ්‍ය බලතල පළාත් පාලන ආයතනවලට ලැබී නැත්නම් අනෙක් කොයි දේ තිබුණත් හරියාකාර වැඩ කරන්නට බැහැ. ඒ අනුව ඉතාමත් අවශ්‍ය පියවරක් ගත යුතුව තිබෙනවා. ගම්කාර්ය සභා, සුළු නගරසභා, පළාත් ආණ්ඩු සභා සහ මහ නගර සභා යන මේ සිව් වැදෑරුම් පළාත් පාලන ආයතන කෙරෙහි බල පාන ව්‍යවස්ථා පද්ධතිය හෙවත් ව්‍යවස්ථා මාලාවන් ඒ ඒ පළාත් පාලන ආයතන වර්ගයට ගැළපෙන අයුරින් සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය කරුණක් හැටියට පිළිගත යුතුව තිබෙනවා. ඒ කාර්යයත් දැන් සම්පූර්ණයෙන්ම වාගේ සපුරාලන්නට විධිවිධාන යොදා තිබෙනවා. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවස්ථා මාලා අනුමත කිරීම මවිසින් කරනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලද්දේ පසුගිය සතියේදීයි. මේ ආදායම් වර්ෂයේදී ඒ සංශෝධන පනත් කෙටුම්පත් නැත්නම් ව්‍යවස්ථාවන් මේ ගරු සභාවේ සැලකිල්ලට යොමු කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. මේ වැදගත් පියවරවල් දෙකම දීර්ඝ කාලයක් තිස්සේ කඩදාසියට පමණක් සීමා වුණා. දීර්ඝ කාලයක් තිස්සේ කථාවට පමණක් සීමා වුණා. එම පියවරවල් දෙක ගන්නට පුළුවන්කම ලැබීම ගැන අපේ ජාතික රජය ප්‍රීති වන බව ප්‍රකාශ කරන්න සතුටුයි. ආදායම් අඩු පළාත් පාලන ආයතනවලට වැඩියෙන් ආධාර දීම අවශ්‍ය බව මේ ගරු සභාවේ පුන පුනා නොයෙක් අවස්ථාවල සාකච්ඡා වී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මා මුලින් කී විධියට ඒ කටයුතු මේ වර්ෂයේදී ක්‍රියාත්මක කරන්නට බැරි වුණේ, ඒ සඳහා මුදල් ප්‍රතිපාදනය කරන්න පසුගිය වර්ෂයේදී විධිවිධාන නොයෙදී තිබුණ නිසයි. ඒ වුණත්, තිබෙන මුදල් ප්‍රමාණය අනුව, ප්‍රථම පියවරක් වශයෙන් දිළිඳු ගම් සභා 135 කට රුපියල් ලක්ෂ 143 ක් පිරිනමා තිබෙන බව මා ප්‍රකාශ කරන්න සතුටුයි. ආණ්ඩු පක්ෂයේ ආසනය, විරුද්ධ පක්ෂයේ ආසනය කියා වෙනසක් නැතුව, මට ලැබී තිබෙන වාර්තා අනුව, සංඛ්‍යා ලේඛන අනුව, පළාතේ තත්ත්වය අනුව, ආදායම අනුව, ජනගහනය අනුව, කළ යුතු වැඩ කටයුතුවල අවශ්‍යතාව අනුව, ඒ විධියේ විශේෂ ආධාර දුන්නා. ලබන වර්ෂයේදී ප්‍රතිපත්තියක් අනුව, ආදායම් අඩු, අත්‍යවශ්‍ය වැඩ රාශියක් කළ යුතුව තිබෙන පළාත් පාලන ආයතනවලට වැඩියෙන් ආධාර දෙන්නට මේ අවුරුද්දේ මුදල් ප්‍රතිපාදනය කරගත් බව මා ඉතාමත් සන්තෝෂයෙන් මතක් කරන්න කැමතියි.

ගම් සභාවලට පමණක් ග්‍රාමීය කර්මාන්ත සඳහා මීට ප්‍රථම වැඩියෙන් දී තිබෙන ආධාර මුදල ලක්ෂ 50 යි. මේ රජය 1967-68 වර්ෂයේදී ඒ ප්‍රමාණය ලක්ෂ 30 කින් වැඩි කර ලක්ෂ 80 දක්වා නැංගුවා. පසු ගිය වර්ෂයේ ලක්ෂ 90 දක්වා වැඩි කළා. මේ වර්ෂයේදී ග්‍රාමීය කටයුතුවලට පමණක් රුපියල් ලක්ෂ 100 ක් වෙන් කළ බවත් මා ප්‍රකාශ කරන්න සතුටුයි. මේ අනුවයි අපි බලාපොරොත්තු වන්නේ, ලබන ආදායම් වර්ෂයේදී ආදායම් අඩු, ජනගහනය වැඩි, සපුරාලිය යුතු අත්‍යවශ්‍ය වැඩ තිබෙන පළාත් පාලන ආයතනවලට වැඩිපුර ආධාර දෙන්න.

ගම්බද පළාත්වල දියුණුව සඳහා මේ ආණ්ඩුවෙන් තවත් පියවර කීපයක් ගන්නට අදහස් කරනවා. ඒදඬු සහ දුර්වල පාලම් ආදිය සම්බන්ධයෙන් සලකා බැලූ මට පෙනී ගියා, රුපියල් තිස් දාහකට 40 දාහකට 50 දාහකට වඩා වියදම් කර පාලම් 4කට 5කට වඩා සෑදීමට එක වර්ෂයකදී ගම් සභාවලට බැරි බව. ඒ නිසා මගේ වැඩ අංශයේ ඉංජිනේරු මහතා ලවා පූව්වු පාලම් ක්‍රමයක් සකස් කළා. ඒවා ඉතාමත් සවි ශක්තියෙන් යුක්ත අතර, ඕනෑම බර ප්‍රමාණයක් ගෙනයන්න පුළුවන්, ඉදිරි කාලයේදී බස් රථ පවා ධාවනය කරන්න පුළුවන් ආකාරයටයි තනා ඇත්තේ. දැනට පාලම් සීයක් සාදාගෙන යනවා. ඉදිරි කාලයේදී අපි බලාපොරොත්තු වෙනවා. අඩු ගණනේ එක ගම් සභාවකට එක පාලමක් බැගින්වත් දෙන්නට. සාමාන්‍යයෙන් දෙන ආධාරවලට අමතරවයි ඒ පාලම් ආධාරය දෙන්නෙ. ඒ සඳහා මේ වර්ෂයේ රුපියල් ලක්ෂ 30ක් වෙන් කර ඇති බව මා ප්‍රකාශ කරන්න සතුටුයි.

එ අතරම අපි මුඩුක්කු සංහාරය සඳහා නිවාස තැනීම පිණිස පළාත් පාලන ආයතනවලට ආධාර දෙනවා. මේ නිවාස සෑදීමේ වේගය බොහොම අඩුයි. වර්ෂයකට නිවාස 60 කට 70 කට වඩා—වැඩිම වුණොත් 100 කට වඩා—තැනෙන්නෙ නැහැ. ඒ සඳහාත් අර පූව්වු පාලම් වාගේම පූව්වු ගෙවල් ක්‍රමයක් සකස් කරන්නට පළාත් පාලන වැඩ අංශය සමත් වී තිබෙනවා. වර්ග අඩි 400 කින් පමණ යුක්ත වන මෙම ගෙවල්වලට කාමර දෙකක්, විසිත්ත කාමරයක්, මුළුතැන්ගෙයක්, ශාලාවක් ආදී අංග ඇතුළත් වෙනවා. එවැනි කුඩා ගෙයක් සඳහා වැය වේ යයි ගණන් බලා තිබෙන මුදල රුපියල් 3,800 ක් පමණ වෙනවා. දින දෙකක් ඇතුළතදී එය සාදා නිම කරන්න පුළුවන්. ඒ විධියේ පූව්වු ගෙවල් ක්‍රමයක් අපේ ඉංජිනේරු අංශය නිර්මානය කර තිබෙන බව මම ඉතාමත් ප්‍රීතියෙන් සඳහන් කරන්න සතුටුයි. මේ සම්බන්ධව එක් කාර්මික නිලධාරියකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]
ගේ නම මා සඳහන් කළයුතුමයි. එම්. රත් දෙනිය නම් දක්ෂ ඉන්ජිනේරු මහත්ම යකු මගේ අමාත්‍යාංශයේ සිටිනවා.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)
(Mr. F. R. Dias Bandaranaike—Dompe)

Quite right.

**ගරු ප්‍රේමදාස**
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

මා සියලුම ඉන්ජිනේරු මහත්වරුන් කැඳවා "තමුන්නාන්සේලාගේ කාර්මික දැනුම නගරබද ප්‍රදේශවලට පමණක් සීමා කරන්නට එපා; අපේ දුප්පත් අහිංසක ගම්බද ප්‍රදේශවල දුක් විඳින ජනතාව ගේත් දුකට පිහිට වනු පිණිස යම් ක්‍රමයක් පිළියෙළ කරන්නට උත්සාහ කරන්න"ය කිව්වා. ඒ අභියෝගයට රත්දෙනිය මහත් මයා සාර්ථක ලෙස පිළිතුරු දී තිබෙන බව —ඒ මහත්මයාටත් ඒ මහත්මයාට ආධාර කරන නිලධාරි මහත්වරුන්ටත් ප්‍රශංසා මුඛයෙන්—මා සඳහන් කරන්නට සතුටුයි. ඒ මහත්මයා වර්ග තුනක ගෙවල් තුනක් නිර්මාණය කර තිබෙනවා. එක් ගෙයක පැරණි ගෘහවල මෙන් හතරැස් අඩි 300ක මැද මිදුලක් තිබෙනවා. පදිංචියට හතරැස් අඩි 600 ක් තිබෙනවා. මේ ගෙය රුපියල් 5,500 කින් තනා නිම කරන්නට පුළුවනි. ඊට වඩා කුඩා නිවසකුත් ඒ මහත්මයා තනා තිබෙනවා. පුළුවන්කමක් ලැබුණොත් මේ මාසය අවසානයේදී ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම දැනට රත් මලානේ තිබෙන ඒ නිවාස තුන නැරඹීමට පැමිණෙන මෙන් ආරාධනා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. මේ ගෙවල් විශාල වශයෙන් නිෂ්පාදනය කරන්නට පුළුවනි. දහ දොළොස් දෙනෙකුට දින දෙකක් ඇතුළත මේ ගෙයක් තනා නිම කරන්නට පුළුවනි. ඒවාගේම මේ නිවාස සෞඛ්‍ය පහසුකම් සහිත සනීපාරක්ෂාවෙන් යුත් නිවාස හැටියට මට නිර්දේශ කරන්නට පුළුවනි. ඒකත් අප ගෙන තිබෙන ඉතාම වැදගත් පියවරක්.

ඒවාගේම ජල සම්පාදනය සම්බන්ධ වත් අප වැදගත් පියවර කීපයක් ගෙන තිබෙනවා. සමහර ප්‍රදේශවල කඳු මුදුන් වලින් ඉතා පිරිසිදු ජලය කඩා හැලෙනවා. නමුත් ඒ ජලය ප්‍රයෝජනයට ගන්නේ නැහැ. එවැනි ප්‍රදේශවල කුඩා ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කරන්නට අප පියවර ගෙන තිබෙනවා. ඒවාගේම වියළි කලාපයේ කොතරම් ළිං කැණුවත් පායන කාල යට වතුර නැහැ. එම නිසා වියළි කලාපයේ ගැඹුරු ළිං කැණීමට අප පියවර ගෙන තිබෙනවා. ඒ ප්‍රදේශවල තිබෙන දිය උල්පත්, දිය බුබුළු ප්‍රයෝජනයට ගෙන ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කරන්නටත් අප පියවර කීපයක් ගෙන තිබෙනවා. කාරක සභා අවස්ථාවේදී ඒ කරුණු සම්බන්ධව තවත් විස්තර ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, මෙපමණ කාල යක් තුළ සෑම වැය ඇස්තමේන්තුවක්ම කොළඹට එවන්නට සිද්ධ වී තිබුණා. නමුත් ඒ ක්‍රමය දැන් වෙනස් කර තිබෙනවා. අනුරාධපුරය, මහනුවර, ගාල්ල, බදුල්ල සහ යාපනේ යන ප්‍රදේශවල ප්‍රධාන ඉංජිනේරු කාර්යාල පහක් පිහිටුවා තිබෙනවා. තව නොබෝ දිනකින් ඉන්ජිනේරු මහත්වරුන්ගේ සහයෝගය ඇතිව රත්නපුරේ තවත් කාර්යාලයක් පිහිටුවන බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. එවිට පළාත් පාලන ආයතනවල වැය ඇස්තමේන්තු ඒ ඒ ප්‍රදේශවලදීම අනුමත කරවා ගන්නට පුළුවනි.

ගරු කථානායකතුමනි, දැන් දිස්ත්‍රික්ක විසි දෙකේම පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල පිහිටුවා තිබෙනවා. ඒවාට අවශ්‍ය වාහන සපයා දී තිබෙනවා. එපමනක් නොවෙයි. මේ වර්ෂයේ තවත් වැදගත් පියවරක් ගන්නවා. මෙතෙක් රජයේ බඩු ගබඩාව වැනි ආයතනයක් නොතිබුණු නිසා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය බඩු බාහිරාදිය සහ වෙනත් ද්‍රව්‍ය ලබා ගැනීමට පුළුවන්කමක් තිබුණේ නැහැ. දැන් පළාත් පාලන බඩු ගබඩාවක් පිහිටුවන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පියවර ගෙන තිබෙනවා. රත්මලානේ දැන් ඒ ගොඩනැගිල්ල තනා ගෙන යන බව මා සතුටින් ප්‍රකාශ කරනවා.

පළාත් පාලන ආයතනවල සේවකයින්ට පමණක් නොවෙයි මහජන නියෝජිත වරුන්ටත් පළාත් පාලන කටයුතු පිළිබ ඳව පුහුණුවක් ලබා දෙන්නට අප පියවර ගෙන තිබෙනවා. ඒ කාය්‍යීය සඳහා මහ නුවර පේරාදෙනියේ දැන් අභ්‍යාස මධ්‍ය ස්ථානයක් පිහිටුවා තිබෙන බව මා සඳහන් කරන්නට සතුටුයි.

පසුගිය කාලය තුළ වතු පාරවල් සම්බන් ධව තිබුණු බලවත් හිරිහැරයක් අපට සැහෙන ප්‍රමාණයකට විසඳන්නට පුළුවන් වුණා. විශේෂයෙන්ම සබරගමුවේ රත්න පුර දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කය, මහනුවර දිස්ත්‍රික්කය වැනි ප්‍රදේශවල වතු වල ගේට්ටු දමා මේ පාරවල් අවහිර කිරීමේ ක්‍රමයක් තිබෙන බව තමුන්නාන්සේලා දන් නවා. ඒ ප්‍රශ්නය විසඳන මාර්ගයක් මා දිසාපතිවරුන්ට පෙන්වා දී තිබෙනවා. මේ පාරවල් මහජනතාවට පාවිච්චි කරන්නට ඉඩ නොදීමට හේතුව ඇසුවාම වතු හිමි යන් මේවායේ බර වාහන ගමන් කරන වාය, එතකොට මේ පාරවල් අබලන් වෙන වාය කිව්වා. මේ පාරවල් සියල්ලම ආණ්ඩුවට අරගෙන ප්‍රතිසංස්කරණය කරන්නට ගියොත් දීර්ඝ කාලයක් ගත වෙනවා. ඒවා ගේම විශාල මුදලක් වැය වෙනවා. ගම් මුන්ට වුවමනා කරන්නේ, හදිසි ලෙඩකු ඉස්පිරිතාලයට ගෙන යාම එදිනෙදා අවශ්‍ය කරන බඩුමුට්ටු ගෙන ඒම, ආදිය සඳහා ප්‍රමාණවත් කුඩා වාහන මිස බර වාහන නොවෙයි. එම නිසා යම් බර ප්‍රමාණයක් නියම කර ඒ ප්‍රමාණයේ වාහන පමණක් ගෙන යාමට අවසර දී ගේට්ටු ගළවා ඇම්ම වීමේ වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මා දිසාපතිවරුන්ට උපදෙස් දී තිබෙනවා. කෑගල්ලේ දිසාපතිවරයා දැනටමත් මේ සම්බන්ධව පියවර ගෙන තිබෙන බව මට වාර්තා කර තිබෙනවා. මීට අවශ්‍ය ව්‍යවස්ථා ද සකස් කර මේ පිළිබඳව යෝග්‍ය වැඩ පිළිවෙළක් ඇති කරන්නත් මා බලාපො රොත්තු වෙනවා. ගිය රජයේ වැඩ ඇමැ තිව සිටි කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. ජී. කලුගල්ල මයා.) මේ ප්‍රශ්නයේ ජීය

වරක් ගත් අවස්ථාවේදී නඩුහබවලට පවා මුහුණ දෙන්නට සිදු වුණු බව තමුන්නාන් සේට මතක ඇති.

පළාත් පාලන ආයතන සෑම තිස්සේම ආධාර මුදල්වලින්ම කටයුතු කරනවාට වඩා ණය මුදල් ලබා ගැනීමට පුරුදු වීමත් අවශ්‍ය කාරණයක්. එහෙත් ඒ සඳහා අමාරුකම් කීපයක් තිබුණා. ණය දීම සඳහා ණය සංවර්ධන අරමුදල ප්‍රමාණවත් නොවූ නිසා එය වැඩි කළ යුතුව තිබුණා. දැන් එය තවත් ලක්ෂ 30 කින් වැඩි කර තිබෙනවා. ඊළඟට, පළාත් පාලන ආයතනයක් විසින ලබා ගන්නා ලද—විශේෂයෙන් ජල සම් පාදන යෝජනා ක්‍රම සඳහා ලබා ගන්නා ලද—ණය මුදල් ආපසු ගෙවීමට මීට කලින් නියමිතව තිබුණු කාලය අවුරුදු 20 යි. මා එය වෙනස් කොට, සියයට හතර හමාරේ සුළු පොළියක් සමග අවුරුදු 40 ක් තිස්සේ ගෙවිය හැකි අන්දමට කාලය දීර්ඝ කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙය ආධාර මුදලක් හා සමානයි.

ප්‍රජා මණ්ඩල ව්‍යාපාරය දැන් අලුත් මුහුණු වරකින් සංවර්ධනය කරගෙන යනවා. සංවර්ධන කටයුතු සඳහාත් සංස්කෘතික හා ආගමික කටයුතු සඳහාත් ක්‍රීඩා හා පුස්ත කාල සම්බන්ධ කටයුතු සඳහාත් රජයේ ආධාරවලට වඩා ප්‍රදේශවාසීන්ගේ ශ්‍රම දානය පරිත්‍යාගය ලබාගෙන මහජන සහ යෝගය ඇතිව ඒකාබද්ධ වැඩ පිළිවෙළක් අනුව දැන් කටයුතු කෙරෙනවා. පුස්තකාල, ගොඩනැගිලිවලට පමණක් සීමා නොකොට සංචාරක පුස්තකාල ක්‍රමයකුත් ඇති කිරීමේ වැඩ පිළිවෙළක් දැන් යෙදී තිබෙනවා. මේ පියවරවල් සඳහා ලෝක බැංකුවෙන් විශාල ණය මුදලක් ලබා ගැනීමටත් අප කටයුතු කරගෙන යනවා.

මීගමුවේ සිට ගාල්ල දක්වා වන වෙරළ බඩ මහා ජල සම්පාදන යෝජනා ක්‍රමය පිළිබඳ වූ වැඩ පිළිවෙළෙන් සතුටුදායක ප්‍රති ඵල ලැබී තිබෙන බව මා ප්‍රකාශ කරන්න සතුටුයි. ඒ වැඩ පිළිවෙළ අවසාන වනතුරු නොසිට ගාල්ලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය ආරම්භ කරන ලෙස මා නියම කර තිබෙනවා. දැනටමත් ඒ සඳහා ටෙන්ඩර් කැඳවා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

මේ හැර, වගුරු බිම් සංවර්ධනය කොට නව නගර පිහිටුවීමේ වැඩ පිළිවෙළද මාලිගාවත්තේ සංවර්ධන යෝජනා ක්‍රමයෙන් ආරම්භ වුණා. ඉතාම වේගයෙන් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වේගෙන යන බව තමුන්නාන්සේ දන්නවා ඇති. මේ අනුව අනෙකුත් ප්‍රදේශවලද නවාංග සම්පූර්ණ නගර පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

පූජා භූමි සම්බන්ධයෙන්ද අප බලාපොරොත්තු වුණු කාල නියමයන් අනුව කටයුතු කරගෙන යන බව සඳහන් කළ යුතුයි.

මා මුලින්ද කීවාක් මෙන්, නොයෙකුත් ව්‍යවස්ථා වෙනස් කොට පළාත් පාලන ආයතනවලට වැඩි බලතල දීමට කටයුතු කරගෙන යන අතර ගෙවල් කුලී ආඥා පණතට සංශෝධන කීපයක්ද මෙම සභාව ලවා සම්මත කරවා ගත් බව තමුන්නාන්සේ දන්නවා. විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් පණත් දෙකක් සම්මත කර ගත්තා. පළාත් පාලන සේවා කොමිෂන් සභාව ප්‍රතිසංස්කරණය කළා. ඉදිරි කාලයේදී තවත් වාර්තා කීපයක් මෙම සභාව ඉදිරියෙනි තබන්නත් මා බලාපොරොත්තු වෙනවා.

පළාත් පාලන ආයතන පිළිබඳ වැඩ පිළිවෙළේ නව සංවර්ධනයක් ඇති කිරීමේ අවශ්‍යතාව නොයෙක් අවස්ථාවල මෙම සභාවෙහි සඳහන් වී තිබෙනවා. සභාපතිවරුන් තේරීම, මුදල් ආදිය පාවිච්චි කිරීම, මුදල් රෙගුලාසි ආදී දේවල් සම්බන්ධයෙන් යම් යම් වැඩ පිළිවෙළවල් ඇති කරන්නට දැන් ක්‍රියා කරගෙන යනවා.

ඊළඟට, අපට මුහුණ පාන්නට සිදු වී තිබෙන බරපතළ ප්‍රශ්නයක් නම් පළාත් පාලන ආයතනවල සිදු වන දූෂණයි. සමහර පළාත් පාලන ආයතන විසුරුවා හැරීම ගැන හිටපු පළාත් පාලන ඇමතිතුමාට තමුන්නාන්සේලා චෝදනා කළා. එහෙත්, යම් යම් හේතු නිසා එතුමාට එසේ කරන්නට සිදු වුණා. මා මේ අමාත්‍ය ධුරය භාර ගත්තාට පසුවත් එවැනිම අවස්ථා ගණනාවක් මා ඉදිරියට පත් වී තිබෙනවා. පළාත් පාලන ආයතනවල පවතින යම් යම් දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් මහජන මන්ත්‍රීවරුම සමහරවිට ලියුම් එවා තිබෙනවා. ඒවා ගැන පරීක්ෂා කරනවා. එහෙත් මෙය පක්ෂයකට පමණක් සීමා වී තිබෙන දෙයක් නොවෙයි. මේ ගැන පක්ෂවලට චෝදනා කරන්නට පුළුවන්කමක් නැහැ. දූෂණය, නාස්තිය, බලය අනිසි ලෙස පාවිච්චි කිරීම, මේ මහජන ජීවිතයේ සමහර අයගෙන් කෙරෙනවා. එහෙම නම් ඒවා වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමට අපට යුතුකමක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම පළාත් පාලන ආයතන විසුරුවා හැරීමත්, සභාපතිවරු ඉවත් කිරීමත් යන කාරණා දෙස මා බොහෝවිට බැලුවේ ඉතාමත් පිළිකුලෙන්. මෙවැනි ව්‍යවස්ථා නීති පොතට ඇතුළු කර තිබෙන්නේ මොකද කියා මා සොයා බැලුවා. වෙනත් රටවල පළාත් පාලන ක්‍රම ගැන මා සොයා බැලුවා. බොහෝ රටවල සභාපතිවරුන් ඉවත් කිරීමේ හා පළාත් පාලන ආයතන විසුරුවා හැරීමේ බලතල රජයට දීලා නැහැ. ඒ රටවල තත්ත්වය මොකක්ද? ඒ රටවල පළාත් පාලන ආයතනවලට මහජන ඡන්දයෙන් තේරී පත් වන නියෝජිතයන්ට විධායක බලතල පැවරී නැහැ. විධායක බල තල සියල්ලම පැවරී තිබෙන්නේ සේවකයන්ටයි. පළාත් පාලන ආයතනවල රාජකාරියේ යෙදී සිටින රාජ්‍ය සේවකයන්ට හෝ පළාත් පාලන සේවකයන්ටයි ඒ බලතල පැවරී තිබෙන්නෙ. පළාත් පාලන ආයතනත්, පළාත් පාලන ආයතනවල සභාපතිවරුත් සන්තකව තිබෙන්නේ ප්‍රතිපත්ති තීරණය කිරීමේ බලය පමණයි. ප්‍රතිපත්ති තීරණය කිරීමේ බලය පමණක් තිබෙන පළාත් පාලන ආයතනවල සභාපති හෝ සභිකයන් හෝ ඉවත් කරන්නට වුවමනා නැහැ. එහෙම නම් ඉවත් කරන්නට සිදු වෙන්නෙ විධායක බලතල තිබෙන රාජ්‍ය නිලධාරීන් හෝ පළාත් පාලන නිලධාරීනුයි.

අපේ රටේ තිබෙන්නෙ සම්පූර්ණයෙන්ම වෙනස් තත්ත්වයක්. අපේ රටේ විධායක බලතල තිබෙන්නේ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ටයි. නගර සභාවක නම් නගරාධිපති අතේත් නගර සභාවට විධායක බලතල තිබෙනවා. මුළු නගර සභාවේම විධායක බලතල නගරාධිපතිට පවරන්නට පුළුවන්. අනික් සේවකයන්ට පවරන්නටත් පුළුවන්. එහෙත් සභාව සන්තකවයි තිබෙන්නෙ. මහ නගර සභා, පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා හා ගම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභා යන ආඥා පනත් හතරේම සභාපතිවරුන් හෝ සභිකයන් අතින් වැරදි සිදු වුණොත් ඔවුන් නිලවලින් ඉවත් කිරීමේ බලතල තබා තිබෙන්නේ ඒ නිසයි. ඒ බලතල තිබෙන්නෙ කා අතේ ද? මහජන ඡන්දයෙන් තේරී පත් වුණු අමාත්‍යවරයා අතේ යි. මහජන ඡන්දයෙන් තේරී පත්වුණු පළාත් පාලන ආයතන හෝ සභාපතිවරුන් ඉවත් කිරීමේ ඒ බලය මහජන ඡන්දයෙන් තේරී පත් වුණු අමාත්‍යවරයා අතේ තබා තිබෙනවා. ඒ ආයතනවලට හෝ සභාපතිවරුන්ට හෝ ඡන්දයෙන් තේරී පත්වුණු සභිකයන්ට හෝ විධායක බල තල පැවරී නැත්නම් මේ බලතල රජය සන්තකව තිබීම අවශ්‍ය වෙන්නෙ නැහැ. එහෙම නම් නිලධාරීන්ගෙන් වැරදි සිදු වුණාම ඔවුන් පත් කරන සේවා කොමිසමට—රාජ්‍ය සේවා කොමිසමට හෝ පළාත් පාලන සේවා කොමිසමට—ඒ ගැන ක්‍රියා කරන්නට පුළුවනි. මේක සමබරව තබා තිබෙන ක්‍රමයක්. ඒ නිසා මේ ව්‍යවස්ථා නීති පොතෙන් ඉවත් කරනවා නම්, එහෙම නම් මට තීන්දු කරන්නට සිද්ධ වෙනවා, දැනට පළාත් පාලන ආයතනත්, සභාපතිවරුත්, සභිකයනුත් බුක්ති විඳින විධායක බලතල ඉවත් කරන්න. ඒ විධායක බලතල ඔවුන් අතම තිබෙනවා නම් ඔවුන්ගෙන් වරදක් සිදු වූවිට මහජනතාව වෙනුවෙන් ඒ ගැන ක්‍රියා කරන්නටත් යම් ආයතනයකට බලතල තිබිය යුතුයි. එනම්, රජය වෙනුවෙන් අමාත්‍යවරයාට ඒ බලතල තිබිය යුතුයි.

මේ ඉවත් කිරීමේ බලතල හා විසුරුවා හැරීමේ බලතල වෙනස් කළයුතුයි කියා අප නිතරම කථා කරනවා. එහෙත් ඒ වෙනස කරන විට තවත් වෙනසක් කරන්නට සිද්ධ වෙනවා. එහෙම නම් විධායක බලතලත් වෙනස් කරන්නට සිද්ධ වෙනවා. ඒ වගේම ඒ බලතල තිබෙන පලියට හිතුවක්කාර ලෙස ඒ බලතල පාවිච්චි කරන්නට රජයට පුළුවන්කමක් නැහැ. ලැබී තිබෙන්නේ ඉතා වැදගත් බලතල නිසා ඒ අනුව ක්‍රියා කරනවිට කරුණු හොඳහැටි සොයා බලා, නිදහසට කරුණු කීමට අවස්ථාවක් ලබා දී, සාධාරණ ලෙස කරුණු කිරා බලා විනිශ්චයක් දෙන ආකාරයට ක්‍රියා කිරීමට සිදු වෙනවා. සමහර ආයතන සම්බන්ධයෙන් ලැබී තිබෙන පැමිණිලි ගැන කල්පනා කර බලන විට මට කනගාටු හිතෙනවා. හැකි තරම් අවස්ථාවලදී බොහෝ ප්‍රවේසමෙන් අවවාද දීමෙන් මේවා සකස් කර ගැනීමයි මගේ ප්‍රතිපත්තිය. එහෙත් බැරිම තැනක් ආවොත් යම් යම් පියවර ගන්නට සිදු වන බව ප්‍රකාශ කරන්නට සතුටුයි.

රටක නියම සංවර්ධනය සඳහා රජය මගින් පමණක් නොව පළාත් පාලන ආයතන මගිනුත් වැඩ රාශියක් ඉටු කළ යුතුව තිබෙනවා. මධ්‍යගත කොට ඒ හැම දෙයක්ම කරන්නට තනිකර රජයකට පුළුවන්කමක් ඇත්තේ නැහැ. එම නිසා මේ රජය බලාපොරොත්තු වෙනවා, ක්‍රමානුකූලව මෙම ව්‍යවස්ථා යනාදිය වෙනස් කරන විට සංවර්ධන වැඩ කටයුතුවල උරුමය හා ඒවා ක්‍රියාත්මක කිරීමේ බලය පළාත් පාලන ආයතනවලට පවරා දෙන්නට. මා තමුන්නාන්සේලා ඉදිරියෙහි සඳහන් කළා ලබන මුදල් වර්ෂය සඳහා පළාත් පාලන කටයුතු සම්බන්ධයෙන් වෙනත් වර්ෂවලට වඩා මුදල් රාශියක් වෙන් කර ගන්නට පුළුවන්කම තිබුණු බව. මේ පුළුවන්කම ලැබුණේ කෙසේද? මෙම රට සංවර්ධනය කිරීම සඳහා යෙදුවාය කියන වැඩ පිළිවෙළින් ප්‍රයෝජනයක් ඇති වුණාද නැද්ද යන්න ගැන මේ ගරු සභාවේ නොයෙකුත් දෙනා සැක පහළ කළ බව ඒ අයගේ විවේචනවලින් පෙනී ගියා. මගේ අමාත්‍යාංශය ගැන කල්පනා කර බලන විට මට ඇත්ත වශයෙන්ම කිව හැකියි, ඒවායින් විශේෂ ප්‍රයෝජනයක් ඇති වී තිබෙන බව. මේ වාරයේදී මගේ අමාත්‍යාංශයට මුදල් වෙන් කර ගැනීමට තිබුණු පහසුව ගැන කල්පනා කරන විට ඒ බව ඔප්පු කරන්නට පුළුවනි. මේ මුදල් ලැබුණේ කොහෙන්ද? මේ රටේ සංවර්ධනයට අවශ්‍ය මුදල් නියම ප්‍රමාණයට පාවිච්චි කරන්නට නම්, අපේ රටින් පිටව යන ධනය අප හැකිතාක් දුරට අපේ රටේම ඉතිරි කර ගන්නට වුවමනාය යන්න තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. එහෙම නොවුණොත් අපට සිද්ධ වෙයි අපේ සංවර්ධන වැඩ නතර කරන්න. මම ඊට හොඳ නිදර්ශනයක් කියන්නම්. පසුගිය රජයේ මැතිඇමතිවරු ඉතාම ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා. ඒ රජය කාර්මික සංවර්ධනයක් ඇති කළාය කියා. අප කවුරුත් පිළිගන්නවා කර්මාන්ත රාශියක් ආරම්භ කිරීමට අවසර දුන් බව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

මගේ කල්පනාවේ හැටියට 1960 දී බල යට පත් වුණු එම රජය කර්මාන්ත ගණනා වක් ආරම්භ කිරීමට අවසර දුන්නා පමණක් නොවෙයි, එම කර්මාන්ත පවත්වා ගෙන යාමට අවශ්‍ය අමුද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ගෙන්වීමටත් අවසර දුන්නා. නමුත් සිදු වුණේ මොකක්ද? සවල්ප කාලයක් ගත වන විට ආරම්භ කළ කර්මාන්ත සියල්ලක්ම පාහේ නතර කරන්න සිද්ධ වුණා නොවෙද? අමුද්‍රව්‍ය ගෙන්වීමට දුන් අවසර පත්‍ර සීමා කරන්න සිද්ධ වුණා පමණක් නොවෙ, යන්ත්‍රෝප කරණ ගෙන්වීමට දුන් බලපත්‍රත් සීමා කරන්න සිද්ධ වුණා. එපමණක් නොවෙයි, අලුතෙන් කර්මාන්ත ආරම්භ කිරීමත් නතර කරන්න සිද්ධ වුණා. අවශ්‍ය විදේශ විනිමය නොමැතිකම නිසයි එසේ නතර කරන්න සිද්ධ වුණේ. එක් අතකින් අපට විදේශ විනිමය උපයා දෙන අපේ නිෂ්පාදනවල මිල ගණන් පහත වැටුණා. අනික් අතින් අපට ඉතාමත්ම අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, රෙදිපිළි සඳහා පෙරට වඩා වැඩි මිලක් ලෝක වෙළඳපොලේදී ගෙවන්න සිද්ධ වුණා. කර්මාන්ත යුගයක් ආරම්භ කළ බව ඇත්ත. නමුත් ආරම්භ කළ යුගය වහාම පාලනය කරන්නත් සිද්ධ වුණා, හේතු දෙකක් නිසා. අපෙන් පිටරටට විකුණන ද්‍රව්‍යවල මිල ගණන් පහත බැස්සා, ඒ වාගේම පිටරටින් ගෙන්වන අපට ඉතාමත්ම අවශ්‍ය හාල් සහ වෙනත් අතිරේක ආහාර ද්‍රව්‍යවල මෙන්ම රෙදිපිළි ආදී ද්‍රව්‍යවල මිලත් වැඩි වුණා. මෙන්න ඇති වුණු තත්ත්වය. මේකයි ඇති වුණු ආර්ථික පරිහානිය.

එවැනි අවස්ථාවක අප ගතයුතු පියවර මොනවාද? ඇත්ත වශයෙන්ම අප ගත යුතු පියවර දෙකක් තිබෙනවා. එකක් නම්, පිටරටින් ගෙන්වන එහෙත් අපේ රටේ නිපදවන්න පුළුවන් ද්‍රව්‍ය මෙහිම නිෂ්පාදනය කරන්න පියවර ගැනීම. ඒ වාගේම එම නිෂ්පාදනයන්ගෙන් නියම ප්‍රතිඵල ලැබෙන තුරු රටේ සංවර්ධනය අඩපණ වෙන්නට ඉඩ නොදී ආධාර කරන්න කැමති රටවලින් ආධාර ලබාගෙන එම තාවකාලික තත්ත්වයට මුහුණ දීම යි. එසේ කිරීම වරදක්ද? 1964 දී තිබුණු ආණ්ඩුව මුහුණපෑවේ ඒ තත්ත්වයටම නොවෙද? එය නැතැයි කියා මොනම කෙනෙකුටවත් කියන්න පුළුවන්ද? තමුන්නාන්සේලාගේ රජයේ ගරු මුදල් ඇමතිවරුන් මෙම ආසනයේම සිට ඉදිරිපත් කර ඇති අයවැය වාර්තා කියවා බලන්න. මා ඒ සියල්ලක්ම කියවා බැලුවා. දොම්පෙ ගරු මන්ත්‍රීවරයා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) මුදල් ඇමතිවරයාව සිටි කාලයේ සිට යටියන්තොට ගරු මන්ත්‍රීවරයා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිවරයාව සිටි කාලය දක්වා ඉදිරිපත් කරන ලද අයවැය වාර්තා සියල්ලක්ම මා කියවා බැලුවා. දොම්පේ ගරු මන්ත්‍රීවරයා මුදල් ඇමතිවරයාව සිටි කාලයේදී, මුහුණ දෙන්න සිදු වුණු ඒ තත්ත්වයට වහාම විශේෂ පියවර ගණනාවක්ම ගත්තා. යම් යම් ද්‍රව්‍ය මෙරටට ගෙන්වීම තහනම් කළා; යම් යම් දේවල් ගෙන්වීම සීමා කළා. එබඳු හදිසි පියවර ගත්තේ මුදල් ඉතුරු කර ගන්නටයි, විදේශ විනිමය ඉතුරු කර ගන්නටයි. ඒ වාගේම 1962-63 අවුරුද්දේදී, කොලොන්නාවේ ගරු මන්ත්‍රීවරයා (ඉලංගරත්න මයා.) මුදල් ඇමතිවරයා වශයෙන් පත්ව සිටියදී කුමන ක්‍රියා මාර්ගයක්ද අනුගමනය කළේ? ගරු කථානායකතුමනි, එතුමා මෙම ගරු සභාවේ පෙන්නුම් කර දෙන්න වෑයම් කළා, මේ රජය විදේශ ආධාර ලබා ගන්නවාය, ලෝක බැංකුවෙන් ආධාර ලබා ගන්නවාය කියා. මේ ගරු සභාව ඇතුළේ පමණක් නොව, රට පුරාම ගොස් කියන්න පටන් ගත්තා අපේ රට ලෝක බැංකුවට උගස් කර තිබෙනවාය කියා. මොකක්ද මේ ලෝක බැංකුව කියන්නෙ? ණය දෙන ආයතනයක්. ණය ගන්නය කියා ලෝක බැංකුව අපට බල කරන්නෙ නැහැ. අපට මුදල් අමාරු වුණාම පොලියට ණය ගන්නවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මොනවද කොන්දේසි?

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)
ණය ගන්නට ගියාම කොන්දේසිවලට යට වන්නට ඕනෑ. මා තමුන්නාන්සෙ ගෙන් රුපියල් දාහක් ඉල්ලුවොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සෙ කවදාවත් මට නිකම් දෙන වද? කැමති දවසක දෙන්නය, එහෙම නැත්නම් නිකම් ඉන්නය කියා සල්ලි දෙනවද? මේ තරම් පොලියක් දෙන්නට ඕනෑය, මේ දේ උගස් තියන්නට ඕනෑය කියා තමුන්නාන්සෙ කියයි. සෝවියට් දේශය කොන්දේසි නැතිව නිකම් ණයට සල්ලි දෙනවද? තමුන්නාන්සේ මේ රටේ සිටින, සෝවියට් දේශයේ නියෝජිත යෙක්. සෝවියට් තානාපති කාර්යාලය හැරුනම, තමුන්නාන්සෙත් මේ රටේ සිටින, සෝවියට් දේශයේ නියෝජිතයෙක්.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඒක සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රකාශයක්. ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
තමුන්නාන්සේලා වරින් වර උපදෙස් ලබා ගන්නට සෝවියට් දේශයට යන්නෙ මොකටද? තමුන්නාන්සේලා සෝවියට් දේශයේ සම්මේලනවලට සහභාගි වන්නෙ ඇයි?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඔක සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රකාශයක්. ධනපති පන්තියේ ඒජන්තවරුන් හැම දාම අප ගැන කියන්නෙ ඔකයි.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
ඔකද උත්තරය? තමුන්නාන්සේ සෝවියට් දේශයේ නියෝජිතයකු නොවේය කිය නවද? ඒ කීම සෝවියට් දේශයට ආරංචි වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
ඒ ගැන මට බයක් නැහැ.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
මීට පසු එක්සත් ජාතික පක්ෂයට උදව් කරන්නය කියා සෝවියට් දේශය තමුන් නාන්සේලාට කිව්වොත් තමුන්නාන් සේලා බැ කියනවද?

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)
අපි එක්සත් ජාතික පක්ෂයට කවදාවත් උදව් කරන්නෙ නැහැ.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
සෝවියට් දේශය එහෙම කිව්වොත් තමුන්නාන්සේලා ඒ කීම පිළිගන්න ඕනෑ.

එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.
(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(Mr. F. R. Dias Bandaranaike)
එහෙම කියයි කියා බලාපොරොත්තු වෙනවද?

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)
බලාපොරොත්තු වෙනවා. සෝවියට් දේශය පැහැදුනොත් එහෙම කියයි කියා අප බලාපොරොත්තු වෙනවා. කොයි වෙලාවෙ එහෙම කියයිද දන්නෙ නැහැ. ගරු දෙම්පේ මන්ත්‍රීතුමාලා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) වැනි අය ඒවට ලෑස්ති වෙලා ඉන්නට ඕනෑ. කොමියුනිස්ට් පක්ෂයේ චීන පිළ ක්‍රියා කරන්නෙ කොහොමද? සම්පූර්ණයෙන්ම එහෙන් ලැබෙන උපදෙස් පිටයි. සෝවියට් දේශයේ ඇති දේශපාලන සංවිධානයේ මෙරට සිටින නියෝජිතයන් හැටියට කොන්දේසි නැතිව සෝවියට් දේශයෙන් ණය අර ගෙන දෙන්නව මාතර ගරු මන්ත්‍රීතුමාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

(තුඩාවේ මයා.) පක්ෂයට පුළුවන් ද? එහෙම දෙනවා නම් මම ගන්න ලෑස්තියි. කොයි මිනිහද කොන්දේසි නැතිව ණය දෙන්නෙ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේලාගේ ධනපති ආර්ථිකය වෙනස් කරන්න.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

ඔන්න ඔය සටන් පාඨ ටික තමයි, තමුන්නාන්සේලා පාඩම් කරගෙන ඉන්නේ. ඉදිරි ගමන, ප්‍රගතිය, ධනපති. ඕවා කියව කියවා ඉන්නවා. එතැනින් එහාට කිසි දෙයක් නැහැ.

ගරු කථානායකතුමනි, මට වුවමනා කළා ණයක් ගන්නට, මා කලින් කී මීගමුවේ සිට ගාල්ල දක්වා වූ ජල යෝජනා ක්‍රමය සඳහා. ලෝක බැංකුවේ නියෝජිතයන් ඇවිත් සාකච්ඡා කර ඒ සඳහා එක්තරා පොළියක් ඉල්ලා තිබුණා. මා ඒ පොළියට ණය ගන්නට ලෑස්ති නැත, වෙන ආයතන ගැන බලන්නය කියා මා කීවා. මහා බ්‍රිතාන්‍ය, ජපානය, ප්‍රංශය ආදි රටවලින් ගන්නට පුළුවන්ද කියා බලන්නය කියා මා කීවා. එහෙත් ඒ රටවලින් ලබා ගන්නට බැරි වුණා. දැන් සාකච්ඡා මාර්ගයෙන් පොළී අඩු කර ගන්නට උත්සාහ කරනවා. අපට ඔරොත්තු දෙන පොළියකට ණය ලැබෙනවා නම් මා ගන්නට සූදානම්. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිතයන් මා සමග සාකච්ඡා කළා. මුළු ණය මුදල ලැබෙන තෙක් බලාගෙන ඉන්නෙ නැතිව ඒ ජල යෝජනා ක්‍රමයේ වැඩ ගාල්ලෙන් අරඹන්නය කියා මා කීවා. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) ලෑස්ති නම් කොන්දේසි නැතිව ණය ලබා දෙන්නට ඒ යෝජනා ක්‍රමය ක්‍රියාවේ යොදවන්නට මා අදත් ලෑස්තියි. සෝවියට් දේශයෙන් හෝ වේවා චීනයෙන් හෝ වේවා අඩු පොළියට, කොන්දේසි නැතිව ණය ලැබෙනවා නම් මොන මෝඩයද නොගන්නෙ? තමුන්නාන්සේලා ලෝක බැංකුව පස්සෙ ගියේ නැද්ද? ලෝක බැංකුව පස්සෙ යන්නට එපා, අපි නිකම් ණය දෙන්නම් කියා තමුන්නාන්සේලා කිව්වද? මොන මෝඩයද කොන්දේසි නැතිව ණය දෙන්නෙ? තමුන්නාන්සේලා සටන් පාඨ ටිකක් කට පාඩම් කරගෙන රට මුළා කරමින් මේ ගරු සභාවටත් ඇවිත් ඒවා කියනවා නම් අපට ඒවාට මුහුණ දෙන්නට සිදු වෙනවා.

මොකක්ද කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කිව්වෙ?

"ලෝක බැංකුව සමග කලින් සාකච්ඡා කළ පරිදි ලැබෙන රුපියල් 3 කෝටි 1 ලක්ෂයක මුදලක් මේ අවුරුද්දේදී මතු දක්වන වැඩ සඳහා යොදවනවා ඇති. ඒ වැඩ නම්:—ජය විදුලි බල යෝජනා ක්‍රමය, දෙවෙනි (ඒ) අදියර, ජල විදුලි බල යෝජනා ක්‍රමය, දෙවෙනි (බී) අදියර, ග්‍රෑන්ඩ්පාස් හි දෙවෙනි උෂ්ණ තාප බල යන්ත්‍රය යන ඒවායි."

"ලෝක බැංකුවෙන් තවදුරටත් ණය ලබා ගැනීම සඳහා, අපි මේ අවුරුද්දේදී උත්සාහ ගත් නමුත්, එයින් පලක් වුණේ නෑ. ලෝක බැංකුවේ නිලධාරීන් අපට දන්වා තිබෙන විදියට, ණය නොලැබීමට එක් හේතුවක් නම්, ලංකාණ්ඩුව විසින් ගත වූ අවුරුද්දේදී අයිතිකර ගත් තෙල් සමාගම්වල දේපළ සඳහා ඒවාට වන්දි ගෙවීමට අපට නොහැකි වූයේ යයි කියන කරුණ බව, මා ඔබට දන්වන්නේ, ඉතා කණගාටුවෙනුයි." [නිල වාර්තාව; 1963 අගෝස්තු 1; කා. 52; තී. 1257.]

හරි, මොකටද මේ කොන්දේසිවලට අපි යට වෙන්නේ? වෙන කෙනෙක් ළඟට ගොස් ණය ගන්න තිබුණානේ. ඊළඟට මුදල් ඇමති වූ යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය එන්. එම්. පෙරේරා) තිබුණානේ සෝවියට් දේශයට යන්නට. එහෙම නැත්නම් වෙනත් දේශයකට යන්නට තිබුණානේ. උන්නැහේ කොහාටද ගියේ? උන්නැහෙත් ගියේ ලෝක බැංකුව පස්සේ. නැතෙයි කියනවාද? මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) පිළිගන්නවා ඇති යටියන්තොට ගරු මන්ත්‍රීතුමා අපට වඩා ප්‍රගතිශීලීයි කියා. පිළිගන්න වාද? එයට උත්තර නැහැ. උත්තර නැත්තේ ඇයි කියා මා දන්නවා. මේ අය ප්‍රගතිගාමියි කියා සමසමාජ සම්මේලනයේදී කියා තිබුණා. ඒකයි උත්තර නැත්තේ. එපමණක් නොවෙයි මේ ඊනියා සමාජවාදීයි කියන රටවල තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් නොවේය කියලත් තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ හිතේ අමාරුවට දුන් තැවි තැවී ඉන්නා වෙලාවක යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ප්‍රගතිශීලියි කියන්නේ කොහොමද ? එහෙම කියන්න පුළුවන්ද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**
අහලා කියන්නම්.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
**(The Hon. Premadasa)**
එහෙනම් " හිස් මාස්ටර්ස් වොයිස් ".

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**
තමුන්නාන්සේලා කියන්නේ එහෙමනේ. ඒ විධියට උත්තර දෙන්නත් ඕනෑ.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
**(The Hon. Premadasa)**
ගරු කථානායකතුමනි, අද රටපුරාම ලොකු මිථ්‍යාවක් ගෙන යනවා. අපි මොන තරම් දේශපාලන වශයෙන් විරුද්ධ වුණත්, අපි ඔය පැත්තේ හිටියත් මේ පැත්තේ හිටියත්, තමුන්නාන්සේලාත් පිළිගන්නවා ඇති රටක සංවර්ධනය පිළිබඳව ඉතාම වැදගත්ම යුගය ඒ රට ලෝකය විශ්වාස කරන ස්ථාවර තත්ත්වය කට පත්වීම බව. මිනිහෙක් ගැන වුණත් එහෙමයි. මගේ කොතරම් වත්කම් තිබුණත් මොකටද මා හදිසියකට සාප්පුවකට ගොස් බඩු මුට්ටු ටිකක් අරගෙන " එය මගේ ගණනට දමන්න ; පසුව බිල ගෙවන්නම් " කීවාම " තමුන්නාන්සේට කොපමණ තිබෙනවාය කියා ආරංචි තිබෙනත් බිල් ගෙවන්නේ නැත, විචිකාරයා යයි කියනවා ; ඒ නිසා දෙන්නට බැහැ " කීවොත් ඒ වත්කම මොකටද ? කාගෙන් හෝ ණයක් ඉල්ලුවාම තමුසේ විශ්වාස කරන්නට බැහැ ; ණය ගෙවයි කියා හිතන්නට බැහැ ; කොච්චර ඇප ඔප්පු අත්සන් කළත්, සාක්ෂිකාරයෝ දුන්නත් මේ මිනිහා විශ්වාස කරන්න බැරිය කීවොත් ඇති වටිනාකම මොකක්ද ? රටක වටිනාකමත් මනින්නේ එහෙමයි. රටවල ටත් ඔය විධියේ ආපදා ඇති වෙනවා. එවැනි අවස්ථාවක ලෝකයෙන් ආධාර ඉල්ලුවාම ලංකාව නම් දැන් විශ්වාස කරන්නට බැරි තත්ත්වයකට ඇවිත් තිබෙනවාය කිව්වොත් මොකක්ද තත්ත්වය ? 1964 දී ඒ අවාසනාවන්ත තත්ත්වය ලංකාවට තිබුණාද නැද්ද කියා මා අහනවා. අද ඒ තත්ත්වය මගහරවා ගෙන නැද්ද ? මේ අවුරුදු 4 තුළ තමුන්නාන්සේලා කියන විධියට රුකිරක්ෂා ප්‍රශ්නය ඇතුළු හැම ප්‍රශ්නයක්ම මුළුමනින්ම විසඳා මේ රට සෞභාග්‍ය සම්පන්න ස්වයම්පෝෂිත රටක් කරන්න බැරි වුණා කියන එක අපි පිළිගන්නවා. එහෙත් මේ අවුරුදු 4 ක සුළු කාලයේදී මේ රට ලෝකයේ විශ්වාසය ඇති වන තත්ත්වයකට පත් කරන්නට අපට පුළුවන් වුණා කියා අපි ආඩම්බර වන්නට ඕනෑ. ඒ බව නොයෙක් ආකාරයෙන් ඔප්පු කරන්නට මට පුළුවන්. ණයක් ගැනීම සඳහා පසුගිය ආණ්ඩුවට තිබුණොත් මේ ආණ්ඩුවට තිබෙන්නේත් ලෝක බැංකුව විතරයි. ඉතින් ඒ ලෝක බැංකුව අප පස්සෙන් එන්නේ නැහැ. " අපෙන් ණයක් ගනිල්ලා " යයි කියමින් අප පස්සෙන් එන්නේ නැහැ.

දැන් ලංකාව විශ්වාස කරන්නට පුළුවන් තත්ත්වයකට සංවර්ධනය වී ගෙන යනවා යයි ඒ මුදල් ආයතනය කියතොත් ඇත්තෙන්ම එය අපට විශේෂ සහතිකයක් නොවෙයිද ? මෙය වැරදි යයි සෝවියට් දේශය කියනවාද ? ධනපති ක්‍රමයේ ආණ්ඩු ලෝක බැංකුව පස්සේ යනවා යයි අපට දොස් කියනවා. හොඳයි, යුගෝස්ලාවියාව ලෝක බැංකුව පස්සෙ ගියේ නැද්ද ? හංගේරියාව ලෝක බැංකුව පස්සේ ගියේ නැද්ද ? රුමේනියාව ලෝක බැංකුව පස්සේ ගියේ නැද්ද ? ලෝකයේ ධනවත්ම රටේ නායකයා පසුගියදා රුමේනියාවට ගිය විට එතුමා පිළිගත්තේ නැද්ද ? මේවාට උත්තර දෙන්න. ඉස්සර නම් රට හැම තැනම ගොස් " බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් " යනුවෙන් කියමින් අපට මඩ ගසන්නට හැදුවා. දැන් ඒ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී කථාව කියන්නේ නැහැ. දැන් ඒ වෙනුවට කියන්නේ " ලෝක බැංකුව " කියලයි. ලෝක බැංකුවට මේ රට උකස් කරන්නට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව ක්‍රියා කර තිබෙනවාලු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

ගරු කථානායකතුමනි, මුදල් ආයතන අප පස්සෙන් එන්නේ නැහැ. ඒ ආයතන වෙත යන්නේ අපයි. වෙන යන්නට තැනක් නැති නිසා අප ඒවා වෙත යනවා. පසුගිය අවුරුදු හතර ඇතුළත අපේ ගරු අගමැතිතුමාත්, ගරු මුදල් ඇමතිතුමාත්, පොදුවේ මේ රජයත් අනෙක් ජාතීන්ට විශ්වාසය තැබිය හැකි තත්ත්වයක් ලංකාවට ලබා දී තිබෙනවා. එය ආණ්ඩුවකට කරන්නට පුළුවන් ඉතාමත්ම විශිෂ්ටතර සේවයක් බව ප්‍රකාශ කරන්නට මා කැමතියි. මේ අවස්ථාවේදී ඉතා වැදගත් ප්‍රකාශයක් මා කියවන්නට කැමතියි. 1969 පෙබරවාරි මස 7 වැනිදා නිකුත් වුණු "Current Economic Position and Prospects of Ceylon"—issued by the I.B.R.D. International Development Association—නමැති වාර්තාවේ 26 වන පිටුවේ සඳහන් 73 වන ඡේදයයි මා මේ කියවන්නේ.

"The considerable economic success achieved in recent years despite the limited expansion of Ceylon's import capacity must be attributed to the success of the Government's domestic production effort which permitted the use of an increasing proportion of Ceylon's foreign exchange for imports of investment goods."

ලෝකයේ අනෙක් රටවලට අපේ රට කෙරෙහි විශ්වාසය තබන්නට පුළුවන් තත්ත්වයකට අප අපේ රට පත් කර තිබෙන බව පෙන්වන්ටයි, මට වුවමනා කෙළේ. මේක මේ රජය මේ රටට ලබා දුන් විශේෂ තත්ත්වයක් බව පිළිගන්නට ඕනෑ. මේ අතර තමුන්නාන්සේලා අප ඉදිරියට දමා ගසන වැදගත් ප්‍රශ්න දෙකක් තිබෙනවා. ජීවන වියදම වැඩි වීම හා රැකී රක්ෂා හිඟය ඒ ප්‍රශ්න දෙකයි. මා කල්පනා කරන හැටිය ජීවන වියදම ගැන කාරණා කීපයක් කියන්නට සතුටුයි. මේ කටයුත්ත සම්බන්ධයෙන් නිරත වී සිටින නිලධාරීන් කීප දෙනකු ලවා මා මේ පිළිබඳ විශේෂ විභාගයක් කෙරෙව්වා. ජීවන වියදම පිළිබඳ නියම තත්ත්වය සොයා බලන ලෙස මා ඒ අයට කීවා. ඒ අනුව මට වැදගත් වාර්තාවක් ලැබී තිබෙනවා. 1960 සිට 1965 දක්වා වූ කාලය සම්බන්ධවත්, 1965 සිට 1968 දක්වා වූ කාලය සම්බන්ධවත් කරුණු සඳහන් වැදගත් වාර්තාවක් ලැබී තිබෙනවා. මෙම ජීවන වියදම සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා රාජාසන කථාව පිළිබඳ විවාදයේදී වැදගත් ප්‍රකාශයක් කළා. ජීවන වියදම නඟින ආකාරයටම ඒ වියදමට ඔරොත්තු දෙන්නට පුළුවන් ජීවන තත්ත්වයක් රටට ඇති නොවුණොත් එය භයානක බවයි, එතුමා ප්‍රකාශ කෙළේ. අප එය පිළිගත යුතුයි. නිදසුනක් වශයෙන් එතුමා එක්සත් ජනපද රාජ්‍යය ගැන, සෝවියට් දේශය ගැන සඳහන් කළා. අපේ රටේ රුපියල් කීපයකට ගන්නට පුළුවන් සපත්තු ජෝඩුවක් මාතර ගරු මන්ත්‍රීතුමාගේ රටේ—සෝවියට් දේශයේ—රූබල් 700 ක්, 800 ක් වෙනවා. 1957 දී මා සෝවියට් දේශයට ගිය අවස්ථාවේදී සපත්තු ජෝඩුවක මිළ විමසුවා. එවිට රූබල් 750 ක් බව මට දැන ගන්නට ලැබුණා. එහෙත් ඒ තත්ත්වයට මුහුණ පෑ හැකි අන්දමට වැටුප් ලැබෙනවා නම් එය කාරණයක් නොවෙයි. ලංකාවේ ජීවන වියදම අඩු කරන්නැයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් එක අතකින් කියන විට ඒ කියන්නේ කුමක්දැයි කල්පනා කර බලන්නට ඕනෑ. පිටරටින් ගෙන්වන ද්‍රව්‍ය පැත්තකින් තබමු. ඒක අපට පාලනය කරන්නට බෑ. අපේ රටේ ද්‍රව්‍යවලත් මිළ ගණන් අඩු වැඩි වන්නේ අවශ්‍යතාව අනුවයි. මිළ පාලනය කළොත් නිෂ්පාදනය අඩු වෙනවා. එසේ නිෂ්පාදනය අඩු වන්නට කටයුතු සැලැස්වීම හේතුකොට ගෙන නිකමුන් වන්නේත් අපේම මිනිසුනුයි. අවශ්‍යතාවට අනුව සිදු වන නිෂ්පාදනයට ගැළපෙන මිළක් ලැබෙන්නටම ඕනෑ. එවිට ජීවන වියදම ඉහළ නැඟීම පුදුමයට කරුණක් නොවෙයි.

අපි උදාහරණයක් ගෙන බලමු. පිටරටින් අර්තාපල් ගෙන්වීම තහනම් කළාම මේ රටේ අර්තාපල්වල අවශ්‍යතාව වැඩි වුණා. අවශ්‍යතාවට සරිලන අර්තාපල් නිෂ්පාදනයක් ඇති වන තුරු අර්තාපල්වල මිළ ගණන වැඩියි. ඒ අවස්ථාවේ මිළ පාලනය කරන්නට ගියොත් අර්තාපල් නිෂ්පාදනය අඩු වෙනවා. එවිට සිදු වන්නේ මොකක්ද? පිටරටින් අර්තාපල් ගෙන්වන්නේත් නැහැ. වුවමනා තරමට මේ රටේ අර්තාපල් නිෂ්පාදනය කෙරෙන්නේත් නැහැ. එවිට කියන්න බැරිකමක් නැහැ අපේ අල හොද්දටත් තට්ටු කළාය කියා. රතු ළූනුවල තත්ත්වයත් ඒ විධියමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිටරටින් ගෙන්වීම තහනම් කළ වහාම මේ රටේ නිෂ්පාදනවල මිල ඉහළ නගිනවා. අවශ්‍යතාවත්, නිෂ්පාදනයත් සම වුණාම මිල ගණන් නියම තත්ත්ව යට එනවා.

අනෙක් අතින් මිල ගණන් කොයි තරම් වැඩි වුණත් කමක් නැහැ. ඒවා මිල දී ගන්නට තරම් පාරිභෝගිකයාට ශක්තියක් තිබෙනවා නම්. එම නිසා ජීවන වියදම වැඩි වීම භයානක දෙයක් නොවෙයි. එහි භයානකකම තිබෙන්නේ, ජීවන වියදමට සරිලන ජීවන තත්ත්වයක් ඇති වුණේ නැත් නම් පමණයි.

ඒ අනුව තමුන්නාන්සේලාගේ කාල යත්, අපේ කාලයත් අතර ජීවන වියදම හා ජීවන තත්ත්වය සංසන්දනය කර බලමු. මා අත තිබෙන මේ සඛ්‍යා ලේඛන පිළියෙළ කළේ ඒ පිළිබඳ විශේෂඥ දැනු මක් ඇති නිලධාරීන් කීප දෙනෙක්. අපේ ජීවන වියදම් අංකය තවමත් ගණන් ගන්නේ, 1952 අවුරුද්ද ඒකකයක් වශ යෙන් 100 හැටියට සලකාගෙනයි. ඒ අනුව බලන විට 1960 දී 103.5 ක් වූ ජීවන වියදම් අංකය 1965 වන විට 112.5 දක්වා ඉහළ නැඟ තිබෙනවා. එහෙම නම් තමුන් නාන්සේලාගේ කාලය තුළ ජීවන වියදම් අංකය සියයට 8.7 කින් ඉහළ නැඟ තිබෙ නවා. එය 1968 වන විට 121.5 දක්වා වැඩි වී තිබෙනවා. එහෙම නම් අපේ කාලය තුළ ජීවන වියදම් අංකය ඉහළ නැඟ තිබෙන්නේ සියයට 8 කින් පමණයි.

The cost of living index between the period 1965 and 1968 rose from 112.5 to 121.5, that is, an increase of 8 per cent. Then, during their time, from 1960 to 1965, it rose from 103.5 to 112.5, that is, an increase of 8.7 per cent. I will not grouse this if they had made provision for the real wages also to go up, that is, earning power.

මේ ගැන කිසිම චෝදනාවක් කරන්න වුවමනා නැහැ. ජීවන වියදම ඉහළ නැඟීම ප්‍රශ්නයක් නොවෙයි. පසුගිය මහා මැතිවරණ කාලයේදීත් අපේ තර්කය වූයේ, ඉහළ නැඟ ඇති ජීවන වියදමට සරිලන ජීවන තත්ත්වයක් ඇති නොකිරීමයි.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.**
(මිනුවන්ගොඩ)
*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன— மினுவாங்கொட)*
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

එහෙමද කිව්වේ ?

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

ඔව්. අදත් කියන්නේ එයමයි. ඒ අනුව තමුන්නාන්සේලාට පුළුවනි, ඉහළ නැඟ තිබෙන ජීවන වියදමට සරිලන ජීවන තත්ත්වයක් අප ඇති කර තිබෙනවාද කියා අහන්න. අප එවැනි ජීවන තත්ත්ව යකුත් උදා කර දී ඇති බව ඔප්පු කරන්නට පුළුවනි. 1960 සිට 1965 දක්වා වූ තමුන්නාන්සේලාගේ පාලන කාලය තුළ ජීවන වියදම් අංකය 103.5 සිට 112.5 දක්වා සියයට 8.7 කින් ඉහළ ගොස් තිබෙන බව මා කලින් පෙන්වා දුන්නා. දශම 7 පැත්ත කට දමමු. 1960 සිට 1965 දක්වා කාලය තුළ තමුන්නාන්සේලා පඩි වැඩි කර තිබෙන්නේ සියයට 4.7 කින් පමණයි. ඒ කාර්මික සහ වෙළඳ අංශයේ පමණයි. වැටුප් පාලක සභාවල කම්කරුවන්—Wages Board Workers—සම්බන්ධයෙන් සියයට 2.85යි. රජයේ සේවකයන් සම්බන්ධයෙන් සියයට 8 යි. එතකොට 1965 සිට 1968 දක්වා කාර්මික සහ වෙළඳ අංශයේ කොතරම් වැඩිවීමක් වුණාද ? තමුන්නාන්සේලාගේ කාලයේ තිබුණු සියයට 4.7 අපි වැඩි කර තිබෙනවා සියයට 13.4 කට. වැටුප් පාලක සභා අංශයේ තමුන්නාන්සේලාගේ කාල යේ තිබුණු සියයට 2.85 අපි වැඩි කර තිබෙනවා සියයට 10.5 කට. තමුන්නාන් සේලාගේ කාලයේ ආණ්ඩුවේ අංශයේ සියයට 8 ක් නංවන විට අපි සියයට 11.5ක් නංවා තිබෙනවා. මෙම සංඛ්‍යා ලේඛනවල තිබෙන විස්තරවලට අනුව 1960 සිට 1965 අතර කාල සීමාවේදී කර්මාන්ත හා වෙළඳ අංශයේ සේවකයන්ගේ මූර්ති වැටුප් නැතහොත් වැටුපේ නියම වටිනාකම සිය යට 4.7 කින් අඩු වුණා.

ගරු කථානායකතුමනි, මට ප්‍රථමයෙන් සුළු වැරදීමක් වුණා. ඒ අයගේ කාලයේ වැඩි වුණා නො වෙයි අඩු වුණා. අඩු වීම වැඩි වීමක් හැටියට සඳහන් කිරීම ගැන මට සමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]
වන්නට ඕනෑ. 1960 සිට 1965 අතර කාල යේ මෙම සංඛ්‍යා ඔක්කොම වැඩි වුණු ඒවා නොවෙයි ; අඩු වුණු ඒවායි. ඒ කියන්නේ සියයට 4.7, සියයට 2.85 සහ සියයට 8 යන ඒවායි. එම අංශ තුනේම අඩුවීමක් තමයි වෙලා තිබෙන්නේ. පඩි පාලක සභා යටතේ නියමිත වැටුපක් ලබන සේවක යන්ගේ වැටුප සියයට 2.81 කින් අඩු වුණා. එසේම ආණ්ඩුවේ සේවකයන්ගේ නියම වැටුපද සියයට 8.0 කින් අඩු වුණා. එහෙත් 1965-1968 අතර කාලයේදී මෙකී අංශ තුනේ සේවකයන්ගේ වැටුපේ නියම වටිනාකම පිළිවෙළින් සියට 13.4 කින්, සියයට 10.5 කින් හා සියයට 11.5 කින් වැඩි වුණා. මෙය ඉතා වැදගත් කාර ණයක්. සේවක කොටස් පිළිබඳව, එනම්, කර්මාන්ත හා වෙළඳ අංශය, පඩි පාලක සභා අංශය සහ රජයේ සේවකයන්ගේ අංශය පිළිබඳව මා කීවා.

ඊළඟට ගොවි ජනතාව සම්බන්ධයෙන් බලමු. 1965-68 කාලය තුළ කෘෂිකර්මාන් තයෙන් ලැබුණු ආදායම, විශේෂයෙන්ම ගොවීන්ගේ ආදායම වැඩි වුණා. මීට හේතුව වැවිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම පමණක් නොව වවනු ලැබූ ප්‍රමාණයද වැඩි වීමයි. 1964-68 අතර කාලය තුළ වී නිෂ් පාදනය සියයට 28 කින් වැඩි වුණා. වී සඳහා ගොවීන්ට ගෙවූ සහතික මිල රුපි යල් 12 සිට 14 දක්වා එනම් සියයට 16 කටත් වඩා වැඩි වී තිබෙනවා. මේ සමගම සාමාන්‍ය වෙළඳ පොළේ වීවල මිල සියයට 40 කින්ම වැඩි වුණා. එම නිසා ජීවන විය දම වැඩි වූවාට වඩා බොහෝ සෙයින් වැඩි තරමක් ගැමි ජනතාවගේ ආදායම දියුණු වුණා.

තමුන්නාන්සේලා කාර්මික සංවර්ධන යයි කියමින් පිටරටවලින් කාර්මික භාණ්ඩ ගෙන්වීම තහනම් කළා. බොහොම හොඳයි. එසේ කරන්නට ඇත්තේ ලාං කික කාර්මික සංවර්ධනය වැඩි කරන් නට වියහැකියි. එහෙත් වුණේ කුමක්ද? ඒවායේ මිල වැඩි වුණා. කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් කළේ මොකක්ද? පිටරටින් එන්න ඇරියා. එම නිසා පිටරට නිෂ්පාදන සමග මේ රටේ නිෂ්පාදනවලට තරග කරන්නට සිදු වුණා. මේ ගැන ටිකක් කල්පනා කර බලන්න. මේවා මා කියන්නේ දේශපාලන ප්‍රයෝජනය පිණිස නොවෙයි. වැඩිදුර කල්පනා නොකර හෝ මාක්ස්වාදී න්‍යාය ධර්මවලට යට වී හෝ කළ දෙයක්. තමුන්නාන්සේලා කාර්මික යුගයක් ඇති කරන බව කියමින් කාර්මික බඩු භාණ්ඩ පිටරටින් ගෙන්වීම තහනම් කළා. මෙහි කර්මාන්ත දියුණු කරන්නටය කියා යම් යම් ව්‍යාපාරිකයන් ට පුළුවන් තරම් ආධාර දුන්නා. එසේ කළාම ඒ අයගේ නිෂ්පාදනවල මිල ගණන් වැඩි වුණා. එසේ මිල වැඩි වන්නට හැරියා මිස වෙන මොකක්ද කළේ ? මේ රටේ වැඩි ජනතාව විසින් කරනු ලබන අත්‍යාවශ්‍ය කර්මාන්තය වන කෘෂිකර්මය කරන අයට පිටරටින් ගෙන් වන අර්තාපල්, පිටරටින් ගෙන්වන රතු ලූණු සහ පිටරටින් ගෙන්වන සහල් යනා දිය සමග තරග කරන්නට සිදු වුණා. අන් තිමේදී වෙළඳ පොළේ සහල් මිල වැඩි වුණාම අපි ඔක්කෝටම උඩ බලන්න සිදු වුණා. එහෙත් මේ ආණ්ඩුව කරන්නේ කුමක්ද ? තමුන්නාන්සේලා කාර්මික අංශයට ඇති කළ වැඩ පිළිවෙළ අපි කෘෂි කාර්මික අංශය යනුවෙන් ඇති කළා. අප පිළිගන්නා ප්‍රතිපත්තිය නම් කාර්මික සංවර්ධනයත් කෘෂිකාර්මික සංවර්ධන යත් කියන දෙකම එකට අත්වැල් බැඳ ගෙන දියුණුව කරා යායුතුය යන්නයි. මෙම රජය මේ වකාවානුවේදී කර තිබෙන වැද ගත්ම වෙනස්කම එයයි. එසේ නොවුව හොත් කොතරම් භයානක තත්ත්වයක් ඇති වියහැකිද යන්න ගැන අප කල්පනා කළයුතුයි.

අද මේ රටේ නිෂ්පාදනය කරන කාර්මික භාණ්ඩවල මිල පාලනයක් කිරීම සම්බන්ධ යෙන් රජය ක්‍රියාත්මක කරගෙන යන වැඩ පිළිවෙල මෙයයි. දැන් වුවමනාවට වැඩි යෙන් කාර්මික නිෂ්පාදන ව්‍යාපාර ඇති වී තිබෙන බව ඒවායේ මිළ ගණන් අනුව බලන විට පේනවා. මේ ගැනත් විශෙෂ පරීක්ෂණයක් අද පවත්වාගෙන යනවා.

ගරු කථානායකතුමනි, මා ඒ කාරණය ඔය ආකාරයට ඉදිරිපත් කෙළේ කුමන හේතුවක් නිසාදැයි මම දැන් පැහැදිලි කර දෙන්නම්. විරුද්ධ පාර්ශ්වය රට පුරාම ගොස් ජනතාව ඉදිරියේ අසන ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුව ජීවන වියදම අඩු කරන වාය කිව්වා නොවේදැයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා රටේ නොයෙක් තැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දී ප්‍රශ්න කරනවා. ඒ අතරම, "කෝ ජීවන වියදම අඩු කළාද?" කියාත් අහනවා. ආණ්ඩුව කොහොමද ජීවන වියදම අඩු කරන්නේ? පිටරටින් ගෙන්වන දේ තහනම් කර, ඒ දේවල් මේ රටේම නිෂ්පාදනය කරන්නැයි අපේ මිනිසුන්ට කියා, ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් නොකඩවා අනුගමනය කරගෙන යෑමේදී වුවමනා ප්‍රමාණයට නිෂ්පාදන ආවාම මිල ගණන් නියම ආකාරයට සැසඳෙනවා ඇති. ඒ කාරණය පිළිගත් දෙයක් නොවෙයිද? ඒ ගැන තවත් තර්කයක් වුවමනාද? මීට පෙර කාලවල වරායෙන් අර්තාපල් බෑවාම ලොරි වල කුණු වෙවී උඩරට පළාත්වලට ගෙනගිය හැටි තමුන්නාන්සේ දන්නවා. අද පවතින තත්ත්වය කොහොමද? ඒකත් තමුන්නාන්සේ දන්නවා. අද සිදු වන්නේ වෙනදා සිදු වූ දේට හාත්පසින්ම වෙනස් දෙයක් නොවෙයිද? අද උඩරට පළාත් වලින් කොළඹට ලොරි ගණන් අර්තාපල් එනවා. ඉතින් මෙය වෙනසක් නොවෙයිද? රතු ළූනු ගැන කල්පනා කර බලන්න. වෙනත් අත්‍යවශ්‍ය දේවල් ගැනත් කල්පනා කර බලන්න. ඒවා සම්බන්ධයෙනුත් අද මේ රටේ තිබෙන්නේ වෙනදා පැවති තත්ත්වයට වඩා හාත්පසින්ම වෙනස් තත්ත්වයක් නොවෙයිද? ඉතින් මෙය වෙනසක් නොවෙයිද?

ඉස්සර කෘෂිකාර්මිකයකු හැටියට ජීවත් වුණු පියා කල්පනා කෙළේ තමන්ගේ දරුවාට දීප්තිමත් අනාගතයක් ලැබෙන්නේ කෘෂිකර්මාන්තයේ පිහිටෙන් නොවේය කියලයි. ඉස්සර කෘෂිකාර්මිකයා කල්පනා කෙළේ තමන්ගේ දරුවා නගරයට යවා ඉංගිරිසි ටිකක් උගන්වා රජයේ රැකියාවකට යොමු කරවීම ඉතාමත් හොඳ වැඩේ හැටියටයි. එහෙත් අද කොහොමද තත්ත්වය? අද ගොවියා කල්පනා කරන්නේ කොහොමද? අද නාගරිකයා කල්පනා කරන්නේ කොහොමද? අපෙන් අද බොහෝ දෙනා අහන්නේ, "මට පිටිසරින් ඉඩම් කෑල්ලක් අරන් දෙන්න බැරිද, වගා කරන්නට?" කියායි. ඇයි එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ? ඒ අය දන්නවා, ඒ අයගේ ළමයින්ගේ අනාගතය රඳා තිබෙන්නේ සිඳාදියේ නොව ගම්බද ප්‍රදේශවලය, යන්න. අද මේ රජය ඒ තත්ත්වය ලබා දී තිබෙනවා. එය ජයග්‍රහණයක් නොවෙයිද?

දැන් අලුත් චෝදනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මොකක්ද ඒක? "මේ ගරු සභාවේ මන්ත්‍රීවරුනුත් දැන් ඉඩම් අරන් වවනවා," කියනවා. ඒකට කරන්නට දෙයක් නැහැ. ඒ මන්ත්‍රීවරුනුත් දන්නවා තමන්ගේ ළමයින්ගේ අනාගතය තිබෙන්නේ ඉස්සර වාගේ ඉංගිරිසි ටිකක් උගන්වා ආණ්ඩුවේ රැකියාවකට දැමීම උඩ නොවන බව. ඒ ළමයින්ගේ ආරක්ෂාවට, අනාගත දියුණුවට හිතකර වන්නේ කෘෂිකර්මාන්තය බව දන්නා නිසයි ඒ අයත් ඒ විධියට ක්‍රියා කරන්නේ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

වවනවා නම් කමක් නැහැ. ඇත්ත වශයෙන්ම කෙරෙන්නේ ඒක නොවෙයි. ඒ අය වටිනා කැලෑව කපා පුළුස්සා දමනවා; කැලෑව විනාශ කරනවා. බොහෝ දෙනා කැලෑවෙන් ලී අරන් විකුණනවා.

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

ඉතින් තමුන්නාන්සේ ඒකටත් විරුද්ධයි. වැරදි වැඩ කරන උදවිය ඉන්නවා නම් ඒ ගැන වෙනම ක්‍රියා කරන්නට පුළුවනි. මා කිව්වේ ඒ ගැන නොවෙයි; වගාව ගැනයි. 1960-65 අතර කාලයේදී කර්මාන්ත දියුණුවීමත්, කාර්මික නිෂ්පාදන ගණනාවක්ම පිටරටින් ගෙන්වීම තහනම් කිරීමත් නිසා මෙරට නිපදවනු ලැබූ කාර්මික බඩුවල මිල ඉහළ නැංගා. මීට සම සමව මෙරට ගොවීන්ගේ වැවිලි ද්‍රව්‍යවල මිල ඉහළ නොයෑම නිසා, කර්මාන්තවල දියුණුවේ හේතුවෙන්, ගැමි ජනතාවට සිදු වූයේ පාඩුවක් බව කියන්නට ඕනෑ. එහෙත් අද පවතින තත්ත්වය මොකක්ද? ගැමි ජනතාවගේ නිෂ්පාදනවලටත් අද සෑහෙන මිලක් ලැබෙනවා. පිටරටවලින් ගෙන්වන ද්‍රව්‍ය තහනම් කළ නිසා විදේශ විනිමයත් ඉතිරි වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

අද කර්මාන්ත අංශයෙන් සිදු වී තිබෙන්නේ කුමක්දැයි බලමු. අප බලයට පත් වුණාට පස්සේ අපේ කර්මාන්ත ඇමතිතුමාට පුළුවන් වෙලා තිබෙනවා, විරුද්ධ පාර්ශ්වය ආණ්ඩු කරද්දී තහනම් කරන ලද දේවල තහනම ඉවත් කර දමා අමු ද්‍රව්‍යවලට මුදල් දෙන්නට; යන්ත්‍රෝපකරණවලට මුදල් දෙන්නට. අද කාර්මික සංවර්ධනයේ ප්‍රගතිය ඇති කරන්නටත් පුළුවන් වෙලා තියෙනවා. අපේ ප්‍රතිපත්තිය හැටියට කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය එකට අත්වැල් බැඳගෙන යා යුතුයයි මා කිව්වේ ඒ නිසයි. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ඒකයි.

රැකීරක්ෂා හිඟය පිළිබඳ ප්‍රශ්නය ගැන අපි ඊළඟට කල්පනා කර බලමු. අපේ රටේ දැන් ලක්ෂ පහකට පමණ රැකියාවන් හිඟ බව යම් යම් සංඛ්‍යා ලේඛනවලින් අප කාටත් පාහේ දැනගන්නට ලැබී තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ සමීක්ෂණයකදී වැදගත් කරුණු රාශියක් හෙළි වී තිබෙනවා. අවුරුදු පතා අලුතින් රැකියා ලැබිය යුතු අයගේ ගණයට ලක්ෂයක් පමණ දෙනා එක් වන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සමීක්ෂණවලින් හෙළි වූ එක් වැදගත් කාරණයක්. මේ අය අතර පාසල්වලින් පිට වන උදවියත්, නියමිත වයස් සීමාවට පැමිණි උදවියත් වෙනත් නොයෙක් වර්ගවලට අයත් උදවියත් සිටින්නට පුළුවනි. කරන ලද සමීක්ෂණයකදී සොයා ගත් කාරණයක් තමයි මා ඒ සඳහන් කෙළේ. රජයේ කෘෂිකර්මාන්ත හා කාර්මික වැඩ පිළිවෙළ නිසා—සංවර්ධන වැඩ පිළිවෙළ නිසා—ගත වූ අවුරුදු පහ තුළ අවුරුද්දකට අලුත් ඇබෑර්තු ලක්ෂයක් පමණ බැගින් ඇති වූ බව තමුන්නාන්සේ දන්නවා. ශ්‍රී ලංකා මහ බැංකුවේ සමීක්ෂණවලිනුත් ඒ බව හෙළි වී තිබෙනවා. අපේ සංවර්ධන වැඩ නිසයි එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. අප බොහෝ දෙනා හිතන විධියේ රැකියාවල් නම් නොලැබෙනවා වෙන්නට ඇති. ඒ ගැන සැකයක් නැහැ. රැකීරක්ෂාවල් සොයමින් මා ළඟට පැමිණෙන උදවියත්, තමුන්නාන්සේ ළඟට එන උදවියත්, වෙනත් ගරු මන්ත්‍රීතුමන්ලා මුණගැහෙන්නට එන උදවියත් යන මේ හැම දෙනාම පාහේ සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන විධියේ රක්ෂාවල් නැතිවා වෙන්නට පුළුවනි.

මා හමු වන්නට එන බොහො දෙනා බලාපොරොත්තු වන්නේ "වොචර්" වැඩක්. වොචර් වැඩක්ය කියන්නේ මුර වැඩක්. වොචර් වැඩේ හැටියට කරන්නට තියෙන්නේ බලන් ඉන්න එකයි. තවත් සමහර අය "ඕවර්සියර්" වැඩක් ඕනෑය කියනවා. ඕවර්සියර් වැඩේ කියන්නේ මොන විධියේ වැඩකටද? ඕවර් කියන්නේ උඩින්; සියර් කියන්නේ බලන්නා. එන කොට ඕවර්සියර් කියන්නේ උඩින් බලන්නා කියන එකයි. එන වැඩි දෙනා එන්නේ වොචර් වැඩේ—බලන් ඉන්න වැඩේ—නැත්නම් ඕවර්සියර් වැඩේ—උඩින් බලන් ඉන්න වැඩේ—වාගේ වැඩ හොයන්නටයි, රක්ෂාවල් හැටියට. ළඟදී මා හමු වන්නට කෙනෙක් ආවා. එයා කලින් හිටපු තැනින් රක්ෂාවෙන් අස් කරන ලද කෙනෙක්. රක්ෂාවෙන් අස් කළාලු. චාජ් ෂීට් එකේ මොනවද තියෙන්නේ? හය වතාවක්ම අහු වෙලා තියෙනවා, නිදාගෙන ඉඳලා. රක්ෂාව වොචර් වැඩේ. ඉතින් එයා බලන් ඉන්න වැඩේවත් හරියට කරලා නැහැ. අද රට ගමන් කරන සංවර්ධනයට ගැළපෙන පිළිවෙළට අපේ තරුණයන්ට පුහුණුවක් දිය යුතුයි. තමුන්නාන්සේලා එදා එසේ පුහුණුවක් දුන්නාද කියා මා අහන්න කැමතියි. අධ්‍යාපන වැඩ පිළිවෙළ වෙනස් කරන්න තමුන්නාන්සේලා හුඟක් සාකච්ඡා පැවැත්තුවා. තමුන්නාන්සේලාගේ ඇමතිතුමා ලෝකෙ වටේ ගිහින් ආවා. එහෙත් වෙනසක් ඇති කළාද? කලා උපාධිධාරීන් වැඩි වීමට තමුන්නාන්සේලා පුළුවන් තරම් වැඩ සැලැස්සුවා. තමුන්නාන්සේලා කෙළේ කලා උපාධිධාරීන් බිහි කිරීමයි. මේ රජය ඒ පිළිවෙළ වෙනස් කරන්න තීරණය කළා. තමුන්නාන්සේලා බොරු ප්‍රචාරයක් ගෙනයනවා, මේ රජය හදන්නේ ධීවරයාගේ ළමයා ධීවරයා කරන්නය, වඩුවගේ ළමයා වඩුවා කරන්නය ආදී වශයෙන්.

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කවුද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ප්‍රේමදාස**

*(கௌரவ பிரேமதாச)*

(The Hon. Premadasa)

තමුන්නාන්සේලාගේ දිවුලපිටිය ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) කිව්වා. නැහැ, අපි එහෙම දෙයක් කරන්නෙ නැහැ. අපේ රජය සූදානම් වන්නේ ළමයාගේ දෙමව්පියන් කවුරු වුණත් ඒ ගැන නොසලකා ඒ ළමයාගේ උපන් හපන්කම් අනුව ඔහුව යම් යම් අංශවලට පුරුදු පුහුණු කිරීමටයි. නියම අධ්‍යාපන වැඩපිළිවෙළක ප්‍රතිඵලය විය යුත්තේ ඒකයි. ප්‍රතිපත්තිය විය යුත්තේ ඒකයි.

අන්න ඒ ක්‍රමයයි අපි දැන් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඇති කර තිබෙන්නෙ. අවුරුදු 4 ක් තුළදී එක පාරටම ගොඩ නැඟිලි සාදා ගුරුවරුන් පත් කර ප්‍රාතිහාර්යයක් කරන්න බැහැ. අනුක්‍රමයෙන් ඒ කටයුතු කරන්න ඕනෑ. සෝවියට් රුසියාවෙ සමහර පළාත්වල එවැනි ක්‍රම තිබෙනවා නම් ඒවා මල්පල ගෙන තිබෙන්නෙ අවුරුදු කීයකට පසුවද? ඊටත් වඩා සැලකිය යුතු කරුණ නම් ප්‍රජාතන්ත්‍රවාදී වැඩපිළිවෙළ අනුව රටක් දියුණු කරන විට එම දියුණුව ඇති වන්නේ සෙමිනුයි. අප කරන්නට බලාපොරොත්තු වන සියලුම යෝජනා මේ මන්ත්‍රී මණ්ඩලය ඉදිරියට ගෙනෙන්න ඕනෑ. එසේ ගෙනා විට තමුන්නාන්සේලා පැය ගණන් කථා කර ඒවා ප්‍රමාද කරනවා. එහෙම එකක් නැහැ, සෝවියට් රුසියාවෙ. සෝවියට් දේශයේ අගමැතිතුමාට සිතුනොත් ඕනෑ එකක් කරන්න පුළුවනි. කවුරු හෝ විරුද්ධව කථා කළොත් සයිබීරියාවට යවාවී. දැන් හඳටත් යවන්න පයෝෂණ කරගෙන යනවා ඇති.

ඊළඟට කථානායකතුමනි, විරුද්ධ පක්ෂය නඟන තවත් චෝදනාවක් තමයි, අපේ කෘෂිකර්ම සංවර්ධනයෙන් පිහිට ලැබී තිබෙන්නේ ධනවතුන්ටය කියන එක. මා ඒ ගැන සංඛ්‍යා ලේඛන සෙව්වා. අපේ රජය ගෙන යන ගොවිතැන් වැඩපිළිවෙළ උඩ කාටද වැඩි ප්‍රයෝජනයක් ලැබී තිබෙන්නෙ කියා තමුන්නාන්සේ දන්නවාද? 1963 දී මධ්‍යම බැංකුවෙන් කරනු ලැබූ සමීක්ෂණයකදී එළිදරව් වී තිබෙන්නේ, ඒ අවස්ථාවේ සිටි ජනගහනයෙන් සියයට 60 ක්ම ගොවිතැන් ව්‍යාපාරයේ ප්‍රයෝජනයෙන් ජීවත් වන ජනතාවක් බවයි. අද තමුන්නාන්සේලා දන්නවා, අපේ ජනගහනය ලක්ෂ 120 ක් බව. එතකොට අර සමීක්ෂණය අනුව කිසිම සැකක් නැතුව කියන්න පුළුවන් මෙයින් 70 ලක්ෂයක් පමණ ගොවිතැන් සංවර්ධනය නිසා ජීවත් වන බව. ඒ කෙසේද කියා අපට දැන ගන්න පුළුවන්.

අක්කර බාගෙට අඩු ඉඩම් කට්ටි 2,42,690 ක් තිබෙනවා. එහි අක්කර ප්‍රමාණය 58,005 යි. අක්කර භාගයේ සිට අක්කරයට අඩු ඉඩම් කට්ටි 2,53,823 ක් තිබෙනවා. එහි අක්කර ප්‍රමාණය 1,47,376 යි. අක්කරයේ සිට අක්කර දෙකට අඩු ඉඩම් කට්ටි හිමියන් සංඛ්‍යාව 1,62,120 යි. එහි අක්කර ප්‍රමාණය 1,93,794 යි. අක්කර දෙකේ සිට අක්කර 5 ට අඩු ඉඩම් කට්ටි 85,310 යි. එහි අක්කර ප්‍රමණය 2,31,726 යි. අක්කර 5 හේ සිට අක්කර 10 ට අඩු ඉඩම් කට්ටි 19,705 යි. අක්කර ප්‍රමාණය 1,22,073 යි. එසේ නම් කථානායකතුමනි, වීවල සහතික මිල වැඩි කිරීමෙන් කාටද වැඩි ප්‍රයෝජනයක් ලැබී තිබෙන්නෙ? අර්තාපල් තහනම් කර මෙහි අර්තාපල් වගා කිරීමෙන් කාටද වැඩි ප්‍රයෝජනයක් ලැබී තිබෙන්නෙ? රතුලූනු ගෙන්වීම තහනම් කර රතුලූනු මෙහි වගා කිරීමෙන් කාටද වැඩි ප්‍රයෝජනයක් සැලසී තිබෙන්නෙ? මුළු ජනතාවටමයි. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ රජය ගෙන යන්නේ රටේ පොදු සාමාජීක දියුණුවට අදාළ ප්‍රතිපත්තියක් බව කියන්න ඕනෑ. මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙල මේ අයවැය වාර්තාවෙන් මතු වී පෙනෙනවා. ඒ නිසා මේ අයවැය වාර්තාව ඒකච්ඡන්දයෙන් සම්මත කිරීම රටේ දියුණුව පතන කාගේත් යුතුකමක්.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please !

The Sitting is suspended till 2 P.M.

**රැස්වීම, ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 2 மணி வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, හත් හවුලේ 5 වැනි අයවැය ගැන කතා කිරීමට ප්‍රථම මේ අයවැය ලේඛන විවාදයේදී පළාත් පාලන ඇමතිතුමා විසින් කරන ලද ප්‍රකාශයකට මා පිළිතුරු දිය යුතුව තිබෙනවා. එතුමා එතුමාගේ කතාවේදී කියා සිටියා, මා සෝවියට් දේශයේ නියෝජිතයෙක්ය කියා. ඇත්ත වශයෙන්ම එක් අතකින් බලන විට සමාජවාදී රටක නියෝජිතයෙක් වෙන්න පුළුවන් වෙනවා නම් මා ඒ ගැන ආඩම්බර වෙනවා. නමුත් එතුමාට වුවමනා වූයේ සෝවියට් දේශයේ නියෝජිතයෙක් හැටියට මා හැඳින්වීමෙන් මා මේ රටේ කටයුතු වෙනත් රාජ්‍යයකට වුවමනා විධියට කරන්නට වැයම් කරනවාය, නැත්නම් ඒ රටේ සේවකයෙක් හැටියට මා ක්‍රියා කරනවාය කියා පෙන්වීමෙන් මට අපහාස කිරීමටයි. ඒ අදහස ඇතුවයි එතුමා ඒ ප්‍රකාශය කළේ. පළාත් පාලන ඇමතිතුමා වැනි කෙනෙක් එවැනි ප්‍රකාශයක් කිරීම ගැන මා කණගාටු වෙනවා. නමුත් මා ආපසු හැරී කියන්නට කැමති නැහැ, පළාත් පාලන ඇමතිතුමා බටහිර ජර්මනියේ නියෝජිතයෙක්ය කියා. එතුමා ඇමතිකම ලැබුණාට පසු බටහිර ජර්මනියට ගොස්—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

කැමති නැත්නම් කියන්න [illegible]?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ වුණත් නොකියා බැහැ. එතුමා බටහිර ජර්මනියට ගොස් පැමිණ ඊබට් සංවිධානය නමින් සංවිධානයක් මේ රටේ පිහිටුවන්නට ක්‍රියා කරගෙන යනවා. බටහිර ජර්මනියේ ඉල්ලීම උඩ—නියමය උඩ—ඒ වගේ සංවිධානයක් පිහිටුවීමට ක්‍රියා කරන නිසා එතුමා බටහිර ජර්මනියේ නියෝජිතයෙක් වශයෙන් හඳුන්වන්නට මා කැමති වන්නේ නැහැ. ඒ වගේම එතුමා ඇමෙරිකාවේ නියෝජිතයෙක් හැටියට හඳුන්වා දෙන්නටත් මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අපි කියන්නට ඕනෑ, මේ ආණ්ඩුව හැම අවස්ථාවේදීම ලෝක බැංකුවේ නියමයන් දොහොත් මුදුනේ තබා පිළිගැනීමෙන් ක්‍රියා කරන ආණ්ඩුවක් බව.

ගරු කථානායකතුමනි, මේ හත් හවුලේ 5 වැනි අයවැය ලේඛනය ගැන සාකච්ඡා කරන අවස්ථාවයි. මේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන ලද පසුගිය අයවැය ලේඛන හතරම මට මතකයි. ඒ හැම එකකින්ම පොදු ජනතාවට පහර දීම තමයි මේ ආණ්ඩුවෙන් කළේ. ලෝක බැංකුවේ ඉල්ලීම පිට දේශීය හා විදේශීය ධනපති පංක්තිය සන්තෝෂ කිරීමට ඔවුන් හැම අවස්ථාවේදීම කිසිම සැකක් බියක් නැතිව පොදු ජනතාවට පහර දුන්නා.

මට මතකයි පළමු වැනි අයවැය ලේඛනය ගැන. එම අයවැය ලේඛනය ඉදිරිපත් කරන්න සිටියේ කවදාද? ජූලි මාසයේ 29 වන දින ඉදිරිපත් කරන්නට තිබුණු අයවැය ලේඛනය 1965 අගෝස්තු මාසයේ 5 වන දිනට කල් දැමුවා. ඊළඟට අගෝස්තු මාසයේ 5 වන දින සිට අගෝස්තු මාසයේ 9 වන දිනට කල් දැම්මා. අවසානයේදී අගෝස්තු 9 වන දින තමයි මේ ආණ්ඩුවේ මුදල් ඇමතිවරයාට පළමුවන අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට පුළුවන් වුණේ. අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම මේ විධියට කල් දැමුවේ මන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

හරි ගස්සන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

හරි ගස්සන්න නොවෙයි. මේ ආණ්ඩුව අර "ඒඩ් සිලෝන් ක්ලබ්" කියන සංවිධානයෙන්, ලංකාවට ආධාර දෙන ඒ සංවිධානයෙන් උත්තරය එන තෙක් ප්‍රමාද කළා. මොන විධියේ ආධාර සපයනවාද කියා පිළිතුරක් එවන තෙක් අගෝස්තු 9 වන දින දක්වා අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම ප්‍රමාද කළා. තමන්ගේ පැවැත්මට අධිරාජ්‍යවාදීන්ගේ ආධාර පතා මෙසේ අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම ප්‍රමාද කළ අවස්ථාවක් ලෝකයේ කවර රටකින්වත් අසන්නට පුළුවන්කමක් නැහැ. ලංකාවෙන් තමයි එවැනි සිද්ධියක් ගැන අසන්නට තිබෙන්නෙ. මේ රටේ අයවැය ලේඛනය පිළියෙල කරන්නට පිටරට ආධාර පැතූ, ආධාර දෙනවාය යන පොරොන්දුව ලැබෙන තෙක් අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම ප්‍රමාද කළ මේ ආණ්ඩුව තමයි අපට සෝවියට් දේශයේ නියෝජිතයන්ය කියන්නෙ.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව පළමුවන අයවැය ලේඛනයෙන්ම දේශීය සහ විදේශීය ධනපතියන්ට රුපියල් පනස් හය කෝටියක පහසුකම් සැලැස්වූ හැටි අපට මතකයි. දේශීය සහ විදේශීය ධනපතියන්ගේ බදු බර අඩු කළ හැටි අපට මතකයි. ධන බද්ද සියයට 2 දක්වා අඩු කළ හැටි මතකයි. බ්‍රිතාන්‍යයින්ගෙන් සහ ඉන්දියානුවන්ගෙන් ගත් වීසා බද්ද සම්පූර්ණයෙන්ම අහෝසි කළ හැටි මතකයි. ඒවාගේම කිසිම අවහිරයක් නැතිව විදේශීය රටවලට ශුද්ධ ලාභ මුදල් ගෙන යන්නට පහසුකම් සැලැස් වූ හැටි මතකයි. පළමුවන අයවැය ලේඛනයෙන්ම ඒ ආකාරයට දේශීය සහ විදේශීය ධනපතියන්ට මේ ආණ්ඩුව වරප්‍රසාද රාශියක් අත් කර දුන්නා. ඒවා අපට අමතක කරන්නට බැහැ. ඊළඟට සාමාන්‍ය ජනතාවට සහනයක් දෙනවාය යන මුවාවෙන් භූමිතෙල්වල සහ කපු රෙදිවල බද්ද අඩු කළා. එක් කෝටි අසූ ලක්ෂයක් අඩු කළා. නමුත් ඒ සමගම අනෙක් පැත්තෙන් මොකක්ද කළේ? ජනතාවට එදිනෙදා අවශ්‍ය වන පාරිභෝගික ද්‍රව්‍යවල බදු සියයට 15 දක්වා වැඩි කර රුපියල් දෙකෝටි විසි ලක්ෂයක් ආපසු ගත්තා. එක් කෝටි අසූ ලක්ෂයක් දී දෙකෝටි විසි ලක්‍ෂයක් ගත්තා. ලොකු ධනපතියන්ට දුන් බදු සහන අවසානයේ දී ගෙවන්නට සිද්ධ වුණේ කාටද? මේ රටේ සාමාන්‍ය ජනතාවටයි. දෙවන අයවැය ලේඛනයෙනුත් ආණ්ඩුව ඒ විධියට මයි ක්‍රියා කර තිබෙන්නෙ. ඒ අයවැය ලේඛනයෙනුත් විදේශීය මුදල් ආයෝජකයන්ට ඔවුන් උපදවන ලාභ සියරට ගෙන යන්නට ඉඩකඩ දෙනවාය යන පොරොන්දුව දුන්නා. එපමණක් නොවෙයි. 1961 වර්ෂයේදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව තිබුණු කාලයේදී විදේශීය බැංකුවල යම් යම් සීමාකිරීම්වලට යටත් කර තිබුණා. ඒ අවහිරකම් සහ නීති අස් කරන බවට මේ ගරු මුදල් ඇමතිතුමා විදේශීය බැංකුවල්ට පොරොන්දුවක් දුන්නා. විදේශීය බැංකුකාරයන්ටත් වෙනත් ධනේශ්වරයන්ටත් පහසුකම් ලබා දුන් අතර පොදු ජනතාවගේ පාරිභෝගික භාණ්ඩ රාශියක ආනයන බදු වැඩි කොට 1 කෝටි 50 ලක්ෂයක මුදලක් මේ ආණ්ඩුව දෙවැනි අයවැය ලේඛනයෙන් ලබා ගත්තා. ධනපතියන්ගේ කාර්වල ආනයන බද්ද අඩු කොට දුප්පතාගේ බයිසිකලයේ බද්ද සියයට 23 සිට 50 දක්වා වැඩි කළා. ධනපතියන්ට සෑම පහසුකමක්ම සලස්වා දුප්පතා පිට තව තවත් බදු බර පැටෙව්වා. ධනපතියන්ට අවශ්‍ය ශීතල පෙට්ටි, නාන කාමරවලට අවශ්‍ය බඩු, සෝදන යන්ත්‍ර, කෙස් වේලන යන්ත්‍ර වැනි දේවල මිළ අඩු කළා. කුරුඳුවත්තේ නෝනලාට අවශ්‍ය ලෝම දිග බල්ලන් වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණු බදු මුදල මේ ආණ්ඩුව විසින් බාගයකින් අඩු කළා. දුප්පතාට සහන සලසා තිබෙන්නේ මේ විධියටයි. 1967 අයවැය ලේඛනයෙනුත් සම්පූර්ණයෙන්ම පහසුකම් සලසා තිබෙන්නේ ධනපතියන්ට පමණයි. විශේෂ බදු ක්‍රම යටතේ රජයේ ඉඩම් කොල්ල කා ගත් උදවියට සෑම සහනයක්ම සැලසූ අතර අලුත් බදු මගින් පාරිභෝගිකයන්ගෙන් රුපියල් 9 කෝටි 50 ලක්ෂයක් මේ රජය උදුරා ගත්තා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

1968 අයවැය ලේඛනයෙන් මොකද වුණේ ? මේ රට සම්පූර්ණයෙන්ම විදේශ වලට ණය වන තත්ත්වයකට පත් වුණා. දේශීය වශයෙන් දවසකට 10 ලක්ෂයක ණය ගන්නට සිදු වෙනවා. අයවැය හිඟය පියවන්නට රජය කල් පනා කෙළේ මේ විධියට ණය ගැනීමෙනුයි. දිගටම මේ අන්දමට කටයුතු කර ගෙන ආ මේ ආණ්ඩුව මෙම අයවැය ලේඛනයෙන් ලබා දීමට රජය පොරොන්දු යක් සලසා නැහැ. වැඩි වන ජීවන වියදම නිසාත් බඩු මිළ ඉහළ යාම නිසාත් මේ රටේ ජනතාව අතර විශේෂයෙන්ම රජයේ සේවකයන් අතර, විශාල උද්ඝෝෂණ ඇති වුණා. රජයේ සේවකයන්ට යම් කිසි සහනයක් මේ අයවැය ලේඛනයෙන් ලබා දීමට රජය පොරොන්දු වුණා. එහෙත් එය ක්‍රියාත්මක කරන්නෙ යන්නේ කවදා සිටද ? 1969 ඔක්තෝබර් මාසයේ සිට. පොරොන්දු වුණේ කවදා සිට දෙන්නද ? 1968 සිට.

මේ රටේ සිටින්නේ රජයේ සේවකයන් පමණක් නොවෙයි. වැඩි වන ජීවන වියදමත් ඉහළ යන බඩු මිළ ප්‍රමාණයත් අනුව රජයේ සේවකයන්ට විශේෂ සහනයක් සැලසීමේ යුතුකමක් තිබෙනවා. ඒ සමගම, රැකිරක්ෂා නැති විශාල පිරිසක් මේ රටේ සිටින බවත් අප සැලකිල්ලට ගත යුතුයි. රැකිරක්ෂා නැති පිරිස 5 ලක්ෂයක් බවයි ගරු පළාත් පාලන ඇමතිතුමා කිව්වේ. ඇත්ත වශයෙන්ම 5,00,000 ක් නොවෙයි, අද රැකි රක්ෂා නැති උගත් තරුණ තරුණියන් පමණක් 7,00,000 ක් පමණ සිටිනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.** (ගලගෙදර)
(*திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா—கலகெதர*)
(Mr. W. M. G. T. Banda—Galagedera)
ඊටත් වැඩියි.

**තුඩාවේ මයා.**
(*திரு துடாவ*)
(Mr. Tudawe)
වැඩි නම් ඒ වැඩි ගණන කියන්න. මේ ගණන 1971 වන විට 10,00,000 ක් පමණ වෙනවා කියා තමයි, මේ ආණ්ඩුවේ උපදේශකයන්ගේ ගණන් හිලව්වල තිබෙන්නේ. මේවා අපේ ගණන් හිලව් නොවෙයි. මේ ආණ්ඩුවට උපදෙස් දෙන උදවියගේ ගණන් හිලව්. රැකී රක්ෂා ප්‍රශ්නය—විශේෂයෙන් තරුණයන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය—විසඳීමේ කටයුත්තක් මේ අවුරුදු 5 තුළ සිදු වී නැති බව අපට කණගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනවා. අද තරම් මේ රටේ තරුණයන් අසහනයට පත් වූ යුගයක් තවත් නැහැ. අද තරුණයන් මහපාරට බැස සටන් පාඨ කියන්නට පටන් ගෙන තිබෙනවා. "රක්ෂා දියව්; නැත්නම් ජීවනාධාර දියව්" යන සටන් පාඨ යටතේ අද තරුණයන් හා කම්කරුවන් මහපාරට බැස මේ ආණ්ඩුවට විරුද්ධව පෙළපාලි යන්නට පටන් ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ තරුණයන්ටත් ලෝකයේ අවශේෂ රටවල තරුණයන්ට වගේ හොඳ ජීවිත ගෙන යන්නට හැකි වන අන්දමට ඔවුන්ගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්නට ඕනෑ. හොඳ සරමක්, ෂර්ට් එකක්, බැනියමක් අඳින්නටත්, විනෝද ගමන් බිමන් යන්නටත්, චිත්‍රපටි ආදිය බලන්නටත් විශේෂයෙන්ම තරුණයන්ට වුවමනා කරනවා. ඒ අන්දමට විනෝද වන අතරම තමන්ගේ දෙමව්පියන්ට සලකන්නටත්, නොයෙක් යුතුකම් ඉටු කරන්නටත් ඔවුන්ට වුවමනා කරනවා. මේ රජය යටතේ ඔවුන්ගේ තත්ත්වය එන්ට එන්ටම පිරිහුණා මිස, ඔවුන්ගේ අසහනය එන්ට එන්ටම වැඩි වුණා මිස අඩුවන පාටක් නම් පෙනෙන්නට නැහැ. ගරු කථානායකතුමනි, මේ රටේ ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වෙනවාය, මිනිත්තු 2 කට එක කටක් ඇති වෙනවාය, මේ ශීඝ්‍රයෙන් වැඩිවන ජනගහනය අනුව ආහාර සපයන්න, වස්ත්‍ර සපයන්න, ගෙවල් සපයන්න, අධ්‍යාපන පහසුකම්, ගුරුවරුන් හා පාසල් ගොඩනැගිලි සපයන්න නොයි තරම් අමාරුද, මේ ප්‍රශ්න විසඳීම විශ්ව කර්මයාට හැර වෙන කිසිවෙකුට කරන්නට බැරිය, මේක ආණ්ඩුවකට කරන්නට බැරි වැඩක්ය ආදි වශයෙන් ගරු අගමැතිතුමාත්, ගරු ඇමතිවරුත් හැම අවස්ථාවකදීම වගේ කිව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කවුද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේලා තමයි. එහෙම කිව්වා පමණක් නොවෙයි, මේ රටේ ජනගහනය වැඩිවීම අඩු කරන්නට රජයේ උත්පත්ති පාලන වැඩ පිළිවෙලට ආධාර දෙන්න කියාත් කිව්වා.

ගරු කථානායකතුමනි, දැන් මොකද වෙලා තිබෙන්නෙ? අළුත් යුගයක් ඇවිල්ල.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)
තමුන්නාන්සේ මාතර පරදිනව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේ ඇවිල්ල තරඟ කරල බලන්න, කොහොමද කියා. දැන් අගමැතිතුමා කියනවා ප්‍රශ්නයක් නැහැ කියා. පසුගියදා අනුරාධපුරයේ සිත්තම් පලම් ශාලාවේ තරුණ රැස්වීමක් අමතා එතුමා කථා කර තිබෙනවා. ඒ රැස්වීමේ මූලාසනය දරා තිබෙන්නේ ගරු අධ්‍යාපන ඇමතිතුමායි. එහිදී අගමැතිතුමා කිව්වෙ මොකක්ද? "දවස" පත්‍රයේ ඒය වාර්තා වී තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒක තමුන්නාන්සේගේ පත්තරේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
දවසද? වාර්තා වී තිබෙන්නෙ මෙහෙමයි:

"මහවැලි ගඟ යෝජනා ක්‍රමය ඇරඹුණු පසුව රක්ෂාවල් කිරීමට මිනිස් හිඟයක් ඇති වනු ඇතැයිද, එනිසා නව නවත් දරු උපත් වැඩි කිරීම සඳහා බෝවීම වැඩි කරන ලෙස රජය තරුණයන්ගෙන් ඉල්ලා සිටින්නේ යයිද . . ."

ගරු කථානායක තුමනි, එදා උත්පත්ති පාලනය කරන්නට යයි කිව්ව අගමැතිතුමා දැන් උත්පත්ති වැඩි කරන්ට යයි කියනවා.

පසුගියදා තවලම පැවති රැස්වීමකදී කථා කළ කෘෂිකර්ම ඇමතිතුමා කර තිබෙන ප්‍රකාශයක් "සන්" පත්‍රයේ මේ අන්දමට වාර්තා වී තිබෙනවා:

"MINISTER ASSURES UNEMPLOYMENT PROBLEM WILL BE SOLVED BEFORE POLLS

'The National Government will solve the unemployment problem before it goes to the polls next year' said Mr. M. D. Banda, Minister of Agriculture and Food, at a meeting held in Thawalama in the Hiniduma Electorate."

ලබන මහා මැතිවරණයට පෙර රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන බවයි, ගරු කෘෂිකර්ම ඇමතිතුමා කියන්නේ. එතුමාගේ ප්‍රකාශය ගැන කල්පනා කරන විට මහා මැතිවරණයක් පැවැත්වීමට මේ රජය ලැස්තිද යන්න ගැන මට සැකයක් ඇති වෙනවා. ලබන මහා මැතිවරණයට පෙර රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට මේ රජයට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. එසේ විසඳන්නට බැරි නම් විසඳනවාය කියන්නේ කොහොමද? රැකීරක්ෂා ප්‍රශ්නය ගැන ගරු කෘෂිකර්ම ඇමතිතුමා එක ප්‍රකාශයක් කරන අතර ගරු අගමැතිතුමා නවත් ප්‍රකාශයක් කරනවා. දැන් රැකීරක්ෂා ප්‍රශ්නයක් නැත, දැන් තියෙන්නේ රැකීරක්ෂාවලට තරුණයන් සොයා ගන්නට පුළුවන්ද යන ප්‍රශ්නයය කියා ගරු අගමැතිතුමා කියනවා. මහවැලි ගඟ උතුරට හැරෙව්වම මේ ප්‍රශ්න සියල්ලම විසඳෙන බවයි, ගරු අගමැතිතුමාගේ අදහස. ගංගා හරවා මේ ප්‍රශ්න විසඳන්නට පුළුවන්ද? ලෝකයේ අනික් රටවලුත් මේ ප්‍රශ්න විසඳුවේ ගංගා හරවලාද? ගංගා හරවා මේ ප්‍රශ්න විසඳන්නට බැහැ. මේ ප්‍රශ්න විසඳන්නට නම් මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ ඔළු හරවන්නට ඕනෑ. කොහාටද? උතුරට නොවෙයි, වමට හරවන්නට ඕනෑ. දකුණට හැරී තිබෙන ඔළු වමට හැර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

වීමෙනුයි, මේ ප්‍රශ්න විසඳන්නට පුළුවන්. දකුණු දිහා බලාගෙනම ක්‍රියා කරන, ධන පති ආර්ථික ක්‍රමය කෙරෙහි විශ්වාසය තබන, ඇමෙරිකන් ආණ්ඩුවේ සුවච කීකරු ගෝලයන් හැටියට ක්‍රියා කරන මේ වගේ ආණ්ඩුවකට පුළුවන්කමක් නැහැ, ගංගා හරවා මේ ප්‍රශ්නය විසඳන්නට. මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ ඔළු වමට හැරෙව්වත් ඒවා යාන්ත්‍රික විලාශයකින් ආපසු දකුණට හැරෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ නිසා මේ ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තිය වෙනස් නොකර මේ ප්‍රශ්න කවදාවත් විසඳන්නට බැරි බව අපට කියන්නට සිදු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ කාර්මික හා කෘෂිකාර්මික දියුණුව එකට ඇති කර ගන්නට පුළුවන් බව අප පිළි ගන්නවා. කෘෂිකාර්මික කටයුතු සඳහා සැහෙන වාරිමාර්ග ක්‍රම ඇති කිරීමෙන් ඒ වාරිමාර්ග ක්‍රම පාවිච්චි කර මේ රටේ කාර්මික සංවර්ධනයක් ඇති කරන්නට පුළුවන්කම තිබෙනවා. මේ රටේ එවැනි සංවර්ධන යෝජනා ක්‍රම කීයක් හරිගස්සා තියෙනවද? මේ රටේ ස්වාභාවික ධන සම්පත් වලින් සැහෙන ප්‍රයෝජනයක් අප ලබාගෙන තිබෙනවද? අපේ රටේ තිබෙන ඉතාම උසස් සම්පත වන ජල සම්පතින්—මේ රට මැදින් පටන්ගෙන අහිංසක ලෙස, අසරණ ලෙස මුහුදට ගලා බසින ඒ ගංගා වන්ගෙන්—නියම ප්‍රයෝජන ගන්නට වැඩ පිළිවෙළක් අප ඇති කර තිබෙනවද? ගොවීන්ට අවශ්‍ය වේලාවට ජලය ලබා දෙන්නට, ගංවතුර වළක්වන්නට, පානීය ජලය ලබා ගන්නට ජලයෙන් ජල විදුලිය ලබාගෙන ගම්බද පෙදෙස් ආලෝක කිරීමට පමණක් නොව ඒ විදුලි බලය පාවිච්චි කර කර්මාන්ත දියුණු කිරීමට කටයුතු කිරීම සඳහා වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවද? අපේ ලංකාවේ තිබෙන සුන්දර දිය ඇලිවලින් කීයක් ජල විදුලි බලය නිපද වීම සඳහා යොදාගෙන තිබෙනවද? මේ කටයුතු කරන්නේ නැතිව, අපේ රටේ ධන සම්පත්වලින්, ස්වාභාවික සම්පත් වලින්, නියම ප්‍රයෝජන ගන්නේ නැතිව අපට කොයි විධියකින්වත් අපේ රට ඉදිරියට ගෙන යන්නට පුළුවන්කමක් නැහැ. අද අපේ ගරු පළාත් පාලන ඇමතිතුමා කථා කරමින් පසුගිය රජයට දෝෂාරෝපණය කළා පසුගිය රජය කලා අධ්‍යාපනයට තැන දීගෙන කටයුතු කළා මිස විද්‍යා අධ්‍යාපනයට තත්ත්වයක් දී විද්‍යා අධ්‍යාපනය දියුණු කරන්නට කටයුතු කළේ නැත කියා. එහෙත් මේ රජය 1965 සිට අවුරුදු හතරහමාරක් තිස්සේ ඒ සම්බන්ධව කළේ කුමක්ද කියා අපට අහන්නට සිදු වී තිබෙනවා. ගරු කථානායකතුමනි, 1967-68 වර්ෂය සඳහා වූ ජාතික උසස් අධ්‍යාපන සභාවේ වාර්තාව මා ළඟ තිබෙනවා. 1967 ඔක්තෝබර් මාසයේත් 1968 ඔක්තෝබර් මාසයේත් විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගත් ශිෂ්‍යයන් පිළිබඳ විස්තර මේ වාර්තාවේ තිබෙනවා. ඒ වාර්තාව අනුව 1967 ඔක්තෝබර් මාසයේදී කලා, නීතිය හා පෙරදිග පාඨමාලා සඳහා ශිෂ්‍යයින් 2,355 දෙනෙක් බඳවාගෙන තිබෙනවා. එහෙත් 1968 ඔක්තෝබර් මාසයේදී 2,752 ක් බඳවාගෙන තිබෙනවා. ඒ අනුව බලන විට කලා අංශයට වැඩියෙන් බඳවාගෙන තිබෙන බව පෙනී යනවා. අනික් පැත්තෙන් විද්‍යා අංශයට බඳවාගත් ප්‍රමාණය අඩු කර තිබෙනවා.

| | 1967 | 1968 |
|---|---|---|
| ජීව විද්‍යාව | ... 206 | ... 149 |
| භෞතික විද්‍යාව | ... 324 | ... 198 |
| වෛද්‍ය විද්‍යාව | ... 230 | ... 227 |
| දන්ත වෛද්‍ය විද්‍යාව | ... 28 | ... 25 |

මේ අන්දමට හැම එකකටම වාගේ 1967 දීට වඩා අඩු ප්‍රමාණයක් තමයි 1968 දී බඳවාගෙන තිබෙන්නේ. පසුගිය ආණ්ඩුවට දොස් කියන මේ ආණ්ඩුවෙන් මා අහනවා, මේ අන්දමට විද්‍යා අංශවලට ශිෂ්‍යයින් බඳවා ගැනීම අඩු කර තිබෙන්නේ ඇයි කියා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)
පාස් වුණේ නැත්නම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
පාස් වුණේ නැත්නම් එයටත් හේතුවක් තිබෙන්නට ඕනෑ. එහෙනම් ඒ හේතුව නැති කරන්නට මේ ආණ්ඩුව කළේ මොනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
1970 දී කරනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේලා 1970 දී තමයි හැම එකක්ම කරන්නට යන්නේ.

ගරු කථානායකතුමනි, විද්‍යා විෂයයන් ඉගෙන ගැනීමට තිබෙන පහසුකම් ප්‍රමාණවත් නැහැ. එහෙත් පහසුකම් වැඩි කිරීමට මේ ආණ්ඩුව පසුගිය අවුරුදු 4 1/2 තිස්සේ කිසිවක් කරලත් නැහැ. ලෙහෙසියෙන් කරන්නට පුළුවන් අනික් ආණ්ඩුවට දෙස් කීම නිසා, එය කරනවා.

ගරු කථානායකතුමනි, අපේ රට මුහුදින් වට වූ රටක්. මේ මුහුදේ විශාල ධන නිධානයක් තිබෙනවා. මාලු පමණක් නොවෙයි තිබෙන්නේ. මුහුදු දියේ තිබෙන ලවණ වර්ග පාවිච්චි කර රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නට පුළුවන්කම තිබෙනවා. එමෙන්ම ඒවා ගැන නියම පරීක්ෂණයක් කරන්නට නම් සමුද්‍ර ජීව විද්‍යාව ගැනත් සාගර විද්‍යාව ගැනත් දැනුම ඇති අය ඇති කරන්නට ඕනෑ. අපේ විශ්ව විද්‍යාලවල තවමත් ඒ විෂයයන් ඉගැන්වීමට කටයුතු සලස්වා නැහැ. මේ ජාතික උසස් අධ්‍යාපන සභාවේ වාර්තාවේ කියා තිබෙනවා විශ්ව විද්‍යාලවල ගෘහ නිර්මාණ ශිල්පය පවා උගන්වන්නට පටන් ගත්තේ 1968 දීයි කියා. සාගර විද්‍යාව හෝ සමුද්‍ර විද්‍යාව ඉගැන්වීමට තවම කිසිම වැඩ පිළිවෙළක් අරගෙන නැහැ. මේ විධියට රටක් දියුණු කරන්නේ කොහොමද ?

ඉපේ රටේ ආර්ථික තත්ත්වය දියුණු කිරීමට අපේ රටේත් රට වටේත් මහ පොළොවේත් තිබෙන ධන නිධාන පාවිච්චියට ගන්නට ඕනෑ. භූගර්භ විද්‍යාව හරියාකාර උගන්වා අපේ රටේ පොළොව ඇතුළේ තිබෙන සම්පත්වලින් නියම ප්‍රයෝජන ගන්නට වැඩ පිළිවෙළක් ඇති කරන තුරු අපට ඉදිරියට යන්නට පුළුවන්කමක් නැහැ. විශ්ව විද්‍යාලවලට වැඩි වැඩියෙන් ශිෂ්‍යයන් ඇතුළු කර ගන්නවා. එහි මහ ඝෝෂාවක් කරතත් ඒ සම්බන්ධයෙන් ජාතික උසස් අධ්‍යාපන සභාවේ වාර්තාවේ සඳහන් වන්නේ කුමක්ද ?

> "දියුණු වූත්, දියුණු වී ගෙන යන්නා වූත් සමහර රටවල් සමඟ සසඳා බලන කොට මෙරට විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව අඩු බව කිව යුතුය."

දියුණු වූ, දියුණු වී ගෙන යන රටවල් සමඟ සසඳන විට අපේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව අඩු බව ජාතික උසස් අධ්‍යාපන සභාවේ වාර්තාවෙන් පැහැදිලි කර තිබෙනවා. ඒ වාගේම අපේ රටේ ආර්ථික දියුණුවට වුවමනා කරන පාඨමාලා ඔස්සේ ප්‍රමාණවත් ශිෂ්‍ය පිරිසක් පුහුණු නොකරන බවත් එහි සඳහන් කර තිබෙනවා.

> "ආර්ථික දියුණුවට අදාළ වන වැදගත් පාඨමාලා හදාරන ශිෂ්‍යයන් ගණනත් ඉතා අල්පය. විශ්ව විද්‍යාලවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 1.2 වූ ශිෂ්‍යයන් 180 දෙනකු විසින් පමණක් කෘෂිකර්මය පිළිබඳ පාඨමාලා හදාරනු ලැබේ."

කෘෂිකාර්මික දියුණුවක් ඇති කිරීමට ක්‍රියා කරන මේ රටේ ශිෂ්‍යයන් 180 දෙනයි, කෘෂිකර්මීය පිළිබඳ පාඨමාලා හදුරන්නේ. වෙනත් විධියකට කියතොත් විශ්ව විද්‍යාලවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 1.2 යි, කෘෂිකර්මය පිළිබඳ පාඨමාලා හදාරන්නේ. අපේ රටේ අර්ථ සම්පත්තිය දියුණු කර ගැනීමට පුළුවන් වන අන්දමට ඒ පාඨමාලා හදාරන පිරිස් සපයා ගත හැකි වන සේ අපේ අධ්‍යාපනය සකස් කිරීම ඉතා මත්ම අවශ්‍යව තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ ඉකුත් අවුරුදු හතර හමාරක පාලන කාලය තුළ අල්ලස් දූෂණ පැවතුණු බව රහසක් නොවෙයි. මැති ඇමතිවරුන්ගේ වත්කම් හෙළිදරව් කරන බව ඉකුත් මහ මැතිවරණයේදී ආණ්ඩු පක්ෂයේ උදවිය කීවා. ඒ වාගේම ඒ පිළිබඳව මෙම ගරු සභාවේදීත් කියා තිබෙනවා. එහෙත් ආණ්ඩුවේ ආයුෂ අවසන් වන තුරුම ඒ කී දේ ඉෂ්ට කරන්නට පුළුවන්කමක් ඇති වී නැහැ. මැති ඇමතිවරුන්ගේ වත්කම් අවුරුදු පතා හෙළි කළ යුතු බව දකුණු ඉන්දියාවේ මදුරාසි ආණ්ඩුව පසුගිය දවස්වල තීරණය කළා. හැම මැති ඇමති කෙනකුම අවුරුදු පතා තම වත්කම් පිළිබඳ නිවැරදි විස්තරයක් ප්‍රධාන ඇමතිවරයාට ඉදිරිපත් කළ යුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

යයි ඒ ආණ්ඩුව තීරණය කර ඇතත් මේ ආණ්ඩුවට ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්නට ශක්තියක් නැහැ. පසුගිය කාලය තුළ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් කොතරම් තර වී තිබෙනවාදැයි දැන ගත හැකි වන අන්දමට ඔවුන්ගේ වත්කම් හෙළි කළ යුතුව තිබෙනවා. එක් ඇමතිවරයකු අල්ලස් චෝදනාවකට අසු වී ඇති බව පසුගියදා ගරු අගමැතිතුමා මෙම ගරු සභාවේදී ප්‍රකාශ කළා. ඒ පිළිබඳ කාරණය අල්ලස් කොමසාරිස්වරයාට ඉදිරිපත් කර තිබෙනවාලු. මේ චෝදනාව අවුත් තිබෙන්නේ කාට විරුද්ධවදැයි අප දැන ගන්නට කැමතියි. මේ කාරණය රටට එළි නොකරන්නේ ඇයි ? රටේත් මේ ගරු සභාවේත් දැන ගැනීම සඳහා මේ චෝදනාව ඉදිරිපත් වී තිබෙන්නේ කා සම්බන්ධයෙන්දැයි ප්‍රකාශ කිරීම යුතුකමක්. අගමැතිතුමා මෙය අල්ලස් කොමසාරිස්තුමාට යවා තිබෙනවා. මේ ගැන අද ධනපති ප්‍රවෘත්ති පත්‍රවල පවා කතුවැකි ලියන්න පටන්ගෙන තිබෙනවා. 1969 අගෝස්තු 15 වන සිකුරාදා "ලංකාදීප" කතු වැකියෙන් මේ අන්දමට කියා තිබෙනවා. මා එම කතු වැකියෙන් කොටසක් කියවන්න කැමතියි :

> "මේ රජය බලයට පත් වීමට පෙර ජනතාව ඉදිරියේ දුන් ප්‍රතිඥාවකි, බලය ලැබුණහොත් මැති ඇමතිවරුන් සියල්ලගේම වත්කම් හෙළි කරන වග. බලයට පැමිණ වර්ෂ හතරහමාරක් ගෙවී ඇතත් මේ ප්‍රතිඥාව ඉටු කිරීමට මැති ඇමතිවරුන්ට තවමත් නොහැකිව ඇත්තේ එයට වඩා වැදගත් වෙනත් කටයුතු සම්බන්ධයෙන් ස්වකීය කාලය මිඩංගු කිරීමට සිදු වීම නිසා විය යුතුය."

තව දුරටත් මේ අන්දමට කියා තිබෙනවා :

> "අපේ මැති ඇමතිවරුන්, රජයේ ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ සියලු සේවක පිරිසක් පළිඟු මෙන් පවිත්‍ර ඉතා ආදර්ශවත් පිරිසක් විය හැකි. එහෙත් ඔවුන්ගේ ආදායම් මාර්ගත්, ගත කරන කුමාර ජීවිතත් සසඳා බලන විට ඔවුන්ගේ වත්කම් හෙළිකිරීමට අවශ්‍ය, නීතිරීති පැනැවීම අනික් සියලුම ජාතික ප්‍රශ්නවලට වඩා මුල් තැන ලැබිය යුතු වැදගත් කරුණකි."

මැති ඇමතිවරුන්ගේ වත්කම් හෙළි කිරීමට අවශ්‍ය නීතිරීති පැනවීම අනිකුත් සියලුම ජාතික ප්‍රශ්නවලට වඩා මුල් තැනක් දිය යුතු වැදගත් කරුණක් වශයෙන් පෙන්වා දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම එය සත්‍යයක්. අප රට ජනතාවට සේවය කරන්නටය කියා අවුත් අල්ලස් මාර්ගයෙන්, කොන්ත්‍රාත් මාර්ගයෙන් පිඹුරන් වාගේ තර වුණු මැති ඇමතිවරුන් ඉන්නවා නම් ඒ අය ගැන සොයා බැලීම ඉතාමත්ම වැදගත්.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. ஷெல்றன் ஜயசிங்ஹ—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

On a point of Order, Sir. If the hon. Member is making a specific charge against another Member there is a way of doing it—by way of a substantive motion.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

He said "if there are any such persons". He did not say that there are.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ මන්ත්‍රීතුමාට සිංහල තේරෙන්නෙ නැති නම් මට කරන්න දෙයක් නැහැ.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)

ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් මතු කරන්න කැමතියි. මාතර ගරු මන්ත්‍රීවරයා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වී ගරු මැති ඇමතිවරුන්ට චෝදනා නගනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I think what the Hon. Prime Minister said has been misquoted. He did not say that anybody has been accused of bribery ; what he said was that he was prepared to allow any allegation even against a Minister to be gone into. He did not say that there

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

were specific charges against any particular Minister or that any Minister was involved in bribery.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඇත්ත වශයෙන්ම මා එහෙම දෙයක් කිවේ නැහැ.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)
කීවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු කථානායකතුමනි, මා කියවාගෙන ආ කතු වැකියේ ඉතිරි කොටසද කියවා මගේ කථාව හමාර කරන්න මා අදහස් කරනවා.

තවදුරටත් මේ අන්දමට කියා තිබෙනවා :

" ..................ව්‍යාපාරවල කොටස්කරුවන් වීම, ජාවාරම්කාර සමාගම්වල අධ්‍යක්ෂවරුන් වීම, තුට්ටු වට දෙකට ඉඩකඩම් ගෙන ඒවා ලක්ෂ ගණන් ලාභ තබාගෙන විකිණීම වැනි නොසරුප් ක්‍රියා මහජනයා මැති ඇමතිවරුන්ගෙන් බලාපොරොත්තු නොවෙති. "

ගරු කථානායකතුමනි, " ලංකාදීප " කතු වැකියෙන් මේ අන්දමට ආණ්ඩුවට අවවාද යක් දෙනවා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
තට්ටු ගෙවල් ගහගත්තු හැටි, ගිරිදර මෝල කරගෙන ගිය හැටි, ඕනෑ නම් අපිත් කියන්නම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේලා හැමදාමත් කියන්නෙ ඕක තමයි. මෙම ආණ්ඩුවේ යුතුකමක් තිබෙනවා, ආණ්ඩුව ජනතාවට දුන් පොරොන්දුවක්, මෙම පාර්ලිමේන්තුවේදී දුන් පොරොන්දුවක්, ඉටු කරන්න. නමුත් උත්සාහ කරන්නෙ නැත්තේ ඇයි ? මැති ඇමතිවරුන්ගේ වත්කම් හෙළි කරන්න පියවර ගන්න බැරි ඇයි ? අප ලෑහැස්තියි අපේ වත්කම් ඕනෑම වේලාවක හෙළි කරන්න.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
අල්ලස් දූෂණවලට වැරදිකාරයන් වුණු අයගේ ප්‍රජා අයිතිවාසිකම් අහෝසි කරන්න තමුන්නාන්සේ ඡන්දය දුන්නේ නැහැ. [බාධාකිරීමක්].

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු කථානායකතුමනි, ගොවියාට විශාල සේවයක් කළාය, ගොවියාට තැනක් මේ රජයෙන් දුන්නාය කියනවා. නමුත් තමුන්නාන්සේලාගේ ධනපති ප්‍රවෘත්ති පත්‍රවලම පළ කර තිබෙන්නේ මොනවාද ? [බාධාකිරීමක්].

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
කරුණා කර මෙය මන්ත්‍රණ සභාවක් බව මතක තබාගන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගොවීන්ගේ තත්ත්වය පිළිබඳව විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන්ගෙන් සමන්විත කෘෂිකාර්මික ආර්ථික කොමිසමක් මගින් පර්යේෂණ පවත්වා තිබෙනවා. ඒ පර්යේෂණවල ප්‍රතිඵලය මොකක්ද ? ගොවි ජනපද 9 ක ගොවීන්ගේ තත්ත්වය පරීක්ෂා කර බැලීමේදී ඔවුන්ගෙන් 2/3 ක් දරිද්‍රතාවයේ රේඛාවෙන්, දිළිඳුකමේ මායිමෙන්, පහළ තත්ත්වයක සිටින බව හෙළිවී තිබෙනවා. ඒ බව අද " ඩේලි නිව්ස් " පත්‍රයේත්, තවත් පත්‍රවලත් පළ වී තිබෙනවා. ගොවීන්ට සේවය කරන බවක් පෙන්වන්නට මේ රජය කොයි තරම් උත්සාහ කළත් ගොවීන් ඒවාට රැවටෙන්නේ නැහැ. පසුගිය කාලය තුළ පැවැත්වුණු ගම්සභා මැතිවරණවලදී මේ රජයේ නියෝජිත අපේක්ෂක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

යන් පරාජයට පත් කරමින් ඡන්දය දුන් වැඩි දෙනා කවුද? ඔවුන්ගෙන් වැඩි පිරිස කම්කරුවන් නොව ගොවීන්. ගොවීන්ගේ ගැළවුම්කාරයන් වශයෙන් පෙනී සිටින්නට උත්සාහ කරන, ගොවි රජුන් තෝරා ඔටුණු පැළැන්දවූ මේ රජයේ නියෝජිතයන් පරාජයට පත් කරමින් ගොවීන් මේ රජය කෙරෙහි තමන් තුළ ඇති අප්‍රසාදය පැහැදිලිවම දක්වා තිබෙනවා. මේ රජයේ ධනවාදී ප්‍රතිපත්තියට ඔවුන් දක්වන විරෝධය එයින්ම ඔප්පු වෙනවා. එසේ ගම්සභා මැතිවරණවලින් පරාජය වූවාට පසු සමහර සභිකයන් උස්සාගෙන ගොස්, නොයෙක් මාර්ගවලින් ලියකියවිලි අත්සන් කරවාගෙන ඔවුන් එක්සත් ජාතික පක්ෂයට බඳවා ගනන්ට මහන්සි ගත් බවත් අප දන්නවා. මේ රජය ගොවි ජනතාවට සේවය කර තිබෙන ආකාරය ගම්සභා මැතිවරණවලින් පරාජය වීමෙන්ම පෙනෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
තමුන්නාන්සේ කලින් කියවූ පත්තරය කරුණා කර සභාගත කරනවාද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඔව්, කථානායකතුමනි, මා එය ඉදිරිපත් කරනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)
කියෙව්වෙ බොරුද දන්නේ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
මන්ත්‍රීතුමා කරුණා කර වාඩි වෙන්න. තමුන්නාන්සේ හැම තිස්සේම කට දානවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේ රජය මහජනතාවගේ හාල් සේරුවක් කපා දමා, අත්‍යවශ්‍ය අනිකුත් ආහාර ද්‍රව්‍යයත් පහසු මිළට ලබා දීමට අපොහොසත් වීමෙන් ඔවුන් ජීවන වියදම් බරින් මිරිකෙන තත්ත්වයකට පත් කළා.

පවුල් සංවිධානය සම්බන්ධයෙන් ළමා රෝග පිළිබඳ විශේෂඥයකු වන මහාචාර්ය සී. සී. ද සිල්වා මහතා කළ ප්‍රකාශයකින් එළිදරව් වන්නේ මොකක්ද? මේ රජය යටතේ මන්දපෝෂණයෙන් පෙළෙන අය ගෙන් සියයට 45 ක්ම අවුරුදු 15 ට අඩු ළමයින්ය.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
ඉස්සර තිබුණේ නැද්ද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මා කථා කරන්නේ වර්තමාන තත්ත්වය ගැනයි. මේ රටේ සෞඛ්‍ය තත්ත්වය කොයි තරම් දුරට පිරිහී තිබෙනවාදැයි එයින් පෙනෙනවා.

අල්ලස් ගැන කියන විට සමහර මන්ත්‍රීවරුන්ට බොහොම කේන්ති ගියා. රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ විශාල කොන්ත්‍රාත්තුවක් පිළිබඳ දූෂණයක් සම්බන්ධයෙන් එළිදරව් කරන්නට මට පුළුවන්කම ලැබී තිබෙනවා. ලක්ෂ 32ක් පමණ වටිනා මෙම ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට විදුලි දෙපාර්තමේන්තුව මගින් ටෙන්ඩර් කැඳවූවාට පසු ඒ සඳහා ජපන් රටිනුත් ප්‍රංශ රටිනුත් සමාගම් දෙකක් මගින් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කර තිබුණා. එම ටෙන්ඩර් පත්‍ර පිළිබඳව කටයුතු කිරීම මාස ගණනාක් ප්‍රමාද කොට දැන් ඒවායින් එක ටෙන්ඩරයක් පිළිගැනීමට තීරණය කර තිබෙනවායැයි දැනගන්නට ලැබී තිබෙනවා. එනම් ජපානයේ ටෙන්ඩර් පත්‍රයයි. මෙම ටෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩර් පත්‍ර කැඳවීම කළේ තෙවන වරටයි. එංගලන්තයේ රන් පවුම අවප්‍රමාණ කිරීම නිසා පළමුවන වතාවේ ටෙන්ඩර් කැඳවීම අවලංගු කළා. ඊළඟට තවත් වතාවක් ටෙන්ඩර් කැඳවීම අවලංගු කළා. ඊළඟටයි මෙම කැඳවීම කළේ. මෙම අවස්ථාවේදී මේ කියන අන්දමට ටෙන්ඩර් ඉදිරිපත් කර තිබෙනවා. දැන් ජපානයේ ටෙන්ඩරය භාර ගෙන ප්‍රංශ සමාගමේ ටෙන්ඩරය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර තිබෙනවා. එම සමාගමේ ටෙන්ඩර් පත්‍රය අවලංගු කර තිබෙන්නේ Micro Wave Section නමැති කොටසෙහි පවත්නා යම්කිසි දුර්වලතාවයක් නිසා බව කියනවා.

ලංකාවේ ඉංජිනේරු මහතකු මේ ගැන පරීක්ෂා කර බලා එය නුසුදුසුයයි ප්‍රකාශ කරන ලද හෙයින් ප්‍රතික්ෂෙප කර තිබෙනවා. එහෙත් එම කොටස වෙනුවෙන් ලක්ෂ 4කට වැඩියෙන් වැය වන්නේ නැහැ. ලක්ෂ 27ක් පමණම වැය වන්නේ අවශ්‍ය කරන අනිකුත් උපකරණ සඳහායි. එහෙත් දැන් පිළිගෙන තිබෙන අනික් ටෙන්ඩර් පත්‍රය ගෙන බැලූ විට එහි සඳහන් වන අනිකුත් උපකරණ ඇත්ත වශයෙන්ම සුදුසු නැතැයි තවත් පරීක්ෂණ වාර්තාවකින් එළිදරව් වී තිබෙනවා. ප්‍රංශයේ ටෙන්ඩරය පිළිගන්නවා නම් ලංකාවට මීට වැඩියෙන් වාසි තත්ත්වයක් උදා වන බව දැනගන්නට ලැබී තිබෙනවා. ප්‍රංශයේ ප්‍රෑංකුව අවප්‍රමාණ කිරීම නිසාත් මෙම උපකරණ සම්බන්ධයෙන් අවුරුදු පහක සහ තිකයක් දී තිබෙන නිසාත් රටවල් ගණනාවකින් අමතර කොටස් ගැනීමට මෙම සමාගමට පුළුවන්වී තිබුණු නිසාත් එම මුදල් ගෙවීමේ දී යම් යම් පහසුකම් ඇති කරන්නට ප්‍රංශ සමාගම පොරොන්දු වී තිබෙන නිසාත් ප්‍රංශ සමාගමේ ටෙන්ඩරය භාරගත්තා නම් වඩාත් සාධාරණ බව කියන්නට පුළුවනි. එක කොටසක් නරක් වුණු පලියට අනික් කොටස් ලබා ගැනීම අතහරින්නේ නැතුව සමාගම් දෙකෙන්ම කොටසක් බැගින් ලබා ගන්නට පුළුවන් වන පිළිවෙලට කටයුතු කර අපේ රටට වාසි සැළසෙන ආකාරයෙන් ක්‍රියා කරන්නට ඉඩකඩ තිබුණු නමුත් අන්තිම මොහොතේ ජපානයේ සමාගමට එම කට යුත්ත භාර දෙන්නට තීරණය කර තිබීම වරදක් බවයි පෙනෙන්නෙ.

මේ කියන ටෙන්ඩරය භාර ගැනීම නිසා ඇත්ත වශයෙන්ම අප රටට රුපියල් ලක්ෂ 5ක් පමණ අලාබ වන්නට ඉඩ තිබෙනවා. එම ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකයකු හැටියට සිටි නිලධාරියකුගේ සහෝදරයෙක් මේ කියන ජපන් සමාගමේ ලංකා වෙළඳ නියෝජිතයා ලෙස ක්‍රියා කරන බව දැනගන්නට ලැබී තිබෙනවා. එසේ හෙයින් මෙම වැඩ කටයුතු ගැන රටේ නොයෙකුත් අන්දමේ කතා පැතිරෙන්නට පටන්ගෙන තිබෙනවා. ලක්ෂ ගණනක මුදල් ඒ උදවියට කොමිස් වශයෙන් ලැබෙනවාලුයි ලොකු රාවයක් රටේ පැතිර ගොස් තිබෙනවා. එම මුදල් විදේශ බැංකුවල තැන්පත් කරන්නට අවස්ථාව සැළසෙන නිසා කිසිම බියක් නැතුව මෙවැනි වැඩ කරන්නට අද සමහරුන්ට අවස්ථාව සැළසී තිබෙනවා. ඒ නිසා ඇමතිවරුන්ගේ සහ අනිකුත් උදවියගේ ගෞරවය රැකෙන අන්දමට මේ සම්බන්ධයෙන් මීට වඩා විධිමත් පරීක්ෂණයක් කොට ලංකාවට ලැබෙන්නට තිබෙන ලාබය නියම අන්දමින් ලබා ගතහැකි වන පිළිවෙළටත් ලංකාවේ මුදල් අපතේ නොයන පිළිවෙළටත් යම් යම් අයට කොමිස් මුදල් ලබා ගෙන තර වන්නට ඉඩ අවස්ථාව නොලැබෙන පිළිවෙළටත් ක්‍රියා කරන්නට තිබෙන යුතුකම ගැන මෙම රජයට මේ අවස්ථාවේදී මතක් කරන්නට සිදු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, මගේ කථාවට වෙන් කරන ලද කාලය දැන් ඉකුත් වන්නට ආසන්නව තිබෙන නිසා, මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. තමුන්නාන්සේගේ නියමය අනුව තවත් විනාඩියකින්, දෙකකින් මගේ කථාව අවසන් කරන්නම්.

ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අයවැය ලේඛනය හතරවැනි වතාවටත් රුපියලේ අගය අඩු කළ අයවැය ලේඛනයක් හැටියට හඳුන්වන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

1967 සැප්තැම්බර් මාසයේදී පළමුවැනි වරට රුපියලේ අගය පහලට දැම්මා. ඊ ළඟට 1968 මාර්තු මාසයේදී දෙවැනි වරටත් රුපියලේ අගය පහලට දැම්මා. ඊට පසු විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය ඇති කිරීමෙන් රුපියලේ අගය අඩු කළා. රජයේ දෙපාර්තමේන්තු සහ සංයුක්ත මණ්ඩල සමහරක් විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමය තුළට රිංගා සිටින නිසා දැන් හතරවැනි වතාවටත් රුපියලේ අගය අඩු වී තිබෙනවා. එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන නිසා මේ අයවැය ලේඛනයෙන් මේ රටේ දුප්පතාට නම් කිසිම සහනයක් ඇති වන්නේ නැහැ. මේ අයවැය ලේඛනය දේශීය සහ විදේශීය ධනපතියන්ට සහනයක් සැලසෙන ආකාරයට සකස් කරන ලද අයවැය ලේඛනයක් හැටියටයි හඳුන්වා දිය යුතුව තිබෙන්නේ. සුළු කර්මාන්තකාරයන්ට හිස ඔසවන්නට බැරි තත්ත්වයක් මේ අයවැය ලේඛනයෙන් ඇති වෙලා තියෙනවා. දැන් සුළු කර්මාන්ත දහයක්, පහළොවක් වැහිලා තිබෙනවා. ඉදිරි කාලයේදී තවත් සුළු කර්මාන්ත වැසී යනවා ඇති. මෙය ජාතික හැඟීමක් ඇතිව සකස් කරන ලද්දක් ලෙස අපට පිළිගන්නට බැහැ. සුළු කාර්මිකයන් දුර්වල වන අන්දමට මෙය සකස් කර තිබෙනවා. ධනපති පන්තියට වාසි වන අන්දමටයි මෙය සකස් කර තිබෙන්නේ. මෙය ඒ ආකාරයට සකස් කර තිබෙන අතර මහජනයා සූරා කන්නටත් බලවත් උදවියට ඉඩ ලැබෙනවා. රජයෙන් මුදල් ණයට ගෙන සුළු සුළු කර්මාන්ත ඇති කළත් ඒවායින් ඒ උදවියට වාසියක් නොලැබෙන අන්දමටයි වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ. කළුකඩකාරයන් තව තවත් දිරිගැන්වීමේ ක්‍රියා මාර්ගයන් තමයි මෙයින් ඇති වන්නේ. පොදු මහජනයා කළුකඩකාර පිරිසගෙන් බේරා ගැනීමේ වැඩ පිළිවෙළක් ඇති කිරීම ආණ්ඩුවේ යුතුකමක් බව කියන්නට කැමතියි. [බාධා කිරීම්] සුළු කර්මාන්තකාරයන්ට තමන්ගේ ඒ ව්‍යාපාරවලින් ලැබිය යුතු ආදායම නොලැබෙන පරිදි ලොකු ජාවාරම්කාරයන්ට ගිල ගන්නට ඉඩ නොදී සුළු කර්මාන්තකාරයන් ආරක්ෂා කිරීමට වැඩ පිළිවෙළක් ඇති කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ අයවැය ලේඛනය ලෝක බැංකුවේ නියමයන් සියේට සියයක්ම අනුගමනය කරමින් සකස් කරන ලද්දක් නිසා ඊට විරුද්ධත්වය පළ කළ යුතුව තිබෙනවා. ලෝක බැංකුවේ නියමයන් ඒ ආකාරයටම පිළිපදිමින් සකස් කරන ලද මේ අයවැය ලේඛනයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් ජාත්‍යන්තර කම්කරු සහෝදරත්වය අනුගමනය කරන පක්ෂයක නියෝජිතයකු වශයෙන්—[බාධා කිරීමක්] අප කථා කරන විට මේ ආණ්ඩුවේ සිටින, ධනපති පන්තියේ ධනපති ආර්ථික ක්‍රමයක් අනුගමනය කරන උදවියට කැක්කුමක් ඇති වීම ගැන මා පුදුම වන්නේ නැහැ. එසේ තමන්ගේ පන්තියට විරුද්ධව කරන කථාවකට මේ මන්ත්‍රීන් විරුද්ධව නැඟී සිටීම ගැන මා පුදුම වන්නේ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

If there are any more interruptions, I shall have to ask the hon. Members who interrupt to leave.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් මේ ආකාරයට මගේ කථාවට බාධා කිරීම ගැන මට කරන්නට කිසිම දෙයක් නැහැ. අප ක්‍රියා කරන්නේ සාධාරණ විධියටයි. අප හිතන ආකාරයටයි අප කථා කරන්නේ. ලෝකයේ ජාත්‍යන්තර කම්කරු පන්තියේ සහෝදරත්වයක්ය කියන්නේ කුමක්දැයි නොදන්නා පිරිස කෑගසනවා. අප කථා කරන්නේ අප පිළිගන්නා දේවල් අනුවයි. අප යම්කිසි විධියකට හිතනවාද, ඒ විධියටයි අප කථා කරන්නේ. අනුන්ගේ මොළයකින් නොවෙයි අප කල්පනා කරන්නේ. අප කල්පනා කරන්නේත් ක්‍රියා කරන්නේත් අපේ මොළය පාවිච්චි කරමිනුයි. අපට කථා කරන්නට ඉඩ නොලැබෙන හැටියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තර්ජනය කරනවා නම් එය වැරදියි. [බාධා කිරීම්] විරුද්ධ පාර්ශ්වයේ අපට අපේ මතය ප්‍රකාශ කරන්නට ඉඩ තිබෙන්නට ඕනෑ. ආණ්ඩු පක්ෂයේ නමුන්නාන්සේලාට වාගේ නොවෙයි, අපට දර්ශනයක් තිබෙනවා. අපට තිබෙන්නේ සමාජවාදී දර්ශනයක්. ඒ නිසා ඒ සමාජවාදී දර්ශනය උඩයි අප කථා කරන්නේ. රටක් දියුණු කරන්නට පුළුවන් වන්නේ සමාජවාදී දර්ශනයක් අනුවයි.

මහාචාර්ය ජී. පී. මලලසේකර මහත්මයා —ලංකාව වෙනුවෙන් සෝවියට් දේශයේ පෙනී සිටි ප්‍රථම තානාපතිවරයා—කියා තිබෙන දෙයක් මේ අවස්ථාවේ මතක් කරන්නට කැමතියි. සෝවියට් දේශයේ රක්ෂාවක් නැති මිනිසකු සොයා ගන්නට නැතැයි මලලසේකර මහත්මයා කියා තිබෙනවා. මා කියන දෙයක් නොවෙයි, මෙය. කෝටි විසිපහක් තරම් විශාල ජනකායක් ජීවත් වන සෝවියට් දේශයට ඒ රටේ ජනතාවට රක්ෂාවල් දෙන්නට පුළුවන් වෙලා තියෙනවා. එයින් පෙනී යන්නේ සමාජවාදී වැඩ පිළිවෙළක් අනුව කටයුතු කිරීමෙන් ඒ තරම් දේවල් කරන්නට පුළුවන් බවයි. ධනපති පන්තිය විනාශ කර දමාලයි ඒ අයට ඒ තත්ත්වයට එන්නට පුළුවන් වුණේ. ඒ බව ප්‍රකාශ කරමින්, මේ අයවැය ලේඛනයෙන් මේ රටේ ප්‍රශ්න විසඳන්නට බැරි බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 2.53

**රාජදුරෙයි මයා.**

*(திரு. இராஜதுரை)*

(Mr. Rajadurai)

கௌரவ சபாநாயகரவர்களே, இந்த ஐந்தாவது வரவுசெலவுத்திட்ட விவாதத்திலே ஒரு சில வார்த்தைகள் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் அளித்தமைக்காக நான் நன்றி கூறக் கடமைப்பட்டவனாக இருக்கிறேன். ஆச்சரியமான சம்பவங்கள் பல உலகத்திலே நடந்து கொண்டிருக்கின்ற நேரத்திலே, இலங்கையிலே அப்படியொரு ஆச்சரியமான சம்பவமும் நடக்கவில்லையென்றால் எமக்கு எப்படி மதிப்புக் கிடைக்கும்? சந்திரனுக்கு மனிதனை அனுப்பி மாபெரும் சாதனையொன்றை ஏற்படுத்திக் கொண்டிருக்கின்ற இந் நேரத்திலே, இந்த ஐந்தாவது வரவுசெலவுத் திட்டத்தைச் சமர்ப்பித்த நிதியமைச்சரவர்களைப் பற்றி இரு பக்கங்களையும், சிறப்பாக ஆளும் கட்சியின் பக்கத்தைச் சேர்ந்த கௌரவ அங்கத்தவர்கள் பேசிக் கொண்டிருக்கிறார்கள்.

ஐந்தாவது வரவுசெலவுத் திட்டம் இந்தப் பாராளுமன்றத்திலே சமர்ப்பிக்கப்பட்டது ஒரு பெரிய சாதனையென்று சொல்லப்படுகிறது. மனித வரலாற்றிலேயே சந்திரனுக்கு மனிதனையனுப்பியது மாபெரும் சாதனையென்று வர்ணிக்கப்படுகின்ற நேரத்திலே, இப் பாராளுமன்றத்திலே ஐந்தாவது வரவுசெலவுத் திட்டத்தைச் சமர்ப்பித்ததற்காக வரவிலக்கணம் வரைந்தும் புகழ்மாலை பொழிந்தும் நாம் குரலெழுப்பிக் கொண்டிருக்கிறோம். இப்படிச் செய்யாவிட்டால், இந்த நேரத்திலே, இலங்கை மக்களுக்கு உலகத்தில் எப்படி மதிப்புக் கிடைக்கப் போகிறது? இந்த வரவுசெலவுத் திட்டத்திலே விவசாயத்தைப் பற்றியும் விவசாயிகளைப் பற்றியும் பெரிதாகப் பேசப்பட்டது. வடக்கு, கிழக்கு மாகாணங்களிலே அளப்பரிய உதவிகள் வழங்கப்பட்டிருக்கிறதென்று இங்கே புள்ளி விபரங்கள் மூலம் எடுத்துக்காட்டியிருக்கிறார்கள். வடக்கு மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் விவசாயத்துறையில் உதவி செய்யவில்லையென்றால், நிதி உதவி அளிக்கவில்லையென்றால் இலங்கையைப் பொறுத்த அளவிலே வேறெந்த மாகாணங்களுக்கு அளிக்கப் போகின்றார்கள் என்று அவர்களைப் பார்த்து நான் கேட்க விரும்புகிறேன்.

கடந்த சில ஆண்டுகளுக்கு முன்னர் இந்த நாட்டில் அமைக்கப்பட்ட சில தொழிற்சாலைகள் அரசியல்வாதிகளினுடைய உயிரைக் காப்பாற்ற, பாராளுமன்றப் பிரதிநிதித்துவத்தைக் காப்பாற்ற அமைக்கப்பட்ட காரணத்தினால் தான் எதிர்பார்த்த நன்மைகளை அளிக்கவில்லை. மாறாக, இந்த நாட்டின் செல்வத்தில் கோடிக்கணக்கான ரூபாய்கள் அந்தத் தொழிற்சாலைகளுக்குச் செலவழிக்கப்பட்டு, சிலவற்றுக்கு மூடுவிழா நடாத்தப்பட்டும் சில மூச்சுப் போய்க் கொண்டிருக்கும் நிலையிலுமிருந்ததை நாம் கண்டோம். ஆகவே, நாட்டின் செல்வம், தேசிய வளம் நாடு பூராவும் பகிர்ந்தளிக்கப்பட்டுப் பரவலாக்கப்பட வேண்டும். மூலவளம், கனிவளம் உள்ள பகுதிகளில் தொழிற்சாலைகள் ஆரம்பிக்கப்படவில்லையென்றால் அவை தோல்வியே கண்டிருக்கும். கிழக்கு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ராஜ்துரை மயා.]

மாகாணம் வற்றுத நதிகள் ஓடும் மாகாணம். பல்லாயிரக் கணக்கான குளங்களைத் தமிழ் மன்னர்களும் சிங்கள மன்னர்களும் கட்டியிருக்கிறார்கள் என்பதைச் சரித்திரம் நமக்குக் கூறுகின்றது. அந்தக் குளங்கள் இப்பொழுது தூர்ந்து, அழிந்து, சிதைந்து போயிருக்கின்றன. அவை திருத்தப்பட வேண்டும்.

வடக்கு, கிழக்கு மாகாணங்கள் தமிழ்ப் பிரதேசங்கள் என்று அரசியல் வாதிகள் கருதுவார்கள் என்றால் வடக்கு, கிழக்கு மாகாணங்கள் நாட்டின் ஓர் அங்கமாக இல்லையா என்று கேட்க விரும்புகிறேன். இரண்டாவது மகா யுத்தம் நடைபெற்ற நேரத்திலே இந்த நாட்டின் அரிசித் தேவையை ஈடுசெய்த பெருமை கிழக்கு மாகாணத்துக்குத்தான் உண்டு. கிழக்கு மாகாண விவசாயிகளுக்கு அதிகமான நன்கொடையை இந்த அரசாங்கம் சிறப்பாகச் செய்யவேண்டியிருக்கின்றது என்று சொல்ல வேண்டும். அவ்விதம் செய்தால்தான் நாட்டின் உணவுற்பத்தியைப் பெருக்க முடியும். இவற்றில் பாரபட்சம் காட்டப்பட்டால் நாட்டின் விவசாயத் துறையில் நாம் வெற்றி காண முடியாது. நாட்டின் நெல் விளைச்சலை அதிகரிக்க முடியாது. ஆனால், அவற்றுக்காகக் கொடுக்கப்படுகின்ற நிதி, செய்யப்படுகின்ற உதவி இன்னும் போதாது.

கடந்த நான்கு வருட காலமாக இந்த நாட்டின் அரிசி உற்பத்தி பெருகியிருக்கின்றதென்று சொல்கின்றார்கள். ஆனால், அதற்குரிய காரணத்தை இரு பகுதியினரும் பொறுமையுடன், நிதானத்துடன், அரசியல் கட்சிக் கட்டுக்கோப்புக்கு அப்பால் நின்று கவனிக்க வேண்டும். 1956 ஆம் ஆண்டிலிருந்து 1964 ஆம் ஆண்டு வரை இந்த நாட்டில் பொது மக்களிடையே குரோத மனப்பான்மை, சந்தேக மனப்பான்மை அதிகமாக நிலவி வந்ததை நாம் அறிவோம். 1964 ஆம் ஆண்டுக்குப் பின்னர் சமூக ஒற்றுமை, சௌஜன்ய உறவுக்கான மின்னொளி போன்ற வெளிச்சம் நமக்குத் தெரிந்தது. அந்த நேரத்திலே இலங்கைத் தமிழரசுக் கட்சியின் தலைவரைப் பெரும்பான்மை மக்கள்—சிங்கள மக்கள்—பாராட்டிப் பேசியதைச் சரித்திரத்திலிருந்து பிரிக்கமுடியாது. 1964 ஆம் ஆண்டு இந்தக் கௌரவ சபையிலே பத்திரிகை மசோதா முறியடிக்கப்பட்டபின் எங்கள் கட்சித் தலைவர் திருவாளர் செல்வநாயகம் அவர்கள் பாராளுமன்றத்திலே வந்து இறங்கியதும் "செல்வநாயக்கத்துக்கு ஜயவேவா" என்று குரலெழுப்பிய பெரும்பான்மைச் சகோதரர்களை நாமறிவோம். திருவாளர் செல்வநாயகம் அவர்கள் ஜனநாயகத்தைக் காப்பாற்றினார் என்று அவருக்குப் பாராட்டுத் தெரிவிக்கப் பட்டது.

இந்த நாட்டின் தேசிய அரசாங்கம் அமைக்கப்பட எங்களுடைய கட்சி மூல காரணமாகவும் முக்கிய காரணமாகவும் இருந்திருக்கின்றது. நாம் இந்த நாட்டிலே சௌஜன்யமான உறவை உண்டுபண்ண விரும்பினோம் என்பதை அரசியல் வாதிகள் ஒப்புக் கொள்வார்கள். திருவாளர் செல்வநாயகம் ஜனநாயகத்தைக் காப்பாற்றினார், அவர் மூலம் இந்த நாட்டின் ஜனநாயகம் காப்பாற்றப்பட்டது, தேசிய ஒற்றுமைக்கு அவர் வித்திட்டார் என்று எல்லாம் அவர் பாராட்டப்பட்டார். அதன்பின்தான் இந்த நாட்டின் பொருளாதாரத் துறையில், சிறப்பாக விவசாயத் துறையில் ஒரு முன்னேற்றம் ஏற்பட்டது. ஈரினங்களுக்கிடையே இந்த நாட்டிலே சமூக ஒற்றுமை ஏற்பட்டபின்னர்தான் விவசாயத் துறையிலே புரட்சிகரமான மாற்றம் ஏற்பட்டது. அதன் பின்னர்தான் இந்நாட்டு மக்கள் ஒருவரோடொருவர் நெருங்கிப்பழக முற்பட்டார்கள் என்பதைச் சொல்லிவைக்க விரும்புகிறேன்.

இதற்குக் காரணமாக இருந்தது இரு பெரும் அரசியற் கட்சிகளிடையே ஏற்பட்ட அரசியல் ஒற்றுமையாகும், ஒத்துழைப்பாகும் என்பதை எவரும் மறுத்துரைக்க முடியாது. ஆகவே, இந்த இடைக்காலத்தில் நாட்டின் அரிசித் தேவைக்காக கோடிக்கணக்கான ரூபாக்களை வெளிநாடுகளுக்குச் செல்லவிடாது தடுத்து நிறுத்தும் அளவுக்கு விவசாயம் பெருகியிருக்கின்றதென்றால் அதற்கு நாம்—எங்கள் கட்சி ஒரு மூலகாரணமாக இருந்ததென்பதை எவரும் மறுத்துப் பேச முடியாது. நாம் ஏற்படுத்திய சமூக ஒற்றுமைதான் இந்த நாட்டு மக்களை விவசாயத்துறையில் ஈடுபடவும், பொருளாதாரத் துறையில் ஈடுபடவும், காடுகளை நோக்கிப் போகும் பாதைகளை உண்டுபண்ணவும், உணவுற்பத்தியைப் பெருக்கவும் சந்தர்ப்பத்தை அளித்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தது என்பதை, கௌரவ சபாநாயகர் அவர்களே, உங்களுடைய கவனத்திற்குக் கொண்டு வர விரும்புகிறேன். ஆகவே, சமூக ஒற்றுமை என்பது 1965 ஆம் ஆண்டிற்கும் 1969 ஆம் ஆண்டிற்கும் இடைப்பட்ட காலத்தில்தான் ஏற்பட்டது. இந்தக் காலத்திலேதான் இந்த நாட்டிலே நீர்ப்பாசனத் துறையும் விவசாயத் துறையும் தலைசிறந்து விளங்கின. இந்தக் காலத்திலேதான் உணவு உற்பத்தி பெருகி இருக்கின்றது என்பது எவரும் ஒப்புக் கொள்ளக்கூடிய உண்மையாகும்.

இந்தச் சபையிலே கடந்த சிம்மாசனப் பிரசங்க விவாதத்தின்போதும் இந்த வரவு செலவுத்திட்ட விவாதத்தின்போதும் தமிழரசுக் கட்சியினராகிய எங்களைப் பலரும் பல கோணங்களில் தாக்க முற்பட்டதை நாம் அறிவோம். நாங்கள் இந்த நாட்டிலே என்ன கேட்கிறோம்? என்ன வேண்டுகின்றோம்? எதற்காக நாம் ஒரு அரசியல் இயக்கத்தை நடாத்துகின்றோம் என்பதை எவரும் சரிவரச் சொல்லாமல், இந்த நாட்டின் அரசியல் வாதிகளிற் சிலர் குட்டையைக் குழப்புகிறார்கள். தமிழ் பேசும் மக்களின் உரிமையை வைத்து இந்த நாட்டின் ஆட்சிப் பொறுப்பை எந்தக் காலத்தில் கைப்பற்றலாம் என்று பெரும்பான்மை மக்கள் மத்தியில் சில அரசியல்வாதிகள் நினைத்து வருகின்றார்கள். ஆனால் எங்கள் சகோதரர்கள்—சிங்களப் பொது மக்கள்—மிகவும் சிந்திக்கும் ஆற்றல் வாய்ந்தவர்கள். தங்களைத் தவறான வழியில் வழிநடத்திச் சென்றவர்கள் யார் என்று அவர்கள் ஒரு காலத்தில் சிந்திப்பார்கள். தங்களைத் தவறான வழியில் வழிநடத்திச் சென்றவர்களைச் சிங்கள மக்கள் காணும் நாள் மிக விரைவில் வரத்தான் போகின்றது. இந்த நாட்டுத் தமிழ் பேசும் மக்களுடைய பிரச்சினைகளைச் சொல்லிச் சொல்லி ஒவ்வொரு தேர்தலிலும் வாக்குகளைப் பெற்று ஆட்சிப் பொறுப்பையும் அரசாங்கத்தையும் கைப்பற்றுவதைத் தவிர இவர்களுக்கு வேறு வழி இல்லை என்பதை இந்த நாட்டில் நடு நிலைமையுள்ள சிங்கள மக்கள் ஒரு காலத்தில் உணரத்தான் போகிறார்கள். அந்தக் காலமும் வரத்தான் செய்யும்.

இந்த நாட்டிலே நாம் என்ன கேட்கிறோம்? நாம் இந்த நாட்டிற்கு நேற்று வந்தவர்கள் அல்ல; அல்லது முந்தநாள் வந்தவர்கள் அல்ல. நாம் இந்த நாட்டில் ஆயிரக்கணக்கான ஆண்டுகளாக இருக்கிறோம். பரம்பரை பரம்பரையாக இருக்கிறோம். இன்னும் பல ஆயிரக்கணக்கான ஆண்டுகளுக்குப் பிறகும் இந்த நாட்டில் நாம் வாழத்தான் போகின்றோம். ஆகவேதான் நாம் இந்த நாட்டிலே எங்களுக்குச் சில அடிப்படை உரிமைகள் வேண்டுமென்று கேட்கிறோம். இந்த அடிப்படை உரிமைகளை உலகத்தில் எந்த இனமும் இழந்து வாழவில்லை. கிழக்கே யப்பானிலிருந்து மேற்கே அமெரிக்காவரை எந்த நாட்டிலும் வாழுகின்ற தேசிய இனங்கள் தங்கள் சொந்த மொழியை, இலக்கியத்தை, கலையை, பண்பாட்டை, தமது பாரம்பரியத்தை இழந்து வாழ்கின்றனவா என்று இந்தக் கௌரவ சபையிலே நான் கேட்கவிரும்புகிறேன். ஆகவே இலங்கையில் வாழுகின்ற நாம்—வரலாற்றுக் காலத்திற்கு முன்பிருந்தே இந்த நாட்டில் வாழ்ந்து வருகின்ற நாம்—இந்த நாட்டில் எங்கள் உரிமைகள் எல்லாவற்றையும் இழந்து போகவேண்டுமென்று இந்த நாட்டுப் பெரும்பான்மை மக்கள் நினைக்கிறார்களா என்று கேட்கிறேன். நாங்கள் அப்படித்தான் வாழ முடியுமா என்று கேட்கிறேன்.

இந்த நாட்டிலே சுதந்திரத்தின் பின்னர் சிங்கள மக்கள் மத்தியிலே அவர்களுக்கு அவர்கள் மொழியிலே ஒரு ஆர்வம் ஏற்பட்டிருக்கின்றது. அவர்களுடைய இலக்கியத்தில் அவர்களுக்கொரு காதல் பிறந்திருக்கின்றது. அவர்களுக்கு அவர்களுடைய கலாசாரத்தில் ஒரு மோகம் உதித்திருக்கின்றது. தங்களுடைய மொழி, இலக்கியம், கலாசாரம், சமயம் ஆகியவற்றில் இந்த நாட்டுப் பெரும்பான்மை மக்களுக்கு ஏற்பட்டிருக்கக்கூடிய பாசமும் நேசமும் மற்ற இனத்தவர்களுக்கும் ஏற்படக்கூடிய ஒன்றுதான். அது மாத்திரம் தமிழ் பேசும் மக்களுக்கு மாத்திரம் ஏற்படக்கூடாது என்று நீங்கள் எதிர்பார்க்கிறீர்களாக? அதைத்தான் நீங்கள் எதிர்பார்த்துக் கொண்டிருக்கிறீர்களா என்று நான் பெரும்பான்மை மக்களைப் பார்த்துக் கேட்கவிரும்புகிறேன். அப்படியான ஒன்றை நீங்கள் எதிர்பார்க்கவே முடியாது. ஆகவே, நீங்கள் உங்கள் மொழியைப் பற்றிச் சிந்திப்பதைப் போல நாங்களும் எங்களுடைய மொழியைப் பற்றிச் சிந்திருக்கிறோம். உங்கள் மொழி இந்த நாட்டின் ஆட்சி மொழியாக வந்தால் அதற்கு நாங்கள் தடையா? அதே நேரத்தில் எங்கள்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජදුරෙයි මයා.]

மொழிக்குள்ள உரிமையை நாங்கள் கேட்கக் கூடாதா? இந்த நாட்டில் வாழ வேண்டியவர்கள் நாம். நாம் இந்த நாட்டில் வாழத்தான் போகிறோம் என்பதைத் தெளிவாக இந்தச் சந்தர்ப்பத்தில் எங்களில் அக்கறை உள்ளவர்களுக்கு எடுத்துரைக்கவிரும்புகிறேன்.

அடுத்ததாக, இந்த நாட்டின் உணவு உற்பத்தி இன்று பெருகி இருக்கின்றது. இந்த நாட்டின் அரிசித் தேவைக்காக கோடிக்கணக்கான ரூபாக்களை வெளிநாடுகளுக்கு அனுப்பி இருக்கிறார்கள் சென்ற அரசாங்கத்தினர். நாம் அவற்றைத் தடுத்து நிறுத்தி உள்நாட்டிலேயே உணவைப் பெருக்கி இருக்கிறோம் என்றால் அதற்கு இந்த நாட்டிலே ஏற்பட்ட தேசிய ஒற்றுமைதான் காரணம் என்பதை ஒவ்வொரு அரசியல்வாதியும் உணர்ந்து கொள்ள வேண்டும். இந்தச் சமூக ஒற்றுமை கிடைக்கவில்லையென்றால் உணவு உற்பத்தி பெருகியிருக்க முடியாது என்பதை எவரும் மறுக்க முடியாது. கிழக்கு மாகாண விவசாயிகளுக்கு அதிகமான உதவிகளைச் செய்கிறோம் என்கிறது அரசாங்கம். உணவு உற்பத்திக்காக அங்குள்ள விவசாயிகளுக்கு உதவி செய்யாமல் அரசாங்கம் வேறு எங்குள்ளவர்களுக்கு உதவியைக் கூடுதலாகச் செய்ய முடியும் என்று கேட்கவிரும்புகிறேன். உங்களுக்கு வேண்டிய நெல்லைக் கிழக்கு மாகாணம் இன்று உற்பத்தி செய்கின்றது. கிழக்கு மாகாணம் இன்று அதிக விளைச்சலைக் கண்டிருக்கின்றது. ஒவ்வொரு நாளும் கிழக்கு மாகாணத்தின் நெல்லை ஏற்றிக்கொண்டு புகையிரதங்கள் வேறு இடங்களுக்கு ஓடிக்கொண்டிருக்கின்றன. அரசாங்கம் கிழக்கு மாகாணத்திற்குத் தந்தது போதாது. இதுவரை செய்த உதவிகளும் போதாது என்று வற்புறுத்திக் கூற விரும்புகிறேன். குறிப்பாக இலங்கை முழுவதிலுமுள்ள விவசாயிகளுக்குப் போக்குவரத்து வசதிகள் இல்லை. குடி தண்ணீர் வசதிகள் இல்லை. அவர்களுக்கு நல்ல வைத்திய வசதிகளும் இல்லை. அவர்களுடைய பிள்ளைகள் படிக்க நல்ல பள்ளிக்கூட வசதிகள்தானும் இல்லை. குறிப்பாக மட்டக்களப்பைப் பொறுத்த அளவில் என்னுடைய தொகுதியைப் பற்றிச் சொல்லுகிறேன் என்று எனது பேச்சை இடைமறிக்க வேண்டாம் என்று கௌரவ சபாநாயகர் அவர்களை கேட்டுக் கொள்ளுகிறேன். ஒரு வேளை சபைக் குழுநிலை விவாதத்தின்போது இதனைத் தெரியப்படுத்தலாம் என்று நீங்கள் சொல்லலாம். ஆனால், "வரவு செலவுத் திட்ட மதிப்பீட்டிலே சேர்க்கப்படும்; அடையாள மானியம் தரப்படும்" என்று சொல்லப்பட்ட ஒரு பிரச்சினையை இந்தச் சந்தர்ப்பத்தில் சபையின் கவனத்துக்குக் கொண்டு வருவது பொருத்தமாக இருக்குமென எண்ணுகிறேன்.

மட்டக்களப்பு மாவட்டம் 25 மைல் நீளமான ஒரு நீண்ட வாவியால் பிரிக்கப்பட்டிருக்கிறது. இரு பிரிவுகளையும் எழுவான் கரை என்றும் படுவான் கரை என்றும் சொல்வார்கள். எழுவான் கரையில் வாழுகின்ற மக்கள் அத்தனை பேரும் இந்த வாவியைத் தாண்டிச் சென்று படுவான் கரையில் கமம் செய்கிறார்கள். இப்படியாகக் கமம் செய்பவர்களைத் தொடர்புபடுத்துவதற்குப் பாலங்கள் தேவை. தாம்போதிகள் தேவை. அதை இந்தக் கௌரவ சபையிலே, பல பிரதிநிதிகள் பல வருட காலமாக வற்புறுத்தி வந்திருக்கிறார்கள்.

எனது தொகுதியைப் பொறுத்த அளவில் வலைக்கட்டிறவு, வவுண தீவு என்று சொல்லப்படும் ஆற்றினூடாக ஒரு தாம்போதி—பாலம்—அமைக்கப்பட வேண்டுமென்று கடந்த 12 ஆண்டுகளாக இந்தக் கௌரவ சபையிலே நான் வற்புறுத்தி வந்திருக்கிறேன். 1965 ஆம் ஆண்டு இன்றைய அமைச்சர் திருவாளர் மொண்டேகு ஜயவிக்ரம அவர்கள் அந்தப் பகுதிக்கு விஜயம் செய்தார்கள். அந்தத் துறையிலே அவருக்கு ஒரு வரவேற்பு அளிக்கப்பட்டது.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

This is the Second Reading Debate. The Hon. Member is now dealing with matters which should properly be dealt with during the Committee stage. At this stage he should discuss policy.

**රාජදුරෙයි මයා.**
*(திரு. இராஜதுரை)*
(Mr. Rajadurai)

இது ஒரு முக்கியமான விடயமான காரணத்தினால் இதைப்பற்றி இந்த வரவு செலவுத் திட்டப் பேச்சிலே குறிப்பிட வேண்டியிருக்கிறது. இந்த ஆற்றினூடாகத் தாம்போதி அமைப்ப

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தற்கு கௌரவ மராமத்து அமைச்சர் அன்று வாக்குறுதியளித்திருந்தார். 1968 ஆம் ஆண்டு ஆடி மாதம் 5 ஆம் தேதி அவருடைய அமைச்சிலிருந்து கிடைக்கப்பெற்ற கடிதத்தை நான் இங்கே வாசிக்கிறேன்.

"Dear Sir,

I have to acknowledge receipt of your letter dated 27.6.69, I wish to inform you that this item of work has been included in the Draft Estimates for 1968-69, with Token Provision."

அந்தக் கடிதத்தின்படி இதுவரை எதுவும் வரவு செலவுத் திட்ட மதிப்பீட்டிலே சேர்க்கப்படவில்லை என்று சொல்வதற்காகத்தான் நான் இதனை எனது பேச்சினூடே கொண்டு வந்தேன். இது ஏன் கைவிடப்பட்டது? என்ன காரணத்துக்காக இது கைவிடப்பட்டது என்று விளங்கவில்லை. இதன் மூலம் ஏராளமான பணத்தை மிச்சப்படுத்த அரசாங்கத்துக்கு வாய்ப்பு இருக்கிறது. இந்தத் தாம்போதி அமைக்கப்படுவதன் மூலம் அரசாங்கத்துக்கு வருடமொன்றுக்கு ஐந்து இலட்சம் ரூபாவுக்கு மேல் சேமிக்க இடமிருக்கிறது. இப்படிப்பட்ட முக்கியமான தாம்போதி, பாலம், முதலியவற்றை அமைப்பதை அரசாங்கம் ஏன் புறக்கணிக்க வேண்டும்?

விவசாயிகளுடைய பிரச்சினைகளுக்கு அதி முக்கிய இடமளிக்கிறோம் என்று சொல்லும் அரசாங்கம் கிழக்கு மாகாண விவசாயிகளின் அதி முக்கிய தேவையான போக்குவரத்துக்கு ஏன் தடையாக இருக்க வேண்டும்?

கௌரவ சபாநாயகரவர்களே, மண்முனைத் துறை பற்றியும் சில கருத்துக்கள் தெரிவிக்க விரும்புகிறேன். மண்முனைத்துறை பற்றி கடந்த பதினைந்து ஆண்டுகளுக்கு மேலாக இந்தக் கௌரவ சபையிலே ஒவ்வொரு பிரதிநிதியும் வற்புறுத்தி வந்திருக்கிறார்கள். மட்டக்களப்புப் பிரதிநிதிகளும், பட்டிருப்புப் பிரதிநிதியும் இந்தக் கௌரவ சபையிலே இதைப்பற்றி அடிக்கடி வற்புறுத்தி வந்திருக்கிறார்கள். ஆனால் இது புறக்கணிக்கப்பட்டிருக்கிறது. பனிச்சங்கேணித்துறைக்கு ஒரு பாலம் அமைப்பதற்கு கௌரவ மராமத்து அமைச்சர் நிதியுதவி செய்திருப்பதையிட்டு அவரைப் பாராட்டுகிறேன்.

திரு. பீ. பி. ஜீ. கலுகல்ல அவர்கள் மராமத்து அமைச்சராக இருந்த காலத்தில் அமெரிக்காவிலிருந்து இலங்கையின் தெருக்களையெல்லாம் பரிசீலனை செய்து அறிக்கை சமர்ப்பிக்க ஒரு குழு இங்கு விஜயம் செய்ததை இந்தக் கௌரவ சபை மறந்திருக்க முடியாது. அந்தக் குழுவினர் மூன்று வருட காலமாக இந்நாட்டின் ஒவ்வொரு பகுதிக்கும் சென்று பார்வையிட்டார்கள். பார்வையிட்டு இலங்கை அரசாங்கத்துக்கு ஒரு அறிக்கை சமர்ப்பித்தார்கள். அந்த அறிக்கையில் மட்டக்களப்பிலிருந்து திருகோணமலை வரை செல்கின்ற கரையோரப் பாதைக்கு ஒரு முக்கிய இடம் அளித்திருந்தார்கள். அந்தப் பாதை திருத்தப்பட வேண்டும்; அந்தப் பாதையில் பனிச்சங்கேணி, வெருகல், உப்பாறு ஆகிய துறைகள் ஒவ்வொன்றிலும் பாலங்கள் போடப்பட வேண்டுமென்று அமெரிக்காவிலிருந்து வந்த அந்தக் குழுவினர் அறிக்கை சமர்ப்பித்திருந்தார்கள். ஆகவே அது செய்யப்பட வேண்டிய ஒன்று; அந்தப் பாதைகள் கட்டப்படவேண்டியவை என்று சொல்லிவைக்க விரும்புகிறேன்.

வலையிறவுப்பாலம், மண்முனைப்பாலம் ஆகியவை கிழக்கு மாகாண விவசாயிகளுக்கு ஒரு வரப்பிரசாதம் என்பதைக் கௌரவ சபையினர் ஏற்றுக்கொள்ள வேண்டும். அந்தப் பகுதியிலே 20,000 க்கும் மேற்பட்ட ஏக்கர் பிரதேசத்திலே விவசாயிகள் கமம் செய்கிறார்கள். 100 சதுரமைல் விஸ்தீரணமுடைய பகுதிதான் இப்பகுதி. இப்பகுதியிலிருந்து வருடமொன்றுக்கு ஒருகோடியே நாற்பத்தைந்து இலட்சம் ரூபாய் பெறுமதியான நெல்லை விவசாயிகள் உற்பத்திசெய்கிறார்கள். இந்த நெல்லை 35 மைல்கள் தூரம் மட்டக்களப்பிலே உள்ள அரிசி ஆலைக்குக் கொண்டு வருவதற்கு இந்த அரசாங்கத்துக்கு வருடமொன்றுக்கு ஏற்றுமதிக் கூலியாக மூன்று இலட்சத்து முப்பதினாயிரம் ரூபாய் செலவாகிறது. இப்பாலம் அமைக்கப்பட்டால் இந்தப் பணம் மிகுதியாகாதா என்றுதான் கேட்க விரும்புகிறேன். அதுமட்டுமல்ல, இப்பொழுது பாவனையிலே இருக்கின்ற பாதை அடிக்கடி பழுதாகிறது. அந்தப் பாதையில் வேலைசெய்கிறவர்களுடைய சம்பளம், திருத்தங்கள் ஆகியவற்றுக்கு வருடமொன்றுக்கு 80,000 ரூபாய் செலவாகிறது. பத்து வருடகாலத்தில் அந்தப் பாதைக்குச் செலவழிக்கப்படுகின்ற

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජදුරෙයි මයා.]

பணம், இந்தப் பாலத்தை அமைப்பதற்குப் போதுமானதாகும். இதேமாதிரித்தான் மண்முனைத்துறைக்கும் போதும்; கிட்டங்கித் துறைக்கும் போதும். ஆகையினலே 1968-69 ஆம் ஆண்டு வரவு செலவுத் திட்டத்திலே சேர்ப்பதாகக் கொடுத்த வாக்குறுதியை—சும்மா அல்ல—கடிதமூலம் எனக்களித்த வாக்குறுதியை கடைசி நேரத்தில் கைவிட்டு விட்டார்கள். எதற்காகக் கைவிடப்பட்டதென்று நான் கேட்க விரும்புகிறேன். விவசாயிகளுக்கு நன்மை செய்கிறோம் எனறு சொல்லுகின்ற இந்த அரசாங்கம், விவசாயிகளுக்கு அதிமுக்கியத்துவம் வாய்ந்த இந்தப் பாலத்தை அமைத்துத்தருவோமென்று எனக்குமட்டுமல்ல—இந்த நாட்டு மக்கள் அத்தனை பேருக்கும் வாக்குறுதியைக் கொடுத்துவிட்டு ஏன் அதனை மீறவேண்டுமென்று கேட்க விரும்புகிறேன். ஏன் இந்தப் பாகுபாடு என்று கேட்கிறேன்.

அடுத்ததாக, இந்த நாட்டிலே வேலையில்லாத் திண்டாட்டத்தைப்பற்றி மிக அதிகமாகப்பேசப்பட்டது. சமீபத்திலே ஐந்து பெண் பொலிஸாரின் காலியிடங்களுக்கு விண்ணப்பங்கள் கோரப்பட்டபொழுது 10,000 பேர் மனுப்பண்ணியிருக்கிறார்கள்; 400 பொலிஸ்காரர்களுக்கான காலியிடங்களுக்கு 25,000 பேர் மனுப்பண்ணயிருக்கிறார்களென்று பத்திரிகைகளிலே படித்தேன். இன்று நாட்டின் எல்லா பகுதிகளிலும் வேலையில்லாத் திண்டாட்டம் ஒரு பெரும் நோயாக ஏற்பட்டுவிட்டது. அதைத் தீர்ப்பதற்குப் பல வழிவகைகளைக் கையாளுகிறோம் என்று சொன்னார்கள். எனக்கு நன்றாக ஞாபகமிருக்கிறது. 1967 ஆம் ஆண்டிலே அலரி மாளிகையிலே நடந்த அரசாங்கத்தரப்புக் குழுக்கூட்டத்திலே வேலையில்லாப் பிரச்சினையைப் பற்றியும், வேலையற்ற பட்டதாரிகளின் பிரச்சினையைப் பற்றியும் ஆராய்வதற்கும் அதைத் தீர்ப்பதற்குமென ஐந்து அமைச்சர்களைக் கொண்ட ஒரு குழுவொன்று நியமிக்கப்பட்டது. ஆனல் இன்றைக்கு ஆண்டுகள் மூன்றாகியும், அந்தக்குழு எப்படி இயங்கியது? எத்தனை பேருக்கு வேலை கொடுத்திருக்கிறதென்பதை நாம் அறியோம். மூன்று இலட்சம்பேர் எஸ். எஸ். ஸீ. பரீட்சை எழுதியிருக்கிறார்கள். அவர்களில் ஒரு இலட்சத்து ஐம்பதினாயிரம் பேர் சித்தியடைந்திருக்கிறார்களெனப் பத்திரிகை வாயிலாக அறிகிறோம். இன்றைக்கு நாட்டிலே வேலையற்றிருக்கின்ற படித்த வாலிபர்களின் தொகை பல இலட்சமாகும். வருடமொன்றுக்கு ஒரு இலட்சம் பேராக வேலையற்றோர் பெருகிக்கொண்டுவருகிறார்கள். இந்நாட்டின் இளைஞர் சக்தியை—இந்நாட்டு வாலிப இளைஞர்களின் சக்தியை—அவர்களின் ஆற்றலை—ஏன் அரசாங்கம் சரிவரப் பயன்படுத்தாமல் இருக்கின்றதென்றுதான் கேட்கின்றேன். விவசாயத்துறையில், மீன்பிடித்துறையில், கைத்தொழில் துறையில் அவர்களின் ஆற்றலைச் சரிவரப் பயன்படுத்த வேண்டுமென்று நான் அரசாங்கத்தைக் கேட்டுக்கொள்ளுகிறேன்.

எங்களுடைய அமைச்சர்களும் பாராளுமன்றப் பிரதிநிதிகளும் வெளிநாடுகளுக்குப் போய்க்கொண்டே வருகிறார்கள். வெளிநாடுகளிலே இளைஞர்களின் ஆற்றலை அவர்கள் அறிந்திருப்பார்கள். இளைஞர்கள் ஒரு நாட்டின் தேசிய செல்வங்கள். அவர்கள் சரிவரப் பயன்படுத்தப்படவேண்டும். இன்றைக்கு ஒவ்வொரு நாளும் தொழில் கந்தோர்களிலே போய்ப் பார்த்தால் நூற்றுக்கணக்கான இளைஞர்கள் என்ன வேலை கிடைக்கும்—ஏது கிடைக்கும் என்று தவித்துக்கொண்டிருக்கிறார்கள். ஆங்கிலத்தில் எஸ். எஸ். ஸீ. சித்தியடைந்த மாணவர்கள் காவற்காரர்களாகவும், தொழிலாளர்களாகவும் கூலிக்காரர்களாகவும் வேலைபார்க்கின்ற நிலைக்கு இன்று போய்க்கொண்டிருக்கின்றார்கள். இந்த நிலையை அரசாங்கம் தீவிரமாக யோசிக்க வேண்டும். எல்லோருக்கும் பசி ஒன்றுதான். சிங்களவர்களுக்கும் பசி ஒன்றுதான்; தமிழர்களுக்கும் பசி ஒன்றுதான். நாட்டின் இளைஞர்களிடத்தில் தோன்றியிருக்கின்ற வேலையில்லாப் பிரச்சினையைத் தீர்க்க வேண்டும்.

கிழக்கு மாகாணத்தில் மீன்பிடித்தொழிலுக்கு அரசாங்கம் போதியளவு ஆதரவு கொடுக்கவில்லை என்று நான் பகிரங்கமாகக் குற்றஞ்சாட்டவிரும்புகிறேன். கடந்த நான்கு வருடங்களிலே நானூறு வள்ளங்கள் கையளிக்கப்பட்டிருக்கின்றன. ஆனல், இரண்டேயிரண்டு வள்ளங்கள்தான், ஐம்பதினாயிரம் வாக்காளரையும் எண்பதினாயிரத்துக்கு மேற்பட்ட பொதுமக்களையும்கொண்ட தொகுதிக்குக் கொடுக்கப்பட்டிருக்கின்றன. இது போதுமா என்று நான் உங்களைப் பார்த்துக் கேட்க விரும்புகிறேன். வலைகளின் விலை கூடி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

யிருக்கின்றது. 'தங்கூஸ்' விலை கூடியிருக்கின்றது. இவற்றின் விலையைக் குறைக்க அரசாங்கம் என்ன நடவடிக்கை எடுத்திருக்கின்றதென்று கேட்க விரும்புகிறேன்.

சபாநாயகர் அவர்களே, இந்த நாட்டின் விவசாயிகளின் பிரச்சினைகள் பற்றிப் பலர் பேசியிருக்கிறார்கள். அவர்கள் வாழும் சீர்கெட்ட நிலை கிராமப் புறத்திலிருந்து வருகின்றவர்களுக்குத்தான் தெரியும். என்னைப் போன்ற, கௌரவ மூதூர் இரண்டாவது பிரதிநிதி (ஜனாப் ஏ. எல். அப்துல் மஜீது), கௌரவ பட்டிருப்புப் பிரதிநிதி (திரு. எஸ். எம். இராசமாணிக்கம்) போன்ற கிராமத் தொகுதிகளிலே இருந்து வருகின்ற அங்கத்தவர்களுக்குத்தான் அந்த விவசாயிகளினுடைய கஷ்டங்கள் தெரியும். [குறுக்கீடு] நண்பர் கௌரவ வவுனியாப் பிரதிநிதியும் தம்மை ஞாபகப்படுத்திக் கொள்கிறார் நன்றி. கிராம விவசாயிகள் படுமோசமான நிலையில் இருக்கிறார்கள். விவசாயக் குடும்பங்களிலே படித்து வேலையில்லாது இருக்கின்ற வாலிபர்களைப் பற்றிய புள்ளிவிவரங்களை அரசாங்கம் எடுக்க வேண்டும். உணவுற்பத்திக்கு முதுகெலும்பாயிருக்கின்ற அசல் விவசாயிகளின் குடும்பங்களிலிருக்கின்ற படித்த வாலிபர்களின் பெயர்களைத் திரட்ட வேண்டும். அவர்களுக்கு மாணவ ஆசிரியர் நியமனங்களிலோ, அல்லது வேறு நியமனங்களிலோ முதலிடம் கொடுக்க வேண்டும்; அல்லது அவர்களை விவசாய ஆசிரியர்களாக நியமிக்க வேண்டும். குறைந்த பட்சம் நூறு ரூபா சம்பளத்திலாவது பின்தங்கிய கிராமப் புறங்களிலே வாழ்கின்ற விவசாயிகளின் பிள்ளைகளுக்கு, உணவுற்பத்தியின் முதுகெலும்பாயிருக்கின்ற விவசாயிகளின் பிள்ளைகளுக்கு அரசாங்கம் முதலிடம் அளித்து, நியமனம் அளிக்கவேண்டுமென்று கேட்டுக் கொள்கிறேன். அப்போதுதான் நாம் விவசாயிகளுக்கு நன்மை செய்கிறோம் என்று சொல்ல முடியும்.

கன்னங்குடா, ஈச்சந்தீவு, மகிழவெட்டுவான் போன்ற கிராமங்களில் படித்த வாலிபர்கள் வேலையில்லாது இருக்கின்றார்கள். ஏன் அவர்களை விவசாய ஆசிரியர்களாக நியமிக்க முடியாது? நூறு ரூபா சம்பளத்திலாவது ஏன் அவர்களை நியமிக்க முடியாது? அவர்களுக்குப் போட்டிபோட முடியாது. அத்துடன், விவசாயிகளுக்கு நன்மை செய்ய வேண்டுமென்றால், பென்ஷன் திட்டம் என்று சொல்வது போல் ஏதாவதொரு திட்டத்தை அவர்களின் பிற்காலத்தில் பயன்படக் கூடிய வகையில் ஆக்க வேண்டும். பிற்காலத்தில் அவர்கள் ஓரளவு பச்சைத் தண்ணீரைச் சுடுநீராக்கி, சுடுநீரைத் தேநீராக்கிக் குடிக்க வசதி செய்ய வேண்டும். கௌரவ சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி இங்கே இருக்கிறார். உண்மையான விவசாயிகள் பிற்காலத்திலே படும் கஷ்டங்களை, அவர்கள் வாழும் பரிதாபமான நிலையை அவரும் கண்டிருக்கின்றார்; நாமும் பார்த்திருக்கிறோம். ஆகவே, இந்த விவசாயிகளுக்குப் பிற்காலத்திலே உதவி செய்யக்கூடிய வகையில் ஒரு திட்டத்தை அரசாங்கம் அடுத்த ஆண்டிலாவது வகுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கிறேன். வேளாண்மை செய்து இந்த நாட்டின் பட்டினியை நீக்கி இந்த நாட்டின் உற்பத்தியைப் பெருக்கும் ஒவ்வொரு விவசாயிக்கும், பிற்காலத்தில் சுமுகமாக வாழ குறைந்த பட்சம் ஒரு சிறு தொகையையாவது கொடுக்க அரசாங்கம் திட்டம் வகுக்க வேண்டும். எல்லோரும் படித்து பதவிகளை நாடிப் போகும் நேரத்தில் அவர்கள் வேளாண்மை செய்வதற்கு நிலங்களை நாடிப் போகின்றார்கள். அவர்கள் வேளாண்மை செய்து நாட்டின் உணவுப் பஞ்சத்தைத் தீர்க்கிறார்கள். நாட்டின் பட்டினியைத் தீர்க்கிறார்கள். நமது நாட்டவர்க்கு நிம்மதியைத் தருகிறார்கள். நமது நாட்டில் நல்ல தெருக்களும் கட்டடங்களும் உருவாக மூலகாரணமாக இருக்கிறார்கள். ஆனால் அதே நேரத்தில் விவசாயிகள் பிற்காலத்தில் கூனிக்குறுகி, குந்தியிருக்க இடமில்லாமல் இருக்கும் பரிதாப நிலையைப் பார்க்கிறோம். எனவே, அவர்களுக்குப் பிற்காலத்தில் பயன்படக் கூடிய வகையில் ஒரு நல்ல திட்டத்தை ஆக்க வேண்டுமென்று மீண்டும் கேட்டுக் கொள்கிறேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, நான் அதிக நேரம் எனது பேச்சை நிகழ்த்திக் கொண்டிருக்க விரும்பவில்லை. கிழக்கு மாகாணத்தைப் பொறுத்த அளவிலே உள்ள பிரச்சினைகளைப் பற்றி கௌரவ பட்டிருப்புப் பிரதிநிதி அவர்கள் உங்கள் கவனத்துக்குக் கொண்டுவந்தார்கள். ஆகவே, அந்தப் பிரச்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජදුරෙයි මයා.]
சிலைகளை மீண்டும் ஒரு சில நிமிடத்தில் நினைவு படுத்தி எனது உரையை முடித்துக் கொள்கிறேன்.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The hon. Member has already exceeded the time allotted to him.

**රාජදුරෙයි මයා.**
*(திரு. இராஜதுரை)*
(Mr. Rajadurai)

I shall finish in another five minutes.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I cannot give the hon. Member another five minutes because he has already exceeded his time. His Whip has allotted a certain number of minutes for his speech. He had asked for that time and was given that time. He had undertaken to take only 20 minutes.

**රාජදුරෙයි මයා.**
*(திரு. இராஜதுரை)*
(Mr. Rajadurai)

மட்டக்களப்பு, கற்குடா ஆகிய பிரதேசங்களில் இரண்டு துறைமுகங்களையும் திறக்க வேண்டும் என்று கேட்டிருக்கிறேன். வதுளை, வெலிமடை போன்ற பகுதிகளிலிருந்து ஏற்றுமதி செய்யப்படும் தேயிலைப் பெட்டிகளை மட்டக்களப்பு, கற்குடா ஆகிய இடங்களின் துறைமுகங்கள் மூலம் அனுப்புவதனால் செலவைக் குறைக்க முடிவதோடு, அதனால் நாட்டுக்கு அதிக நன்மை பயக்கத்தக்கதாகவும் இருக்கும். அத்துடன் கிழக்கு மாகாணத்திலுள்ள பல நூறு பேருக்கு வேலைவாய்ப்பை அளிக்கவும் முடியும்.

மட்டக்களப்பு தொழில் நுட்பக் கல்லூரியைத் திறக்க விரைவாக நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அதற்காக ஐம்பது ஏக்கர் நிலம் சுவீகரிக்கப்பட்டிருந்தும் இதுவரை அந்தத் தொழில்நுட்பக் கல்லூரி திறக்கப்படவில்லையென்ற குற்றச்சாட்டைச் சுமத்த விரும்புகிறேன். அடுத்ததாக, கனிட்ட பல்கலைக் கழகம் திறக்கப்படுவதில் கிழக்கு மாகாணப் பிரதிநிதிகளுக்கிடையே எதுவித கருத்து வேற்றுமையும் இல்லை. எனவே, மட்டக்களப்பு மாவட்டத்தில் ஒரு கனிட்ட பல்கலைக்கழகம் அவசியம் திறக்கப்பட வேண்டும்.

இறுதியாக கைத்தொழில் பேட்டையொன்று கிழக்கு மாகாணத்தில் அமைக்கப்படவேண்டும். அப்படியான ஒரு பேட்டை கிழக்கு மாகாணத்தில் அமைக்கப்படுமென்றால் அங்கு படித்து ஊர்சுற்றிக்கொண்டு திரியும் பல நூறு இளைஞர்களுக்குத் தொழிற்கல்வி பெற்று, தொழிற்சாலைகளிலோ, தனிப்பட்ட ஸ்தாபனங்களிலோ வேலைபெற வாய்ப்பு ஏற்படும். அதேபோன்று மீன்பிடிப் பயிற்சிக் கல்லூரியொன்றையும் கிழக்கு மாகாணத்தில் நிறுவ வேண்டும். மீன்பிடிப் பயிற்சிக் கல்லூரியொன்றை கிழக்கு மாகாணத்தில் அமைக்கவில்லை என்றால் வேறு எங்கே அமைப்பது? ஆகவே மீன்பிடித் தொழிலில் ஆர்வம் காட்டுகின்ற இளைஞர்களைக் கைதூக்கி விடுவதற்கு நீங்கள் கிழக்கு இலங்கையிலே ஒரு மீன்பிடிப் பயிற்சிக் கல்லூரியை அமைக்க வேண்டுமென்று கேட்டு, கிழக்கு மாகாணத்திற்கு நீங்கள் செய்கின்ற அல்லது கொடுக்கின்ற நிதி எந்த விதத்திலும் பழுதுபோகாது என்றும் அது கடலில் வீசி எறிகின்றது போன்றதல்ல என்றும் கூறி அது உங்களுக்கு வட்டியும் முதலுமாகப் பலனைக் கொடுக்கும் என்று சுட்டிக் காட்ட விரும்புகிறேன். கிழக்கு மாகாணத்தில் இருக்கின்ற விவசாயிகள் இந்த நாட்டின் பட்டினியையும் பஞ்சத்தையும் போக்கிக் கொண்டு இருக்கிறார்கள். ஆகவே கிழக்கு மாகாணத்திற்கும், சிறப்பாக வடக்கு மாகாணத்திற்கும் குறிப்பாக வவுனியாத் தொகுதிக்கும் நீங்கள் வழங்குகின்ற எந்த நிதியும் வீண்போகாது. அது இந்த நாட்டின் தேசிய வளத்தை வளர்க்கும், பெருக்கும் என்று சொல்லி எனக்குப் பேசுவதற்கு இவ்வளவு நேரத்தையும் அளித்த உங்களுக்கு நன்றிகூறி எனது உரையை முடித்துக் கொள்ளுகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.20

**හේමචන්ද්‍ර සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)

*(திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*

(Mr. Hemachandra Sirisena—First Akurana)

ගරු කථානායකතුමනි, අය වැය ලේඛනය පිළිබඳව යමක් කියන්නට මත්තෙන් මට ප්‍රථම කථා කළ මඩකලපුවේ ගරු මන්ත්‍රීතුමා (රාජදුරෙයි මයා.)—පෙඩරල් පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා—කථා කළ ස්වරූපය ගැන වචනයක් කියන්න කැමතියි. එතුමා අද කථා කෙළේ පසු ගිය අයවැය වාර්තාව පිළිබඳ විවාදයේදී කරන ලද කථාවට පටහැණි කථා ශෛලියකිනුයි. එය අපට පුදුමයක් වී තිබෙනවා. ඒ කොයි ආකාරයට කථා කළත් එතුමා බොහෝම පරෙස්සම් වී කථා කළා. ඇමතිවරුන්ගේ සිත් නොරිදෙන ආකාරයටත්, තම ඡන්ද කොට්ඨාශයේ ඡන්දදායකයන්ගේ සිත් දිනාගන්නා ආකාරයටත්, ඉදිරියටත් ආණ්ඩු පක්ෂයේ විශෙෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ හොඳ හිත ආරක්ෂා වන ආකාරයටත් ඒ කථාව කළ බව අපට පැහැදිලි ලෙස පෙනී යන බව මා කියන්න කැමතියි. ඒ කෙසේ වෙතත්, ඡන්දය පාවිච්චි කරන අවස්ථාවේදී මධ්‍යස්ථයි කියන එක එක්කෙනෙක් හෝ දෙන්නෙක් ප්‍රකාශ කරනවා ඇති. මා එසේ කියන්නේ විරුද්ධ පාර්ශ්වයට පැමිණි දවසේ සිට මේ වන තුරු ආණ්ඩුවට විරුද්ධව නම් ඡන්දය කිසිම අවස්ථාවක පාවිච්චි කර නැති නිසයි. ඒ කථාව සම්බන්ධයෙන් මා ඊට වඩා යමක් කියන්න අදහස් කරන්නෙ නැහැ.

ජාතික යයි කියාගන්නා මේ රජයේ මුදල් ඇමතිතුමා අය වැය ලේඛන 5 ක්ම ඉදිරිපත් කිරීමෙන් වාර්තාවක් තැබුවාය කියා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකුම ප්‍රසංසා මුඛයෙන් කථා කර තිබෙනවා. අයවැය ලේඛන 5 ක් ඉදිරිපත් කළ බව අපි කවුරුත් පිළිගන්නවා. එහෙත් මේ රටට යහපතක් වන ආකාරයටවත් රට දියුණුවන ආකාරයටවත්, රටේ ඇවෙන ප්‍රශ්නවලට විසඳුමක් ඇති වන ආකාරයටවත්, ගරු මුදල් ඇමතිතුමා මේ වන තුරු වාර්තාවක් සකස් කළේ නැති බව අප විසින් මෙහිදී මතක් කර දිය යුතුව තිබෙනවා.

මේ වර අය වැය ලේඛනය සකස් කර තිබෙන්නේ පුදුමාකාර උපක්‍රම ශෛලියකින් බව අපට පෙනී යනවා. මේ රජය විසින් ඉදිරිපත් කර ඇති මේ අවසාන අය වැය ලේඛනය බැටළු හම පොරවාගත් කොටි පැටවකුගේ ස්වරූපයක අයවැය ලේඛනයක් වශයෙන් හඳුන්වන්න පුළුවනි. තව අංශයකින් කියනවා නම් අප කුඩා කල කියවා තිබෙන පොතක කථාන්තරයකට මෙය උපමා කරන්න පුළුවනි. ඒ කථාව මේකයි. එක්තරා ගොඩනැගිල්ලක උඩු මහලට නැඟීම සඳහා එක්තරා උපක්‍රමයක් යොදා තිබෙනවා. කුරුමිණියකුගේ හිසෙහි වෙඩරු ටිකක් තවරා උගේ කකුලක ඉතාම සිහින් නූල් පොටක් බැඳ බිත්තියේ තැබුවාලු. ඒ කුරුණියා හිසේ තිබෙන වෙඩරු සුවඳ ඉව කරමින් බිත්තිය දිගේ ඉහළට ඇදී ගියා. කුරුමිණියා උඩුමහලට ළං වූ විට එහි සිටි අය අර සිහින් නූල අල්ලාගත්තා. ඊට පසු පහත සිටි තැනැත්තා ඒ සිහින් නූලේ තව ඊට ටිකක් ලොකු නූලක් ගැට ගසා ඉහළට යවා, ක්‍රම ක්‍රමයෙන් ඊට වඩා ටිකක් ලොකු ලනුවක් යවා, ඉන් පසුව කඹයක් යවා, පසුව ඒ කඹේ දිගේ උඩු මහළට ගොස් තමන් සිත් වූ පරිදි එහි වාසය කළාය, පල ප්‍රයෝජන ගත්තාය කියා ඒ කථාවේ සඳහන් වෙනවා. අන්න ඒ වාගේම අපේ ගරු මුදල් ඇමතිතුමාත් ඉතාම සියුම් ක්‍රමයකින් මේ අයවැය ලේඛනය ජනතාව ඉදිරියේ තබා මේ රටේ ආර්ථිකය උඩුමහලේ සැපවත් ජීවිත ගත කරන කොටස්වලට භුක්ති විඳිම පිණිස සලස්වා තිබෙනවා. ජනතාවගේ ශ්‍රමය සූරා ගන්නටත් තමන්ගේ සගයන්ගේ යහපත සඳහාත් වැඩ පිළිවෙළක් ඇති කරමින් මේවර අය වැය ලේඛනය සකස් කර තිබෙන බව අපට පැහැදිලි ලෙස පෙනී යනවා.

ගරු කථානායකතුමනි, ජනතාව මුලාවට පත් කර ආණ්ඩු බලය ලබා ගෙන ඒ බලය ලබා ගැනීමට සහයෝගය දැක්වූ ජනතාව තලා පෙලමින් රට පාලනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය දැයි මා මෙහිදී ප්‍රශ්න කරනවා. එක්තරා ප්‍රමාණයකින්—සුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]
ප්‍රමාණයකින්—වැටුප් වැඩි කිරීමක් කර තිබෙනවා. අවසාන මොහොතේ හෝ මේ ගත් පියවර පිළිබඳව අපට සෑහීමකට පත් වීමට පුළුවන්කම තිබෙනවා. නමුත් ලබා දෙන්නට යන වැඩි වැටුප් ප්‍රමාණය එදිනෙදා පාරිභෝජනයට අවශ්‍ය බඩු මිලදී ගැනීමේදී ආපසු ඇද ගැනීමේ වැඩපිළිවෙලක් තිබෙන බව පෙනෙනවා. වැටුප සුළු වශයෙන් වැඩි වුණත් එය ආපසු ඇද ගැනීම සඳහා බඩු මිල වැඩි වී තිබෙන බවක් මෙහිදී සඳහන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව ප්‍රශ්න මහත් රාශියක් විසඳුවාය කියා උදම් අනන බවක් පෙනෙනවා. නමුත් මේ රටේ විසඳන්නට තිබෙන ප්‍රශ්න පිළිබඳව කිසිම තැකීමක්, කිසිම සැලකිල්ලක්, මේ වන තෙක් මේ රජයෙන් දක්වා නැති බවයි රට දෙස බැලූ විට අපට පෙනී යන්නෙ. කෘෂිකාර්මික කටයුතු අතින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා විශාල මහන්සියක් දැරීම නිසා විශාල උනන්දුවකින් කටයුතු කිරීම නිසා එහි ප්‍රතිඵල ලැබී තිබෙනවාය කියා උදම් ඇනීමක් රට පුරාම කර ගෙන යනවා. නමුත් අද මේ රටේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳව සලකා බලන විට මීට පෙර අපේ රටේ ගොවි ජනතාව අඩු අස්වැන්නක් ලබා ගෙන ජීවත් වූ කාලයේදී ලැබූ සහනයන්, පහසුකම්, ආදිය වත්, වැඩි අස්වැන්නක් ලබනවාය කියන මේ කාලයේදී නොලබන බව මහජනතාවගේ ප්‍රකාශනවලින් අපට දැන ගන්න ලැබී තිබෙනවා. බඩු මිලදී ගැනීමේදී කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය භාණ්ඩ හෝ වේවා, පාරිභෝජනයට අවශ්‍ය භාණ්ඩ හෝ වේවා, වෙනත් සුඛෝපභෝගි ආහාර ද්‍රව්‍ය හෝ වේවා, පාරිභෝගිකයාට වුවමනා කරන වෙනත් භාණ්ඩ හෝ වේවා, ඕනෑම භාණ්ඩයක් ගැන සලකා බලන විට ඒවායේ මිල දෙගුණ තෙගුණ වශයෙන් වැඩි වී තිබෙන බවක් පෙනෙනවා. ඒ නිසා මේ අවධියේදී කෘෂිකර්මය අතින් රට දියුණු වීම නිසා පොදු ජනතාව සැපවත් ජීවිතයක් ගත කරනවාය කියා පිළිගන්නට පුළුවන්කමක් නැති බව මේ ආණ්ඩුවට මතක් කරන්න කැමතියි. ඇතැම් අවස්ථාවලදී, මේ ගරු සභාවේදීත් පිටතදීත්, මෙම රජයේ මැති ඇමතිවරුන්—විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමා—නිකන් හාල් දෙන රජය මේ ජාතික රජයයයි පුරසාරම් දෙඩීමක් මේ වන තෙක්ම කර ගෙන යන බවක් පෙනෙනවා. තව ඉදිරියටත් මේ ප්‍රකාශය කොතෙක් දුරට කර ගෙන යන්න අවස්ථාව ලැබේද යන්න නම් අපට සැක සහිතයි. සෑම අවස්ථාවකදීම නිකම් දෙනවාය යන ප්‍රකාශය කරන මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගෙන් මා ප්‍රශ්නයක් අහනවා. මේ රටේ රැකිරක්ෂා නැතිව සිටින දස දහස් සංඛ්‍යාත තරුණ තරුණියන්ට රැකිරක්ෂා සපයා නොදෙන්නේ රැකිරක්ෂා නිකම් දෙන්නට බැරි නිසාද? රැකිරක්ෂා නැති ජ්‍යෙෂ්ඨ සමතුන් ලක්ෂ ගණනින් සිටිනවා. උපාධිධාරීන් දස දහස කට අධික සංඛ්‍යාවක් සිටිනවා. මොනම රැකිරක්ෂාවක්වත් ලබා ගැනීමට පුළුවන්කමක් නැතිව ලත වෙවී සිටින මේ විශාල පිරිසට රැකිරක්ෂා සපයා නොදෙන්නේ රැකිරක්ෂා නිකම් දෙන්නට බැරි නිසාද යන ප්‍රශ්නය මා නැවතත් ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවයේ පුරප්පාඩු තිස් පන් දහසක් තිබෙනවාය, ලබන මාසයේ ඒ පුරප්පාඩු සියල්ලම පුරවනවාය, ගුරු සේවයේ පුරප්පාඩු දහසය දහසක් තිබෙනවාය, ලබන මාසයේ හෝ ඊළඟ මාසයේ ඒ පුරප්පාඩු සියල්ලම පුරවනවාය ඔය ආදී වශයෙන් නොයෙකුත් ප්‍රකාශ කර දැන් අවුරුදු තුන හතරක් ගත වී තිබෙන බව මේ ආණ්ඩුවට අමතක වී තිබීම පුදුමයට කාරණයක්. ඒ පුරප්පාඩු පිරවීමෙන්වත් මේ රටේ උගත් පෙළේ තරුණ තරුණියන්ට රැකිරක්ෂා නොදෙන්නේ රක්ෂාවක් නිකම් දෙන්නට බැරි නිසාද කියා මා නැවතත් ප්‍රශ්න කරනවා.

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේදීත් ඉන් පිටස්තර වේදිකාවලදීත් දැන් මේ ආණ්ඩුව නගන විශාලම සටන් පාඨය තමයි මහවැලි ගඟ යෝජනා ක්‍රමය. මහවැලි ගඟ යෝජනා ක්‍රමය අවුරුදු පහළොවක් පමණ පරණ යෝජනා ක්‍රමයක්. මීට ඉහතින් මේ රටේ පාලනය ගෙන ගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙනුත් ඊටපසු ඇතිවූ සභාග ආණ්ඩුවෙනුත් මහවැලි ගඟ යෝජනා ක්‍රමය සඳහා මුදල් වෙන් කොට තිබෙනවා. නමුත් මේ ආණ්ඩුව පටන් ගත් දා සිටම මහවැලි ගඟේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පුරසාරම දොඩනවා. සෑම අයවැය ලේඛනයකින්ම සෑම රාජාසන කථාවකින්ම පමණක් නොවෙයි සෑම විවාදයකදීම, සෑම දේශපාලන රැස්වීමකදීම මහවැලි ගඟ ව්‍යාපාරය ගැන සඳහන් කරමින් ජනතාව මුළා කරනවා. මහවැලි ගඟ දැන් අනුරාධපුරයට හරවා හමාර වී තිබෙන බව ප්‍රකාශ කරමින් මේ ආණ්ඩුව මහවැලි ගඟ යෝජනා ක්‍රමය ගැන උදන් ඇනීම අපට පුදුමයට කාරණයක්. මහවැලි ගඟ යෝජනා ක්‍රමය සඳහා මේ වර අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙන මුදල මීට ඉහතින් වෙන් කරන්නට යෙදුණු මුදලට වඩා වැඩි වන්නේ ඉතාම සුළු ප්‍රමාණයකින්. ඒ මුදල සෑහෙන තරම් වැඩි කර නොතිබීම ගැන මා කණගාටු වෙනවා. කෝටි සංඛ්‍යාත මුදලක් වැය වන මහවැලි ගඟ යෝජනා ක්‍රමය සඳහා මේ වර අයවැය ලේඛනයෙන් සෑහෙන මුදලක් වෙන් කර නැත්නම් එහි වැඩ කටයුතු ආරම්භ කරන්නේ කෙසේද යන ප්‍රශ්නය මා ඉදිරිපත් කරනවා.

මහවැලි ගඟ යෝජනා ක්‍රමය වාගේම විශේෂයෙන්ම මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ රැව් පිළිරැව් දෙන තවත් පාඨයක් තිබෙනවා. ඒක තමයි පල්ලෙකැලේ ව්‍යාපාරය. පල්ලේකැලේ ව්‍යාපාරය රැකීරක්ෂා නැති උදවියගේ ප්‍රශ්නය විසදන මහා ධන ආකරයක් බවට පරිවර්තනය වේ ගෙන යන බව මේ ආණ්ඩුව ප්‍රකාශ කරන්නේ වී නමුත් මේ නොබෝදා ඒ ස්ථානයට ගිය මට පල්ලෙකැලේ ඔය කියන කිසිම වෙනසක් වී නොමැති බවත් එදා තිබුණු තත්ත්වයෙන්ම තවමත් තිබෙනා බවත් පෙනී ගියා. කිරි මණ්ඩලයෙන් පිහිටුවා තිබෙන ගොඩනැගිල්ල හැරුණු විට වෙනත් කිසිවක් සම්පූර්ණ වී නැහැ. කර්මාන්ත ශාලා කීපයකට අත්තිවාරම් කැපීමේ වැඩ ආරම්භ කර තිබෙනවා පමණයි. පල්ලේකැලේ ව්‍යාපාරය ඔය කියන තත්ත්වයට ගෙන ඒමට තව අවුරුදු දහයක පහළොවක කාලයක් ගත වන බව අපට පැහැදිලිවම පෙනෙනවා. පල්ලේකැලේ ව්‍යාපාරයත් මහවැලි ගඟ යෝජනා ක්‍රමයත් එකට සම්බන්ධ කොට ගෙන මේ රට සංවර්ධනය කිරීමට ගන්න උත්සාහය ගැන මගේ ප්‍රශංසාව රජයට හිමි වෙනවා. ඒ සමගම, පල්ලෙකැලේ හා මහවැලි ගඟ ව්‍යාපාර ගැන කථා කිරීමෙන් පමණක් මේ රටේ උගත් තරුණ තරුණියන් මුළා කරන්නට බැරි බවත් පැහැදිලි ලෙසම මා මේ අවස්ථාවේදී රජයට මතක් කර දිය යුතුයි.

අයවැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී එක් එක් අමාත්‍යාංශය පිළිබඳ වූ ප්‍රශ්න ඉදිරිපත් කරන්නට අප බලාපොරොත්තු වන නිසාත්, මගේ කථාව මීට වඩා දීර්ඝ කරන්නට මා කල්පනා කරන්නේ නැහැ. බැටළු හමක් පොරවා ගත් කොටියකුගේ විලාශයෙන් ඉදිරිපත් කරන ලද මෙම අයවැය වාර්තාවට අපගේ කිසිම සහයෝගයක් නොලැබෙන බව ප්‍රකාශ කරමින් තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව මෙතෙකින් නවත්වනවා.

අ. භා. 3.36

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු කථානායකතුමනි, ජාතික රජයේ 5 වන අයවැය කථාව පිළිබඳ විවාදයට සහභාගි වන්නට අවස්ථාව ලැබීම ගැන මා විශේෂයෙන් සන්තෝෂ වෙනවා. මේ විවාදයේදී ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් මේ රජයේ වගා ව්‍යාපාරය ගැන විශේෂ වශයෙන් කථා කළ බවයි සඳහන් කරන්න තිබෙන්නේ. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් රජයේ වගා ව්‍යාපාරයත් ආර්ථික ක්‍රමයත් පිළිබඳව විශාල වගාඩම්බර දෙඩූ බව අපට පෙනෙනවා.

අපේ ප්‍රදේශවල ගොවි ජීවිතය සම්බන්ධයෙන් පවත්නා එක්තරා කියමනක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. අපේ පළාත්වල කුඹුරු හොඳට පැහෙනවා. කුඹුරේදී එය කොතරම් සාරවත් ලෙස පෙනුණත් ගොයම් කපා පාගා මැන බලන විට කුඹුරේදී පෙනුණු ප්‍රමාණයට වඩා වී ප්‍රමාණය යම් කිසි විධියකින් අඩු වී ඇති බව පෙනී යනවා. එවැනි අඩුවක් පෙනී ගිය විට අපේ පැරණි ගොවි මහත්වරුන් ඒ පාවරය එතැනම වසා දමා අඩුක්කුබෑම නමින් හැඳින්වෙන කිසියම් වත් පිළිවෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

වගයක් පවත්වා අවසානයේදී නැවත සුබ වේලාවක් බලා කමතේ වැඩ පටන් ගන්නවා. කමත්වල මෙසේ වී අඩු වීම ගොවි මහත්වරුන් විසින් හැඳින්වෙන්නේ "බහිරවයා ඇදගැනීම" යනුවෙනුයි. අඩුක්කුබෑම නම් වත් පිළිවෙත් පවත්වන්නේ ඒ නිසයි. මේ රජය පිහිටුවූ දා පටන් අද වන තුරු අගමැතිතුමාත් ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුනුත් රට පුරා යමින් "වගා වෙලා, වගා වෙලා" කියමින් පුරසාරම් කථා කළ හැටියටත්, ජාතිකයයි කියා ගන්නා මේ රජය රැක ගැනීමේ හොරණෑව වශයෙන් පාවිච්චි කෙරෙන ගුවන්විදුලිය කළ ප්‍රචාරයේ හැටියටත්, ජාතිකයයි කියා ගන්නා ප්‍රවෘත්ති පත්‍ර නමැති පච ප්‍රචාරක අංශයෙන් ගෙන ගිය ප්‍රචාරයේ හැටියටත්, වගාව සාර්ථක වී තිබෙනවා නම්, වීවලින් පමණක් නොව අල වගාවෙනුත් වෙනත් දේවලිනුත් මේ රට පුරවා මිනිසුන්ගේ උසට තට්ටු ගහන්නට තරම් ධන ධාන්‍යයෙන් මේ රට ආඪ්‍ය විය යුතුව තිබුණා. මට පෙනෙන හැටියට අර "බහිරවයා ඇද ගැනීම" කිවා වගේ තත්ත්වයක් මෙතැනත් තිබෙන්නේ. මේ මැති ඇමතිවරුන්ගේ කටවලුත්, මේ රටේ ගුවන් විදුලියත්, පච ප්‍රවෘත්ති පත්තරත් යන මේ සියල්ලම බහිරවයන් හැටියට අපට පෙන්වා දෙන්නට පුළුවනි. වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ අපට පෙන්වන්නේ බොරුවක්; ඇස්බැන්දුමක්. කොටින්ම, මේ මන්ත්‍රීවරුන් අපේ ප්‍රදේශවල තත්ත්වය පිළිබඳව බොහොම හොඳට නොයෙක් පුරසාරම් දොඩනවා. ගරු කථානායකතුමනි' මම මේ තමුන්නාන්සේට කියන්නේ ඇත්තයි. අපේ ප්‍රදේශයේ කහට වේලෙන් ජීවිත ගත කරන පවුල් අද සිටිනවා. දරුවන් හත් අට දෙනා සිටින මව්පියන් තම දරුවන්ට කහට වේලක් පමණක් දී ජීවිත රකින අවසථා තිබෙනවා. එහෙත් මැති ඇමතිවරුන්ගේ පුරසාරම්වල හැටියට මේ රට මසුරන්වලින්, කිරියෙන් පැණියෙන් ඉතිරී මේ රටේ ජනතාව සම්පූර්ණයෙන් ශක්තිමත් මහා ජාතික දේහයක් බවට පත් වී අවසානයි. වගා ව්‍යාපාරය, වගා ප්‍රෝඩාව කොයි අන්දමේ දෙයක්දැයි මහ ජනතාව අද හොඳහැටි තේරුම්ගෙන තිබෙනවා. මොවුන්ගේ වගා ව්‍යාපාරය ඉලක්කම්වලට සීමා වූවක් බව කියන්නට ඕනෑ. මේ රටේ සාමාන්‍ය මහජනතාව ජාතික හැඟීමකින්, ජාතික කැක්කුමකින් යුක්තව මේ ව්‍යාපාරයට මුලදී ඇදී ආවත් මේ වගා ප්‍රෝඩාව නිසා ඒ තත්ත්වයත් සම්පූර්ණයෙන් නැති වූ බව තමුන්නාන්සේට කියන්නට ඕනෑ.

නිදර්ශනයක් වශයෙන් ඉතාමත්ම හිනා උපදවන කථාවක් මා තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි. පසුගිය මාස්කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී ගොවිතැන් තද ඉඩෝරය නිසා සම්පූර්ණයෙන්ම වියළී විනාශ වී ගියා. ඊළඟට යල් මෝසමේ වගාවත් ඒ වගේම පාළු වුණා. ඒ ප්‍රදේශයේ කුඹුරුවල අස්වනු පිළිබඳ වාර්තා කොළඹ කායාීලයට එව්වා. ජාතිකය කියා ගන්නා මේ රජයේ පුරසාරම් ප්‍රෝඩාවට මේ ඉලක්කම් ප්‍රමාණවත් නොවන නිසා කොළඹ කාර්යාලයේ සිටින කෘෂිකර්ම සංවර්ධන අධ්‍යක්ෂතුමකු වන නිල් බණ්ඩාරනායක මහත්මයා ගිය සතියේ අනුරාධපුරයේ දිසාපතිතුමාට දුර කථනයෙන් කථා කර "මේ ඉලක්කම් මදි. මේවා ටිකක් වැඩි කර එවන්නට" යයි කිව්වේ නැද්ද කියා මා අහනවා. මේ අනුව ඒ නිලධාරීන් මේ ඉලක්කම් වැඩි කර නැවතත් එව්වා. සංඛ්‍යා ලේඛන සකස් කරන්නෙ මේ ආකාරයටයි. නිලධාරීන්ට වුවමනා වුණාම ඉලක්කම් වලින් වගාව වැඩි කරනවා.

ගාලු දිස්ත්‍රික්කයේ, කළුතර දිස්ත්‍රික්කයේ, රත්නපුර දිස්ත්‍රික්කයේ ඉතා විශාල අන්දමින් වගාවන් සාර්ථක වුණාය කියා මේ කාණ්ඩය පුරසාරම් දෙඩුවා. ගොවි රජවරුන් එකාපිට එකා තෝරා ඔවුන්ට ඔටුණු පළඳවා පදක්කම් ගසා රිය පෙරහැරවලින් ගෙන ගියා. එපමණක් නොවෙයි, මේ ගොවි රජවරු අහස් යානාවකින් ඉන්දියාවටත් පිටත් කළා. ඒ ගොවි රජවරුන් එහිදී කෘෂිකර්ම මධ්‍යසථාන නරඹන්නට ගිය විට, එහි සිටි උදවිය ප්‍රශ්න කළා, "රජ වන්නට තමුන්නාන්සේලා ලැබූ අස්වැන්න කොපමණද?" කියා. ඒ අවස්ථාවේදී මෙහෙ 270 යයි කිව්ව උදවිය තමන් ලැබූ අස්වැන්න හැටියට සඳහන් කළේ 160, 140 ආදි වශයෙන් අඩු ගණනුයි. මේ නිලධාරීන්ගේ වැඩ ගැන කොමිසමක් මගින් කරුණු සොයා බලන ලෙස ගරු අගමැතිතුමාගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා ඉල්ලා සිටිනවා. ඔන්න ඔය විධියෙ ප්‍රෝඩාවක් තමයි ගෙන යන්නෙ. ඒ අන්දමට ප්‍රකාශ කර නැද්ද කියා පරීක්ෂා කර බලන ලෙස මා ඉල්ලා සිටිනවා. වගාව සම්බන්ධයෙන් මොන විධියේ ප්‍රචාරයන්ද ගෙන යන්නෙ? ඇත්ත වශයෙන් මහ ජනතාව එහෙම පිටින්ම මුළා කිරීමේ බලාපොරොත්තුවෙනුයි මෙබඳු ප්‍රචාරයන් ගෙන යන්නෙ. ගරු කථානායකතුමනි, අප පිළිගන්නවා මේ රට වගා කරන්න ඕනෑ බව. වගා කිරීමට අගමැතිතුමා ගන්න මහන්සිය ගැන එතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. නමුත් එතුමා මොන තරම් මහන්සි ගත්තත් අනිකුත් උදවිය මේ දක්වාම ගෙන යන්නේ ප්‍රෝඩාවක් බව කියන්න ඕනෑ. වගා කිරීමේ මුවාවෙන් මිනිමෝක් රථ, ජීප් රථ, ට්‍රැක්ටර් ගෙන්වා ගෙන එයින් වාසි ලබාගන්නවා.

ගරු කථානායකතුමනි, තේ වගාව සම්බන්ධයෙනුත් මගේ අදහස් දක්වන්න කැමතියි. අපේ රටින් පිටරට යවන මූලික ද්‍රව්‍ය අතුරෙන් තේ වැඩිම ආදායමක් ලබන ද්‍රව්‍යය හැටියට සලකන්න පුළුවනි. කොටින්ම අපේ රටේ ආර්ථික තත්ත්වය යට විශේෂයෙන්ම බල පාන ද්‍රව්‍යයක් වශයෙන් මෙය පෙන්වා දෙන්නට පුළුවනි. නමුත් අපේ තේ මිල පහත වැටීම නිසා ජාතික ආදායමත් පහත වැටී තිබෙනවා. මෙසේ තේ මිල ලෝක වෙළඳපොලේ පහත වැටීමට හේතුවත්, එයින් වැඩි ආදායමක් අප රටට නොලැබීමට ඇති හේතුවත්, කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) පැහැදිලි කර දුන්නා. තේ වෙළඳාම සම්බන්ධයෙන් විදේශ රටවලට ගොස් සාකච්ඡා කිරීම පිණිස නියෝජිතයන් වශයෙන් බොහෝ විට යවන්නේ තේ වෙළඳාම සම්බන්ධයෙන් හෝ තේ කර්මාන්තය සම්බන්ධයෙන් කිසිවක් නොදන්නා නිලධාරීන් පිරිසක් බව පෙනී ගොස් තිබෙනවා. නිලධාරී පැළැන්තියෙහි ඕනෑ එපාකම් අනුව වෙළඳ ගනුදෙනු කරනවා මිස, ඒ පිළිබඳව අවබෝධයක් ඇති අයට සහභාගි වන්න අවස්ථාවක් රජයෙන් සලසා දෙන්නෙ නැහැ. නිලධාරී පැළැන්තියෙහි බලතල වලට ජනතාව යට කර තැබීමට මේ රජය තවමත් උත්සාහ දරන බව පසුගිය දවස් වල දිසාපතිවරුන්ගේ බලතල වැඩි කිරීමෙන් පැහැදිලි වෙනවා. එහෙම වැඩි කළේ සමහර විට නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳව ඉලක්කම් වැඩි කර ගන්නට වෙන්න ඕනෑ. තවමත් මේ රටේ පාලන බලය එහෙම පිටින්ම පැවරී තිබෙන්නේ මා කලින් සඳහන් කළ නිලධාරී පැළැන්තියටයි. අපේ රට අධිරාජ්‍යවාදීන්ගෙන් නිදහස් කර ගන්නට පුළුවන් වුණාට, සාමාන්‍ය පුරවැසියාට එතරම් නිදහසක් ලැබී නැහැ. මන්ද? නිලධාරීන් තවමත් ක්‍රියා කරන්නේ සාමාන්‍ය පුරවැසියන් යටත් කරගෙනයි.

ගරු කථානායකතුමනි, මා කථා කරගෙන ආවේ අපේ තේ වෙළඳාම සම්බන්ධවයි. තේ අලෙවිය සම්බන්ධයෙන් ගණුදෙනු කිරීම සඳහා බොහෝ විට විදේශයන් කරා යවන්නේ තේ වගාව සම්බන්ධයෙන් හෝ තේ කර්මාන්තය සම්බන්ධයෙන් හෝ තේ වෙළඳාම සම්බන්ධයෙන් හෝ කිසිම දැනුමක් තේරුමක් නැති පුද්ගලයන් බව මතක් කර දෙන්න කැමතියි. මෙතෙක් කල් නිලධාරී මහතුන් නියෝජිතයන් වශයෙන් ඒ ඒ රටවලට යැවීමෙන් වැඩක් සිදු වී තිබෙනවාද? මා දන්න අන්දමට වැවිලි කරුවන්ගේ සංගමයේ සභාපති වරුසවිතාන මහතා එක්සත් ජාතික පක්ෂයේ කමිටුවෙන් අස් වන්නට හේතු වුණේ, නිලධාරීන් නොයවා කර්මාන්තයෙහි නියැලී සිටින උදවිය යවන්නැයි ඒ මහතා විසින් කරන ලද ඉල්ලීම ගැන නොසැලකීම නිසයි. අගමැතිතුමා පවා ඒ මහතාගේ ඉල්ලීම ගැන සැලකිල්ලක් දැක්වූයේ නැහැ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ මහතා එක්සත් ජාතික පක්ෂයේ විධායක කමිටුවෙන් ඉල්ලා අස් වුණු බව දැනගන්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, තේ මිල ක්‍රම ක්‍රමයෙන් පහත වැටී ගෙන එනවා. මෙයට ඉක්මණින් ප්‍රතිකර්මයක් යොදන්න ඕනෑ. අපේ තේ විදේශයන්ට හැකි පමණ අලෙවි කිරීමට උත්සාහ දරන්න ඕනෑ. අපේ රටේ තේ වැඩියෙන් බොන්න උනන්දු කරන්න ඕනෑ. අපේ තේවල ඇති උසස්කම විදේශිකයන්ට අවබෝධ කර දෙන්න උත්සාහ කරන්න ඕනෑ. ඒ වාගේම ද්‍රව්‍ය හුවමාරු ක්‍රමය යටතේ අපේ තේ විදේශයන්ට යවන්න මහන්සි ගන්න ඕනෑ. අපේ රට සමග ගනුදෙනු ඇති කර ගැනීමට සමාජවාදී රටවල් ඉතාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

ඕනෑකමක් දක්වනවා. එහෙම නම් ද්‍රව්‍ය හුවමාරු ක්‍රමය යටතේ ඒ රටවල් සමගත් වෙළඳාම් ඇති කර ගැනීමට, අපේ තේ වෙළඳාම් කිරීමට උනන්දුවක් දක්වන්න ඕනෑ. නමුත් ඒ අන්දමින් රජය ක්‍රියා නොකිරීම නිසා අපේ තේ මිල දවසින් දවස පහත වැටී ඇති බව ප්‍රකාශ කරන්න සිදු වී තිබෙනවා. එම නිසා අයවැය ලේඛන පහක් නොවෙයි මේ වාගේ අයවැය ලේඛන දහසක් සකස් කර ඉදිරිපත් කළත් අපේ රටට කිසිම යහපතක් වන්නේ නැති බව, අපේ රට සංවර්ධනය වන්නේ නැති බව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. වන්නිනායක ඇමතිතුමාගේ අය වැය ලේඛන 5 ක් නොවෙයි, 1,000 ක් ඇති කළත් ඒවායේ කිසිම සරුසාරත්වයක් හෝ ඒවායින් ජාතියේ ඉදිරි ගමනට ලැබෙන කිසිම බලයක් හෝ නැති බව මා ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ අය වැය ලේඛන දුර්වල නිසා තමයි, ඒවා පවතින්නේ. ඒවා ශක්තිමත් නම් විරුද්ධ පාර්ශ්වයෙන් ඒවාට ඔයිට වඩා විවේචන ඉදිරිපත් වන බව ඔයිට වඩා ගල් වදින බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. විවේචන කරන්නට තරම්වත් දෙයක් ඒවායේ ඇත්තේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ අධිරාජ්‍යවාදී වගා ක්‍රමය නැති කිරීමට අවශ්‍ය වන අයුරින් කටයුතු කරන්නට ඕනෑ. මේ අය වැය ලේඛනයෙනුත් උත්සාහ කරන්නේ ධනවාදීන්ගේ ආර්ථික ක්‍රමයේ හැටියට මේ රටේ ඉදිරි ගමන යාමටයි. මේ රටේ වැඩි ජනතාව බඩගින්නේ වේලි වේලී දුක් සුසුම් හෙලද්දී අතලොස්සක් පමණ වූ ධනපති පිරිස සැප සම්පත් වළඳිමින් ඉදිරි ගමන යන්නට බලාපොරොත්තු වෙනවා. ලබන අවුරුද්දේ අය වැය ලේඛනය මේ රටේ හොඳම සමාජවාදී අය වැය ලේඛනයක් වේවායි, දුක් විඳින ගොවි කම්කරු ජනතාව සුඛිත මුදිත කිරීමට හැකියාවක් ඇති අය වැය ලේඛනයක් වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

හාල් සේරුවක් ශත 85 ට අරගෙන නිකම් දෙනවාය, ඒක මදිද කියා එක මන්ත්‍රීවරයකු කථා කරන විට ඇසුවා. ඇත්ත වශයෙන්ම මේ වාගේ විලි ලජ්ජා නැති කථාවලින් මහජනයා මුළා වන්නට පුළුවන්. ඒ නිසා සත්‍යය කුමක්ද යන්න පහදා දෙන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, ශත 85 කට එක හාල් සේරුවක් ගෙනෙනවා නම් හාල් සේරු දෙකම 1.70 ක් වෙනවා. පසුගිය ආණ්ඩුව දුන්නා වගේ හාල් සේරු දෙකම ශත 50 ට දුන්නොත් මේ ආණ්ඩුවට 1.20 ක අලාභයක් විඳින්නට සිදු වෙනවා. දැන් එක හාල් සේරුවක් නිකම් දීමෙන් මේ ආණ්ඩුව ශත 35 ක ලාභයක් ලබනවා. ඔකයි, සැබෑ ප්‍රවෘත්තිය. ආණ්ඩුවට හාල් සේරු දෙකට 1.70 ක් වියදම් වන විට පසුගිය ආණ්ඩුව දුන්නා වාගේ හාල් සේරු දෙක ශත 50 කට දුන්නොත් 1.20 ක අලාභයක් සිදු වෙනවා. දැන් හාල් සේරුවක් ශත 85 කට ගෙන ඒ සේරුව නිකම් දීමෙන් එක මිනිහකුගෙන් එක සතියකදී ආණ්ඩුවට ශත 35 ක වාසියක් ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මේ විධියේ ප්‍රෝඩාවලින් තමයි, ජාතික රජය කියා ගන්නා මේ රජය මහජනතාව මුළා කරන්නේ. බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ද සිල්වා මයා.) කිව්වා බලපිටිය දිනුවේ වගා ව්‍යාපාරය නිසාය කියා. වගා යන වචනයේ “ව” යන්න වෙනුවට “ප” යන්න යොදා ඒ මන්ත්‍රීතුමා එම ප්‍රකාශය කළා නම් හොඳයි. රැකීරක්ෂා දෙනවාය කියා නොයෙක් බොරු පොරොන්දු දී, කරන්නට තිබුණු හැම දෙයක්ම කර, එක්සත් ජාතික පක්ෂයේ පමණක් නොව මුළු හත් හවුලේම බලය යොදවා ගෙන ගිය මැතිවරණ ව්‍යාපාරයක් එය. බලපිටියේ වගා ව්‍යාපාරයක් තිබුනේ නැහැ. ගරු මන්ත්‍රීතුමාට වැරදීමකින් වන්නට ඕනෑ, “ප” යන්න වෙනුවට “ව” යන්න යොදා ඒ ප්‍රකාශය කර ඇත්තේ.

පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී බලපිටියේ මන්ත්‍රීතුමා හාල් වීරයා වුණා. හාල් සේරු බාගයක් කපන්නට එකල සිටි මුදල් ඇමතිතුමා යෝජනා කළ අවස්ථාවේදී ඊට විරුද්ධව කථා කර හාල් වීරයා බවට පත් වී එතුමා ගමට ගියා. එසේ යන විට එක පාඨශාලාචාර්යතුමෙක් බාර්ලි බෝතල 4 බැගින් හොරෙන් දොළොස් පළකට යවා ඒ මන්ත්‍රීතුමා සඳහා දොළොස් පළක පිළිගැනීම් ඇති කළා. මල් මාලායි ඔරේන්ජ් බාර්ලි බෝතල් හතර බැගිනුයි දොළොස් පොළකට දී පිළිගැනීම් පවත්වා හාල් කැපීමට විරුද්ධ මහා වීරයා හැටියටයි එදා කථා කළේ. එහෙත් අද බලපිටියේ අය දහස් ගණනක් බඩගින්නේ සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලපිටියේ අයට ඔරුවේ යන්නට කලින් හාල් සේරු බාගයක පමණ බත් කන්නට ඕනෑ. ඊළඟට ඔරුවේදී කන්නට හාල් සේරුවක පමණ බත් මුලක් බැඳ ගන්නට ඕනෑ. මුහුදු ගිහින් ගෙදර ආවාමත් හාල් සේරු බාගයක පමණ බත් කන්නට ඒ අයට ඕනෑ. වාරකන් නැති, රක්ෂාව කරන කාලයට ඒ අයට දවසකට හාල් සේරු 2 ක් පමණ ඕනෑ කරනවා. බලපිටියේ ගරු මන්ත්‍රීතුමා කියනවා, හාල් කැපීම හොඳයි කියා. එහෙත් ඒ නිසා මේ රටේ දුප්පත් ජනතාවගේ බඩට ඉතා දැඩි ලෙස පහර වැදී තිබෙනවා. ඔවුන් අද ඉන්නේ දුක් සුසුම් මැදයි. මේ රජය තුවක්කුව බයිනෙත්තුව කෙලින් කර මර්දන නීති දමාගෙන ඉතා දරදඬු ලෙස රට පාලනය කළ නිසා මහජනතාව ඒ පුරුද්දට තවම ඉන්නවා. එහෙම නොවුණා නම් හාල් කැපීමේ රඟ බලා ගන්නට තිබුණා. මේ රජය විසුරුවා හැර මැතිවරණයක් සඳහා එළියට බැස්ස දවසට හාල් කැපීමේ රඟ මහජනයා පෙන්නාවි.

වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (පර්සි සමරවීර මයා.) කියනවා " බලමු, බලමු " කියා. එදාට එතුමාටත් පෙනේවි. ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ අයත් හිතන්නේ කොළඹ හතේ කුරුඳුවත්තේ අය හිතන පිළිවෙළටයි. මේ රටේ සාමාන්‍ය මහජනතාවගේ දුක් සුසුම්, දුක් හැඟීම්, ඔවුන් පෙළන වේදනාව, දුක, තේරුම් ගන්නට ශක්තියක් මේ රජයේ අයට තිබෙනවාය කියා මා හිතන්නේ නැහැ. එවැනි ශක්තියක් තිබෙනවා නම් මේ අන්දමට දුක් බර ජීවිත ගත කරන්නට මහජනතාවට අවස්ථාව සලසන්නේ නැහැ. මේ අන්දමට අවුරුදු 4 ක් ගත කිරීම ලෝක ඉතිහාසයේ පුදුම දෙයක්. වෙන රටක නම් මෙවැනි පාලකයින්ට උන් හිටි තැන් නැතිව යන්නට වෙනවා. වෙන රටවල නම් මෙවැනි පාලකයින් එල්ලා දමනවා. එහෙත් මේ රටේ පාලනය ගෙන යන්නේ බයිනෙත්තුවට මහජනතාව බය කර ගෙනයි. ඒ නිසා මේ අය තවමත් පාලනය කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, වගා ව්‍යාපාරය ගැන කියන විට මට එකක් මතක් වෙනවා. 1953-54 වන විට මේ රටේ අල ව්‍යාපාරය ගැනයි මට මතක් වුණේ. වැලිමඩ ගරු මන්ත්‍රීතුමා බොහොම විශාල අලකාරයෙක්. 1953-54 වන විට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව මගින් මේ රටේ අල ව්‍යාපාරය නැත්නම් අල වගාව සම්පූර්ණයෙන්ම නතර කර දැම්මා. [බාධාකිරීමක්] අල වවන උදවිය නොවෙයි අල කන උදවිය ගැනයි කථා කරන්නේ. මේ උදවිය අල වවනවා කිය කියා අල වගාව කන නිසයි මා ඒ ගැන කථා කරන්නේ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

අල කන්නේ නැතිව අපි ගිහින් තේ ටිකක් බොමු.

The Sitting is suspended till 4.30 P.M. On resumption the Hon. Deputy Speaker will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 4.30 மணி வரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று உப சபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ පානය සඳහා විසිර යන්නට කලින් මා කියමින් සිටියේ අර්තාපල් වගාව ගැනයි. එක් කාලයකදී අර්තාපල් ඉංග්‍රීසිකාරයන්ගේ නැත්නම් ඕස්ට්‍රේලියන් කාරයන්ගේ ආහාරයක් හැටියට සලකන්නට පුළුවන්කම තිබුණා. ඔවුන්ට ලාභයට අර්තාපල් සැපයීම සඳහා ඒ කාලයේ මේ රටේ අර්තාපල් වගාව දියුණු කෙළේ නැහැ. ඩඩ්ලි සේනානායක මහතාගේ ආණ්ඩුව 1953 දී අර්තාපල් වගා කිරීම නවත්වා දමා රහංගල ගොවිපල වසා දැමූ බව මට මතකයි. 1956 න් පසුව සී. පී. ද සිල්වා ඇමතිතුමාට මේ වගාව පටන් ගන්නට පුළුවන්කම තිබුණත් එතුමා ඊට ඉදිරිපත් නොවී ඒ වෙනු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වට ඇපල් වවන්නට පටන් ගත්තා. 1962 වන විට අල වගාව සම්පූර්ණයෙන්ම නැති වී තිබුණා. ඒ කාලයේදී අල වගාව නැති කිරීම සඳහා කඩාකප්පල්කාරීන් පිරිසක් සිටියා. ඒ කඩාකප්පල්කාරීන් කවුරුන්දැයි වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (පර්සි සමරවීර මයා) දන්නවා ඇති. අද බීජ අල ගබඩාව භාරව සිටින කෙනකු එදා අල වගාව කඩාකප්පල් කිරීමට ක්‍රියා කළ අතර එදා අල වගා කළ බිම් ප්‍රමාණය අක්කර 9 දක්වා අඩු වී තිබුණා. අල වගාව සම්පූර්ණයෙන්ම විනාශ වී යන්නට කටයුතු යෙදී තිබුණු අවස්ථාවේදී දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් පත් වීම හේතු කොටගෙන නැවත ඒ වගාවට පණ ලැබුණා. රෝග නැති බීජ අර්තාපල් ගෙන්වා මහජනයා අතර බෙදා හැර ඒවා වගා කිරීම සඳහා මහජනයා අතර විශාල උනන්දුවක් ඇති කිරීමට එතුමා ක්‍රියා කළා පමණක් නොව කඩාකප්පල්කාරීන් පළවා හැරියා. තණ කොළ කැපීම සඳහා යවන්නට සුදුසු යයි බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ද සිල්වා මයා.) විසින් සඳහන් කරන ලද ඒ දොම්පේ ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද සේවය නිසයි, අද අර්තාපල් වගාව පිළිබඳව මහ උජාරුවට කතා කරන්නට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට පුළුවන් වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිරිස් වගාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මහ හයියෙන් කෑ ගහනවා. හොඳයි, 1964 දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබුණු මිරිස් අක්කර ප්‍රමාණය 1969 දී අද තිබෙනවාදැයි මා ඒ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රශ්න කරනවා. සංඛ්‍යා ලේඛන අනුව මිරිස් වගා වූ අක්කර ප්‍රමාණය අද එදාට වඩා අඩුයි. වගාව වැඩි දියුණු කරනවා යයි අද මහ ලොකු පුරසාරම් දෙඩුවත්, කෑ ගසන්නේ නැතිව, ගුවන් විදුලිය මගින් බෙරිහන් දෙන්නේ නැතිව, පුවත්පත්කාරයන්ගේ පන්දම් ඇල්ලීමක් නැතිව වගාව සම්බන්ධයෙන් සැහෙන දියුණුවක් ඇති කිරීමට එදා ක්‍රියා කළ බව අමතක කරන්නට බෑ.

වගාව පිළිබඳව අද තිබෙන තත්ත්වය තවත් අතකින් පෙන්වා දෙන්නට ඕනෑ. අද වැව් බැඳීම කරගෙන යනවා. ඒ කාලයේ දී නම් ඒ කටයුතු කෙළේ ටෙන්ඩර් කැඳවා වුවත් අද "චේම්බර් ඔෆ් කොමර්ස්" ආයතනයට ඒ වැඩ කොන්ත්‍රාත් දී තිබෙනවා. ඒ ආයතනය උප කොන්ත්‍රාත්කාරයන් අල්ලා ගෙන වැඩ කරගෙන යනවා. අද වැව් බැම්වලට පස් යන්තමින් දමා, යන්තමින් හරි ගස්සනවා. යන්තම් පස් දමනවා මිස ඒ දමන පස් තලන්නේ නැහැ. ජාතික ධනය වියදම් කර අනාගත පරපුරේ ප්‍රයෝජනය සඳහා මේ වැව් සකස් කරන කොට ඒවා කාලයක් පවතින අන්දමට සකස් කළ යුතු බව අමුතුවෙන් කියන්නට වුවමනාවක් නැහැ. එහෙත් ඒ වැඩේ හරියාකාර ලෙස සිදු වන්නේ නැහැ. වැව් කණ්ඩි සකස් කරන විට, ඒවා කෙසේ සකස් කරනවාදැයි ආණ්ඩුවේ නිලධාරියකු ගොස් සොයා බලන්නේ නැහැ. එය මැද්දෙන් ට්‍රැක්ටරයක් ගමන් කරවන්න දෙන්නේ නැහැ, ඒවා තැළෙන නිසා. යම්තම් පස් පුරවා වැව් කණ්ඩි හරිගස්සා කොන්ත්‍රාත්කරුවන් තමන්ගේ ගනමනාව බේරා ගන්නවා. රටේ ආර්ථික තත්ත්වයට මොනවා වුණත් ඔවුන්ට කමක් නැහැ. තමන්ට ලැබෙන ගනමනාව නිසා සමහර නිලධාරීනුත් ඒවා නුදුටුවන් සේ ඇස් පියාගෙන සිටිනවා. ඒ **කොහොම වුණත්, මේ රජය** කොයි තරම් කෑ ගැහුවත්, අයවැය ලේඛනවලින් මුදල් වෙන් කළත් වගා ව්‍යාපාරය සාර්ථක තත්ත්වයට ගෙන එන්නට තවමත් බැරි වී තිබෙනවා.

ගිං ගඟ යෝජනා ක්‍රමය සම්බන්ධයෙනුත් වචන ස්වල්පයක් කිව යුතුව තිබෙනවා. ගිං ගඟ යෝජනා ක්‍රමය පටන් ගන්නට යන බවට හිනිදුම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි මයා.) ප්‍රකාශයක් කර තිබෙනවා. බෙන්තර-ඇල්පිටිය අතුරු මැතිවරණ කාලයේදීයි—1966 ඔක්තෝබර් මාසයේදී—ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා එක වේලකට මුල් ගල් තබා ආවේ. ගිං ගඟට වඩා විශාල ගංගාවන් මිනිසුන් තමන්ගේ ප්‍රයෝජනයට උචිත පරිද්දෙන් සකස් කරගෙන තිබෙනවා. අපේ රටේම සමහර පළාත්වලට නිසි පරිදි වතුර නොලැබීම නිසා ගොවිතැන් පාළු වී ගිය අවස්ථා කොතෙකුත් අහන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබෙනවා. එසේම තවත් සමහර පළාත් වලට ගංවතුර ගලා ගෙවල් දොරවල් කඩා ගෙන ගිය අවස්ථාත් අනන්තවත් තිබෙනවා. අවුරුදුපතා ගිං ගඟ ගැලීම හේතු කොටගෙන ඒ ගඟ අසබඩ වාසය කරන මිනිසුන්ට රුපියල් කෝටි ගණනින් පාඩු වී තිබෙනවා. ගිං ගඟ ඇති වුණේ කවදාද, එදා සිටම අවුරුදුපතා ඔය ගංවතුර ගැලීමත් සිදු වෙනවා. අප පුංචි කාලයේ සිට මේ වන තුරු එසේ ගංවතුර ගැලීම නිසා ජන ජීවිතයට වූ පාඩුව රුපියල් කෝටි ගණන කට වැඩියි. එසේ ජන ජීවිතයට විශාල හානි ගෙන දෙමින් අපතේ යන මහා ජලස් කන්ධය ජාතියේ සුබ සෙත සඳහා යොදා ගන්නට පුළුවන් ක්‍රම තිබෙනවා. එහෙත් එවැන්නක් නොකර මේ රජය කරන්නට යන්නේ අතිසාරයට අමුඩය ගහන්නා වාගේ දෙයක්.

පසුගිය රජය විසින් ඉතා ප්‍රයෝජන වත් යෝජනා ක්‍රමයක් සකස් කර තිබුණත්, ඒ යෝජනා ක්‍රමය ඉවත දමා කොහෙත්ම සාර්ථක නොවන යෝජනා ක්‍රමයකුයි, මේ රජය දැන් ක්‍රියාත්මක කරන් නට අදහස් කරන්නේ. ගඟ දෙපස වාසය කරන ප්‍රගතිශීලීන්ගේ ගෙවල් කඩා බිඳ දමන්නට සිදු වන ආකාරයට ගඟ දෙපස වේලි බඳින්නට මේ රජය අදහස් කරනවා. එසේ ගඟ දෙපස වේලි බැඳීමෙන් ජල ගැලීම් වළක්වන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. වතුර එක්රැස් කර, එයින් විදුලිය නිපදවා නොයෙකුත් ප්‍රයෝජන ගන්නට පුළුවන් යෝජනා ක්‍රමයකුයි, පසුගිය රජය මගින් සකස් කර තිබුණේ. අතිසාරයට අමුඩය ගැසීමක් බඳු මේ වේලි බැඳීම ජාතික ධනයත්, ශ්‍රමයත් අපතේ යැවීමක් බව කණගාටුවෙන් නමුත් ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. මේ යෝජනා ක්‍රමයට ගිං ගඟ දෙපස වාසය කරන මුළු මහත් ජනතාවම සිය විරුද්ධත්වය පළ කර තිබෙනවා. මේ යෝජනා ක්‍රමයෙන් ගඟබඩ පත්තුවටවත්, ගිනිදූම් පත්තුවට වත් කිසිම සෙතක් සැලසෙන්නේ නැති බවයි, කාගේත් අදහස. රත්ගම ගරු මන්ත්‍රීතුමා (ඩී. ඊ. තිලකරත්න මයා.) පවා මේ යෝජනා ක්‍රමයට විරුද්ධ යයි මා හිතනවා. ආණ්ඩු පක්ෂයේ ඉන්නා ජනහිතකාමී මන්ත්‍රීවරුන් කවුරුනුත් පාහේ මේ යෝජනා ක්‍රමයට විරුද්ධයි. කිසිසේත් සාර්ථක නොවන මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස මා අවධාරණයෙන් ඉල්ලා සිටිනවා. මෙය මහ ජන මුදල් නාස්තියක් පමණයි.

මට තවත් කරුණු කීපයක් ගැන කතා කරන්නට තිබෙනවා. එහෙත් තමුන්නාන්සේ වැඩිදුර කතා කරන්නට එපාය කියන හෙයින් මා එතරම් දුරට කතා කරන්නට අදහස් කරන්නේ නැහැ. මේ වන විට අය වැය ලේඛන 5 ක් ඉදිරිපත් කළායැයි කියමින් උදම් අනන මෙම රජය 1966 දී ඉදිරිපත් කළ අයවැය ලේඛනයෙන් කීවේ මොනවාද ? සහල්, මිරිස්, රතු ලූනු, කිරි ආහාර වර්ග, කරවල, සිමෙන්ති, ගොවි උප කරණ සහ රෙදිපිළි යනාදිය මේ රටේම නිපදවන තැනට කටයුතු කර රට ස්වයං පෝෂිත කරනවායැයි එදා කිව්වා. එදා ගරු මුදල් ඇමතිතුමා කිව්වා මෙම අංශයන් ගෙන් රට ස්වයංපෝෂිත කිරීම මෙම ජාතික රජයේ එකම පරමාර්ථය බව. 1966 අවුරුද්දේ ඉදිරිපත් කළ අයවැය වාර්තා වෙන් ප්‍රකාශිත වූ එකම කරුණක්වත් ඉටු කරන්නට තමුන්නාන්සේලාට පුළුවන් වී තිබෙනවාදැයි මා ප්‍රශ්න කරනවා. මෙම රජයට මේ කියන කරුණුවලින් එකක්වත් ඉටු කරන්නට බැරි බව මා කියනවා. මේ අයට තව අවුරුදු 5 කට තබා අවුරුදු 20කට රට භාර දුන්නත් එන්න එන්නම රටේ දරිද්‍රභාවය වැඩි වෙනවා මිස, සාමාන්‍ය මහ ජනතාවගේ දුක දොම්නස වැඩි වෙනවා මිස, මෙම පොරොන්දු ඉටු කරන්නට පුළුවන්කමක් නම් ලැබෙන්නේ නැහැ. මේ අය මෙම අවසාන අයවැය වාර්තාව ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී මා ප්‍රාර්ථනය කරනවා, මේ රටේ රැකිරක්ෂා විරහිත සාමාන්‍ය තරුණ තරුණියන් වෙත ඇස් බැල්මක් හෙලන්නේ නැතුව ඉදිරි පත් කර ඇති කිසිදු වැදගැම්මකට නැති මෙවැනි අයවැය ලේඛන මින් ඉදිරියට කිසිම දවසක මේ රටේ ඇති නොවේවා කියා. එසේම මීළඟට ඉදිරිපත් වන අයවැය ලේඛනය මේ රටේ සාමාන්‍ය ගොවි කම්කරු ජනතාවට වැඩක් සැලසෙන පරිද්දෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]
ඔවුන්ගේ ජීවන තත්ත්වය හා ආත්ම ගරුත්වය නිසියාකාර වැඩිවී උසස් වී මතු වී යන පරිද්දෙන් සමාජවාදී රජයක් විසින් ඉදිරිපත් කරන අයවැය ලේඛනයක් වේවායි කියාත් මා පතනවා. එවැනි හැකියාවක් ඇතිවන අන්දමේ අයවැය ලේඛනයක් මී ළඟ වතාවේදී ඉදිරිපත් කරන්නට සමාජවාදී රජයකට පුළුවන් වේවායි නැවතත් ප්‍රාර්ථනය කරමින් නමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසාන කරනවා.

අ. භා. 4.43

**එම්. ඒ. ඩැනියෙල් මයා.** (හේවාහැට)
*(திரு. எம். ஏ. டனியல்—ஹேவாஹெற்ற)*
(Mr. M. A. Daniel—Hewaheta)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) විසින් පවත්වන ලද කතාවෙන් පසු වචනයක් දෙකක් කතා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඔගේ කථාව ආරම්භ කරන ගමන්ම මතක් කරන්නට සිදු වී තිබෙනවා, ජාතික රජයේ පස්වන අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇතිවුණු මෙම විවාදයේදී ඇතැම් මන්ත්‍රීවරු ඉදිරිපත් කර තිබෙන්නේ මේ අයවැය ලේඛනයට අදාල කරුණු නොවන බව. සමහර මන්ත්‍රීවරුන් කථා කළේ අනාගත මැතිවරණ වේදිකාවලදී කථා කරන පිළිවෙළටයි. කෙසේ වෙතත් මෙවැනි අවස්ථාවක දීවත් කථා නොකරනවා නම් ඒ උදවියගේ කථා පත්‍රවල වැටෙන්නේ නැහැ. මෙසේ කථා නොකළොත් කථා කරන්නට තමන්ට අවස්ථාවක් ලැබෙන්නේ නැති බව ඒ උදවිය දන්මම කල්පනා කර අවසානයි.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
එළියට බැහැලා බලන්න.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)
ළඟදී අපි එළියට යනවා, මෙම කරුණුත් එළියට දීලා.

ගරු මුදල් ඇමතිතුමා, මේවර පවත්වන ලද අයවැය කථාවේදී ඉතා පැහැදිලි ලෙස කිව්වා මීළඟට කරන්නට බලාපොරොත්තු වන වැඩ කටයුතු සැළැස්ම කර තිබෙන්නේ මෙන්න මේ මේ විධියටය යන්න. අනතුරුව එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් පැහැදිලි කර දුන්නා, පසුගිය කාල සීමාවේ දී යම් යම් ආයතනවලින් යම් යම් ක්‍රමවලට අනුව ලබා ගත් මුදල් යම් යම් දේ සඳහා යෙදෙව්වේ මෙන්න මේ මේ පිළිවෙළටය, ඒවායින් පල ලැබුණේ මෙන්න මේ මේ පිළිවෙළටය කියන කාරණය. ඒවායින් අපේ රටේ ජනතාව කොතරම් දුරට පල ලබා සිටිනවාද යන්න දැනගන්නටයි අප දැන් බලාපොරොත්තු වන්නේ. පසුගිය අවුරුදු හතර හමාරක කාලය තුළ මෙම රජය මගින් කර තිබෙන වැඩ කටයුතුවල ප්‍රතිඵල අපට දැන් පෙනෙනවා. විශේෂයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා එතුමාගේ කල්පනාව යොදවා මේ රට පරිහානියට යාමෙන් වළක්වාලීම පිණිස වගා ව්‍යාපාරය ආරම්භ කළා. ජාතික රජය අද වගා කටයුතු දියුණු කරගෙන යනවා. වගා ව්‍යාපාරය නමින් ජාතික රජය අද ලංකාවේ අස්සක් මුල්ලක් නැර වගා සංවර්ධනයේ යෙදී සිටින නමුත් විරුද්ධ පාර්ශ්වයේ උදවිය රට පුරා යමින් ප්‍රචාරය කරන්නේ කුමක්දැයි කල්පනා කරන්නට ඕනෑ. එතුමන්ලා අපේ වගා ව්‍යාපාරය සාර්ථක භාවය ගැන නොදන්නවා නොවෙයි. කොළඹ පතේ ජීවත් වන ගරු මන්ත්‍රීවරුන් සමහර විට මේ ගැන නොදන්නවා විය හැකියි. එතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරන්නට කැමතියි. කරුණාකර ගොඩේ ගම්මානවලට ගිහිල්ලා බලන්න. වගා ව්‍යාපාරයේ ප්‍රතිඵල කොයි තරම් දුරට සාර්ථක වී ඇද්දැයි එතකොට එතුමන්ලාටම අවබෝධ කර ගන්නට පුළුවන් වෙනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරැක්ටර් නැතැයි එක් ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා. පස සකස් කිරීම ආදී වැඩ සඳහා විරැක්ටර්යකට දවසකට ගෙවන්නට සිදු වන මුදල වැඩියයි එතුමාම ප්‍රකාශ කළා. විරැක්ටර්වල මිළත් වැඩියයි එතුමා සඳහන් කළා. මේවා අසා මට පුදුම හිතුණා. මෙවැනි දේ කියන ඕනෑම කෙනෙක් මහියංගනය වැනි ප්‍රදේශවලට ගියොත් නැවත වරක් මේ ගරු සභාව ඇතුළට ඇවිත් එවැනි කථාවක් නොකියනවාට මගේ හිතේ නම් කිසිම අවිශ්වාසයක් නැහැ. කැළෑ අක්කර ලක්ෂ ගණනින් තිබෙන ප්‍රදේශවල, ජාතික ආණ්ඩුවෙන් කර තිබෙන දේ බැලුවොත් මෙවැනි කථා කියන්නේ නැහැ. කැළෑ එළිකිරීම ආදි කටයුතුවලදී ජනතාවට පහසුකම් සපයා දී තිබෙන ආකාරය ගැන නොදන සිටීම කණගාටුදායකයි. පෝර සපයා දීමෙන්, ඒවා පාවිච්චි කරන සැටි කියා දීමෙන්, කෘමිනාශක බෙහෙත් වර්ග දීමෙන්, ඒවා යොදන ආකාරය පිළිබඳව උපදෙස් දීමෙන්, නිලධාරීන් යොදා ඔවුන්ගේ මාර්ගයෙන් වෙනත් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය හැම ආධාරයක්ම ලැබෙන්නට විධිවිධාන යෙදීමෙන් ජාතික රජය කර තිබෙන දේවල් කවුරුත් දැනගත යුතුව තිබෙනවා. ගම්මානවලට ගිහිල්ලා බැලුවොත් මේවා ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගන්නට පුළුවන් නොවේද? කරුණා කර ගිහිල්ලා බලන්න. අද වගා ව්‍යාපාරය ඉතාමත් සාර්ථක අන්දමින් කරගෙන යන බව මේ ගරු සභාවේදී ඉතාමත් ප්‍රීතියෙන් සඳහන් කරන්නට කැමතියි.

ජාතික රජය වගා ව්‍යාපාරයෙන් කරන්නට බලාපොරොත්තු වන්නේ විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා රට පාලනය කරමින් කළ දේවල් කරන්නට නොවෙයි. විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලා එදා බලාපොරොත්තු වුණේ ක්‍රමානුකූලව මේ ලංකාව බඩගින්නේ තබා ඒ මගින් ලංකාවේ ඒකාධිපති ආණ්ඩු ක්‍රමයක් ඇති කරන්නටයි. එහෙත් මේ ජාතික ආණ්ඩුව ඒ සියල්ලක්ම දැන් අනෙක් පැත්තට හරවා බඩගින්න නිවා දැමීමේ ව්‍යාපාරය ආරම්භ කර සාර්ථක ලෙස කරගෙන යනවා. ජාතික ආණ්ඩුව කරගෙන යන වැඩ දකින විට විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාගේ හිතට ටිකක් අමාරු වන බව පෙනෙනවා. ඒ ගැන අප කණගාටු වන්නේ නැහැ. එය අපේ සන්තෝෂයට හේතු වෙනවා. අපේ වගා ව්‍යාපාරය සාර්ථක ලෙස කරගෙන යෑමට විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාගේ ආධාරය අපට කිසිසේත් ලැබුණේ නැහැ. ජාතික ආණ්ඩුවට හැම අයුරින්ම උදවු උපකාර කළ නිලධාරි මණ්ඩලයට ජාතික ආණ්ඩුව කෘතඥතාව පළ කරනවා. රෑ දවල් නොතකා, ඒ දෙකේ වෙනස ගැන කල්පනා නොකර, අපේ අසහාය නායක අග්‍රාමාත්‍යතුමා ඇතුළු ජාතික ආණ්ඩුව පටන් ගත් ඒ වැදගත් ව්‍යාපාරයට අත හිත දී මේ රටේ වගා ව්‍යාපාරය නගා සිටුවීමට නිලධාරීන්ගෙන් විශාල සේවයක් ලැබුණු බව මතක් කරන්නට ඕනෑ. මේ රටේ පුරවැසියන් වශයෙන් ඒ උදවියටත් වුවමනා වෙලා තිබෙනවා මේ රටේ ආහාර වගාව සාර්ථක වෙනවා දකින්නට.

මේ අයවැය ලේඛනය, විරුද්ධ පාර්ශ්වය බලයේ සිටිද්දී ඉදිරිපත් කළ අයවැය ලේඛන හා සසඳන්නට පුළුවන්කමක් නැහැ. පසුගිය ආණ්ඩුව තිබුණු ඒ කාලයේදී වරින් වර මුදල් ඇමතිවරුන් මාරු වුණු ආකාරය අපට මතකයි. මුදල් ඇමතිවරුන් මාරු වන හැම විටකම වාගේ බඩු මිළත් වැඩි වුණා. ගිනිපෙට්ටියක මිළ එක දවසක යම් ප්‍රමාණයක් වී තිබුණද, පසුවදා බලන විට එය ශතයකින් වැඩි වී තිබුණු හැටි අපට දකින්නට ලැබුණා. පිටි ගැනත් වෙනත් බොහොමයක් දේවල් ගැනත් තිබුණේ එවැනි තත්ත්වයක්මයි. දිනෙන් දිනම එක ශතයකින් නමුත් බඩු මිල වැඩි වෙන්නට පටන් ගත්තා. අයවැය ලේඛනයක් ඉදිරිපත් කරන දිනය ළං වන විට ලංකාවේ අස්සක් මුල්ලක් නෑර කළුකඩ කාරයන් බඩු හංගන්නට පටන් ගන්නවා. හෙට අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට තිබෙනවා නම් අද දුප්පත් මිනිහෙකුට ලාම්පුතෙල් ටිකක් ගන්නට බැරි තත්ත්වයක් ඇති වෙනවා. මොකද? කළුකඩ කාරයෝ බඩු හංගනවා. ඒ අයට අනුබල ලැබෙනවා. ඒකයි එහෙම කරන්නේ. හෙට අයවැය ලේඛනය ඉදිරිපත් කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]

නට තිබෙනවා නම් අද ගිහිල්ලා ඉල්ලු වත්, ලූනු රාත්තලක් නැත්නම් මිරිස් රාත්තලක් පවා ගන්නට බැරි තත්ත්ව යක් එදා තිබුණා. එහෙත් අපේ ජාතික ආණ්ඩුවේ ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අයවැය ලේඛනය කළුකඩ මුදලාලිලා තර කරන අයවැය ලේඛනයක් නොවන බව ආඩම්බරයෙන් කියන්නට පුළුවනි. පොදු ජනතාවට කිසිම කරදරයක් නැතිව ජීවත් වන්නට අවකාශ ලැබෙන අන්දමට සකස් කරන ලද අයවැය ලේඛනයක් හැටියට මෙය කවුරුත් පිළිගත යුතුව තිබෙනවා. ඒ බව විරුද්ධ පාර්ශ්වයේ තමුන්නාන්සේලාටත් අවබෝධ වනු ඇති. එහෙත් ඒ බව ප්‍රසිද්ධියේ පිළිගන්නට නම් කැමති නැති බව අපට තේරුම් ගන් නට පුළුවනි.

මේ අයවැය ලේඛනය සම්බන්ධයෙනුත් එකක් කියන්නට තිබෙනවා. සිගරට් මිල ශතයකින් වැඩි වුණා තමයි. හැබැයි ලංකා වේ ජනගහනයෙන් කීයෙන් කී පංගුවක් ද සිගරට් බොන්නේ ? හතරෙන් එක පංගුවක්වත් සිගරට් බොනවාද ? මේ ගැන යම් කෙනෙක් පුරසාරම් දොඩනවා නම් එය නුවණට හුරු වැඩක් නොවෙයි. ශතයකින් වැඩි වීම අප කළ වරදකැයි කවුරුවත් කියන එකක් නැහැ. දුම්කොළ වගා කරන උදවියට ඒ වැඩි වන ශතයෙන් කොටසක් ලැබෙනවා. ඒ ගොවි මහත්වරුන් මේක පත්‍රයේ දැක අපෙන් ඇසුවා මෙයින් සුළු ලාභයක් අපටත් ලැබෙනවාද කියා. මා ඒ ප්‍රශ්නය මුදල් ඇමතිතුමාට දැම්මා. මුදල් ඇමතිතුමා කිව්වා, ඔව්, ගොවියන්ටත් ලැබෙනවාය කියා. එසේ නම් අය වැය ලේඛනයෙන්, දුම් කොළ වවන ගොවියා ටත් යම් කිසි වාසියක් සැලසෙන බව රහසක් නොවෙයි.

ජාතික රජයේ ව්‍යාපාර දැන් ක්‍රමානුකූල තත්ත්වයකට ඇවිත් තිබෙන නිසා අපට දැන් විශේෂයෙන්ම ආඩම්බර වෙන්න පුළු වනි. තමුන්නාන්සේලා එදා අපට භාර දුන්නේ හිස් භාණ්ඩාගාරයක්. ඒ නිසා අප බලාපොරොත්තු වූ ක්‍රම සම්පාදක වැඩ පිළිවෙළ උඩ අය වැය ලේඛන සකස් කිරී මේදී අපට අමාරුකම්වලට මුහුණ පාන්නට වුණා. ඒ අමාරුකම් ක්‍රමානුකූලව අඩු වී ගොස් මහජනතාව පිට තිබූ බදු බර එහෙම පිටින්ම අඩු කිරීමේ සැලැස්මක් සකස් කර ගන්නට පුළුවන් වීම ගැන අපි ආඩම් බර වෙනවා.

තමුන්නාන්සේලාගේ කාල සීමාවේදී යම් යම් කර්මාන්ත ආයතන ඇති කර තිබීම ගැනත් අපි ආඩම්බර වෙනවා. එහෙත් කර් මාන්ත පාඩුවට ගෙන ගිය යුගයක් තිබුණා. අපි ඒ පාඩුව ලාභ පැත්තට හරවා තිබෙන නිසා ඒ කර්මාන්ත ආයතන නොහොත් සංසථාවලින් දැන් ලාභ ලැබෙනවා. යම් දෙයක් අපි කරන්නේ පාඩු විඳින්නත් නොවෙයි, අධික ලාභ ලබන්නත් නොවෙයි. ගන්නා ලාභය ජනතාව අතර බෙදා දීම පිණිසයි. ඒ අනුව අප විදේශ ණය ලබා ගෙන ඇත්තේ ආණ්ඩුවේ සිටින මන්ත්‍රී වරුන්ටත් රජයේ නිලධාරීන්ටත් ෂෝක් කරන්න නොවෙයි. ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ජනතාවගේ ඕනෑ එපා කම් සඳහා ක්‍රියා කිරීමට බව මතක් කළ යුතුයි.

නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අය වැය ලේඛනයෙන් යෝජනා කර තිබෙන කරුණු සියල්ලම කෙසේ වෙතත් අඩක් වත් අපේ මේ කාල සීමාව අවසන් වන් නට කලින් සම්පූර්ණ කර දීමයි අපේ බලා පොරොත්තුව. සමහර ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා, පසු ගිය අවුරුදු හතරහමාර ඇතුළතදී අපේ ඉලක්කය සම්පූර්ණ වුණේ නැහැ කියා. ඇත්ත වශයෙන්ම අපි ආඩම් බරයි කියන්න, මේ ජාතික රජය විසින් කරන ලද වියදමේ ප්‍රතිඵල අපි බලා පොරොත්තු වූවාටත් වඩා ලැබී තිබෙන බව. ඒ ගැන මා සඳහන් කරන්නේ ඉතා මත් ප්‍රීතියෙන්. අපේ මේ ව්‍යාපාර ආරම්භ කිරීමේදී නා නා අයගේ උපදෙස් ලබාගන් නට අපට සිද්ධ වුණා. රෑ දාවල් නොබලා අපේ ඇමතිවරුන් ඒ නිලධාරි මහතුන් සමග සාකච්ඡා කර නියම පියවරවල් ගැනී මට බොහෝම උත්සාහ දරා තිබෙනවා. එහි ප්‍රතිඵල පෙනි පෙනී තිබියදී තමුන්නාන් සේලා ඒවාට හරස් කපමින් මහජනතාව මුළා කිරීමට තැත් කිරීම ශාප ලැබෙන අප රාධයක් බව මා සඳහන් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා තවදුරටත් කියන්න කැමතියි, අපි යම් දෙයක් බලාපොරොත්තු වූවා නම් ඒ බලාපොරොත්තු වූවාටත් වැඩියෙන් ඒ කටයුතු සඵල වී ඇති බව. අපේ ඉලක්කය සම්පූර්ණ කිරීම පිණිස, ජනතාවට හිරිහැර නොවන විධියට, ජනතාවගේ ඕනෑ එපාකම් ඉටු කර දෙමින් අපි හැකි තරම් දුරට, අපට පුළුවන් අන්දමින්, කටයුතු කරන බවත් ප්‍රකාශ කරන්න කැමතියි. ජනතාවගේ වුවමනා එපාකම් සියයට සියයක්ම ඉටු කර දීමට අපට හැකි වුණා. අපේ ව්‍යාපාර නිසා ලංකාවේ ජනතාව කිසිම කරදරයක් නැතුව සිටින අතර ඔවුන්ට තව දුරටත් උදව් උප කාර කරමින් ඔවුන් ආරක්ෂා කරගෙන ක්‍රමානුකූලව ජීවත් වීමට අවශ්‍ය කටයුතු ජාතික රජයෙන් ඉටු වෙනවා ඇති.

රැකීරක්ෂා ප්‍රශ්නය සෑම විටම මතු වන ප්‍රශ්නයක්. අපි දන් මේ සභා ගර්භයෙන් එළියට යන විට වුවද රැකීරක්ෂා පතා පැමිණ සිටින උදවියට මුහුණ දෙන්නට අපට සිද්ධ වෙනවා. රැකීරක්ෂා ප්‍රශ්නය තමයි ලංකාවට වැදී තිබෙන එකම හෙණය. මේ වාමාංශික බලවේගයන් එදා කෙළේ මොකක්ද? රැකීරක්ෂා ඉල්ලා එන අය උදේ සිට හැන්දෑ වන තුරුත්, හැන්දෑවේ සිට උදේ වන තුරුත් කඩදාසිවල පාප්ප ගෑමට දැම්මා. අපි උඹලාට රක්ෂා දෙන්නම් කිය කියා පාප්ප ගෑවෙව්වා. ඒ උදවිය හැමදාම පාප්ප ගෑවා. අන්තිමට ඒ පාප්ප ටික වේලුනාට පසුව අද අපි ළඟට ඇවිත් ඉන්නවා. අපි කිව්වා, ඒ මහත්වරුන් පස්සෙ ගියා නම් ඒ මහත්වරුන්ටම කියා ඒ පාප්ප ටික ගළවා ගන්නය කියා. මා හිතන්නේ නැහැ ඒ අයට කවදාවත් ඔලුව ඔසවන්න ලැබේවිය කියා.

නමුත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මෙම ජාතික රජය විසින් සකස් කර තිබෙන අධ්‍යාපන සැලැස්ම නියම අන්දමට ක්‍රියාත්මක කර ගැනීමට අපේ කාල සීමාව තුළදීම හැකි වුවහොත් මා ඉතාමත් ආඩම්බරයෙන් කියන්න කැමතියි, 1975 වන විට අපේ පස්සෙන් එන ළමයින් අපි පසුපස නැවිත් ඒ අය ලබා ගත් අධ්‍යාපනය අනුව නියම විධියේ රක්ෂාවල් ලබා ගන්නා බව. දනට සකස් කර ගෙන යන ජාතික අධ්‍යාපනය ක්‍රමය ක්‍රියාත්මක වූවාට පසු එවැනි තත්ත්වයක් මේ රටේ ඇති වෙන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වගේම තමුන්නාන්සේලා හිතනවා ඇති ඒ අධ්‍යාපන සැලැස්ම කොළඹට පමණක් සීමා වූවක්ය කියා. එහෙම නැත් නම් මහනුවරට පමණක්, ගාල්ලට නැත් නම් මාතරට පමණක් සීමා වූවක්ය කියා. නැහැ. ජාතික අධ්‍යාපන ක්‍රමයේ නියම ප්‍රතිඵල ලැබෙන විට දක්ෂ ළමයි අදක්ෂ ළමයි යන කොටස් දෙකම දක්ෂ ළමයින් හැටියට සකස් කිරීමට පුළුවන්කමක් ඇති වෙනවා. මේ රටේ දුක් දුක් විඳින ජනතා වට සේවයක් ලබා දීමට එවිට පුළුවන් වෙනවා. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම අමාරු දෙයක් වුවත් ජාතික අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වන විට අනාගත ළමයින්ට නියම රැකියාවක් ලබා ගැනීමට මාර්ග සැල සේවායි අපි ප්‍රාර්ථනා කරනවා. ඒ අතර තුර අප විසින් සකස් කරන ලද යම් යම් ආයතනවලට යම් යම් කර්මාන්තවලට සේවකයන් බඳවා ගැනීමෙන් රැකී රක්ෂා ප්‍රශ්නය තරමක් දුරට විසඳා ගැනීමට හැකි වෙනවා. විශේෂයෙන්ම කිරි මණ්ඩලය වැනි ආයතනවලට පමණක් නොව තවත් කොතෙකුත් එවැනි ආයතන තිබෙනවා.

පල්ලෙකැලේ විශාල ගොඩනැගිල්ලක් පිහිටුවා විශාල කර්මාන්ත නගරයක් ඇති කර එහි සිටින ජනතාවට මහඟු සේවයක් එයින් ලබා දී තිබෙනවා. ජාතික රජය මගින් අක්කර 5,000 ක් පමණ අරගෙන කර්මාන්ත නගරයක් ඇති කිරීමේ පර මාර්ථය උඩ, සැලැස්මක් ඇති කර වැඩ කර ගෙන යනවා. ඒ සැලැස්ම අද තමුන් නාන්සේලාගේ කොළඹ නගරය සකස් කර තිබෙන සැලැස්ම වගේ නොවෙයි. කොළඹ නගරය සැලැස්මක් ඇතිව බිහි වුණ නගරයක් නොවෙයි. නිකම්ම බිහි වුණ නගරයක්. මහනුවර නගරයත් සැලැස්මක් ඇතිව බිහි වුණ නගරයක් නොවෙයි. නමුත් නියම සැලැස්මක් ඇතිව පල්ලෙකැලේ කර්මාන්ත නගරයක් ඇති කිරීමට කර්මාන්ත පුරයක් ඇති කිරීමට මේ ජාතික රජයෙන් කටයුතු කරගෙන


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩැනියෙල් මයා.]

යනවා. නියම සැලැස්මක් සකස් කර එහි පළමු පියවරත් අවසාන බව තමුන්නාන්සේට මතක් කර දෙන්න ඕනෑ. විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට මා ආරාධනා කරනවා, පල්ලෙකැලේ පැත්තට ගොස් මෙම කර්මාන්ත නගරය නරඹා එන්නය කියා. එවිට ඒ අයට අවබෝධ කරගන්න පුළුවන් වේවි, ජාතික රජය විසින් මේ තරම් ධනස්කන්ධයක් වියදම් කර තිබෙන්නේ මොකටද කියා. මේ රටේ රැකිරක්ෂා ප්‍රශ්නය විසඳීමට එම කර්මාන්ත නගරයෙන් හැකි තරම් ආධාර දී තිබෙනවා. එහි ප්‍රතිඵල අනාගත දරු පරම්පරාවට ලබා ගත හැකි වෙනවාට කිසිම සැකයක් නැහැ. පල්ලෙකැලේ විශාල නගරයක්. යථා කාලයේදී තමුන්නාන්සේලාට පුළුවන් වේවි, ගුවනින් හෝ ගොස් එහි සිරි නරඹන්න. ඒ කාලය ඒ තරම් ඈත නැහැ. ඉතාමත් කෙටි කාලයකින්ම ඒ තත්ත්වය දැක ගැනීමට හැකි වේවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ නා නා ජාතීන් වාසය කරනවා. ඒ ජාතීන් සමග සම්බන්ධකම් ඇති කර ගෙන පටන් ගත්ත මේ රජය තමුන්නාන්සේලා වැනි කඩාකප්පල්කාරීන් එකතු වී නැති කර දමන්න හදනවා. තමුන්නාන්සේලා සූදානම් වන්නේ අපටත් කන්න නොදී තමුන්නාන්සේලාටත් කන්න නැති තත්ත්වයක් ඇති කිරීමටයි. පෙඩරල් වාදීන් විසින් අපේ සිංහල ජනතාව අද දෙකඩ කරන්න හදනවා. සිංහල ජනතාවගේ අයිතිවාසිකම් එහෙම පිටින්ම උදුරා දමන ජාතියක් බවට පෙඩරල්වාදීන් අද පත්ව සිටිනවා. තමුන්නාන්සේලා දන්නවා ඇති ඔය පෙඩරල්වාදීන් මේ රජයෙන් ප්‍රයෝජන ලබාගෙන මේ රජය ඉල්ලීම් ඉටු කරන්නේ නැත කියා යාපනයට ගොස් රජයට දොස් කියනවා. ඔය පෙඩරල්වාදීන් තමුන්නාන්සේලාගේ පැත්තට ගත්තොත්—

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අපට ඕනෑ නැහැ.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

චුවමනා නැත්නම් ඔය පිටිපස්සෙන් තබා ගෙන සිටින්නෙ කකුල් රත් වෙන්න ද? මම තමුන්නාන්සේලාට කියන්න කැමතියි ඔය පෙඩරල්වාදීන් යම් දවසක තමුන්නාන්සේලාගේත් බෙල්ල කපන්න බැරි නැහැ. ඒ නිසා මා තමුන්නාන්සේලාගෙන් එක් ඉල්ලීමක් කරනවා. පෙඩරල් පක්ෂය යම් දවසක කුමන රජයකට බැඳුණත් අවුරුදු පහේ නිල කාලය අවසාන වන්නට පෙර ඒ රජයේ බෙල්ල කපන ව්‍යාපාරයක් ගෙන ගියා. නමුත් ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ නායකත්වයෙන් වූ අපේ ජාතික රජය ඒ බෙලි කැපීම්වලට ඉඩක් තැබුවේ නැහැ. ජාතිය විකුණුවේ නැහැ. ජාතිය උකස් කළේ නැහැ. අපේ අගමැතිතුමා ජාතිය ආරක්ෂා කරගෙන ජාතියේ උන්නතිය සඳහා එතුමා බලාපොරොත්තු වූ ආකාරයටම සම්පූර්ණ කාල සීමාව තුළම පාලනය ගෙන යනවා. ළඟදීම මහජනතාව ඉදිරිපිටට යන්නට අප බලාපොරොත්තු වෙනවා.—[බාධා කිරීමක්] පිටි පස්සෙන් සිටින නිසා එතුමන්ලා තමුන්නාන්සේලාට හොර ගිවිසුම් ගැන ප්‍රකාශ කරාවි. අවසාන වශයෙන් ගරු මුදල් ඇමතිතුමාගේ මේ අය වැය ලේඛනයෙන් ලංකා වාසී ජනතාවටත්, ලංකාවේ සුභ සිද්ධිය ප්‍රාර්ථනා කරන ලෝකයේ යම් ජනතාවක් වෙසෙනවා නම් ඒ ජනතාවටත් සෙතක්ම වේවායිද, ලංකාවේ සුඛිත මුදිත තත්ත්වයක් ඇති වේවායිද මා ප්‍රාර්ථනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்தை)*
(Dr. Colvin R. de Silva—Agalawatta)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් තමුන්නාන්සේ මූලසුනේ සිටින විට තමුන්නාන්සේට ගරු කිරීමක් වශයෙන් ඉංග්‍රීසියෙන් කථා කරන පුරුද්දක් මා තුළ තිබෙනවා. නමුත් මේ අවස්ථාවේදී මට සිංහල භාෂාවෙන් කථා කරන්නට හේතූන් කීපයක් තිබෙන බව තමුන්නාන්සේට මතක් කරන්නට සතුටුයි. මේ අයවැය ලේඛන විවාදයේදී ආණ්ඩු පක්ෂයෙන් ඇමතිතුමන්ලා විසින් පවත්වන ලද ප්‍රධානතම කථා තුන ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වා තිබෙන බව මට පෙනී ගියා. මුදල් ඇමතිතුමා සිය කථාව කළේත් ඉංග්‍රීසි භාෂාවෙන්. ඊළඟට හිටපු මුදල් ඇමතිවරුන් දෙදෙනෙකු—රාජ්‍ය ඇමතිතුමා සහ නිවාස ඇමතිතුමා—ආණ්ඩුව වෙනුවෙන් ප්‍රධාන කථා දෙකක් පවත්වා තිබෙන්නේත් ඉංග්‍රීසියෙන්. ඒ පිළිබඳව මා කණගාටු වෙනවා. ඊට හේතුවක් තිබෙනවා. මේ කාලයේ අපේ හැන්සාඩ් වාර්තා පොත් ලංකාව පුරා සිටින ඉංග්‍රීසි භාෂාව නොදන්නාවූ හෝ හරියාකාරව නොදන්නාවූ, නමුත් තම මව් භාෂාව පිළිබඳව ඉතා හොඳ දැනුමක් තිබෙන උදවිය කියවනවා. ඒක මා දන්නා වූ කාරණයක්. අප මෙතැන කථා කරන්නේ අප ඉදිරිපිට සිටින උවියට නම් අප කථා කරන්නේ බොහොම සුළු පිරිසකටයි. මේ ගරු සභාව තුළ සිටින්නාවූ අප පමණක් නොව අප පවත්වන කථාවලට සවන් දෙන්නට මේ ගරු සභාවට පැමිණ සිටින මහජනතාවගේ සංඛ්‍යාවත් බොහොම සුළුයි. මේ ගරු සභාවේ කෙරෙන කථා ගැන දැනුමක් ලබා ගන්නට වුවමනා කරන අය එම දැනුම ලබා ගන්නේ හැන්සාඩ් වාර්තාව කියවීමෙනුයි. වඩා හොඳින් නියම අවබෝධයක් ලබා ගන්නට පත්‍රවලටත් වඩා කියවන්නේ හැන්සාඩ් වාර්තාවයි. පත්‍රවල පළ කරන්නේ සාමාන්‍යයෙන් ප්‍රසිද්ධ කළ යුතුය කියා ඔවුන් සිතන දේවල් පමණයි. සමහර අවස්ථාවලදී—වැරදීමකින් වෙන්නට පුළුවනි ; නැත්නම් නොතේරෙනකම නිසා වෙන්නට ඇති—ප්‍රසිද්ධ කරන්නේ අප නොකී දේවල්. නමුත් මෙතැන අපේ කථා වැරදි නැතිව වාර්තා කරන්නට ලක්‍ෂ ලේඛකයින් සිටිනවා. හැන්සාඩ් වාර්තාවට මව් භාෂාවෙන් කථාවක් ඇතුළු වූවා ම එය විශාල ජනකායකට කියවීමට ලැබෙන නිසා, දැනගැනීමට ලැබෙන නිසා, මා ඉතා ඕනෑකමින් සිංහල භාෂාවෙන් කථා කරන්නට උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් බැරෑරුම් ප්‍රශ්නයක් අප ඉදිරිපිට තිබෙනවා. ඒ සම්බන්ධව කථා කරන විට මට ප්‍රථමයෙන් කථා කළ හේවාහැට ගරු මන්ත්‍රීතුමා (ඩැනියෙල් මයා.) මට සමාව දෙන්නට ඕනෑ, එතුමාගේ කථාව ගැන මා කිසිම සඳහනක් නොකරනවා නම්. ඊට හේතුව, අපට දී තිබෙන කාල සීමාව අප පුළුවන් තරම්ම ප්‍රයෝජනවත් විධියට පාවිච්චි තුළ යුතු වීමයි. එම නිසා මා විශේෂයෙන්ම මගේ කථාව ගරු රාජ්‍ය ඇමතිතුමාගේත්, නිවාස ඇමතිතුමාගේත් කථාවලට එල්ල කරනවා. ඒ දෙදෙනාම හිටපු මුදල් ඇමතිවරුන් බව මා නැවත මතක් කරන්නට ඕනෑ. එක්කෙනකු මුදල් ඇමති වශයෙන් තම ඉතිහාසය සම්පූර්ණ කෙළේ අනෙක් එක්කෙනා පටන් ගත් තැනින්. අද සිටින ගරු රාජ්‍ය ඇමතිතුමා එදා මුදල් ඇමතිවරයා වශයෙන් ඉතිහාසය අවසාන කළේ හාල් මිල නග්ගලායි. ඇමතිතුමා එදා මුදල් ඇමති වශයෙන් සිය කාලය පටන්ගත්තේ එකී හාල් මිළ නැග්ගීමෙන් රජයට මුදල් අතින් ලැබෙන වාසිය ගරාගෙනයි. මේ දෙදෙනා අතරේ දේශපාලන වශයෙන් නම් විශාල පෙරළියක් වුණු බව අද මතක් කළ යුතුයි. 1953 අගෝස්තු මස 12 වන දත් 13 වන දත් ජනතාව මහා හර්තාලයකින් එදා සිටි අදත් සිටින අගමැතිතුමාගේ පුටුව පෙරළා දැම්මා. ඒ තැනට අප දන්නා වූ මාර්ග වලින් අවුරුදු දෙකක් අගමැතිකම් කළ ශ්‍රීමත් ජෝන් කොතලාවල මහත්මයා පැමිණ අගමැති වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාවෙහි, හාල් සේරුව කැපීමේ ප්‍රශ්නය ගැන වචනයක් කියැවී තිබෙනවා. ඒ ගැන මා කියන්නේ එක් කරුණක් පමණයි. හදිසි නීති ක්‍රමය දවස් 1,000 කට වැඩි යෙන් මේ රටේ පවත්වමින් එය රටේ සාමාන්‍ය නීති රාමුව බවට පත් කළ ආණ්ඩුවක් වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම ගැන කථා කිරීමට රාජ්‍ය ඇමතිතුමාටවත් යුතුකමක් නැහැ. ඒ ගැන මා මීට වැඩි යමක් දැන්ම කියන්නේ නැහැ. ඊට වඩා වැදගත් කරුණු කීපයක් තිබෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවෙන් ඔහු විසින්ම ඉතා වැදගත් යයි කියැවුණු ප්‍රශ්න වගයක් මතු කළා. අය වැය ලේඛනය සකස් කිරීමේ ආකාරය ගැන මූලික ප්‍රශ්න වගයක් මතු කළ රාජ්‍ය ඇමතිතුමා අලුත් විධියකට අය වැය ලේඛනය සකස් කිරීම සඳහා මේ සභාවේ දෙපැත්ත එකතු වී අප රටේ ව්‍යවස්ථාත් වෙනස් කරමින් නීති රාමුව හරිගස්සන්න ඕනෑ යයි ඇත්තටම ඉල්ලීමක් කළා. ඒ මගින් කිසියම් කරුණු වගයක් මට අද ඉදිරිපත් කරන්නට ඉඩ තිබෙනවා. මෙම අය වැය ලේඛනය තුළ අය වැය ලේඛන හතරක් තිබෙන බව අපට එතුමා මතක් කළා. ඒ කථාව නම් මා ඇත්තටම පිළිගන්නේ නැහැ. කොටස් හෝ කාණ්ඩ 4 ක් වශයෙන් යම් යම් කරුණු ගැන, යම් යම් ප්‍රශ්න ගැන, කරුණු ඉදිරිපත් කිරීමේ පුරුද්දක් මුදල් ඇමතිවරයා තුළ තිබෙන්නේ වී නමුත්, රටේ අය වැය ලේඛනයේ ප්‍රධාන වශයෙන් පැති 4 ක් තිබෙන බවත් ඇත්තක් වන්නේ වී නමුත් අපේ අයවැය ලේඛනය තුළ ඇත්ත වශයෙන්ම අයවැය ලේඛන 4 ක් තිබෙනවා යයි මා කිසිසේත්ම පිළිගන්නේ නැහැ. ඒක එතුමා එක්තරා දේශපාලන වාසියක් බලාපොරොත්තුවෙන් කළ බෙදීමක් බව මා තව ටිකකින් පෙන්වා දෙන්නම්. මගේ විශ්වාසයේ හැටියට අපට මතක් කළ යුතු අය වැය ලේඛනය සෑදීමේ සහ එය අද තිබෙන තත්ත්වයට ගැළපෙන අන්දම වැනි මූලික ප්‍රශ්න ඒ බෙදීමෙන් සහ කථාවෙන් යටපත් කළා.

මුදල් ඇමතිතුමාට කිසි අපහාසයක් කිරීමේ චේතනාවක් නැතිව මා ඉතා කන ගාටුවෙන් මේ කාරණය මතක් කළ යුතුයි. මේ ආණ්ඩුව යටතේ නම් මුදල් ඇමති ධුරය මුදල් ප්‍රශ්නයේත්, ආර්ථික ප්‍රශ්නවලත් ඉතා සුළු ස්ථානයක් දරන බව මට ඔප්පු කළ හැකියි. ලෙහෙසියෙන් පහසුවෙන් කා වැදෙන කාරණයක් මට මේ සම්බන්ධයෙන් කිය හැකියි. අපේ මුදල් ඇමතිතුමාගේ අයවැය කථා පහම මම අහගෙන ඉඳ තිබෙනවා. ඒක මගේ යුතුකමක් සහ මා ඔහුට කරන්ට උත්සාහ කරන ගරු කිරීමක් බව මේ සභාවේදී කියන්නට කැමතියි. එහෙත් ක්‍රමානුකූලව මට වැටහී යන්නට පටන් ගත්තා, අවුරුදු පතා කරන්නාවූ මේ ජවනිකාවේ එන්ට එන්ටම කිසි අර්ථයක් නැතිව යන බව. මේ මුදල් ඇමතිතුමාගේ කථාවල භාෂාවේ හා රචනයේ ඇති ලක්ෂණ ගැන මගේ හිත ගියාට, ඔහුගේ කට හඬින් ඉඳ හිට අපේ හිත් ටිකක් ප්‍රීති කිරීමට කවටකම් කරන්නට ඔහු තුළ තිබෙන දක්ෂකම ගැන මා සන්තෝෂ වුණාට, ඔහුගේ කථාවෙන් කියන්නාවූ දේවල් ගැන ඇත්තටම ඔහුගේ වගකීමක් නැති බවත්, වගකීමක් තිබුණත් නොතිබුණත් අපේ රටේ මුදල් ප්‍රශ්න ගැන ගන්නාවූ ප්‍රධාන තීන්දු ගැනෙන්නේ මුදල් ඇමතිතුමා නොවන බවත් මට ක්‍රමයෙන් පැහැදිලි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ කාටත් මැතකදී පෙනී ගිය සිද්ධියක් තමයි, මේ ආණ්ඩුව මුදල් සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගන්නාවූ අවස්ථාවල මුදල් ඇමතිතුමා මෙතැන මොන විධියේ කථාවක් කළත් නැතත්, වෙනත් පුද්ගලයකු පත්‍රවල නියෝජිතයන් ඔහු වෙතට කැඳවාගෙන මේ පියවර ගැනීමේ අර්ථයත්, එය ගැනීමට හේතුනුත්, එයින් බලාපොරොත්තු වන ප්‍රතිඵලත් පත්‍රවල මුළු පිටුවක් තරම පිරවෙන තරමට විස්තර කරන බව. මෙතැන ඔහුගේ නම කිව්වට වරදක් නැහැ. අපේ රටේ ඇත්තටම මුදල් පාලනය කරන්නා සහ එහි භාරකාරයාගේ නම දැනගන්න එක හංගනවාට වඩා හොඳයි. ඒ මහත්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යාගේ නම ආචාර්ය ගාමනී කොරෙයා. සාමාන්‍යයෙන් අපි එයාගේ නම මෙතැන සඳහන් කරන්නේ නැති නිසයි, මම ටිකක් හිටව හිටවා නම කිව්වෙ. මේ ඊයෙ පෙරේදා එතුමා පත්‍ර නියෝජිතයන් කැඳ වමින් ආණ්ඩුව මුදල් අංශයෙන් ගත්තා වූ ප්‍රධාන පියවරවල් ගැන බොහොම ප්‍රවේසම්කාරී විස්තරයක් කර තිබුණු බව තමුන්නාන්සේලා අපට පත්‍ර මාර්ගයෙන් දකින්නට ලැබුණා. මේකෙ ඇත්ත මෙයයි. අපට මේක සඟවන්න ඕනෑ නැහැ. ඇත් තට අප මුහුණ දෙමු. අපට දැන් තිබෙනවා සැලසුම් සම්පාදනය කිරීමට දෙපාර්තමේන්තුවක්. ඒකේ ප්‍රධානයා තමයි ඒ මහතා. දැන් අපට වෙනමම තිබෙනවා මුදල් අමාත්‍යාංශයක්. අනික් අංශය මා දන්න තරමට අගමැතිතුමා යටතේ යි තිබෙන්නෙ. මගේ කල්පනාවේ හැටියට නම් කිසිම අනුමානයක් නැහැ, අද ඒ සැලැස්ම හදන අංශය මෙම මුදල් අංශය සම්පූර්ණයෙන්ම පාලනය කරන බවට. එතනයි වැදගත් තීන්දු ගන්නේ. මෙතැන උත්සාහ කරන්නෙ එතැනින් නටන්න කියන විධියට නැටීමටයි. එම නිසා එන්ට එන්ටම අයවැය ලේඛන ඉදිරි පත් කිරීම සහ ඒ පිළිබඳව කරන කථා, තත්ත්වයට ස්ථිරවම නොගැළපෙන ස්වභාවක් උසුලනවා. මෙම ආණ්ඩුව අවු රුදු දෙක තුනක කාලයක් තිස්සේ, මුදල් පිළිබඳව ප්‍රධානම තීන්දු ගෙන තිබෙනවා නම්, එසේ ගත්තේ අයවැය ලේඛන යෙන් පිටස්තරවයි. පසුව ඒ ගැන විස් තර වශයෙන් කථා කරන්න මා බලා පොරොත්තු වෙනවා.

අද මා ටිකක් සන්තෝෂ වෙනවා, මා සඳ හන් කළ ඇමතිවරුන් දෙදෙනා, හිටපු මුදල් ඇමතිවරුන් දෙදෙනා, අවුරුදු එකහ මාරක කාලයක් තිස්සේ අප ඉල්ලු දෙයක් ඉටු කර දෙන්න පොඩි උත්සාහයක් දරා තිබීම ගැන. එනම්, රුපියලේ කාසියේ වටිනාකම අඩු කිරීමෙන් ඔවුන් බලා පොරොත්තු වන ප්‍රතිඵල මොනවාද කියා පැහැදිලි කර දීමට උත්සාහ ගැනීමයි. එහෙන් මෙහෙන් වචනයක් තිබෙනවා. ඒ ගැන මාත් වචනයක් තව දුරටත් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විසත්ර කළ කාරණයට, නැති නම් ඇත්තට, මුහුණ පාමින් මේ අයවැය ලේඛ ගැන අප කථා කළොත් හොඳය කියා මා හිතනවා. ඒ අන්දමට කල්පනා කර, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාව නිසි රාමුවක් තුළට ඇතුළු කරන්නට මට පුළුවනි. ගරු රාජ්‍ය ඇමතිතුමා අපට කියනවා, අයවැය ලේඛනය ගැන කථා කරන අවස්ථාවේදී මතු වන්නාවූ ප්‍රධාන ප්‍රශ්න තුනක් ගැන අප ඇත්තටම වැඩිය කථා කරන්නෙ නැත, ඒ ගැන කියන්න අමතක වෙනවාය කියා. එමෙන්ම අප සාමාන්‍යයෙන් සාකච්ඡා කරන්නෙ අපට ඉදිරිපත් කරන එක් පැත්තක් ගැන පමණයි කියා සඳහන් කළා. මා දන්නෙ නැහැ, ඔය අදහස කෙසේ ඇති වුණාදැයි කියන්නා. ගරු රාජ්‍ය ඇමති තුමා කියනවා අයවැය ලේඛන එකක් නොවෙයි හතරක් තිබෙනවාය කියා. ඒ හතර ගැන මෙන්න මේ විධියට විස්තර කළා.

පළමුවැන්න :

" ..the current revenue and expenditure budget which one would call a rupee budget. "

ඒ කියන්නේ අප කොපමණ එදිනෙදා වියදම් කරනවාද, කොපමණ ආදායමක් ලබනවාද කියන ප්‍රශ්නය පිළිබඳව වූ අය වැය ලේඛනයයි.

දෙවැන්න :

" There is now a detailed foreign exchange budget."

විදේශ විනිමය පිළිබඳව විස්තර සහිතව ඉදිරිපත් කරන අයවැය ලේඛනයක්. ඒ ගැන සඳහන් කළ කාරණා දැන් මතු කරන්නෙ නැහැ, තව ටිකකින් කියන්නම්. තුන් වැනිව අපට පිටරටවලින් ආධාර වශ යෙන් ලැබෙන මුදල් පිළිබඳව අය වැය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ලේඛනයක්—a foreign aid budget—තිබෙනවාය කිව්වා. 4 වැනිව අයවැය ලේඛනයෙන් ඇති වන හිඟය පිළිබඳ අය වැය ලේඛනයක්—deficit budget—තිබෙනවාය කිව්වා.

මේ විධියට බෙදීමෙන් පහසුකම් තිබෙන බව ඇත්තයි. එහෙත් මේ විධියට බෙදීමෙන් සැබෑ ප්‍රශ්නය යට වන්නට ඉඩ නොදිය යුතු බව මගේ හැඟීමයි. අයවැය ලේඛනයකින් මුදල් ඇමතිතුමා බලාපොරොත්තු වන්නේ කුමක්ද යන ප්‍රශ්නය යට අපි මොහොතක් හිත දෙමු. අයවැය ලේඛනය පිළිබඳව අප යම් කිසි අවබෝධයක් ලබා ගන්නට නම් අප පළමුවෙන්ම දැන ගන්නට ඕනෑ, ඒ ආණ්ඩුව අයවැය ලේඛනය නමින් ඉදිරිපත් කරන ලේඛනයෙන් කුමක් ඉෂ්ට කරන්නට උත්සාහ කරනවාද යන කාරණය. ඒ ඉෂ්ට කරන්නට උත්සාහ කරන දෙය—අයවැය ලේඛනයේ පරමාර්ථය හෙවත් අරමුණ ඉෂ්ට කිරීම සඳහා, ආණ්ඩුවට ආදායම් වශයෙන් ලබා ගන්නට පුළුවන් මුදල් කෙසේ පාවිච්චි කරනවාද යන කාරණයයි, මගේ විශ්වාසයේ හැටියට අයවැය ලේඛනයකින් තීන්දු විය යුත්තේ. ඔය විධියට කල්පනා කර බැලුවොත් 4 පැත්තකින් අයවැය ලේඛන 4 ක් සෑදීම සඳහා වෙන් වෙන්ව කටයුතු කිරීමට කල්පනා කිරීම වැරදි බව මට පැහැදිලි වෙනවා. මෙතැනදී මතක තබා ගත යුත්තේ කුමක්ද? අපේ නිවාස කට යුතු භාර ඇමතිතුමාගේ කථාවේදී එතුමා කීවා, මේ ආණ්ඩුවේ මුල් කාලවලදී අයවැය ලේඛනවල එක්තරා අරමුණක් තිබුණු බව මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළාය කියා.

මෙන්න ඒ ඇමතිතුමා ඉංග්‍රීසියෙන් ඒ අදහස ප්‍රකාශ සැටි:

"Now, the Hon. Minister of Finance in his first Budget speech stated that he wished to give a certain direction of policy in the Budget. He stated that the principle of the Budget would be to prevent inflation. Inflation, as you know, is an insidious way of robbing the poor of their savings, and it puts the cost of living up. As such, he enunciated the principle that his primary purpose would be to stabilize prices and to prevent inflation. He also stated that his Budget would be one aimed at economic development.—(OFFICIAL REPORT, 14th August 1969; Vol. 86, cc. 608-9.)

මේ කියා තිබෙන්නේ කුමක්ද? මුදල් ඇමතිතුමා එතුමාගේ පළමුවැනි අයවැය කථාවේදී යම්කිසි අරමුණක් අනුව තමාගේ අයවැය සකස් කර තිබෙන බව—ආණ්ඩුවේ මුදල් පිළිවෙළ සකස් කර තිබෙන බව—ප්‍රකාශ කළාය යන්නයි. මුදල් ඇමතිතුමා කීවාලු, තමාගේ අයවැය ලේඛනය සෑදීමේ එකම ප්‍රතිපත්තිය උද්ධමනය—inflation—වැළැක්වීමය කියා. අපේ ගරු නිවාස ඇමතිතුමා ඒ ගැන ඇත්තකුත් කිව්වා. මොකක්ද ඒ ඇත්ත?

"Inflation, as you know, is an insidious way of robbing the poor of their savings, and it puts the cost of living up."

"ඉන්ෆ්ලේෂන්" හෙවත් උද්ධමනය කියන්නේ දුප්පතාගෙන් ඔහු ඉතිරි කර ගෙන තිබෙන සල්ලි ටික ගසා කෑමයි නැත්නම් හොරකම් කර ගැනීමයි, ඒ සමගම ජීවන වියදමත් වැඩිවීමයි කියලයි එතුමා කීවේ. එය ඇත්තක්. ගරු මුදල් ඇමතිතුමාගේ මූලික අරමුණ බඩු මිල නැග්ම නවත්වා එය එක මට්ටමකට තබා ගැනීම හා උද්ධමනය නතර කිරීමයි කියා එතුමා කීවා යයි ගරු නිවාස ඇමතිතුමා කීවා. මා කිසි දෙයක් කියන්නට ඕනෑ නැහැ. මේ සාකච්ඡාවේදී මන්ත්‍රීවරුන් හුඟදෙනෙක් අපට කීවා යම් යම් පොත් පත් බලන්නට ඕනෑ නැත, මුළු ලෝකය ගැනම බලන්න ඕනෑ නැහැ අර වාර්තාවල් මේ වාර්තාවල් මොනවා වුණත් අපි ගමට යමු කියා. හොඳයි අපි ගමට යමු. මේ ගරු සභාවේ අපේ කථාවලට ඇහුම්කන් දෙන අය අතරවත් මේ මුළු රටේවත් ඇත්තටම මුළු ලෝකයේවත්, මේ ආණ්ඩුව පටන් ගත් කාලයේ තත්ත්වයට බඩු මිල ආරක්ෂා කර ගත්තාය බඩු මිල ගණන් වැඩි වුණේ නැත කියා කියන්නට පුළුවන් කවුරුවත් ඉන්නවාද? එමෙන්ම මේ ආණ්ඩුව යටතේ උද්ධමනය ඇති වුණේ නැත කියන්නට පුළුවන් කවුරුවත් ඉන්නවාද? සිදු වන්නට ඉඩ දෙන්නේ නැත කී දෙකම ඉතා උග්‍ර ලෙස සිදු වී තිබෙන බව අපි කවුරුත් දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නිවාස ඇමතිතුමාගේ ඒ වචනවල අනික් පැත්ත ගරු රාජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා. ඒකත් මම කියන්නම්. "ඉන්ෆ්ලේෂන් " නැත්නම් උද්ධමනය නැතිව ආර්ථික ක්‍රමයෙහි දියුණුවක් ලබා ගන්නට බැරිය කියන එක මේ ආණ්ඩුවේ පුරුදු කථාවක් වී තිබෙනවා. ඒක තමයි මේ අයගේ අලුත් ශස්ත්‍රය. එහි ඇත්ත නැත්ත නොවෙයි එයයි අලුත් ශාස්ත්‍රය. නොයෙක් නොයෙක් රටවල් ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා මෙහි දී විස්තර කර තිබෙනවා. මා ඒවා කියවන්නට ඕනෑ නැහැ, තමුන්නාන්සේලාට මතක ඇති. අපේ නිවාස ඇමතිතුමාත් ඒ විධියටම ලැයිස්තුවක් දුන්නා. රටවල් කීපයක්ම අරගෙන ඒ සෑම රටකම උද්ධමනය වැද ගත් ලෙස ඇති වී තිබෙන බවත් රටවල දියුණුවට එය අවශ්‍ය බවත් කීවා. ඒ ගැන මා ඇන්මම වචනයක් කියන්නට ඕනෑ. එය මා පිළිගන්නා වූ ශාස්ත්‍රයක් නොවෙයි. ධනේශ්වර ක්‍රමය තිබෙන රටවලට එය ඇත්තක් වන්නට පුළුවන්, එක්තරා ක්‍රම යකට. මෙහි දී මේ ගරු ඇමතිතුමන්ලා දෙදෙනා විසින්ම දුන් රටවල් ලැයිස්තුවල සඳහන් වී තිබෙන්නේත් ධනේශ්වර ක්‍රමය පවතින රටවල්මයි. මා කෙලින්ම එකක් කියනවා.

දැනට චීනයේ සිටින අපේ තානාපති තුමා මේ දිනවල ලංකාවේ සිටිනවාය කියා මට දැනගන්නට ලැබුණා. ඒ නිසා මා මේ කියන දෙය ඇත්තද නැත්තද කියා ඕනෑම කෙනෙකුට එතුමාගෙන් දැනගන් නට පුළුවන්. චීනයේ නම් මෙහෙම උද්ධම නයක් නැහැ. බඩු මිළ නැග්මක් නෑ. එහෙත් රතු චීනය ආර්ථික දියුණුව රැක ගෙන තිබෙන බව අද මුළු ලෝකයම පිළිගන්නවා. මගේ කියමන රතු චීනයට පමණක් නොව, සෝවියට් රුසියාවටත් ගැලපෙනවා. සාමාන්‍යයෙන් සමාජවාදී ක්‍රම පවතින රටවලට ඔය ශාස්ත්‍රය නො ගැලපෙන බව මා කියනවා. ඒ රටවල් සම්බන්ධයෙන් ඔය ශාස්ත්‍රය ඇත්තක් නොවෙයි. එහෙම නම්, ධනපති ක්‍රමය තිබෙන රටවල ආර්ථික සංවර්ධනයත් සමඟ මේ උද්ධමනය නමැති තත්ත්වය තිබෙනවා යයි කිව්වොත් නරකද? මේ ඇමතිවරුන් ඒ වචන පාවිච්චි කරන්නේ නැහැ. ධනේශ්වර ක්‍රමයයි, උද්ධමනයයි එකට යනවා. ඒ දෙක එකට යන්නට සිදු වෙනවා වුණත් අපේ නිවාස ඇමතිතුමා කියන්නේ උද්ධමනය නම් දුප්පතාගේ මුදල් ගසා කෑමේ අනියම් ක්‍රමයක් බවයි. එතකොට ප්‍රශ්නය මතු වෙනවා නේද? මේ ක්‍රමය නැතිව රටක ආර්ථික ක්‍රමය දියුණු කිරීමට තිබෙන්නා වූ අනික් මාර්ගය වන සමාජවාදී මාර්ගය අප කෙළින්ම ප්‍රතිපත්ති අනුකූලව පිළිගත යුතු නේද, පාවිච්චි කළ යුතු නේද කියන ප්‍රශ්නය මතු වෙනවා. කොයි අතින් බැලුවත් මේ ආණ්ඩුවේ මේ අවසාන කාලයේදී මුලින්ම ඇති වූ ප්‍රශ්නය නැවතත් මේ අනුව මතු වී තිබෙන බවයි, මා මතක් කරන්නට උත්සාහ කරන්නේ.

මෙවැනි අවස්ථාවලදී ඉදහිට හෝ එවැනි ප්‍රතිපත්ති ප්‍රශ්නවලටත් හිත ගෙන යෑම යුතුකමකැයි මා විශ්වාස කරනවා. එසේ කියන කොට අපට තවත් ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිදු වෙනවා. නොදියුණු රටවල පමණක් නොව, සමාජ වාදී ක්‍රම පවතින රටවලින් පිටස්තරවූ මුළු ලොවේම අද තිබෙන ප්‍රශ්නය නම් මේ උද්ධමනයයි. මේ ප්‍රශ්නය ගරු රාජ්‍ය ඇමතිතුමා මතු කළ වෙනත් තර්කයකට අදාළ වන බව මා මෙතැනදී මතක් කරන් නට ඕනෑ. බඩු ගැනීම සඳහා ජනතාව අතර මුදල් තිබේ නම් මිළ ඉහළ ගියාට මක්වෙනවාදැයි එතුමා කීවා. ඔහු කීවේ එපමණක් නොවෙයි. බඩු මිළ නඟිනවාත් සමගම බඩු ගැනීම සඳහා ජනතාව අතර තිබෙන මුදල් වැඩි වෙනවා නම් එහි වරද කුමක්දැයි එතුමා ඇසුවා. එහි වරදක් නැති බවත් කීවා. මෙය මේ විධියකට කියන විට හරි කියමනක් යයි කෙනකුට හිතෙන්නට පුළුවනි. එහෙත් මෙය ඇත්තක් නොවෙයි. දැනුවත්වම නැත් තක් කීවායයි කියනවා නොවෙයි. මේ අදහස ඇත්තක් නොවෙයි. මේ රජයේ වැඩ පිළිවෙළවල් අනුව නිෂ්පාදකයන්ට කරන ආධාරයක් වශයෙන් ඒ ඒ ද්‍රව්‍යවලට ගෙවන ස්ථිර මිළ එක්තරා ප්‍රමාණයකින් වැඩි කර තිබෙන නිසා, මේ අවුරුදු 5 ඇතුළත ගම්බද ජනතාව අතට වැඩිපුර රුපියල් 50,00,00,000 ක් පමණ ලැබී තිබෙනවා යයි ඔප්පු කරන්නට ගරු රාජ්‍ය ඇමතිතුමා සිය කථාවෙන් උත්සාහ කළා. ඒ මුදල් ගිහින් තිබෙන්නේ පොඩි මිනිසුන් අතට බවත් ඒ සමගම එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා සිටියා. බඩු මිළ ඉහළ නැග තිබෙන බව රජයම පිළිගන්නා මේ අවස්ථාවේදී, එසේ බඩු මිළ ඉහළ යාම නිසා ඒවා මිළ දී ගැනීමට කොපමණ මුදලක් වැඩිපුර වියදම් කරන්නට ජනතාවට සිදු වී ඇත්දැයි අපට පෙන්වා දුන්නා නම් මේ දෙක සංසන්දනය කරන්නට අපට පුළුවන්කම ලැබෙනවා.

මා කියන්නට අදහස් කරන දේ වඩාත් පැහැදිලි කිරීම සඳහා එක උදාහරණයක් දෙන්නම්. මිනිසුන් අතර කලින් රුපියල් සියය බැගින් තිබුණා යයි හිතමු. මේ අවුරුදු 5 ඇතුළත එය 150 දක්වා ඉහළ නැග තිබෙනවා කියාත් හිතමු. අවුරුදු 5 කට කලින් රුපියල් 100 කට ගත් බඩු තොගය ගැනීම සඳහා අද රුපියල් 150 ක් වියදම් කරන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා නම් ඔවුන්ගේ ජීවන තත්ත්වයේ කිසි වෙනසක් සිදු වී නැහැ. ඒ අන්දමට දෙවනුව සඳහන් කළ—කලින් වියදම් කොට ගත් බඩුම ගැනීම සඳහා දැන් වියදම් කරන්නට සිදු වී ඇති—මුදල කොපමණදැයි සඳහන් නොකර, නිකම් ගණන් බලා පෙරට වඩා රුපියල් 50,00,00,000 ක් පමණ දැන් ජනතාව අතට ලැබෙනවා යයි සැකයෙන් මෙන් කීමේ කිසිම තේරුමක් නැහැ. මේ කාලය වන විට අපේ රටේ බඩු මිළ ඉහළ නැග තිබෙන ආකාරය කල්පනාවට ගන්නා විට මා හිතනවා,—ස්ථිරවම කියන්නේ නැහැ මා සැක කරනවා—ස්ථිර මිළ ක්‍රමයකින් නිෂ්පාදකයන්ට ආධාර වශයෙන් වැඩිපුර කොයි තරම් මුදලක් ඔවුන් අතට පත් කොට තිබෙනවාද, ඊට වඩා වැඩි මුදලක් වියදම් කරන්නට ඔවුන්ට සිදු වී තිබෙනවාය කියා.

ඒ බව කීප පැත්තකින්ම පෙන්වන්න පුළුවනි. කාර්මික බඩු ගැන බලමු. ගම්බද ජනතාව අතට මොන ක්‍රමයෙන් හෝ මුදලක් එකතු වෙනවා නම්, ඒවායින් කෘෂිකාර්මික බඩු ගත්තාට පසුව තවත් යම්කිසි මුදලක් අතේ ඉතිරි වෙනවා නම් කාර්මික බඩු ගැනීම සඳහායි, ඔවුන් එය වැය කරන්නේ. එම නිසා, අපේ රටේ කාර්මික බඩුවල මිළ ඉහළ නැග තිබෙන්නේ කොහොමදැයි සාකච්ඡා කිරීම මේ ප්‍රශ්නයට බොහොම අදාළ වෙනවා. ඒ කටයුතු භාර ඇමතිතුමාත්, මේ රජය ආරක්ෂා කරන ධනපති ප්‍රවෘත්ති පත්‍රත් කොතෙකුත් කියා තිබෙනවා, පිටරටින් ගෙන්වූ බඩු මේ රටේම නිෂ්පාදනය කිරීමට ඉදිරිපත් වූ කර්මාන්තකාරයන් පුදුම විධියට ලාභ ලබාගෙන තිබෙනවාය කියා. එක අවුරුද්දකදීම සියයට 400 ක් ලාබ ගත් කර්මාන්ත කාරයන් මේ රටේ සිටින බව ධනපති පත්‍රවල පවා ප්‍රසිද්ධ කර තිබෙනවා මා දුටුවා. ඒ කියන්නේ පළමුවන අවුරුද්ද තුළදීම එම කර්මාන්තය බිහි කර එය දියුණු කිරීම සඳහා යොදවන ලද මුදල මෙන් හතර ගුණයක් ආදායම ලාභ, ලබාගෙන තිබෙන බවයි. ඒ හැරෙන්නට අවුරුදු පහකට අයබදු ගෙවීමේ නිදහසක් ඒ අයට ලැබෙනවා. වෙන වෙනත් ආධාරත් ලැබෙනවා. ඒවා ගණන් නොගෙනයි මා මෙම තත්ත්වය පෙන්නුවේ. ඔකයි තිබෙන තත්ත්වය.

මේ ආණ්ඩුවේ වැඩ කටයුතුවලින් ජනතාව අතට වැඩි මුදලක් ගොස් තිබෙනවා නම්—එහි ඇත්තක් තිබෙනවා—එම මුදල ගියේ සාමාන්‍ය ජනතාව අතට නොවෙයි ; එක්තරා ඉහල පෙළේ පටු තිරුවකට, සුළු කොටසකට පමණයි. එම නිසායි මුදල් වැඩිවුණු පමණට වැඩියෙන් බඩු මිල ඉහල නැග තිබෙන්නේ. ඊට හේතුව කුමක්දැයි පැහැදිළි කර දෙන්නට මා තවදුරටත් උත්සාහ කරනවා. ඕනෑම ජාතියක ඕනෑම මෝස්තරයක යම්කිසි බඩු භාණ්ඩ ගිහයක් තිබෙනවා නම් ඒ ගිහයත් සමගම එම බඩු ඕනෑම මිලකට ලබා ගැනීමට හැකි ආදායම් තත්ත්වයක් ඇති යම්කිසි සමාජ තීරුවක්ද—කොටසක්ද—සිටිනවා. එම සමාජ තීරුව අතර තිබෙන මුදල් ශක්තිය මත ඒ බඩුවලට ඇති වන තරඟය අනුවයි, ඒවායේ මිල ඉහල නගින්නේ. එය සිදුවන්නේ සියළු දෙනාගේම ඉල්ලීම අනුව නොවෙයි. වෙනදා රුපියලට තිබුණු බඩුවක් අද රුපියල් සියයට නංගත් ගන්නට සූදානම්ව සිටින එක්තරා කට්ටියක් සිටිනවා නම් එම කට්ටිය අතර ඇති වන තරඟය අනුවයි එම බඩුවේ මිල නියම වන්නේ. ඒ අනුව එම බඩුවේ මිල රුපියල් සියයටමත් නගින්නට පුළුවනි. සාමාන්‍ය ජනතාවට සල්ලි තිබීමේ හෝ නොතිබීමේ ප්‍රශ්නයක් එතැන ඇත්තේ නැහැ. අර කට්ටිය තමයි එම බඩුවල මිල මට්ටමේ තත්ත්වය තීන්දු කරන්නේ. ඒකයි අද ලංකාවට සිදු වී තිබෙන්නේ. එම නිසා මේ පිළිවෙළට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්පූර්ණ ඉලක්කම් ප්‍රමාණය ලබාගෙන මුළු ජනතාව අතරේ බෙදුවාට ඇත්ත තත්ත්වය මතු වන්නේ නැහැ. ඉංග්‍රීසියෙන් මෙහෙම කතාවක් තිබෙනවා :

That is what you call statistical manipulation, not statistical illustration.

සමාවන්න, මා එය සිංහලට පරිවර්තනය කරන්නට උත්සාහ දරන්නේ නැහැ.

මේ කරුණු සිතට ගත්තාම මට පෙනෙනවා අපේ රටේ එක්තරා සමාජ තීරුවක් සිටින බව. එම සමාජ තීරුව කොතරම් පුළුල්දැයි මනින්නට මා උත්සාහ දරන්නේ නැහැ. එහෙත් මට මෙය කිව හැකියි: වැඩිම වුණොත් එම සමාජ තීරුව සියයට 10කට හෝ සියයට 15 කට වැඩි වෙන්නට බැරි බවයි මගේ විශ්වාසය. ඒ උදවියට නම් මේ ආණ්ඩුවේ මුදල් ප්‍රතිපත්තිය යටතේ විශාල වාසි සැළසී තිබෙනවා. තවත් හොඳ ඉංග්‍රීසි කියමනක් තිබෙනවා. ඒ මෙසේයි :

They are the people guilty of conspicuous consumption and spending.

ඒ කට්ටිය තමයි. නමුත් සාමාන්‍ය ජනයා ? මේකට මම එක පාරටම උත්තරයක් දෙන්නට ඕනෑ. ඊයේත් පෙරේදත් ඉංගිරිසි පත්‍රවල එක්තරා ප්‍රවෘත්තියක් මට දකින්නට ලැබුණා. එය තිබුණේ " ඩේලි නිව්ස් " පත්‍රයේ. මේ ආණ්ඩුවේ සියලුම ඇමතිවරුන්ගේත් මැතිවරුන්ගේත් විශාලම තර්කය තමයි අපේ ආණ්ඩුව ගොවියා පොහොසත් කර තිබෙනවාය යන්න. අපේ ගරු අගමැතිතුමා ප්‍රචාරයට දක්ෂ කෙනෙක්. ප්‍රචාරක කටයුතුවලදී බොහොම ප්‍රයෝජනවත් විය හැකි හොඳ කථාවල් දෙකකුත් මවලා තිබුණා. එක කතාවක් නම් දැන් මුළු රටම දන්නවා. අපට පමණයි මේ කතාව ටිකක් තේරුම් මදිවෙලා තිබුණේ මෙතෙක් කල්. මොකක්ද ඒ කතාව ? අර වැලිමඩ අල වගා කරපු ගොවියා මහපාරේ ගිය ගරු අගමැතිතුමා නැවැත්තුවා කථාව කියන්නට. එය අර්තාපල් වගා කළ අක්කරයෙන් රු. 34,000 ක් ලාභ ලැබුණාය කියන්නටයි වුවමනා කෙළේ. [බාධා කිරීමක්] කමා කරන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩ්ඩක් වැරදුනා. රු. 34,000 ක් නොවෙයි ; රු. 40,000ක්ලු ඔහු ලැබූ ලාභය. එයින් 6,000 ක් අඩු කිරීම ලොකු වැරද්දක් ගරු අගමැතිතුමාට. එක් අක්කරයක අර්තාපල් වගා කිරීමෙන් ඒ තරම් විශාල ලාභයක් මේ ගොවියා ලබා ගත්තාලු. කවුද මේ මිනිහා ? ඒක කියන්ට බැහැ කියනවා ගරු අගමැතිතුමා. ඇයි කියන්නට බැරි ? ගරු අගමැතිතුමා පොරොන්දු වුණා නොවැ ආදායම් දෙපාර්තමේන්තුවට ඔහු අල්ලා නොදෙන්නට. එහෙම නම් ඉතින් මේ රටේ අගමැති තුමාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබෙන්නට තියෙන දේ හොරකම් කරන්නට කටයුතු කරන උදවියට උපකාර කරන පංගුකාරයකු වෙලා ඉන්න බවයි කියන්නේ. ඒකයි අපට පෙනී යන්නේ. ඒක කියාපු මිනිහා අල්ලා දෙන්නට බැහැ නොවැ. කවුරු නමුත් වැලිමඩට ගිහිල්ලා මේ මිනිහා අල්ලාගෙන, " පෙන්නාපන් බන්, ඔය උඹ හම්බ කර ගත්තාය කියාපු රුපියල් හතළිස් දාහ " කිව්වොත්, මොකද වෙන්නෙ ? එතකොට නම් අල්ලා ගන්නට පුළුවන් වෙයි.

මේවා ලක්ෂණ කථා නොවෙයිද ? මොකක්ද මේ පෙන්වන්නට හදන්නේ ? අපේ රටේ අර්තාපල් වගා කරන අලුත් ගොවිරාළලා වගයක් ඇතිවෙලා ඉන්නවා. හැම මිනිහාටම රු. 40,000 ක් හම්බ කරන්නට පුළුවන්ද ? ඊට තරමක් දුරටවත් කිට්ටු මුදලක් උපයා ගන්නට පුළුවන් වෙයිද ? ඒ ප්‍රශ්නය ඇති වෙනවා. එහෙම පුළුවන්ද ? මගේ ළඟ නැදැයිනුත් ඉන්නවා, අර්තාපල් වගා කළ උදවිය අතර.

**ජෝර්ජ් කොතලාවල මයා.** (බණ්ඩාරගම)
*(திரு. ஜோஜ் கொத்தலாவல—பண்டாரகம)*
(Mr. George Kotelawala—Bandaragama)

හැමෝමය කියලා කිව්වෙ නැහැ.

**ටී. බී. සුබසිංහ මයා.** (කටුගම්පොළ)
*(திரு. ரி. பி. சுபசிங்க—கட்டுகம்பொள)*
(Mr. T. B. Subasinghe—Katugampola)

කොතලාවලලා නොදන්න දේවල් ගැන කථා කරනවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ඒ මන්ත්‍රීතුමාත් කථාවට වැටෙන්නට එපායැ. ඒ මන්ත්‍රීතුමාත් කථාවට වැටෙන්නට ඕනෑ, නොවැ. මා වාගේ කෙනකු අත් හරිනවායැ. නැත්නම් හරි නැහැ නොවැ. එන සැරේ කොයි ආසනයකටද යන්නේ, එතනදී එහාට එන අයට ඇහෙන්නට කියන්නටත් තිබෙන්නට ඕනෑ නොවැ, "මම අහවලා කථා කරන කොටත් මෙහෙම කිව්වා නේද, බලා පන්කෝ" කියලා. එහෙම ආධාරයක් වෙන්නට මම සන්තෝෂයි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member must not interrupt.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට කමක් නැහැ. ගරු අගමැතිතුමාම එහෙම කිඅාපු එකයි එතැන තියෙන වසකම. තවත් මිනිහෙක් ඉන්නවා. එයා එම කතාව මම තවත් පැත්තකින් කියනවා. මින්නේරිය, අනුරාධපුරය, පොළොන්නරුව යන මේ ස්ථානවලින් කොහාට ගිය වෙලාවෙද කියන්නට මට මතක නැහැ, ගරු අගමැතිතුමා ඔය සඳහන් කළ එක් ස්ථානයකට ගිය අවස්ථාවක වෙළෙන්දකු ළඟට ගිහිල්ලා "අනේ මේ එක ගොවියෙක් රේඩියෝ පෙට්ටියක්—කථා කරන පෙට්ටියක්—ගත් හැටි කියන්නෑ" යි කිව්වා. ඒ කතාවේ සම්පූර්ණ විස්තරය දැන් මට හරියට මතක නැහැ. ඒ නිසා කියන්නේ නැහැ.

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)

සිංහලෙන් කථා කරන පෙට්ටියක් රු. 400 යි. සිංහලෙනුයි දෙමළෙනුයි කථා කරන පෙට්ටියක් රු. 500 යි. ගෙනැවිත් දෙන්ට කිව්වලු දෙකෙන්ම කථා කරන පෙට්ටියක්.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ගරු අගමැතිතුමා වෙනුවෙන් කථා කරන අනෙක් අයටත් ගරු අගමැතිතුමාටත් මම එකක් කියන්නට කැමතියි. රේඩියෝ ගැන අපේ පුතුන්ටත් උගන්වන්නට තරම් හොඳට කරුණු දන්න පුතුන් අද ලංකාවේ අකුරු නොදන්න උදවියටත් ඉන්නවා. මේවා පාවිච්චි කරන්නැයි අපට දුන් මිනිසුන්ටත් කියා දෙන්නට පුළුවන් උදවිය ඇති. ඒ නිසා, ඊට වඩා හොඳයි, කියලා විශ්වාස කරවන්නට පුළුවන් කථාවක් හදලා කියන එක. දැන් මේ කථාව අපේ රාජ්‍ය ඇමතිතුමා වෙනින් විධියකට කියා තිබෙනවා. රුපියල් පණස් කෝටියක් ජනයා අතට ! ඒ සේරම ගොහින් තිබෙන්නේ සුළු ගොවීන් අතටලු. වචනය පාවිච්චි කර තිබෙන්නෙ "පෙසන්ට්ස්" කියායි. අද මෙතැන නැති ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ ඇමතිතුමා නිතරම කියනවා නොවැ මින්නේරියෙ, පොළොන්නරුවෙ, උතුරු මැද පළාතෙ මේ ගැන ඇති වී තිබෙන අලුත් තත්ත්වය ගැන එතුමාගේ අවාසනාවටදෝ පේරාදෙනියෙ විශ්ව විද්‍යාලයේ කණ්ඩායමක් ඒ පළාත්වල ගොවි ජනපද 9ක් ගැන, පේරාදෙනියෙ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ අධ්‍යක්ෂතුමාගේද ආධාර ඇතුව පැවැත් වූ පයෙෂණයක් ගැන ඉදිරිපත් කර ඇති වාර්තාවේ එක්තරා සාරාංශයක් ඊයේත් අදත් "ඩේලිනිවුස්" පත්‍රයේත් "ටයිම්ස්" පත්‍රයේත් සඳහන් වී තිබුණා. ඊයේ පත්‍රයේ කෙටියෙනුත් අද පත්‍රයේ ඊට ටිකක් දිගිනුත් එය පළ කර තිබෙනවා. මට මේ වාර්තාව ලබාගන්නට බැරි වුණ එක ගැන මම කනගාටු වෙනවා. දෙවනුව කවදා හෝ ලැබුණ විටක මම ඒ ගැන සාකච්ඡා කරන්නම්. මෙහි ගොවි ජනයාට ඕනෑ කරන බඩු ගෙන්වීම සඳහා ඕනෑ කරන මුදල් මේ ආණ්ඩුවෙන් ලැබුණ විධිය බොහෝම හැඩේට මෙහි කියා තිබෙනවා. මා විශ්වාස කරනවා, ආණ්ඩුවේ සියලුම මැති ඇමතිවරුන්, මේ එන මාස ගණන තුළත්, මැතිවරණය කාලය මුළුල්ලෙත් පිට පිටම මෙය කියවනවා ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා. මෙය "Ceylon Daily News" of Saturday, 16th August 1969. මා කියවන්නෙ පස් වෙනි පිටුවෙන්.

"Most farmers' earnings 'fell below poverty line'"

මොකක්ද මෙහි කියන්නෙ? යම් කිසි මට්ටමකට පහළ අය දුප්පතුන් කියා, ගොවීන් කියා කියනවා. ඒ ගොවීන් වැඩි දෙනා ඒ මට්ටමටත් පහළට වැටී තිබෙනවාය කියායි, මෙහි කියා තිබෙන්නෙ. මේ ආණ්ඩුවමයි එය කියා තිබෙන්නෙ.

"Two thirds or more of farmers in nine colonisation schemes had an income standard that fell below the adequate minimum of Rs. 3,000 per annum for supporting a family decently."

ඒ කියන්නෙ මාසෙකට රුපියල් 250 කට අඩු බවයි. මම නොවෙයි කියන්නෙ. මේ කථා කරන අපි ඉතින් නරක ජාතියක් නොවැ. අපි මාක්ස්වාදීන් නොවැ. මේ කියන්නේ ඒ එක පිස්සුවකටවත් නැති පිරිසක්. මොනවද මේ ගොවි ජනපද 9ය. ඉරනයිමඩු, පදවිය, අල්ලායි, මින්නේරිය, ගල්ඔය, මිනිපෙ. හක්වටුනාඔය, රාජාංගනය, මහ විලච්චිය කියන ජනපද නමයේ යි ඔය පයෙශීෂණය කෙළේ. ඉතින් අපට මේ ගරු රාජ්‍ය ඇමතිතුමා කියන්නෙ මොකක් ද? රුපියල් 50 කෝටියක් ගොවීන් අතට ගිහින් තිබෙනවාලු. ඒ ගැන තවදුරටත් කථා නොකර මම කියනවා, මෙතැනට නොගිය බව නම් පැහැදිලියි කියා. මෙම ගොවි ජනපද නමයේ ඉන්නා වූ ගොවීන් ගෙන් තුනෙන් දෙකෙන් පංගුවක්ම දුප්පත්කමේ ආරම්භය වන මට්ටමටත් පහළයි. දැන් අවුරුදු 5 ක කාලයක් පමණක් නොවෙයි, ඩී. එස්. සේනානායක මහත්මයාගේ කාලයේ සිටම—අවුරුදු 35 ක පමණ කාලය තුළ—කරලත් මොකක්ද ඇති වුණ තත්ත්වය? අපි මෙහි ඇත්ත තත්ත්වයටම මුහුණ දී බලමු. මහ මැතිවරණයක් ළඟ එනවාය කියා තමුන් නාන්සේලාගේ දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන් විසින් ලියා එවන ලද විස්තර අනුව සංඛ්‍යා ලේඛන සකස් කර කියවනවාට වඩා හොඳ නැද්ද, මේ ගරු සභාවට ඇත්ත ප්‍රකාශ කළාම. අපි මෙහි ඇත්ත තත්ත්වය දන්නවා. බොරු කියා ඔප්පු කරන්න පුළුවන්කමක් නැහැ.

ඊළඟට මට ඇහුනා, එක් මන්ත්‍රීවරයෙක් කියනවා, විරුද්ධ පාර්ශ්වයේ ඉන්නේ කඩාකප්පල්කාරයන්ය කියා. මට කවුරුවත් කඩාකප්පල්කාරයෙක්ය කිව්වාට මා නම් බියවන්නේ නැහැ. මා නම් ඔය වචනයට බිය නැහැ. මොකක්ද ඔය වචනයේ තේරුම? අපි මොනවාද කඩාකප්පල් කර තිබෙන්නෙ? මේ රටේ ආණ්ඩුවද? නැහැ. මේ රටේ ආණ්ඩුව අතේ තිබෙන යන්ත්‍රයේ කොටසක්ද? නැහැ. මේ රට ආණ්ඩු කිරීමට තිබෙන පාලන යන්ත්‍රය—පාලන චක්‍රය—පාවිච්චි කරමින් යම්කිසි වැඩ කොටසක් කරන විට විරුද්ධ පාර්ශ්වයේ සිටින අපි කොහොමද ඒවා කඩාකප්පල් කරන්නෙ?

**ජෝර්ජ් කොතලාවල මයා.**
*(திரு. ஜோஜ் கொத்தலாவல)*
(Mr. George Kotelawala)
බොරු කියල.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එක් දිනක් අංගොඩ මානසික රෝහලට ගියා. එතනදී මිනිහෙක් මගෙන් ප්‍රශ්නයක් ඇසුවා. ගේ ඇතුළට වී කුඩයක් ඉහළ ගෙන ඉන්න අතර අහනවා, කොයි තරම් වහිනවාද කියල. මට සමාවෙන්න, ඒ පංක්තියට ඇතුල් වෙන්න නම් එපා. ඔයිට ටිකක් මෙහායින් පේළියේවත් සිටියා නම් උත්තරයක් දෙන්න කාලය ගත්තාට කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද මේ වගා ව්‍යාපාරය? ආණ්ඩු පැත්තෙ මුළු ප්‍රචාරයටම උත්තරය මේ ලිපියෙන් ලැබෙනවා. පර්යේෂණයක ප්‍රතිඵලයකුයි මේ ලිපියෙන් පෙන්වන්නෙ. මෙය කඩාකප්පල්කාරයන් වන අපේ ඉලක්කම් නොවෙයි. ඒ නිසා දැන්වත් සමහර අය ඉගෙන ගත යුතු අවස්ථාව පැමිණ තිබෙනවා. මෙතන බොරු කිව්වත් ඒවා අපට අසුවන බව දැන ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව පටන් ගත් තැන අමතක කර නොවෙයි, මේ ප්‍රශ්නයට මා ආවේ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ආණ්ඩුවේ වැඩ පිළිවෙල්වල ප්‍රතිඵල අපේ නිවාස කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් වෙනින් පැත්තකින් අපට පෙන්වන්න සූදානම් වුණා. මේ ඉලක්කම් පාවිච්චි කරන විධිය ගැන ටිකක් දැන ගන්න ඕනෑ. මේ රටේ මේ මධ්‍යම බැංකු වාර්තාවෙන් ඔප්පු වෙලා තිබෙනවාලු පඩි වැඩි වුණ බව. 1968 අවසානය වන විට "රියල් වේජස්" වැඩි වී තිබෙනවාය කියා අපට කිව්වා. ඒ කියන්නේ 1953 වර්ෂය සමග සමාන කළාම රුපියලේ අගය අඩු වීමත් පිරිමසමින් ගන්නා වූ ගණන් තිබියදී 114.3 ක ඉලක්කමක් එනවාය කියනවා. නමුත් තමන්ගේ දෙපාර්තමේන්තුවෙන් දෙන විස්තරය බලා ගත්තා නම් විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමතිතුමා කවදාවත් ඒ වචන ප්‍රකාශ කරන්නේ නැතැයි මා විශ්වාස කරනවා. මා එපමණ ගරු කරනවා එතුමාට.

මධ්‍යම බැංකුවේ 1969 මාර්තු මාසයේ "බුලටින්" එක මා ළඟ තිබෙනවා. ඒකෙ තිබෙන්නෙ මෙහෙමයි: 1968 වර්ෂයට 114.3 ක් තිබුණාට 1969 ජනවාරි මාසයේදී ඒ ඉලක්කම බැස තිබෙනවා. 108.6 යි. ඊළඟට පෙබරවාරි මාසයේදී 108.9 යි. මාර්තු මාසයේදී 108.6 යි. කෙලින්ම හයක් අඩුයි. තවත් තීරුවක මෙහෙම තිබෙනවා. මොනවාටද මේවා එකින් එක කිය වන්නෙ? තමන්ම කියවා බලා ගන්න. නියම තත්ත්වය අපි සිතට ගනිමු. රුපියලේ වටිනාකම අඩු කළා. ඒ බරෙන් කොටසක් පිරිමසන්නට පඩි වැඩි කළාට රුපියලේ අගය අඩු කිරීමෙන් ඇතිවූ පාඩුව මගහැරුණේ නැහැ. දුප්පත් මිනිසාගේ, දුප්පත් පඩි ලබන්නාගේ ආදායම ගසාකෑම එයින් පිරිමැසුණේ නැහැ. මා පාවිච්චි කරන්නේ නිවාස ඇමතිතුමාගේම වචනයි. මගේ වචන නොවෙයි, මා කඩාකප්පල්කාරයෙක්. වැඩි දිනක් යන්නට පෙර ඒ වචන ප්‍රකාශ කළාට තමුන්නාන්සේටත් ඒ කට්ටිය කඩාකප්පල්කාරයෙක්ය කියාවි. මේකෙ නියම තත්ත්වය ටිකක් සිතට ගන්න.

මෙතැන ගරු රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළ වචනයකුත් මා එළියට ගන්නට ඕනෑ. රුපියලේ වටිනාකම අඩු කිරීමෙන් අභ්‍යන්තර වශයෙන් කිසිම බලපෑමක් ඇති නොවන බව එතුමා ප්‍රකාශ කළා. එපමණක් නොවෙයි. රුපියලේ අගය අඩු කළ දවසේ සිට අද වන තෙක් ආණ්ඩුව පැත්තෙන් අපට අසන්නට ලැබෙන්නේ කුමක්ද? ඒ දිනවල ගුවන් විදුලියෙන් ගෙන ගිය ප්‍රචාර ගැනත් අපට මතකයි නොවැ. "කඩාකප්පල්කාරී විරුද්ධ පක්ෂය මොකද මේ කෑගහන්නෙ? තවම රුපියලේ ශත සියයයි. මේක ජාත්‍යන්තර වශයෙන් රුපියල අනික් රටවල මුදල් සමග සංසන්දනය කිරීමේදී නියම තත්ත්වය ඇති කිරීම සඳහා කරන වැඩක් පමණයි. අභ්‍යන්තර වශයෙන් මේකෙ කිසිම බලපෑමක් නැත" ආදී වශයෙන් කළ ප්‍රකාශ ගැනත් අපට මතකයි. අප ඒවාට මෙතැන උත්තර දුන්නා.

ඊළඟට ගනිමු මේ කියමන. ඒක අගමැතිතුමාගේ පටන් ආණ්ඩු පක්ෂයේ සියළුම ප්‍රධාන කථිකයිනුත් අනෙක් කථිකයිනුත් අපට නොයෙක් අවස්ථාවල කියන කියමනක්. අපේ ආණ්ඩුව වෙන ආණ්ඩු වාගේ නොවෙයි, රුපියලේ අගය බැස්සුවාම අපි හදිසි නීතිය පාවිච්චි කර සියළු දෙනාගේම පඩි වැඩි කළාය කියනවා. නිවාස ඇමතිතුමා කිව්වෙත් ඒකමයි. මෙතැන තිබෙන ප්‍රශ්නය ඒකයි. නමුත් රුපියලේ අගය අඩු කළ ප්‍රමාණයට අභ්‍යන්තර වශයෙන් මේ රටේ බඩු මිළ පිළිබඳව නැඟීමක් ඇති වූ බවත් එය වළක්වන්නට බැරි බවත් කවුරුත් දන්නවා. විශේෂ නීතිරීති පනවා තිබෙන ධනේශ්වර එංගලන්තයේත් ඒක වළක්වන්නට බැරි වී තිබෙනවා. මේ ආණ්ඩුව ඒක වළක්වන්නට උත්සාහයක් වත් කළේ නැහැ. මා අද පාවිච්චි කරන තර්කය මෙයයි. රුපියලේ මිළ අඩු කිරීමත් සමගම එක්තරා ප්‍රමාණයකට එය පිරිමැසීම සඳහා පඩි වැඩි කරන්නට ආණ්ඩුවටම සිදු වුණා. රුපියලේ මිළ අඩු කිරීම අභ්‍යන්තර වශයෙන් බල පාන බවත් එසේ බල පාන්නේ බඩු මිළ නැඟීමෙන් බවත්, පඩි වැඩි කිරීමෙන්ම ආණ්ඩුව පිළිගත්තා නේද? ඒ විධියට බලන විට ප්‍රශ්නය කොටයි. රුපියලේ වටිනාකම අඩු කළ ප්‍රමාණයට නැගෙන බඩු මිළ පිරිමැසීම සඳහා ආණ්ඩුව පඩි වැඩි කළාද නැද්ද? ගරු අගමැතිතුමාගේත් ගරු මුදල් ඇමතිතුමාගේත් මීට පෙර කථා දෙකකින් මේ ප්‍රශ්නයට උත්තර ලැබුණා. එහෙත්, අන්තිම අවස්ථාවේදී කෙරෙන කථා ගැන අපට වෙනත් අවස්ථාවකදී සාකච්ඡා කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැහැ. ඒ ගරු ඇමතිවරුන් දෙදෙනාම කියා තිබුණේ, බඩු මිළ නැගෙන ප්‍රමාණය සම්පූර්ණයෙන්ම පිරිමැසෙන තරමට පඩි වැඩි කළා නම්, රුපියලේ මිළ අඩු කිරීමෙන් ලැබුණු වාසිය නැති වන බවයි. කතාව ඇත්ත. මොකක්ද වාසිය? නොකියා පඩි කැපීම. ඉතින් ඔය කරුණු අප මෙහිදී ඉදිරිපත් කළ විට, "නුඹලා කවදාවත් හදිසි නීතිය පාවිච්චි කොට පඩි වැඩි කළාද" කියා අපෙන් රජය අහනවා. පඩි කපලා, කැපීමෙන් කොටසක් දී කැපීම සැඟවීම, හාල් සේරුවක් කපා අනෙක් සේරුව නිකම් දී කළ වංචාව වගේම වංචාවක්. ආණ්ඩු මෙවැනි දේවල් කරන බව ඇත්තයි. මේ විධියේ තර්ක ඉදිරිපත් කරන බවත් ඇත්තයි. ඒ වාගේම, මෙහි ඇත්ත තත්ත්වය මෙය බවත් ඇත්තයි.

මීළඟට මා ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කතාවෙන් මතු වුණු වෙනත් ප්‍රශ්නයකට එනවා. මෙහි මා මුලින් පටන්ගත් ප්‍රශ්නය වෙනත් විධියකට මතු කරන්නයි අද හස් කරන්නේ. ගරු මුදල් ඇමතිතුමාගේ කථාවේ අරමුණ වශයෙන් මුලින් කී දේ නොවෙයි අද තිබෙන්නේ. දැන් එය පැහැදිලියි. මුලින් කියැවුණේ, බඩු මිළ මට්ටම වැඩි වන්නට නොදී තබා ගැනීමත් උද්ධමනය නතර කිරීමත් මෙහි අරමුණු බවයි. දැන් මේ දෙකම ඉෂ්ට වී නැති බව පිළිගන්නවා පමණක් නොව, දැන් මෙය අනෙක් අතට පෙරළා ඒකත් අවශ්‍ය දෙයක් හැටියට පාවිච්චි කරන්න ඕනෑ යයිද කියනවා. මේ දෙකම දැනකට කරන්නේ එකම වැඩක් සඳහායි. එනම්, ආර්ථික සංවර්ධනය සඳහායි. මෙතැනදී මා වැදගත් මූලික ප්‍රශ්න කීපයකට එනවා. ඒ සඳහා අපි මේ අය වැය ලේඛනය කොටස් නොකර සාකච්ඡාවට ගනිමු.

රටක ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට වුවමනා මොනවාද? කවුරුනුත් මෙහිදී පටන්ගන්නේ මුදල්වලින්. ඒ මක්නිසාදැයි මා දන්නේ නැහැ. මුදල් නැතිව බැරිලු. මුදලුත් ඕනෑ. එහෙත්, ඉස්සෙල්ලාම ප්‍රයෝජනයට ගත යුතු ලොකුම දේ හැටියට රටක තිබෙන්නේ ඒ රටේ ජීවත් වන මිනිසුන්ය. රක්ෂා නැති අයට රක්ෂා තිබෙනවා යයි කියන්න උඩරටට යවලා නිකම් පස් කප කපා කුඩයකට දමා කර උඩ තබාගෙන කන්ද උඩ නගින්න යයි කියන්නද, යනුවෙන් මේ කථා දෙකෙන් එක කථාවක ටිකක් කවට විධියට කියා තිබෙනවා. මා එකක් කියන්නම්; ඒ විධියට කරන්ට වුණත් එක්තරා සංවිධාන ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. ඇත්ත ඒකයි.

මොන විධියට කිව්වත්, කවුරු නැතෙයි කිව්වත් අද අපේ රටේ තිබෙන ප්‍රධාන මූලික ප්‍රශ්නය වන්නේ රක්ෂා නැතිකම බව කාටවත් සඟවන්නට බැහැ. බඩු මිළ නැඟීමටත් වඩා වසයි කියා මා කල්පනා කරනවා, මේ රක්ෂා රහිත භාවය. ඒ කරුණු තුනක් නිසයි. පළමුව අපි සංඛ්‍යා වශයෙන් බැලුවත් රක්ෂා නැති අයගේ සංඛ්‍යාව ඉතා විශාලයි. දෙවනුව, ඒ සංඛ්‍යාව අඩු නොවී අවුරුද්දෙන් අවුරුද්ද නවත් වැඩි වන බව ඇත්තයි. තුන්වෙනුව—ඉතාම වස දෙය—ඒ විශාල සංඛ්‍යාව තුළ ඉතාම වැඩි කොටස ඉගෙන ගත් නව පරම්පරාවේ අය වීමයි. මා නිකම් තරුණයන් යයි කියන්නෙ නැහැ; නව පරම්පරාවේ අය. ඉගැන්වීමට අපි වියදම් කරනවා. සමාජයත් වියදම් කරනවා; පෞද්ගලිකවත් වියදම් කරනවා. එපමණ වියදම් කර යම් පුරුදු පුපුණුකම් හා ශක්තීන් අප විසින්ම ඔවුන් තුළ ඇති කර, සමාජය තුළ රක්ෂා නැතියවුන්ගේ තත්ත්වයට අපි ඔවුන් පත් කරනවා නම් අපි ඒ මගින් කරන්නේ අන් සියල්ලටම වැඩිය මනුෂ්‍ය නාස්තියක්. මෙය නිකම්ම මුදල් ප්‍රශ්නයක් හැටියට හිතට ගෙන මදි. මෙය මිනිස් ප්‍රශ්නයක්. මේ සංවර්ධනය මැනීමේ එක ක්‍රමයක් තමයි, රක්ෂා රහිතකමේ ප්‍රශ්නය විසඳෙන ආකාරයේ ක්‍රමයක් තිබෙනවාද කියන කාරණය.

අපේ රටේ පසුගිය අවුරුදු දහය-පහලොහ තුළ උපන් දරුවන්ගේ ප්‍රමාණය වැඩිය කියා කීමේ අර්ථයක් නැහැ. ඒ දරුවන් ඉපදිලා ඉවරයි. පාලන ක්‍රමවලින් මතුවට ඉපදීම වළක්වන්නට පුළුවන් බැරිකම් ගැන මා සාකච්ඡා කරන්නෙ නැහැ. ඒ ගැන වැඩි තද මතයක් මා තුළ කොයි පැත්තකටවත් නැහැ. එහෙත් මේ ඉපදුණු දරු සංඛ්‍යාවට අපේ සමාජය තුළ ප්‍රයෝජනවත් සරු තත්ත්වයක් ලබා දීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ශක්තියක් ඇති ආර්ථික ක්‍රමයක් සහ සංවර්ධනයක් කොයි ආණ්ඩුව හෝ වේවා ඇති කරන්නට නොදන්නවා නම් එයින්ම ඒ සංවර්ධනයේ මදිකම ඔප්පු වන බව මා කියනවා. මේක ඉලක්කම් ප්‍රශ්නයක් නොවෙයි. අර වැඩට, මේ වැඩට අපි වෙන ආණ්ඩුවලට වැඩිය මෙපමණ මුදල් පාවිච්චි කළාය කියන ප්‍රශ්නයකුත් නොවෙයි. වැඩියෙන් පාවිච්චි කළා යයි සිතමු. එහෙත් එයින් අපට වුවමනා කටයුත්ත ඉෂ්ට වෙන්නෙ නැත්නම් එහි අර්ථයක් නැහැනේ. ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාව එක්තරා තර්කානුකූල ස්වභාවයක්, ස්වරූපයක් දරුවත් සැහවීමක් ඇති වී තිබෙන්නේ මෙතැනයි. අප රට කොහොමද සංවර්ධනය කරන්නෙ එක්තරා කටයුත්තක යෙදෙන්නෙ නැති නම් කියා එතුමා කියනවා. එතුමා මෙම උත්තරය දෙන්න උත්සාහ කළේ කුමක් ගැනද? අපේ රට සංවර්ධනයේ නමින්, විදේශ ආධාරවල ස්වරූපයෙන් උගස් තබා ගෙන යනවාය, අපේ මතු පරම්පරාවට මුහුණ පාන්න බැරි වන විධියට උකස් තබා ගෙන යනවාය කියන කාරණය ගැනයි. ඒකයි එතුමාගෙ තර්කය. ගරු රාජ්‍ය ඇමතිතුමා දුන් උත්තරය එම තර්කයට පිළිතුර නොවෙයි. එතුමා කියන්නෙ සෑම රටක්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගන්නා බවයි. අපත් ණය ගන්නවා. එම නිසා ඒ දෙකම එක බවයි එතුමා කියන්නෙ. තමන්ට තිබෙන හැම දෙයක්ම උකසට බැඳ සල්ලි ටිකක් ණයට අරගෙන, එයින් ලැබෙන ආදායමෙන් ආපසු ණය ගෙවීමට නොහැකි බව දැන ගෙන ණය ගත් මිනිහාත්, තමන්ගේ ශක්ති ප්‍රමාණය අනුව යම්කිසි දියුණුවක් ලබාගැනීමට ණය ලබාගත් පුද්ගලයාත් එක හා සමානද? ඇත්තවශයෙන්ම මෙය පුහු තර්කයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙයටත් වඩා වැදගත් කාරණයක් මෙහිදී මතක් කරන්න කැමතියි. අප කරන්නෙත් එංගලන්තය කළ එකමයි කියා කියනවා. අනික් රටවල් මෙන්ම අපේ රටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබාගන්නා විට එතැන කොන්දේසි පිළිගන්න ඕනැයයි කියනවා. ඒ කාරණය ඔප්පු කිරීමට එංගලන්තයේ මුදල් ඇමතිවරයා විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යවන ලද ලිපියකින් කොටසක් ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් කියවන්න යෙදුණා. මම ඒ ලිපිය මොහොතකින් නැවතත් කියවන්නම්. ඇත්තවශයෙන්ම මොන තර්කයට උත්තරයක් වශයෙන්ද ගරු රාජ්‍ය ඇමතිතුමා එය කියවූයේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඇනුත් කියනවා, මා කලිනුත් සඳහන් කළා, මා ඔප්පු කර පෙන්වා දුන්නා, දැන් නැවත වරක් ඔප්පු කර පෙන්වනවා අපේ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන්, ජාත්‍යන්තර බැංකුවෙන් මුදල් ණය ගැනීමෙන් වැටී තිබෙන තත්ත්වය ගැන. අපේ ආණ්ඩුව අපට වුවමනා ක්‍රම අපට වුවමනා පිළිවෙළට සකස් කර ගන්නවා වෙනුවට එම ආයතනවලින් ණය ලබාගන්නා විට ඒ වායින් නියම කරනු ලබන වැඩ පිළිවෙළ, අපේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ වශයෙන් ප්‍රධාන ලෙස පිළිගැනීමේ තත්ත්වයකට පත් වී තිබෙන බව දැන් පැහැදිලියි. අන්න ඒකයි අපේ තර්කය. එයට පිළිතුරු දීමට ගරු රාජ්‍ය ඇමතිතුමා කළ කථාවේ කොටසක්ම උපුටා දක්වන්න කැමතියි. එතුමා උපුටා දක්වා තිබෙනවා, එංගලන්තයේ මුදල් ඇමතිවර රෝයි ජෙන්කින්ස්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ස්වයිට්සර් මහතාට යවන ලද ලිපියෙන් කොටසක්. මෙයින් වෙනත් තර්කයක් මතු කරන්න පුළුවනි. ඒ ලිපිය ඉදිරිපත් කරන්න රාජ්‍ය ඇමතිතුමාට පුළුවන් නම්, මුදල් ණයට ගැනීමේදී මෙම ආණ්ඩුව විසින් එතැනට යවන ලිපිය මෙහි ඉදිරිපත් කරන්න බැරි මන්ද? එසේ නැබුවොත් මෙහි ඇති පරතරය හොඳින් පැහැදිලි වෙනවා ඇති. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි දෙවන වාක්‍යයෙන්ම පැහැදිලියි, මෙම ණය ලබාගැනීමේ අදහස වෙනත් කාර්යයක් සඳහා බව. මෙන්න ඒ ලිපියෙන් කොටසක් :

"Dear Mr. Schweitzer,

The Government of the United Kingdom requests of the International Monetary Fund a stand-by arrangement for a period of one year ...."

එංගලන්තයේ ආණ්ඩුව මෙම අරමුදලෙන් එක්තරා පිළිවෙළක් ඉල්ලා සිටිනවා; මොන විධියේ පොරොන්දුවක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

—ස්ටෑන්ඩ් බයි—ඒ කියන්නේ ඉංග්‍රීසි වට වුවමනා වුණොත් යම්කිසි මුදලක් ලබාගන්නට, එය එක්තරා ප්‍රමාණයකට දීමේ පොරොන්දුවක්.

මෙන්න මේ කොටසයි, මට විශෙෂයෙන් කියවන්නට වුවමනා කරන්නේ. ඒ ආණ්ඩුවේ වැඩ පිළිවෙළත්, අපේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළත් අතර වෙනසක් තිබෙන බව පැහැදිලි වන්නේ මෙතැනිනුයි. වෙනසක් නැත කියා කොපමණ කීවත් මා එය පිළිගන්නට ලෑස්ති නැහැ, පසුගිය අවුරුදු හතරහමාර තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මේ ආණ්ඩුව විසින් ලියන ලද ලිපි අප ඉදිරියට තබන තුරු.

"The purpose of this stand-by is to support the Government's economic objectives and policies . . . . "

ඒක බොහෝම ලොකු වෙනසක්. මේ මුදල් ඉල්ලීමේ අදහස මෙම ආණ්ඩුවේ අරමුණු සහ වැඩ පිළිවෙළවල් ඉටු කර ගැනීමයි යන්නයි, මෙහි අදහස. අපේ ආණ්ඩුව යම් කිසි අරමුණක් ඇතිව යම් කිසි වැඩ පිළිවෙළක් ගෙන යනවා; ඒ වැඩ පිළිවෙළ ඉටු කර ගැනීම සඳහා අපට මේ ණය මුදල අවශ්‍ය වී තිබෙන නිසා නුඹලාගෙන් අපි මේ ණය මුදල ඉල්ලනවා.

මේ ඉල්ලීමෙත් අපේ ඉල්ලීමෙත් අතර ලොකු වෙනසක් තියෙනවා නේද? මගේ විශ්වාසයේ හැටියට මේ ආණ්ඩුව යටතේ අපට සිදුවී තිබෙන්නේ මෙයයි. අපට ණය වුවමනා වී තිබෙන බව අප පිළිගන්නවා. එහෙත් මේ ණය පිටම වැඩ කිරීමේ සහ වැඩ පිළිවෙළවල් සකස් කිරීමේ අදහසින් බලයට ආ ආණ්ඩුවක් වශයෙන් ඒ ණය ලබා ගැනීම සඳහා එතැනින් නියම කරන ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළවල් පිළිගන්නට මේ ආණ්ඩුවට සිදු වී තිබෙනවා. එයයි, අපේ තර්කය; අපේ ප්‍රකාශය. එය එසේ නොවේය කියා කොපමණ කීවත්, ඒ කීම ඇත්තද, නැත්තද කියා කල්පනා කරන්නටවත් අපට පුළුවන් වන්නේ මේ ආණ්ඩුවේ මුදල් ඇමති විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට සහ ලෝක බැංකුවට මෙවැනි අවස්ථාවලදී ලියන ලද ලිපි අප ඉදිරිපිට තබනවා නම් පමණයි. අපේ ආණ්ඩුවත්, බ්‍රිතාන්‍ය ආණ්ඩුවත් අතර ඇති ප්‍රධාන වෙනස ඇත්තේ එතැනයි. එංගලන්තයේ ඒ ලේබර් ආණ්ඩුවේ මොන අඩුපාඩු තිබුණත් එක හොඳක් තිබුණා. ඒ ආණ්ඩුව එම ආයතනයට යැවූ ලිපිය පාර්ලිමේන්තුව මගින් රට ඉදිරිපිට තැබුවා. මුළු රටම මේ ගැන සාකච්ඡා කරනවා. ඒ රටේ සෑම පත්‍රවලම එය පළ වුණා. එංගලන්තයේ "ටයිම්ස්" පත්‍රයේ පළ වී තිබුණු ඒ ලිපිය මෙහිදී මම කියෙව්වා. එංගලන්තයේ තත්ත්වයෙත් අපේ තත්ත්වයෙත් ලොකු වෙනසක් තිබෙනවා. මා වෙන පරතරයක් පෙන්වන්නේ නැහැ. එංගලන්තය දියුණු රටක්; අපේ රට නොදියුණු රටක්. එංගලන්තය වැඩි වශයෙන් කාර්මික රටක්; අපේ රට කෘෂි කාර්මික රටක්. එංගලන්තය කාර්මික භාණ්ඩ ලෝකයට යවන රටක්; අපේ රට තවම අමු ද්‍රව්‍ය නිෂ්පාදනය කර ඒවා ලෝකයේ වෙනත් රටවලට යවා එයින් ලැබෙන ආදායමෙන් රැකෙන්නට උත්සාහ කරන රටක්. මේ රටවල් දෙකේ තත්ත්ව දෙක සමාන නැහැ. මෙන්න මෙතැනයි, වෙනස. අපේ රට නොදියුණු වුණත් වැදගත් හැටියට දුප්පත්ය කියන්නට පුළුවන් රටක්. එවැනි රටක් වශයෙන් අප ඒ ආයතනයට ණය ගන්නට ගියාම ඔවුන් ඒ අවස්ථාව පාවිච්චි කරනවා, අප යන්නට උත්සාහ කරන පාරෙන් හරවා ඔවුන්ට වුවමනා පාරට අප බස්සවන්නට. මොකක්ද වුවමනා පාර? මා කිසිම භයක් නැතිව කියනවා, ජාත්‍යන්තර මහා බැංකුවේ හෙවත් අයි. බී. ආර්. ඩී. එකේ හිටපු ප්‍රධානයාත්, දැනට සිටින ප්‍රධානයා වන මැක්නමාරා මහතාත්, ඔවුන්ගේ ආයතනය ගෙන යන්නේ කුමක් සඳහා ද, කුමන ප්‍රතිපත්තියක් අනුවද යන්න ලෝකයට පැහැදිලි ලෙසම කියා තිබෙන බව. ඒ අයගේ බලාපොරොත්තුව ධනේශ්වර ක්‍රමය අනුව ලෝකයේ දියුණුව ඇති කරන්නයි කියා පැහැදිලිව ඔවුන් කියා තිබෙනවා. එය පුළුවන්ද බැරිද කියන ප්‍රශ්නයට මා බහින්නේ නැහැ. එහෙත් ඒ අය ප්‍රකාශ කළ, ප්‍රසිද්ධ කළ, එකම ප්‍රතිපත්තිය එයයි. ඒ නිසා ඒ අනුව මිස අපේ රටට ඔවුන් ණයක් නොදෙන බව මෙතනදී මතක තබා ගන්න.

එපමණක් නොවෙයි; ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේ සිටම අපේ රටේ තිබුණු ආණ්ඩු සමාජවාදී ගමනට බැස්ස ආණ්ඩුයි කියා ඔප්පු කරන්නටවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී උත්සාහ කළා. ඕනෑ නම් ඒ කියමන පෙන්වන්න පුළුවන්. එහෙත් ඒ සම්බන්ධයෙන් කාලය ගන්නට ඕනෑ කමක් නැහැ. එතුමා වෙනස හැටියට පෙන්නුවේ කොපමණ ඉක්මණින් යන වාද කියන ප්‍රශ්නය පමණක් හැටියටයි. ඒ එසේ වේවා. මගේ විශ්වාසය අනුව නම් එය ඇත්තක් නොවෙයි. මේ රටේ පාර්ලිමේන්තු ක්‍රමය ඇති වූ දින සිටම, නැත්නම් මේ රට නිදහස් රටක්වූ දින සිටම, මේ රටේ ආණ්ඩු සමාජවාදී ගමනක යෙදෙන්නට තැත් කළා නම්, අද මේ ජාත්‍යන්තර අධිරාජ්‍ය බැංකු අප ධනේශ්වර ප්‍රතිපත්ති අනුව වැඩ කිරීමට හැඩ ගස්වනවා නම්, ඔවුන් එයිනුත් කළේ අපේ රටේ තීරණය වැලැක්වීමයි.

දැන් ඊළඟට අපේ රාජ්‍ය ඇමතිතුමා අපෙන් අහනවා, " අපි කළ දේවල් හැර උඹලා කරන්නේ කොහොමද " කියා. මම එකක් කියන්නම්. 1947 දී මා මුලින්ම මේ පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවක මෙම රාජ්‍ය ඇමතිතුමා එවකට මුදල් ඇමතිවරයා වශයෙන් කළ කථාවට පසුව එතුමා සමග මා පිටස්තර වශයෙන් සාකච්ඡා කළ විටෙක ඔහු මගෙන් ඇසුවා " උඹලා අපට කරන්නය කියන්නේ මොකක්ද " කියා. මම කියන්නද කියා මා අහන කොටම, " නෑ නෑ, අප දෙදෙනා අතර ප්‍රතිපත්ති අනුව වෙනසක් තිබෙන බව මා පිළිගන්නවා ; ඒ නිසා මා කියන්නේ උඹලාගේ ප්‍රතිපත්ති එයට ඔබන්නේ නැතිව කරන්නට දෙයක් කියන්නයි " කියා එතුමා කීවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ප්‍රශ්නය වෙනත් විධියකට අහමු. අපේ විදේශ වෙළඳාම බාර ඇමතිතුමාටත් ටිකක් අදාල වන ප්‍රශ්නයක් ගැනයි මා මේ වචනයක් කියන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමා මෙහිදී කියනවා " අපි මොන වාද කරන්නේ ; අපේ රටේ ආර්ථික සංවර්ධනයට අපට ප්‍රධාන වශයෙන් මුදල් සොයන්නට සිදු වී තිබෙන්නේ විදේශ විනිමය වශයෙනුයි ; අපේ යම් කිසි බඩුමුට්ටු අපි පිටරට යවා ඒවා විකිණීමෙන් ලැබෙන ආදායමෙන් අපි සොයා ගන්නා මුදලිනුයි, මේ සඳහා වියදම් සොයා ගන්නට ඕනෑ " කියා. එපමණක් නොවෙයි. රුපියල් 9 කෝටියක හිඟය කුත්—පරතරයකුත්—තියෙනවාලු. " ඒකට කමක් නැහැ ; අපට සිදු වී තිබෙන්නේ මෙයයි ; අප යවන බඩු මුට්ටු ආදියේ මිල බසිනවා ; අපි ගෙන්වන කාර්මික බඩුවල මිල නගිනවා ; මේ ගැන අපට කරන්න දෙයක් නැහැ ; ඒ නිසා උඹලා කරන්නය කියන්නේ මොකක්ද " ඔන්න ඔහොමයි රාජ්‍ය ඇමතිතුමා කියන්නේ. එක කරුණක් මතක් කරන්න මා අපේ විදේශ වෙළඳ කටයුතු බාර ඇමතිතුමාගෙන් අවසර ඉල්ලනවා. මා එක කර්මාන්තයක් ගැන බොහොම උත්සාහ කර තිබෙනවා මේ ගරු සභාවේදී ඒ ගැන අපට පුළුවන් දෙයක් ගැන මතක් කරන්නට. මා නැවත එය මතක් කරන්නට යන්නේ නැහැ. එතුමා එය ප්‍රධාන වශයෙන් පිළිගත් බවත් මා ඉතා ගෞරවයෙන් මෙතැන ප්‍රකාශ කරනවා. අපට කරන්නට දේවල් තියෙනවා. මේ සමාජවාදී ප්‍රශ්නය ක්‍රියාත්මක එකක් වන්නේ එතකොටයි. "එක්ස්පෝට් ඇන්ඩ් ඉම්පෝට් ඉකෝනොමි" එකක් ගැන බොහොම පෙර සිට කියනවා. මේ "එක්ස්පෝට්" සහ "ඉම්පෝට්" කියන වචනවලට සිංහලෙන් කියන වචන මට මතක නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
අපනයන සහ ආනයන

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
බොහොම ස්තුතියි. මා කවදත් ගරු මුදල් ඇමතිතුමාගේ කථාවේ එන වචන මාලාවට ප්‍රීතියෙන් කන් දීගෙන සිටියා.

ලංකාව අපනයන සහ ආනයන ක්‍රමය උඩ ජීවත් වන රටක්. මේ රටින් බඩු පිට රට යවනවා. ඒ වෙනුවට පිටරටින් බඩු මේ රටට ගෙන්වනවා. ඒක ඇත්තයි. දැන් එසේ නම් අපට ඊළඟට තිබෙන ප්‍රශ්නය මොකක්ද? අප ගෙන්වන බඩුවල මිළ නගිනවා නම්, ඒ වාගේම යවන බඩුවල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිළ බසිනවා නම්, යවන බඩුවලට ලැබෙන මිළට සරිලන සේ බඩු ගෙන්වීම එක විධියක්. මේ අතර ජාත්‍යන්තර ඒකාධිකාරී කොම්පැනි වල ක්‍රියා නිසා අප යවන බඩුවල මිළ බසින විට ඊට මුහුණ දීමට විධිවිධාන යෙදීමට අපට යුතුකමක් තිබෙනවා. පුළුවන් තරම් දුරට ඒ ප්‍රශ්නයට මුහුණ දීමට යුතුකමක් තිබෙනවා. පිටරටට බඩු යැවීමේ කටයුත්ත එක තැනකින් කිරීමේ අවශ්‍යතාව මතු වන්නේ මෙවිටයි. එතැනට මා එන්නේ සමාජවාදී අදහස් ඇතිව පමණක් නොවෙයි. අද අපේ රටේ ආර්ථික තත්ත්වය අනුව අප නිකම්ම එතැනට තල්ලු වී සිටිනවා. එය පිළිගෙන ක්‍රියා කරනවා නම් ඊට වඩා හොඳයි.

මේ වෙනුවට ඊට වෙනස් කථාවක් ගරු නිවාස ඇමතිතුමා කර තිබීම ගැන මා කනගාටු වෙනවා. අපේ තේ කර්මාන්තය ආරක්ෂා වී තිබෙන්නේ රුපියලේ වටිනාකම අඩු කිරීම නිසා යයි එතුමා කීවා. හිටපු මුදල් ඇමතිවරයකු එවැනි වචනයක් කීම ගැන මා හරියට කනගාටු වෙනවා. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ ඒ අදහස සටහන් නොවන බව ඔප්පු කරනවාට වඩා අපේ හිටපු මුදල් ඇමතිතුමාගේ දැනුමෙන්ම එය එසේ නොවන බව පිළිගන්නවාට සැකයක් නැහැ. මේක පුදුම ආරක්ෂා වීමක් නොවැ? "ඩිවැලුවේෂන්" එක නිසා අපේ තේ කර්මාන්තය ආරක්ෂා වෙනවා නම්, අපොයි, අප ඒ ආරක්ෂකයා ගෙනුත් ආරක්ෂා වන්නට ඕනෑ.

තවත් එකක් කියා තිබෙනවා. රුපියලේ වටිනාකම අඩු වුණු නිසා කුරුඳු වැනි පිටරට යවන වෙනත් සුළු සුළු වර්ගවලින් අපට වාසි ලැබුණාලු. අපි ඇත්තට මුහුණ පාමු. ජාත්‍යන්තරව විදේශ විනිමය වශයෙන් ලැබෙන්නා වූ මිළ වැඩි කිරීමට අබ මල් රේණුවක බලපෑමක් නෑ. රුපියලේ වටිනාකම අඩු කිරීමේ ශාස්ත්‍රය දන්න ඇමතිතුමා මා කියන එක පිළිගනීතැයි මා හිතනවා. රුපියලේ වටිනාකම අඩු කිරීමෙන් ඉෂ්ට කර ගන්නට පුළුවන් වන්නේ මොකක්ද? මිළ අඩු වීම නිසා අපේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය සඳහා ජාත්‍යන්තර වෙළඳපොළින් වැඩි වාසි එනවා යයි කියනවා. විශේෂයෙන් තමන්ගේ කර්මාන්ත ශක්තිය සම්පූර්ණයෙන් පාවිච්චි කිරීමේ තත්ත්වයක් නැති රටවල් තම මුදල්වල වටිනාකම අඩු කළාම ඉතා ඉක්මනින් තමන්ගේ නිෂ්පාදනය වැඩි කරන්නට පුළුවන් වන නිසා, එසේ මුදලේ අගය අඩු කිරීමෙන් තාවකාලික වාසියක් ලබන්නට ඒ රටවලට පුළුවන් බව අප ඒ දවස්වලම තෝරා දුන්නා. එහෙත් ලංකාව වැනි කෘෂිකාර්මික රටකට ඒ තත්ත්වය නැහැ. ඉතාම හොඳ පෝර දැම්මත් තේ පඳුරක් වවා තේ දළු නෙළන්න අවුරුදු 5 ක් නැත්නම් 3 ක් වත් ගත වෙනවා. බඩ් රබර් වැව්වත් කිරි කපන්න අවුරුදු 7 ක් පමණ යනවා. ඉක්මනින්ම තැළුවත්, කුරුඳු තළන්න අවුරුදු 3 ක් වත් ඕනෑ. මා දන්න තරමින් පොල් ගහකින් ගෙඩි කඩන්න අවුරුදු 7 කින් පුළුවන් වුණාට, වත්තම හරිගැසී එන්න අවුරුදු 10 ක් 12 ක් 15 ක් යනවා. මෙයයි, ඇත්ත. මෙසේ එල නෙලීමට කාලයක් ගන්න ද්‍රව්‍ය නිෂ්පාදනය කරන රටකට සිය මුදලේ වටිනාකම අඩු කිරීමෙන් සිදු වන්නේ එකක් පමණයි. මුදලේ වටිනාකම අඩු කිරීමෙන් සිදු වන්නේ දුප්පතා ගසාකෑමට ගොදුරු වීම පමණයි. මෙය මගේ වචනයක් නොව විද්‍යා පර්යේෂණ හා නිවාස ඇමතිතුමාගේම වචනයක්. එම නිසා අර විධියේ වැරදි ප්‍රකාශ මින් ඉදිරියට වත් නොකරන ලෙස මා ඉල්ලා සිටිනවා. රුපියලේ වටිනාකම අඩු කිරීම නිසා පිටරට යවන ද්‍රව්‍යවල ජාත්‍යන්තර මිළ වැඩි වුණාය කියනවා නම්, රුපියලේ වටිනාකම අඩු කිරීම හරි. එහෙත් එවැන්නක් නම් සිදු වී නැහැ. මෙහෙන් පැන්නොත් අරහෙන් අහු වෙනවා. එම නිසා රුපියලේ වටිනාකම අඩු කිරීමේ කිසිම තේරුමක් නැහැ. කොයි විධියෙන් බැලුවත් එන්නේ එකම තැනටයි. ලොකුම ඇත්තත් එයයි. අපේ ආර්ථික ක්‍රමයේ දියුණුවක් ඇති කරන නිසි මාර්ගයට අප තවම පිවිසුණේ නැහැ. ඒ සේරම වහන්න වගාව, වගාව, කියනවා.

ඒ ගැනත් මේ අවස්ථාවේදී වචන කීපයක් කියන්න ඕනෑ. මේ වගාව සඳහා මෙපමණ මුදලක් යෙදවූවාය, අර වගාව සඳහා මේ තරම් මුදලක් වැය කළාය කියනවා. යම් වගාවකට වේවා, ද්‍රව්‍ය නිෂ්පාදනයකට වේවා, රජය යම්කිසි මුදලක් යෙදෙව්වා නම් ඒ මුදල ලැබුණේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

කොහෙන් ද යි කවුරුවත් අහන්නේ නැහැ. එහෙත් ඒ මුදල ලැබුණේ අපේ පැරණි නිෂ්පාදනවලින් ලැබුණු ආදායමින් නොවෙයිද? කවුරු කෙහොම කීවත් විදේශ ආධාර හැරුණාම, තේ, පොල්, රබර්වලින් ලැබෙන ආදායමෙන් තමයි, අනෙක් දේවල් සඳහා වුවමනා කරන මුදල් අප හොයා ගන්නේ. කෘෂිකර්මය පැත්තෙන් බැලුවාම එය දියුණු කිරීම සඳහා කර තිබෙන්නේ මොනවාද කියන ප්‍රශ්නය එවිට මතු වෙනවා නේද? අපේ තේ වගාව බේරුණේ රුපියලේ වටිනාකම අඩු කළ නිසාය යන කීමේ ලොකු වරදක් තිබෙනවා. එයම පොල් ගැනත් කියන්නට හදා යම් දෙයක් මතක් වී ඇමතිතුමා ඒ වචන ටික ගිල ගත්තා. පොල්වල කොප්පරාවල මිළ ඉහළ නැග්ගේ පිලිපයින් දූපතේ ඇති වුණු හානිය නිසා, එතෙක් පිලිපයින් දූපතෙන් පොල් ගත් ඇමෙරිකාවට ඒ සඳහා ජාත්‍යන්තර වෙළඳ පොළට එන්නට සිදුවුණු නිසා බව මුළු ලොවම දන්නවා. අපේ අපනයන ද්‍රව්‍ය වල මිළ ඉහළ නගිනවාය කියා සන්තෝෂ වෙනවාත් සමගම තිබුණු තැනටම ඒ මිළ බැස්සා. අප ඒ තත්ත්වයට මුහුණ දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත මේක නේද? අපේ රටේ තේ කර්මාන්තය එක්තරා ප්‍රමාණයකට හෝ මේ කාලයේදී ආරක්ෂා වුණා නම් එය එසේ වුණේ හොඳ තේ නිෂ්පාදනය වැඩි යෙන් කර තිබුණු කොටස් නිසයි. උඩරට වේවා මැදරට වේවා පහතරට වේවා හොඳ තේ වර්ග නිෂ්පාදනය වැඩි කළ තැන් වලි නුයි එම තත්ත්වය ආරක්ෂා වුණේ. ඊට හේතුව වුණේ වෙන කිසිවක් නොවෙයි, අළුතින් හොඳ තේ සහ හොඳ රබර් යනාදිය වවන්නට දුන්නු ආධාර වැඩ පිළිවෙළයි. මෙම ආධාර ක්‍රමයට අවශ්‍ය මුදල් ආවේ කොහෙන්ද? එම නිෂ්පාදනවලින් ම ඇතිවුණු ආදායමයි ඒ සඳහා යෙදුවේ. තත්ත්වය ඒකයි. ඒ නිසා ආහාර වගාවට අප කොතෙක් උත්සාහ දැරුවත් අනික් වගා නිෂ්පාදන යනාදියට සැළකිල්ලක් දැක්වීම අඩු කරන්නට බැරිය යන්නයි මා සඳහන් කරන්නේ.

අවුරුදු පහකින් පසු මෙතැනට ඇවිත් කියන්නට කාටවත් ධෛර්යයක් ඇති වෙලා නැහැ, තේවලින් ලැබෙන මුළු ආදායමට සරිලන ආදායමක් සංචාරකයින්ගෙන් ලබා ගන්නට පුළුවන් වී තිබෙනවාය යන්න. එම කතාව ගිවපු මුදල් ඇමතිවරයකු අපට කිව්වා නම්— එම ඇමතිතුමාගේ පළමුවන අයවැය ලේඛන කථාව අවසානයේදී කී වචන කීපය වැනිම වචන කීපයකින් පිළිතුරු දෙන්න පුළුවනි, මෙන්න මේ පිළිවෙළට, ඉංග්‍රීසියෙන් :

"To get into tune with the rhythm of the universe."

That was a remark in rhythm with the universe but it is certainly not in tune with the rhythm of our economy.

මේ විධියට එක එක පැත්ත ගැන වැඩියෙන් බලකර කතාකොට මේක බේරන්නට බැහැ. අපොයි අම්මේ, අපේ වී වගාව වැඩි කිරීම හොඳද නරකද යන්න නොවෙයි ප්‍රශ්නය. ඒක වැරදි ප්‍රශ්නයක්. කුමන වගාවක්වත් තනිවම වැඩි කිරීම හොඳද නරකද කියන එක නොවෙයි ප්‍රශ්නය. අපේ මුළු ආර්ථික ක්‍රමයේම සංවර්ධනය ඉටු කිරීමට වුවමනා කරන මාර්ගය කුමක්ද යන ප්‍රශ්නයටයි අවුරුදු ගණනක් මුළුල්ලේ සිටම අපට සිත දෙන්නට සිදු වී තිබෙන්නේ. මා එදිනෙදා පොඩි පොඩි ප්‍රශ්නවලට සිත නොදී අන්න ඒ මූලික ප්‍රශ්නවලටයි හිත හරවන්නට උත්සාහ දරන්නේ. මෙතැනදී මා අපේ රාජ්‍ය ඇමතිතුමාගේ වචනයක් ඉදිරිපත් කරන්නට කැමතියි. ඇත්තටම ඒ ඇමතිතුමා උත්සාහයක් දරා තිබෙනවා ගරු මුදල් ඇමතිතුමා ඉටු නොකළ කර්තව්‍යයක් ඉටු කර දෙන්නට. තමන්ගේ ආණ්ඩුවට ස්ථිර ප්‍රතිපත්තියක් ස්ථිර අරමුණක් හා ස්ථිර පදනමක් ඇති ආර්ථික වැඩ පිළිවෙළක් තිබෙන බව ඔප්පු කිරීම සඳහා එතුමා මෙසේ ප්‍රකාශ කර තිබෙනවා :

"The theme of this Budget, as has been the theme of all Budgets introduced by this Government from 1965, has been development ;"—

ඇත්ත කියනවා නම් පාර්ලිමේන්තු ක්‍රමය ඇතිවූවායින් පසු මා දන්නා කාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සීමාව තුළ හැමෝම කතා කර තිබෙන්නේ සංවර්ධනය ගැනයි. මෙන්න මේකයි මෙහි තිබෙන රහස :

"how is this country to develop, the public sector and the private sector."—

අපේ ආර්ථික ක්‍රමයේ ආණ්ඩුවට අයිති කොටසක් පුද්ගලික අංශයට අයිති කොට සත් යන දෙකම දියුණු කරන්නේ කෙසේද කියන ප්‍රශ්නයයි පැන නැගී තිබෙන්නේ. මගේ විශ්වාසයේ හැටියට ඒකයි වරදට මුල වී තිබෙන්නේ.

සමාජවාදී ගමනක් යන ආණ්ඩුවකට ඔය විධියේ ප්‍රශ්න මතු වන්නේ නැහැ.

මෙතැන වෙනත් කථාවක් තිබෙන බව මම දන්නවා. එහෙත් ගරු රාජ්‍ය ඇමති තුමා එය මතු කර නැහැ. මිශ්‍ර ආර්ථික ක්‍රමයයි ඒක. ඒ නිසා මම ඒකට වැටෙන්නේ නැහැ. මෙහෙමයි මෙතැන කියා තිබෙන්නේ :

"How is this country to develop, the public sector and the private sector; what are the measures that a State must take either by capital investment in the public sector or by inducements given to the private sector to raise the national income and to develop the economy of this country?—[OFFICIAL REPORT, 13th August 1969; Vol. 86, c. 337.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සන කථා විවාදයේදී මම ප්‍රශ්න මතු කරමින් ඒක ටිකක් විස්තර කළා. අපේ රටේ නිෂ්පාදනවල තිබෙන අගය වැඩි කිරීමේ අර්ථය කුමක්ද කියන ප්‍රශ්නයයි ඒ. ඒ නිසා ඒ කාරණය ගැන මම නැව තත් වරක් කථා කරන්නට යන්නේ නැහැ. එහෙත් මම එකක් ඉතා ඕනෑකමින් කියනවා. රටේ ආර්ථික ක්‍රමයේ රාජ්‍ය අංශය ඇති කරගෙන යන ප්‍රමාණයට, වැඩි කාලයක් යන්නට පෙර පෞද්ගලික අංශය බොහෝ දුරට පටු වේගන යන්නට ඕනෑයයි මම හිතනවා. අද බැංකු රජයට ගැනීමේ ප්‍රතිපත්තියක් ඉන්දියාවේ මතු වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය තුළත් ගැබ් වී තිබෙන්නේ එයමයි. මා දැන් මෙතැන ඒ ගැන කථා කරන්නට යනවා නො වෙයි.

අපි මෙය වෙනත් විධියකින් කල්පනා කර බලමු. ඉන්දියාවේ අගමැතිනිය වන ඉන්දිරා ගාන්ධි මැතිනිය කියා තිබෙන්නේ, මට මතක තිබෙන හැටියට නම්, ඉන්දියාවේ බැංකු 14 ක් රජයට ගැනීමේ අදහස, ඒ බැංකුවල ආදායම සහ මුදල් රටේ ආර්ථික ක්‍රමයේ දියුණුව සඳහා පාවිච්චි කිරීමේ අදහස ඉෂ්ට කිරීමය කියායි. ඔව්, එහි අර්ථය එක් පැත්තකින් පැහැදිලි ලෙස කියා තිබෙනවා. රජයට ගන්න බැංකුවල වැදගත් ප්‍රමාණයක් යම් කිසි ලොකු කාර්මික ධනපතියන් විසින් ඇති කරනු ලැබ පාලනය කරනු ලබන්නා වූ බැංකුය; ඒ බැංකුවල ආදායම සහ මුදල් රටේ ආර්ථික ක්‍රමය දියුණු කිරීම වෙනුවට "ස්පෙකියුලේෂන්" වලට—ඒ කියන්නේ, යම්කිසි දේවල් ඇති වෙනවා යන විශ්වාසයෙන් යම්කිසි තත්ත්වයක් වෙළඳ පොළේ ඇති කර එවැනි තත්ත්ව යකින් ලැබෙන වාසියක් වෙතොත් එය දෙවනුව ලබා ගැනීම සඳහා—පාවිච්චි කරනවාය කියනවා. ඒ කාරණය පැහැදිලි කර තිබෙනවා. ඒ තත්ත්වය නවතිනවා, මේ බැංකු රජයට ගත්තාම. ඒක ඇත්ත. සූදුකාරයන් කරන්නා වාගේ වැඩ එතකොට නවතිනවා. එහෙත් සූදුකාරයන් ඒ සූදුව ගෙන යන්නේ ඒ අයගේ පෞද්ග ලික අංශයේ ඇති අයිතිවාසිකම්, ධනය, ආදිය වැඩි කර ගැනීමටයි. ඒ නිසා ඊට ඉඩ දෙන්නේ නැතැයි කියා තිබෙනවා. ඒක හරි. එහෙත් මා කියන්නේ එහි අර්ථයයි.

මොන විධියට බැලුවත්, අප හැම දෙනා ම රජයට අයිති අංශය දියුණු කිරීමට ඉදිරිපත් වෙනවා නම් ඒ ප්‍රමාණයට අව සානයේදී අපි පෞද්ගලික අංශය සීමා කරනවා. එපමණක් නොවෙයි. මගේ විශ්වාසයේ හැටියට නම්, එන්ට එන්ටම, පෞද්ගලික අංශයට භාර දීලා තිබුණු කොටස් නැවතත් රාජ්‍ය අංශයට ක්‍රමානු කූලව ගන්නට බැරි තත්ත්වයක් ඇති වෙනවා. රජය සන්තක කිරීමේ ප්‍රශ්නය ක්‍රියාත්මක ප්‍රශ්නයක්. එය නිකම්ම ප්‍රති පත්ති ප්‍රශ්නයක් නොවෙයි. මා ඒ ගැන මෙතැන කථා කරන්නේ නැහැ. දැන් මම ඒකවත් කිව්වේ, ගරු රාජ්‍ය ඇමති තුමාගේ කථාවේ ඒ හා සම්බන්ධ ප්‍රශ්න වගයක් තිබෙන නිසයි. නුඹලා යම් යම් අංශ රජයට ගැනීමෙන් ඇති වුණ ප්‍රයෝ ජනය ගැන කථා කළාය, නමුත් රජයට තව කොපමණ ගන්නද, ඒකෙන් මේ විදේශ විනිමය ප්‍රශ්නය විසඳන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]
කෙසේද, කියා අදහස් පළ කළා. නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කථාවෙ තිබෙන මූලික වරද මෙයයි. මෙයින් හැඟීමක් ඇති කරන්නට උත්සාහ කරන්නේ සමාජ වාදයේ ගැබ් වී තිබෙන එකම දෙය අන් කිසිවක් නොව රජය සන්තක කිරීම පම ණක් බවයි. ඒක සම්පූර්ණයෙන් වැරදි අදහසක්. කිසිම වෙලාවක අප කවුරුවත් පිළිගත්තාවූ අදහසක් නො වෙයි, ඒ. ඒක අපේ පිටට දාපු අදහසක්. ඒක ඇත්තක්. රජය සන්තක කිරීමට අවශ්‍ය වුණ තැන්වලදී එය කරනවා. මම කියනවා, ලංකාවේ රජය සන්තක කරන් නට වුවමනා පළමුවෙනිම අංශය වන්නේ විදේශ වෙළඳ අංශයයි කියා. ඒක ගත්ත දවසට මම ලැහැස්තියි කියන්න, අවුරුදු 5 ක් 10 ක් යන්න කලින් ඔය මහා ලොකු තේ වතුකාරයන් ආණ්ඩුව ළඟට වැඳ ගෙන එන්න පුළුවන් අනේ මගේ එකත් ගනින් කියාගෙන. එක වතාවක් එහෙම එකක් වුණා. අපේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති වශයෙන් අර ගෙවල් ප්‍රශ් නය ගැන—නීති පනතක්වත් ගෙනාව නොවෙයි—යෝජනාවක් ගෙනෙන්න යන බව දැනුම් දුන් වෙලාවෙ මම දන්නවා විශාල නිවාස ධනපතියෙක්—ඔහුට ගෙවල් පන්සිය ගණනක් තිබෙනවා—මුදල් ඇමතිතුමා ළඟට ඇවිත් කිව්වා, අනේ මගේ ගෙවල් ටිකත් රජයට අරගෙන මාව නිදහස් කරන්නය කියා.

මෙතැන තිබෙන ප්‍රශ්නය අපේ ආර්ථික යේ කුමන තැන්ද අප විසින් මුලින් අතට ගත යුත්තේ කියන ප්‍රශ්නයයි. එතැන ඉඳලා තමයි අනික් ඒවාට හැරෙන්න පුළුවන් වන්නේ. මම කීප වතාවක්ම මේ ගරු සභාවෙ මතක් කර තිබෙනවා, අපේ තේ කර්මාන්තය පිළිබඳ ප්‍රශ්නයේදී, තේ අයිතිකරුවන්ටත්, පොල් අයිතිකරුවන් ටත්, රබර් අයිතිකරුවන්ටත් ඒ වාගේම වෙනත් මොනම නිෂ්පාදනයක හෝ අයිති කරුවන්ටත් වුවමනා දීර්ඝ කාලීන ස්ථිර මිලක් ලැබීම සහතික කිරීමයි කියා. එත කොට ඒ අනුව ඔවුන්ගේ අනික් කටයුතු සූදානම් කරගන්නට ඔවුන්ට පුළුවනි. මගේ තර්කය හා මගේ විශ්වාසය මේකයි. විදේශ වෙළඳාම හරියාකාර අතට ගත්

ගත් ආණ්ඩුවකට එහි වාසිය හෝ අවාසිය ආණ්ඩුව විසින්ම ලබාගනිමින් එහි සාර්ථ කත්වය ලබා ගත හැකි. දැන් මේ වේලාවෙ මා ඒ ගැන කථා කරන්න ඕනෑ නැහැ. අර ඇසූ ප්‍රශ්නයට උත්තරයයි මා ඒ දුන්නෙ. අපි කල්පනා කරන්නේ අපේ ආණ්ඩුවකින් අපි පටන්ගන්නේ එතැනින් බවයි. එතකොට කිසිම අනුමානයක් නැතුව මේ විදේශ අධිරාජ්‍ය බැංකු කෑ ගහ ගෙන ඒවි, මෙතැනින් ලියා තිබෙන ලියුම් වලින් පොරොන්දු වී තිබෙන්නේ මෙන්න මෙහෙමයි කියා. අන්න එදාට විශාල රණ්ඩුවක් ඇති වේවි. හැබැයි, ඒ රණ්ඩුව නිකම් මුදල් රණ්ඩුවක් නොවෙයි. අපේ රටේ නිදහස් සත්‍යතාවය තහවුරු වන, දේශපාලන ක්‍රියාවලින් මේ රට එක්රුස් වන, මේ ජාත්‍යන්තර බැංකු මාර්ගවලින් අපට බල පාන්නට තිබෙන ඒ අධිරාජ්‍ය ක්‍රමයට නැවතත් අලුත් විධියකට මුහුණ පාන්නට සිදු වන, තත්ත්වයක් ඇති වන බවට මට නම් කිසිම සැකයක් නැහැ.

එයට මුහුණ දෙන්නේ කොයි විධියෙන් ද? අර ඇමෙරිකන් මහා අධිරාජ්‍යයේ එළි පත්ත ළඟ සිටින පුංචි කියුබාවේ පිදෙල් කැස්ට්‍රෝ කියන පුද්ගලයා මාර්ගය පෙන් නුවා වාගේයි. පිදෙල් කැස්ට්‍රෝ බලයට පැමි ණෙන විට ඔහුට කිසිම සමාජවාදී අරමුණක් තිබුණේ නැත කියා ඔහුම කියා තිබෙනවා. එහෙත් අධිරාජ්‍ය වාදීන් ඒ ආණ්ඩුවට ඔවුන්ගේ ආර්ථික මාර්ගවලින් ඒ ඒ අවස් ථාවලදී දේශපාලන බලපෑම් සහ පහර ගැසීම් කළ නිසා ස්වකීය නිදහස ආරක්ෂා වන විධියට නිසි ආකාරයට පිළිතුරු දෙමින් පියවරෙන් පියවර ගැනීමෙන් කියුබාවෙ කැස්ට්‍රෝගෙ ආණ්ඩුව වෙනස් වුණා. අංග සම්පූර්ණ සමාජවාදී ක්‍රමයක් ඒ රටේ ඇති වුණා. මේ රට පාලනය කරන සමගි පෙර මුනේ ආණ්ඩුවකටත් ඒ විධියට පියවර පිට පියවර ගැනීමේ ශක්තිය ඇති වෙන ප්‍රමාණයටයි, ඔය සමාජවාදී ගමන හරියා කාරව ගෙන යන්න පුළුවන් වෙන්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ සිටින අපි නොවෙයි, මේ ආණ් ඩුව භාර ගෙන තිබෙන්නෙ. මේ ආණ්ඩුව භාර ගත් උදවිය එය කර ගෙන යා යුතුයි. අපි ඒ කටයුතු කරන්න ගියොත් එය වැර දියි. මේ ආණ්ඩුව යම්කිසි ප්‍රතිපත්තියක් අනුව රට පාලනය කරන අයයි. ඒ ප්‍රති පත්ති මොනවාද යන්න ඒ ආණ්ඩුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රියාවන්ගෙන් අපි විසඳා ගන්නවා. ආණ්ඩුවේ කියමනාවලින් නම් නොවෙයි. අපේ රාජ්‍ය ඇමතිතුමාගේ කියමනාවලින් නම් ලොකු ඇත්තක් කියවුණා. එතුමා මෙන්න මේ විධියට කියා තිබෙනවා. "We have developed the economy of this country through the speeches of the Finance Ministers." නිකම්ම ඇත්ත කියවුණා. ගරු මුදල් ඇමතිතුමාගේ කතාවලින් අපි අවුරුදු 5 ක් මුළුල්ලේ මේ රටේ ආර්ථික ක්‍රමය දියුණු කර ගෙන ආවාය කියා එතුමා කිව්වා. ඕවාට තමයි කියන්නේ කටින් බතල කොළ හිටවනවාය කියා. ඒකට කමක් නැහැ. එහි ඇත්ත තේරුම් සිතා ගන්න නම් නැවත අපි අපේ Friend ඉගැන්වූ දේවල් මතක් කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතා ඕනෑකමින් කියන්න කැමතියි, අපට මෙතනදී කරන්න තිබෙන කාර්‍යයන් දෙකක් ගැන. විරුද්ධ පාර්ශ්වයේ සිටින අප විසින් කල යුතු කාර්‍යයන් දෙකක් තිබෙනවා. ආණ්ඩුවේ අවසාන කාලයේදී වුණත් මා එය මතක් කර දෙන්න කැමතියි. එයින් එකක් නම් ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල වැරදි පෙන්වීම සහ අපේ ප්‍රතිපත්ති ඊට හරස් කිරීමේ කටයුත්ත නිසි අවස්ථාවලදී කිරීමයි. දෙවැනි කරුණ නම් ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව ගෙන යන වැඩ පිළිවෙල්වල මදිකම්, දුර්වලකම්, පෙන්වා දීමයි. ඔය දෙකෙන් එකක්වත් අපි මෙතෙක් අත්හැර නැහැ. නොයෙකුත් අවස්ථාවලදී මා විසින්ම—මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන්ම වෙනස් වූ ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීමට තැත් කරන කෙනෙක් වූ මා විසිනුත් —මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙල්වල තිබෙන මදිකම් දුර්වලකම් පෙන්වා දීමට උත්සාහ කර තිබෙනවා. අයවැය විවාදයේ කාරක සභා අවස්ථාවලදීත් නොයෙක් අංශවල, විශේෂයෙන්ම ඉඩම් දෙපාර්තමේන්තුවේ, නොයෙක් මදිකම් දුර්වලකම් ගැන කරුණු පෙන්වා දී තිබෙනවා. නමුත් මා අවසාන වශයෙන් කියන්නේ මෙයයි. රාජ්‍ය ඇමතිතුමාට වුණත් ආඩම්බරයෙන් කියන්න සිදු වී තිබෙනවා, රජය අතට අපේ රටේ විදේශ වෙළඳාමෙන් කොපමණ කොටසක් අරගෙන තිබෙනවාද කියා. මගේ වේලාව අවසන් වී ගෙන යන නිසා මා මෙය විස්තර කරන්න යන්නේ නැහැ. කොපමණ කොටසක් රජය අතට අර ගෙන තිබෙනවාද කියන කාරණාව ගැන ඔහු බොහොම ආඩම්බරයෙන් කිව්වා. මෙහි තිබෙන වරද මෙපමණයි. එයින් ගන්න තිබෙන ප්‍රතිපත්ති සහ පාඩම මෙයයි. යම් කිසි අංශයකට ආණ්ඩුව අත තැබීමට යමකින් තල්ලු වෙන තෙක් නොසිට ඒ ප්‍රතිපත්ති අනුව ඒ දෙසට වැඩ කර ගෙන යාමයි. ඒ දෙකේ පරතරය සහ වෙනස තමයි, ධනේශ්වර වාදී සහ සමාජවාදී ආණ්ඩු දෙක අතර තිබෙන පරතරය. ඒ පරතරය අනුව මීළඟට මේ රට ගෙන ආ තැනින් එතරට ගෙන ඒම භාර වන්නේ සමගි පෙරමුණේ ආණ්ඩුවටයි. අපි ඒ අපේක්ෂාවෙන් ලබන මහ මැතිවරණයේදී මහජනයා ඉදිරිපිටට එනවා. අපේ ඒ අදහස ඉටු වෙනවා ඇතැයි විශ්වාස කරන බව ප්‍රකාශ කරමින් මගේ කතාව අවසන් කරනවා.

අ. භා. 7

**ජෝර්ජ් කොතලාවල මයා.**
*(திரு. ஜோஜ் கொத்தலாவல)*
(Mr. George Kotelawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම ළාබාල මන්ත්‍රිවරයකු වන මට පැරණි ඉතා උගත් මන්ත්‍රීතුමකු වන අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට පසුව කථා කරන්නට ලැබීම මගේ වාසනාවක්ය කියා මා කල්පනා කරනවා. මගේ කථාව ආරම්භ කරන්නට මත්තෙන් විරුද්ධව පක්ෂයේ හිතවත් ගරු මන්ත්‍රිවරුන්ගෙන් මා බැගෑපත්ව ඉල්ලීමක් කරන්නට සතුටුයි. සමහර විට මගේ වචන වැරදුණොත් නැත් නම් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රිවරුන්ගේ සිත රිදෙන යම් යම් වචන මගෙන් ප්‍රකාශ වුණොත් එය සිතා මතා කළ දෙයක් හැටියට නොසලකා මට සමාව දෙන මෙන් පළමුවෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම බණ්ඩාරගම කොට්ඨාශය ගැන මේ ගරු සභාවේදී ප්‍රකාශයක් කරන්නට තිබෙනවා. මේ ගරු සභාවේදී මා යම් ප්‍රශ්නයක් ඇසුවොත් ශබ්දයක් කළොත් මා උසාවියෙන් ආවාය කියා විරුද්ධ පක්ෂයේ සියළු දෙනාම කෑගසනවා. මා උසාවියෙන් නොවෙයි ආවෙ. මා එච්චේ අගලවත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) බව මා ආඩම්බරයෙන් කියන්නට සතුටුයි.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
ඒත් උසාවිය මගින් නේද?

**ජෝර්ජ් කොතලාවල මයා.**
*(திரு. ஜோஜ் கொத்தலாவல)*
(Mr. George Kotelawala)
බණ්ඩාරගම සටනේදී මා සමග සටන් කළ ඒ හිටපු මන්ත්‍රීතුමාට එසේ තරඟ කරන්නට නීත්‍යානුකූලව කිසිම බලයක් නොමැති බව අපේ නායකතුමන්ලා බණ්ඩාරගම මහජනතාවට ප්‍රකාශ කළා. නමුත් විරුද්ධ පක්ෂයේ නායකතුමන්ලා, "නැහැ, අපි ගිහින් එතුමා පුටුවේ වාඩි කරනවා, පුටුවක් ගෙනැවිත් දෙනවා" ය කියා බොහොම ලොකුවට කෑගැසුවා. අවසානයේදී ශ්‍රේෂ්ඨාධිකරණයෙන්—[බාධා කිරීමක්].

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
අවුරුදු විස්සක් තිස්සේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙනස් වී තිබෙන බව අප සිතට ගත්තේ නැහැ.

**ජෝර්ජ් කොතලාවල මයා.**
*(திரு. ஜோஜ் கொத்தலாவல)*
(Mr. George Kotelawala)
එයින් කාටද පාඩුවක් වුණේ? විසි තුන් දහසක් ඡන්දදායකයන්ටයි. විසි තුන් දහසකගේ ඡන්දය අහෝසි වී ගිය බව මා තමුන්නාන්සේලාට මතක් කරනවා. අපරාධයක් කර තිබෙන්නේ මා නොවෙයි. බණ්ඩාරගම මන්ත්‍රීවරයා වන මට උසාවියේ මන්ත්‍රී කියන තමුන්නාන්සේලාට මා තවත් කාරණයක් මතක් කර දෙන්නට සතුටුයි. මැතිවරණයකින් පසුව ඡන්ද ගණින විට ඡන්ද පත්‍රිකාවක පොඩි වර දක් තිබුණොත් ඒ ඡන්ද පත්‍රිකාව සම්පූර්ණයෙන්ම අහෝසි කරනවා. ඒවාගේම අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාගේ වැරදි ප්‍රකාශ නිසා—නීතිය නොදන්නකමින්


කළ ප්‍රකාශ නිසා—විසි තුන් දහසකගේ ඡන්දය අහෝසි කරවීමෙනුයි මා බණ්ඩාරගම මන්ත්‍රීවරයා හැටියට පත් වුණේ—නිකම්ම නොවෙයි. මට විරුද්ධව ඉතිරි වුණේ එක්කෙනයි. ඔහුට ලැබුණේ ඡන්ද 217 යි. මට ඡන්ද 18,000 ක් ලැබුණු බව මා තමුන්නාන්සේලාට මතක් කරන්නට සතුටුයි. ඒ අනුව මගේ වැඩි ඡන්ද සංඛ්‍යාව 18,000 කටත් වැඩියි. ඒ සමගම මේ ප්‍රශ්නය කෙරෙහි අපි තවත් පැත්තකින් බලමු. මේ ගරු සභාවේ සිටින සමහර ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවල ඡන්දදායකයින් 12,000 යි. නැත්නම් 15,000 යි. ඉතින් දෙතුන් දෙනෙකු තරඟ කරන විට ඡන්ද හය දහසක් ලැබුණු අපේක්ෂකයා මන්ත්‍රී වෙනවා. නමුත් මට මාස තුනක් වැනි සුළු කාලයක රැස්වීම් තැබූ කොට්ඨාශයකින් ඡන්ද 18,000 ක් ලැබුණු බව මා අවසාන වශයෙන් මතක් කරනවා. එමනිසා මින් ඉදිරියට තමුන්නාන්සේලාට හරස් කපන විට තමුන්නාන්සේලාට විරුද්ධව විහිළුවක් කරන විට මට උසාවියේ මන්ත්‍රීතුමා කියා කියන්නට එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගලගෙදර ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.) විරුද්ධ පක්ෂයේ සිටින අපට වඩා උගත්, අපට වඩා පණ්ඩිත ගරු මන්ත්‍රීවරුන්ට හොඳ පාඩමක් ඉගැන්නුවා. ඒ ආකාරයටම කරුණු කීපයක් ඉදිරිපත් කරන්නටත් මම බලාපොරොත්තු වෙනවා. මට ප්‍රථමයෙන් කථා කළේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා නිසා පළමුවෙන්ම අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශ කීපයකට මට උත්තර දෙන්නට අවසරය දෙන මෙන් ඉල්ලා සිටිනවා. මේ රජය කර්මාන්ත හිමියන්ට වැඩි වැඩියෙන් ලාභ ගන්නට ඉඩ දෙනවාය, එම නිසා ඒ කර්මාන්ත හිමියන් දැන් දැන් මහත් වෙවී ඉදිමෙනවාය කියා අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. ඒ ඉදිමීම ආරම්භ කළේ මේ රජයෙන් නොව පසුගිය රජයෙන් බව මා පළමුවෙන්ම මතක් කරනවා. සීනි බෝල කර්මාන්ත ඇති කර ලාංකිකයන් නොවූ උදවිය ධනේශ්වරයින් කළේ පසුගිය ආණ්ඩුව බව මා ලැජ්ජාවෙන් මතක් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අර්තාපල් වගා කළ කෙනෙක් තමන් එම වගාවෙන් රුපියල් 45,000 ක ආදායමක් ලැබූ බව අපේ අගමැතිතුමාට කී වගක් අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කිව්වා. ඒ තැනැත්තා මෙය ආදායම් බදු දෙපාර්තමේන්තුවට නොකී එකයි පුදුමය. [බාධා කිරීම්] ලංකාවේ සියයට 10 ක් වන ධනේශ්වර පන්තිය මේ රටේ භාණ්ඩ, රෙදි පිළි ආදිය පිළිබඳ බලතල අතට ගෙන සිටින බවත් අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. සියයට 10 ක් පමණ වූ පිරිසකට මෙය කරන්න පුළුවන් වැඩක්ද? අද ගම්බද පෙදෙස්වලට ගිහින් ඒ ජනතාව දෙස බලන්න. අද ඔවුන් සශ්‍රීකයි. හැම කෙනකුටම සපත්තු කුට්ටමක්, සෙරෙප්පු කුට්ටමක් තිබෙනවා. හැම තරුණයෙකුගේම කමිසය නයිලෝන්. සෙන්ට් පුයර සුවඳ නිසා ළඟට යන්න බෑ. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට මේවා නොපෙනෙන්නේ ඇයි? කණ්ණාඩි දැම්මත් බලන්න වුවමනා නැත්නම් පෙනෙන්නේ නැහැ. ටිකක් විපරම් කර බැලුවොත් පමණයි නියම තත්ත්වය පෙනෙන්නේ. අප දෙගොල්ල දෙපැත්තට වී කෝලාහල කරන්න දෙයක් මෙහි ඇත්තෙ නැහැ. අප මෙහි ඇවිත් සිටින්නේත් මහජනතාවට සේවයක් කරන්නයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මහජනයා වෙනුවෙන් මෙම ගරු සභාවට පැමිණ සිටින්නේත් තමන්ගේ ඡන්දදායකයන් වෙනුවෙන් සේවයක් කරන්නයි. හැටන් පාරෙනුත් ශ්‍රීපාදයට යන්න පුළුවනි. රත්නපුර පාරෙනුත් එහි යන්න පුළුවනි. තවත් කොහේදෝ මාර්ගයකිනුත් යන්න පුළුවනි. කොහෙන් ගියත් ශ්‍රීපාදයට යාමේ අරමුණ එකයි. කුමන මාර්ගයකින් ගියත් තමන්ගේ අභිප්‍රාය, අදහස ඉෂ්ට කර ගන්නට පුළුවනි. එම නිසා විරුද්ධ පාර්ශ්වයේ සිටින ගරු මන්ත්‍රීවරුන් අප ඉදිරිපත් කරන හැම දේටම විරුද්ධ විය යුතුයයි මා විශ්වාස කරන්නේ නැහැ. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් නම් එහෙම තමයි. දූන් ගෙදර යන ගමන් වුවත් පාළමක් කඩන්න පුළුවනි. අප කවදාවත් ධනවතා දුප්පතා කරන්න උත්සාහ ගන්නේ නැහැ. අප පිළිගන්නේ මේ රටේ දුප්පතා ධනවතා කිරීමේ ප්‍රතිපත්තියයි. ධනපතියා හංග වේවායි අප කියන්නේ නැහැ. මේ රටේ ධනය සුළු පිරිසකට පමණක් අයිති විය යුතුයයි අප කියන්නේත් නැහැ. මේ රටේ නොයෙක් අංශවල හොරුන් සිටින බව අප පිළිගන්නවා. මේ රටේ වෙළෙන්දන් අතර හොරුන් සිටිනවා; ආණ්ඩුවේ සේවකයන් අතර හොරුන් සිටිනවා; අප ආශ්‍රය කරන අය අතර හොරුන් සිටිනවා. එම නිසා හොරුන්, වංචා කාරයන් ඒ හැටියට හැඳිනගෙන ඔවුන් ආශ්‍රයෙන් අයින් කිරීමෙන් අප රටට පාඩමක් ඉගැන්විය යුතු බවයි මා දෙපැත්තටම කියා සිටින්නේ. මෙම ගරු සභාවට පැමිණියායින් පසු රටට හොඳට වැඩ කරන්න පුළුවන් වේයයි, මෙහි එන්නට ප්‍රථම මා අදහස් කරගෙන සිටියා. නියෝජ්‍ය කථානායකතුමනි, මෙය මේ ගරු සභාවට අගෞරවයක් කිරීමට කියන දෙයක් නොවෙයි. "උඹ හොරා, අරූ හොරා, අනෙක් එකා හොරා" ආදී වශයෙන් මෙහි දෙපැත්තෙන්ම කියැවෙන නමුත්, පතුරු ගසා සූරා බලන විට හැම එකාම හොරා බවයි මෙතැනට පැමිණියාට පසු මට පෙනී ගොස් තිබෙන්නේ! අප මෙම ගරු සභාවට එන්නේ මහජනතාවට සේවයක් කිරීමටයි. අප, එදිනෙදා ජීවිතය මහජන ජීවිතය හරි මග ගෙන යාමට මග පෙන්වන්නන් විය යුතුයි. අප ආශ්‍රය කරන්නේ හොරුන් නම්, අප සමග ක්ලබ් එකට ගොස් බොන්නේ හොරා නම්, අප සමග කාරෙකේ යන්නේ හොරා නම්, රට පිළිගන්නේ හොරාට පමණක් මේ රටේ තැනක් තිබෙන බවයි. එම නිසා, දෙපැත්තේම අයගෙන් මා ඉල්ලා සිටින්නේ අරයා මෙයා සූරන්නේ නැතිව හරියාකාර ජීවිතය ගත කරන්නට උත්සාහ කරන ලෙසයි. අනුන්ගේ වැරදි සෙවීම නතර කරන්න ඕනෑ. එකිනෙකා සූරා ගැනීම නතර කරන්න ඕනෑ. සමහර විට තව අවුරුදු හත අටකින් විරුද්ධ පාර්ශ්වය කෙරෙහිත් මහජනතාව විශ්වාසය තබන්න පුළුවනි.

රාජාසන කථා විවාදයේදී මා ඉල්ලා සිටියා වගේ, මහජනතාව හරි මග ගෙන යන්නට, රට සුබිත මුදිත කරන්නට, නැති අය ඇති අය කරන්නට, දුප්පත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් කොතලාවල මයා.]

දරුවන්ට සුභ අනාගතයක් ඇති කරන්නට, මේ රජයට තමුන්නාන්සේලාගේ සහාය දෙන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මට පෙනී ගිය කරුණක් තමයි, අපි කවුරුත් පඩි ගන්නා උදවිය වුණත් මැති සබයේ ආසනවල වැඩි දෙනකු නැති බව. අපට කථා කරන්නට සිදු වී තිබෙන්නේ බංකුවලටයි. මම මෙහි එන්නට කලින් හිතාගෙන හිටියා, දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) තමයි, හැමදම ඉන්නේ කියා. එහෙත් අවසාන කාලයේදී උන්නැහේත් හිටියෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විහිළු තහළුවෙන් කථා කළාට මේ රටේ වැඩ කරන්ට අප අතර සමගියක් වුවමනා කරන බව මා කියන්නට කැමතියි. මහ ජනතාවගේ නායකයන් අපියි. සමහරවිට මහජනයා වැරදි ඉල්ලීම් කරනවා. මා මන්ත්‍රණ සභාවට එන්නට උත්සාහ කළේ අවුරුදු දහයක් පමණ සිටයි. ඒ කාලසීමාවේදී මට පෙනී ගොස් තිබෙනවා, මහජනතාව වැරදි ඉල්ලීම් කරන බව. ඒ නිසා අප කවුරුත් මැති සබයට පත්වී මෙන් පසුව අපේ කොට්ඨාශ පමණක් නොව, මුළු මහත් රටම, ජාතියම, එක්තරා මාර්ගයක ගෙන යන නායකයන් වන්නට ඕනෑ. අනික් වතාවේ ආසනය ලැබුණත්, නොලැබුණත් මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටින්නේ වැරදි ඉල්ලීම් කරන්නට එපා කියා කෙලින්ම මහජනතාවට කියන ලෙසයි. යමෙකු වැරදි වැඩක් කරන ලෙස ඉල්ලා සිටියොත් අප ඒ අයට කියා දෙන්නට ඕනෑ, අපි පාර්ලිමේන්තුවට ඇවිත් සිටින්නේ රට පාලනය කිරීමට උප දෙස් දෙන්නට, අනුබල දෙන්නට මිස එවැනි වැරදි වැඩ කරන්නට නොවන බව. ඒ විධියට වැඩ කළොත් විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ චෝදනා කීපයකින් ඕනෑම ආණ්ඩුවකට වැළකෙන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා. අපි කවුරුත් රටට වැඩ කරනවා නම්, "ආහාර වගාව දියුණු නැහැ; කාර්මික වර්ධනයක් සිදු වී නැහැ" ආදි වශයෙන් කිය කියා බොරුවට දඟලන්නෙ ඇයි? මා රාජාසන කථා ස්තුති යෝජනාව ස්ථිර කළ අවස්ථාවේදී කියා සිටියා, පසුගිය රජය කර්මාන්ත විශාල සංඛ්‍යාවක් ආරම්භ කළ එක අපි පිළිගන්නා බව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
**(An hon. Member)**
සීනි බෝල කර්මාන්ත.

**ජෝර්ජ් කොතලාවල මයා.**
*(திரு. ஜோர்ஜ் கொத்தலாவல)*
**(Mr. George Kotelawala)**
නැහැ. නැහැ. බොහොම වටිනා කර්මාන්ත ආරම්භ කළ බව අපි පිළිගන්නට ඕනෑ. මෙතැන ඇවිත් ජයග්‍රහණය කරන්නට සත්‍යය හංගන්නට නොවෙයි, ඇත්ත කියන්නට ඕනෑ. කාට වුණත් කරන්නට අමාරු කටයුතු දෙක තුනක් කර තිබීම ගැන පක්ෂයක් වශයෙන් නොව, පෞද්ගලික වශයෙන්, මා කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට (ඉලංගරත්න මයා.) ප්‍රශංසා කරනවා. ඉන්ෂුවරන්ස් කටයුතු රජය සතු කළා. තෙල් සමාගම් රජය සතු කළා. එවැනි වැඩ කර තිබෙන නිසා ඒවා කළේ නැතැයි අපට කියන්නට බැහැ. අපිත් ඇවිත් සිටින්නේ රටට වැඩ කරන්නටයි. එහෙත් රටට වැඩ කරන්නට මෙහි ඇවිත් සිටින අපි පොඩි ළමයි වගේ දෙපැත්තට බෙදී කලබල කරන විට අප මේ ස්ථානයට පත් කර එවූ මහජනතාව කල්පනා කරන්නේ මොකක්ද? මේ ගොල්ල කරන්නේ සෙල්ලමක්; මේ ගොල්ල කරන්නේ බොරුවක් කියා ජනතාව හිතනවා. අපි අතුරු මැතිවරණය කට ගියාම දෙපක්ෂයේම මන්ත්‍රීවරුන් ඇවිත් වේදිකාවට නැගී අරයා කරවල හොරාය, මෙයා කරවල හොරාය කියා කෑ ගහනවා. මහජනතාවට අපි ඇත්ත පින්තූරයක් දෙන්නට ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
**(An hon. Member)**
"ඇත්ත" පත්තරේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් කොතලාවල මයා.**
*(திரு. ஜோஜ் கொத்தலாவல)*
(Mr. George Kotelawala)

අපොයි, "ඇත්ත" පත්තරේ කියන්නෙ ඇත්තම බව තමුන්නාන්සේලා කවුරුත් දන්නවා.

ඒ එක්කම අපට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනාවක් මට මතක් වුණා. අපේ කට්ටියක් ට්‍රැක්ටර් විකුණල පත්‍රයකුත් පටන් ගත්තාය කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ට්‍රැක්ටර්වල මිළ නැගීමත්, අනෙකුත් බඩුමුට්ටුවල මිළ නැගීමත් පුළුවන් නම් අපි වළක්වනවා. අපේ රජය අනික් විතාවේ මහජනතාව ගෙන් ඡන්දය ඉල්ලන්න යන්නේ නැද්ද? අපේ මැති ඇමතිවරුන් තුළ සිංහල ලේ නැද්ද? ඔවුන් තුළ මහජනතාව ගැන කැක්කුමක් නැද්ද? ලෝක වෙළඳපොළේ බඩු මිළ ඉහළ ගොස් තිබෙන නිසාත්, නැව් සමාගම් නැව් ගාස්තු වැඩි කර තිබෙන නිසාත්, බඩුමුට්ටු ගණන් ගොස් තිබෙනවා. කොයි බඩුවත් ගණන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි පහළොවක කාලයක් තිබෙනවා. නමුත් සාමාන්‍යයෙන් මා වැඩිය කථා කරන කෙනෙක් නොවෙයි. අයවැය ලේඛනය සම්බන්ධයෙන් මට කථා කරන්න දෙයක් ඉතුරු වී නැහැ, විරුද්ධ පාර්ශ්වය ඇති තරම් ඒ සම්බන්ධයෙන් කථා කර තිබෙන නිසා. කොහොම වුණත් මෙම අය වැය ලේඛනය බොහොම හොඳයි කියල මට කියන්න පුළුවනි. මැතිවරණයකට මෙම ආණ්ඩුව හෙට අනිද්දා මුහුණ දුන්නත් ඡන්ද ගුන්ඩුය කියන ඒවා එකක්වත් මෙම අයවැය ලේඛනයට ඇතුළත් කර නැති බව කවුරුත් පිළිගන්නවා. එක්තරා විනයක් ඇතුව, මතු පරම්පරාවෙහි යහපත පිණිස වැදගත් යෝජනාවන් රාශියක්ම ඇතුළත් වූ අය වැය ලේඛනයක් සකස් කර ඇති බව පිළිගත යුතුව තිබෙනවා. එය එසේ වුණත් විරුද්ධ පාර්ශ්වය ගරු සභාවට ඇවිත් අපට දොස් කියනවා; අප ඒවාට පිළිතුරු දෙනවා. මේකයි ප්‍රජාතන්ත්‍රවාදය. හැමදාමත් කරන්නෙ ඒකයි. අපට මෙයට වඩා හොඳ ක්‍රමයක් හම්බ වී නැහැ.

අගලවත්තෙ මන්ත්‍රීතුමා කියන ක්‍රමයට ඇත්තෙ එක පක්ෂයක් පමණයි. රුසියාවෙ ප්‍රජාතන්ත්‍රවාදය බොහොම ලක්ෂණට තිබෙනවාලු. මා නම් රුසියාවට ගිහින් නැහැ, ළඟදී තමුන්නාන්සේලාට පින් සිද්ද වෙන්න යන්නට බලාපොරොත්තු වෙනවා. ඒ කොහොම වුණත් රුසියාවේ තිබෙන්නේ එක පක්ෂයක් නම් අනික් පක්ෂයකට ඡන්දය දෙන්නේ කොහොමදැයි මට වැටහෙන්නෙ නැහැ. අපේ හිටපු කථානායකතුමාත්—කටුගම්පොල මන්ත්‍රීතුමාත් (ටී. බී. සුබසිංහ මයා.) —රුසියාවේ තානාපතිවරයකු වශයෙන් සිටියා. එතුමාගෙන්වත් පසුවට ඒ ගැන අසා බලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආහාර වගාව සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වය මොනවා කිවත්, ඇස් තිබෙනවා නම් පෙනේවි; කන් ඇහෙනවා නම් ඇහේවී. දඹුල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) මගේ හොඳ මිත්‍රයෙක්. වී වගාව සරුවට කෙරෙන්නෙ දඹුල්ලෙ. නමුත් එතුමා ගරු සභාවට ඇවිත් කියනවා එතුමාගෙ කොට්ඨාශයේ අය කන්නෙ පාන් ය කියා. එතුමා දන්නවා ඇති, ඉස්සර වාගේ නොවෙයි, දැන් ගොයම් පාගන විට ඉස්සර තේ හෝ කෝපි වක් කරනවා, බුලත් විට කන්න දෙනවා දැන් තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස්. තේ කෝපි වෙනුවට දැන් බොහොම උදවිය බොන්නෙ කසිප්පු. කසිප්පු බීලා පාන් කනවා. අන්න ඒකයි දැන් දඹුල්ලෙ උදවියත් වැඩිපුර පාන් කන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට විහිළු කිරීමට කාලයක් නැහැ. අප සියලු දෙනාත් එකමුතුව වැඩ කළ යුතු අවදියක් දැන් උදා වී තිබෙනවා. අපේ රජය බලයට පත් වුණු දවසේ සිට අද වැටෙයි, හෙට වැටෙයි කියා සමහර අය බලාගෙන සිටියා. නමුත් නරියාට සිදු වුණු දේමයි ඒ අයටත් සිදු වුණේ. අප සම්පූර්ණ කාලයම ආණ්ඩුව ගෙන ගොස් නැවතත් බලයට පැමිණෙන බව ඒ අයට මතක් කර දෙන්න කැමතියි.

මෙහිදී මතක් කර දිය යුතු වැදගත් කාරණයක් තිබෙනවා. අපේ විරුද්ධ පාර්ශ්වයේ එක් මන්ත්‍රීවරයෙක් කීවා මෙම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් කොතලාවල මයා.]

ආණ්ඩු පක්ෂයේ උදවිය දැන් සශ්‍රීක වී සිටිනවාය කියා. මට ඒ කථාවට ටිකක් හිත රිදුණා. අප මෙයට එන්නට පෙරත් සශ්‍රීක වෙලයි සිටියේ. අපේ මුතුන් මිත්තොත් සශ්‍රීක වෙලයි හිටියේ. ඔව්, අප දන්නවා සශ්‍රීක වුණු අය ගැන. මටත් සමහර විට පුදුම හිතෙනවා. සමහර අවස්ථාවල මටත් ඒවා ඉගෙන ගන්න ඇත්නම් හොඳය කියා සිතෙනවා. මන්ත්‍රීවරයකු වශයෙන් රජයෙන් ලැබෙන්නෙ රුපියල් හය සීයක පමණ මුදලක්. එයට අමතරව ලියන මහත්මයට රුපියල් සියයකුත් තවත් කාර් ගාස්තු ආදිය සඳහා රුපියල් හැත්තෑපහකුත් ගෙවනවා. මේ අනුව රුපියල් හත් සිය ගණනයි ලැබෙන්නෙ. නමුත් ගෙවල් කුලියම පමණක් රුපියල් හත්සිය පණහක් ගෙවන අය විරුද්ධ පාර්ශ්වයේ ඉන්නවා. අන්න ඒ නිසයි මා කියන්නෙ, එක පැත්තකට කියන විට තමන්ගෙ පැත්තටත් වදින බව. සමහර විට ඒ අය මෙහාට එන කාර්වල මගේ මහප්පවත් ආවේ නැහැ. නමුත් පඩිය විතරලු තිබෙන්නෙ කියන එකයි පුදුමෙ.

එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණෙන කාලයේදී වත්කම් ප්‍රකාශ කරන බවට කෑගැසූ බව ඒ අය තියනවා. එය නොකිරීම ඇත්ත වශයෙන්ම අපට මදිකමක්. අප යන්නට පෙර එය කරලයි යන්න බලාපොරොත්තුව. නමුත් අපේ අයගෙන් සියයට අනූවක් දෙනාගේ ආදායම් පිළිබඳ විස්තර ආදායම් බදු දෙපාර්තමේන්තුවේ තිබෙනවා. අද නොවෙයි, අප ඉස්කෝලයෙන් අස් වුණු දවසේ සිටමයි එම වාර්තා තිබෙන්නෙ. එය රුපියල් සියයක් වෙන්න පුළුවනි, දෙසියයක් වෙන්න පුළුවනි, නමුත් අපේ ආදායම් පිළිබඳ විස්තර ලියාපදිංචි කර තිබෙනවා. අපට තිබුණු ගෙවල් ගණන, අපට සිටි හරක් ගණන—අපට වැඩිය හරක් ගණන නොවෙයි—[බාධාකිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු අගමැතිතුමා වේදිකාවක් ගානේ ගොස් පොරොන්දු විසි එකක් දුන්නාලු. දෙයියෝ සාක්කි. 21 න් 18 ක්වත් අපි දීලා තියෙනවා. යටියන්තොට මන්ත්‍රීතුමාලා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ දවස්වල 21 ක් ඉල්ලුවා. අගලවත්තේ මන්ත්‍රීතුමයි (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) වැඩියෙන් කෑගැහුවේ. මමත් ළඟ සිටියා. ක්‍රිකට් ගැහුවා. ඒක දැන්ම දෙන්න බැරිය කිව්වා. තමුන්නාන්සේලා විසි එකේ ඒවා මතක් කරන්නට එන්න එපා අපට. අපි සශ්‍රීක වෙලාය, මහත් වෙලාය කිව්වට මහජනයා පිළිගන්නෙ නැහැ. අපෙත් පොඩි පොඩි වැරදි, අඩුපාඩු තියෙන්න පුළුවන්. ජාතියට සෙතක් සැලසීමයි, අප කළ යුත්තේ. ගොවි ජනතාවට සෙත සැලසීමයි, අප කළ යුත්තේ. අපේ ගරු මිනිපේ මන්ත්‍රීතුමා (එච්. එම්. නවරත්න මයා.) පිලිප් ගුණවර්ධන ඇමතිතුමාට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කළා. මා වෙන පවුලක උපන්නා නම් සමහරවිට ඒ පක්ෂයෙන් ඊර්න්නට ඉඩ තිබුනා. ඒ ඇමතිතුමාගේ පුතා කොහේද විද්‍යාලයක ඉන්නවලු. මිනිපේ මන්ත්‍රීතුමා මගේ මිත්‍රයෙක්. මා කියන්නේ සූරන්න එපාය කියායි. එතුමාගේ පුතා ඇති. තමුන්නාන්සේලාගේ නායිකාවගේ දුවත් ඉන්නවා. තනියම ගියත් දෙන්නම එකට මෙහාට එන්නටත් පුළුවන්. මේවා ගැන කථා කිරීම නවත්වා රටට වැඩක් කරමු; රටට සෙතක් කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා බණ්ඩාරගම ආසනය නියෝජනය කළත් ආසන දෙකක වැඩ කරනවා. ලබන වාරයේ යටියන්තොට නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට පෙනී සිටීමට බලාපොරොත්තු වන නිසා යටියන්තොට ප්‍රශ්න ගැන යමක් කියන්නට ඕනෑ. අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය රැකීරක්ෂා පිළිබඳ ප්‍රශ්නයයි. පත්කළ ගරු මන්ත්‍රීතුමා කීවා, ඒ කම්කරුවන්ට සතියකට වැඩ කරන්නට ලැබෙන්නේ දින දෙකක් පමණය කියා. ඒ නිසා වතුකරයේ සිංහල, දෙමළ කම්කරුවන්ට සහනයක් සැලසීම සුදුසු බව මා මතක් කරනවා.

මා අර මුලින් මතක් කළ දේ නැවතත් කියන්න ඕනෑ. මා අළුත් මිනිහෙක්; මා කථා කළ විධියට සමහර කෙනකුගේ හිත රිදෙන්න පුළුවන්; ඒ නිසා මට සමා වෙන්නය කිව්වා. මා වැඩිහිටියන්ට සලකන කෙනෙක්. මට වඩා වැඩිහිටි කාටත් මා කථා කරන්නේ සර් කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලයි. හිත රිදෙන්නට මා යමක් කීවා නම් සමා වන ලෙස මා ඉල්ලා සිටිනවා. නරියා ගිය පාරේ ගොස් රවටෙන්නෙ නැතිව අප සමග එකතු වී රට ස්වයම්පෝෂිත කිරීමට—සමෘද්ධිමත් කිරීමට—අපට සහ යෝගය දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ කාර් එක අතරමග නවත්වා කිව්වාය කී රුපියල් හතළිස් පන් දාහේ කථාව අසත්‍යයක් නොවෙයි. මමත් ඒ වෙලාවේ ළඟ හිටියා. වුවමනා නම් මට ඒ මහත් මයා කැඳවාගෙන ඇවිත් පෙන්වන්නට පුළුවන්. ඒ වාරයේදී රුපියල් 45,000 ක් ලැබුනත් ඊට පසු වාරයේදී අස්වැන්න හරියට නොලැබීම නිසා රුපියල් අට දාහක් පාඩු වුණා. ඕවා ගැන කථා කිරීම නොවෙයි, අප කළ යුත්තේ. මේ රටේ පොදු ජනතාව ගැන අප කල්පනා කරන්නට ඕනෑ. යටියන්තොට ජනතාව නම් මෙපමණ කල් තණකොළ කකා සිටියා. දැන් ඒ අය බත් කන ජනතාවක් බව මා මතක් කරන්නට කැමතියි. අපේ ජනතාවට බොරු කියා රවටන්නට බැහැ. අප වී ගොවිතැන් කරන්නේ මහජනතාවටයි. මුසාජීලාගේ වගේ කොම්පැනිවලට අපි අක්කර දහස් ගණන් දුන්නලු. බඩගින්නේ සිටින ජනතාවට ආහාර දීමටයි, අප කටයුතු කළේ. ඒ කොම්පැනිකාරයන් අපේ මස්සිනාලා නොවෙයි. ඒ අයගෙන් අපට කිසිම ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. අප කාට හෝ ඉඩම් දෙනවා. තමුන්නාන්සේලා ඉඩම් ඉල්ලුවා නම් තමුන්නාන්සේලාටත් දෙනවා. අපේ හිත මිත්‍ර අම්පාරේ ගරු මන්ත්‍රීතුමාටත් (සෝමරත්න සෙනරත් මයා.) ජීප් එකක් දුන්නා. අනිල් මුණසිංහ මහත් මයාටත් ජීප් එකක් දුන්නා. අද තමුන්නාන්සේලාට තව ඉඩම් වුවමනා නම් ඉල්ලන්න. අපි දෙන්නම්. මැණික් ගැරිම පැල්මඩුල්ලේ මන්ත්‍රීතුමාට (ඩබ්ලිව්. ඒ. ධර්මදාස මයා.) දීලා කංසා වැවීමට මමත් වුවමනා නම් හවුල් වෙන්නම්. රටට, ජාතියට සෙතක් කිරීමට අපි ඉදිරිපත් වෙමු. කොයි පක්ෂයටද වැඩක් කරන්න පුළුවන්? කොයි පක්ෂයද කෑ ගහන්නේ? කොයි පක්ෂයද අවුරුදු තිස් ගණනක් දේශපාලනයෙන් රට මුළා කළේ? ඔය ප්‍රශ්නවලට පිළිතුරු දීම මහජනතාවට බාර කරනවා. එමෙන්ම රට තව දුරටත් දියුණුවට පත් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ටික දෙනෙකුටවත් අනික් වාරයේදීත් මේ ගරු සභාවට එන්නට ලැබේවායි කියමින්, මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 7.25

**රාජා වෙලේගම මයා.** (මොනරාගල)
(*திரு. ராஜா வெலேகம—மொனறாகலை*)
(Mr. Raja Welegama—Monaragala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බණ්ඩාරගම ගරු මන්ත්‍රීතුමාගේ විනෝදාත්මක කථාවට පසු වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. එතුමා උසාවියෙන් හෝ කොහෙන් හෝ මේ ගරු සභාවට පත් වී ආවාට පසු කළ දෙවැනි කථාවයි මේ. එතුමාගේ කථාව ගැන එක්තරා කරුණක් සම්බන්ධව පමණයි මතක් කරන්නට මා අදහස් කරන්නේ. එතුමා කීවා, එතුමා වැඩි ඡන්ද 18,000 කින් තේරී පත් වූ බණ්ඩාරගම මන්ත්‍රීවරයාය කියා. එමෙන්ම අවංකව හිතට එකඟව තවත් එකක් කීවා. එතුමාට ලබන වර එන්නට ලැබේද නැද්ද දන්නේ නැතෙයි කියලත් කිව්වා. එමෙන්ම ලබන වර ආසනය වෙනස් කරන්ටත් බලාපොරොත්තු වෙනවා යයි කීවා. වැඩි ඡන්ද 18,000 කින් බණ්ඩාරගමට පත් වූ ඒ මන්ත්‍රීතුමා ඒ ආසනයෙන් පැන යන්නට අදහස් කරන්නේ ඇයි කියා අහන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් විශේෂ කරුණක් මට මතක් වුණා. එතුමා කීවා දැන් හැම කෙනෙක්ම නයිලොන් කමිස ඇඳගෙන සෙන්ට් පවුඩර් දමාගෙන ඉන්නවාය කියා. මා එතුමාට කියනවා, තමන්ගේ මට්ටමෙන් රට මනින්න එපාය කියා. එතුමා නම් සුඛෝපභෝගී ජීවිතයක් ගත කරන කෙනෙක් බව කවුරුත් දන්නවා. එතුමා උපැස් යුවලක් දමා ගෙන ඉන්නේ එතුමාට පෙනුම අඩු නිසා වෙන්න ඇති. එහෙත් එතුමා කණ්ණාඩි කුට්ටම පළදින්නේ වැරදි තැන. වෙන අය පළඳින්නේ ඇස්වලට; එතුමා පළඳින්නේ නළලට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා වෙලේගම මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ කථාවෙන් එක්තරා වැදගත් කරුණකුත් පැහැදිලි වුණා. එතුමා පමණක් නොවෙයි. ඒ රජයේ වගකිවයුතු ඇමතිවරයෙකු වන අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මෙයට ටික කලකට කලින් එක්තරා ප්‍රකාශයක් කර තිබුණා. ඒ ප්‍රකාශයෙන් කියවුණේ මේ රටේ ජනතාව මෙපමණ හොඳට කාලා ඇඳලා මුදල් හම්බ කරගෙන සිටි කාලයක් මෑත ඉතිහාසයේ තිබුණේ නැත කියන එකයි. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් ගරු බණ්ඩාරගම මන්ත්‍රීතුමාත් කියන විධියට, ඒ අය මේ රටේ තත්ත්වය මනින්නේ ඒ අයගේ තත්ත්වයෙන් වෙන්න ඇති. ඔය ආණ්ඩු පක්ෂයේ සිටින ගරු මන්ත්‍රීවරුනුත් ඇමතිවරුනුත් අද රටේ තත්ත්වය ඔන්න ඔය විධියයි කියා කල්පනා කරනවා නම් තමුන්නාන්සේලා ඉන්නේ මිරිඟුවකට මුළා වෙලා යයි මා කියනවා. ඇත්ත වශයෙන්ම අද මේ රටේ තත්ත්වය කුමක්ද කියන එක විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි රටේ සෑම කෙනෙක්මත් දන්නවා.

අපේ ගරු මුදල් ඇමතිතුමාට පිට පිට අවුරුදු 5 ක් ම අයවැය ලේඛන ඉදිරිපත් කරන්නට ලැබීම ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කීපදෙනෙක්ම ප්‍රශංසා කළා. මාත් එතුමාට මගේ ප්‍රශංසාව හිමි කරන්නට කැමතියි. එහෙත් විශේෂයෙන්ම සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. පසුගිය අගෝස්තු දෙවැනිදා ඉදිරිපත් කළේ එතුමාගේත් මේ රජයේත් අවසාන අයවැය කථාවයි. ඒ නිසා පසුගිය හතර අවුරුද්දේ කෙසේ වුවත්, අවසාන අයවැයෙන්වත් ජනතාවට ජන ජීවිතයට යහපතක් ඇති වේය කියා මහ ජනතාව ලොකු බලාපොරොත්තුවකිනුයි හිටියේ. එහෙත් කියන්නත් කණගාටුයි, ගරු මුදල් ඇමතිතුමා මෙන්ම ගරු රාජ්‍ය ඇමතිතුමා වැනි වගකිවයුතු මේ රජයේ අනිකුත් සාමාජිකයිනුත් පිළිගෙන තිබෙනවා, ඒ බලාපොරොත්තු ඉටු නොවුණු බව. එමෙන්ම ඒ අය කීවා "අපට කරන්න පුළුවන් තරමට තමයි කළේ; මෙය සංවර්ධන යුගයක්; ඒ නිසා අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වෙනවා" කියා. එපමණක් නොවෙයි මේ රටේ සෑම පුවත්පතක්ම වාමාංශික පුවත් පත් මෙන්ම ආණ්ඩුවට පක්ෂ පුවත් පතුත් කතෘ වාක්‍යවලින් පවා ප්‍රකාශ කර තිබෙනවා, මේ අයවැය කථාව නිකම් හිස් වචන මාලාවක් පමණයි කියා. තවත් වචන වලින් කියනවා නම් මේ වර අයවැය ලේඛනයෙන් බලාපොරොත්තු වූ සහනය, ශාන්තිය, යහපත, සේවය ජනතාවට ලැබී නැහැ. මේ චෝදනාව සම්බන්ධයෙන් අද මේ රජය කියන්නේ මොකක්ද? දැනට පවතින්නේ සංවර්ධන යුගයක් නිසා ජීවන වියදම ඉහළ යෑම වළක්වන්නට බැරි බවයි; බඩු මිළ ඉහළ යෑම වළක් වන්නට බැරි බවයි. මේ රටේ ජන ජීවිතයට අදාළ වන ආර්ථික, අධ්‍යාපන, සෞඛ්‍ය, රැකීරක්ෂා වැනි ප්‍රශ්න ගැන කල්පනා කරන විට මෙයින් එකක්වත් සතුටුදායක ලෙස විසඳා ඇති බව හෝ විසඳන්නට පරිශ්‍රමයක් දරා ඇති බව හෝ අපට පිළිගන්නට පුළුවන්කමක් නැහැ. මගේ කථාවේදී මේ කාරණා ගැන කෙටියෙන් කරුණු දක්වන්නටයි, මා බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට බලයේ සිටින උදවිය 1965 මැතිවරණ සමයේදී එදා පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව ගැන දැඩි විවේචනයක යෙදුණා. එදා තිබුණු ආණ්ඩුවේ අදක්ෂකම නිසා ජීවන වියදම පහළ හෙළන්නට බැරි යයි කී පිරිසට රට කරවීමේ බලය ලැබුණා. එහෙත් දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පවතිද්දී 112 ට තිබුණු ජීවන වියදම් අංකය අද කීයද? පසුගිය දවස්වල එය 129 වී තිබුණා. දැන් එය 134 දක්වා නැග තිබෙනවා. මේ අවුරුදු හතර හමාර තිස්සේ ජීවන වියදම් අංකය පහළ හෙළන්නට මේ ආණ්ඩුවට බැරි වුණා පමණක් නොව, එය ශීඝ්‍රාකාරයෙන් ඉහළ යෑමවත් වළක්වා ගන්නට බැරි වුණා. ආණ්ඩුවක් විසින් කරනු ලබන කටයුතුවල නියම ප්‍රතිඵල පෙන්වා දෙන්නට අවුරුදු පහක කාල සීමාව ප්‍රමාණවත් නොවන බව රාජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා. අප මේ දැන් අවුත් තිබෙන්නේ මේ ආණ්ඩුවේ පස් වන අවුරුද්දේ මැද හරියටයි. ඉකුත් වූ කාලයේ වැඩ කෙරී තිබෙන ආකාරය දෙස බලන විට මෙම ආණ්ඩුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තව අවුරුදු 25 ක් ඉදිරියට තිබුණත් ඒ ඒ කාලය අනුව රටේ උද්ගත වන ප්‍රශ්න විස දමින් සෑහෙන සංවර්ධනයක් ඇති කරන්නට පුළුවන් වෙතැයි සිතන්නට බැහැ. අද බඩු මිළ හුඟක්ම ඉහළයි. සුඛෝපභෝගී බඩු පැත්තකින් තබමු. දුප්පත් ගම්බද ජනතාව එදිනෙදා පාවිච්චියට ගන්නා අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිළ අඩු කරන්නට මෙම ආණ්ඩුවට බැරි වුණා පමණක් නොව වැඩි මිළට හෝ ඒ බඩු සෑහෙන තරම් සපයා දෙන්නටවත් බැරි වී තිබෙනවා. ඔන්න, අප ලබා තිබෙන දියුණුවක හැටි !

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල අවප්‍රමාණ කරන දවස්වල මෙම ගරු සභාවේ ලොකු විවාදයක් පැවතුණා. රෑ එළි වන තුරු විවාද කළා. රුපියල අවප්‍රමාණ කිරීම නිසා ලොකු පහරක් වදින බව එදා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රිවරුන් තර්ක ඉදිරිපත් කරමින් පැහැදිලිව පෙන්වා දුන්නා. එහෙත් එය ලොකු සෙතක් සැලසෙන වැඩක් බවත්, දවස් කීපයකින්ම එහි ප්‍රතිඵල දැන ගන්නට ලැබෙන බවත් ආණ්ඩු පක්ෂයේ උදවිය එදා ප්‍රකාශ කළා. හොඳයි, දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද ? සෑම බඩුවකම මිළ ඉහළ ගොස් තිබෙනවා. එපමණක් නොව අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කීවාක් මෙන් අද මහජනතාවගෙන් වැඩි කොටසක් ජීවත් වන්නේ දුප්පත්කම පිළිබඳ මට්ටමෙන් පවා පහළට බැසලයි. ජනපද ව්‍යාපාරවල පමණක් නොව අද මුළු රට පුරාම තිබෙන තත්ත්වය ඒකයි. දුප්පත්කම පිළිබඳ යම් මට්ටමක් තිබෙනවා නම් අද ජනතාව ඒ මට්ටමෙනුත් පහළට වැටිලා. ජනතාවගෙන් සියයට 90 ක් ඒ මට්ටමෙන් පහළට වැටිලා. සංවර්ධනය වන රටක ජීවන වියදම මේ විධියට වෙනස් කරන්නට බැරි අන්දමින් ඉහළ යනවා යයි එදා තමුන්නාන්සේලා ප්‍රකාශ කෙළේ නැහැ. ජනතාවට බොරු කියා ආණ්ඩු බලය ලබා ගත්තා. එහෙත් ඒ ආණ්ඩු බලය ලැබුණාට පසුව ක්‍රියා කර තිබෙන්නේ කොහොමද ? අද මහජනතාවට නියම තත්ත්වය වැටහී තිබෙනවා. අද මහජනතාව පසුතැවිලි වෙනවා. " සයිබුගෙන් බෙහෙත් කෑවා " යනුවෙන් ගම්බදව කථාවක් තිබෙනවා. එයින් අදහස් වන්නේ තිබුණු තත්ත්වයක් නැති වී ගියාය කියන එකයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. தென்னக்கோன்—தம்புளை)*
(Mr. T. B. Tennekoon—Dambulla)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන් බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

*சபை கணிக்கப்பட்டு நிறைவெண் இன்மையால் பிரிவு மணி அடிக்கப் பணிக்கப்பட்டது.*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**පසුව ගණපූරණයක් නොතුබූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා විසින් 11 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 7.37 ට 1969 අගෝස්තු 2 වන දින සභා සම්මතිය අනුව, 1969 අගෝස්තු 17 වන ඉරිදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*பின்னர் நிறைவெண் சேராததனல் உப சபாநாயகர் அவர்கள், நிலையற் கட்டளை இல. 11 இன்படி வினுவின்றிச் சபையை ஒத்திவைத்தார்கள்.*

*இதன்படி சபை பி. ப. 7.37 க்கு அதனது 1969 ஒகஸ்ட் 2 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க 1969 ஒகஸ்ட் 17 ஆம் தேதி ஞாயிற்றுக்கிழமை மு. ப. 10 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*Later, a Quorum not being present,* MR. DEPUTY SPEAKER *adjourned the House without Question put, under Standing Order No. 11.*

*Adjourned accordingly at 7.37* P.M. *until 10* A.M. *on Sunday, 17 August 1969, pursuant to the Resolution of the House of 2nd August 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවට ලිඛිත පිළිතුරු

விளுக்களுக்கு வாய்மூல விடைகள்

WRITTEN ANSWERS TO QUESTIONS

## කොන්ත්‍රාත් කොමසාරිස් ඊ. ජී. වික්‍රම නායක මහතා

திரு. ஈ. ஜி. விக்கிரமநாயக்கா, ஒப்பந்த ஆணைக்குழு

MR. E. G. WICKREMANAYAKE, CONTRACTS COMMISSIONER

56/69

නීල් ද අල්විස් මයා. (බද්දේගම)
(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)
(Mr. Neal de Alwis—Baddegama)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකාවේ ටෙන්ඩර් හා කොන්ත්‍රාත්තු සම්බන්ධව කරන ලදැයි චෝදනා කර ඇති අක්‍රමිකතා ගැන පරීක්ෂා කිරීමේ කොමසාරිස් වශයෙන්, රාජනීතිඥ ඊ. ජී. වික්‍රමනායක මහතා පත් කරන ලද්දේ කවදාද? (ආ) මෙතෙක් වික්‍රමනායක මහතාට කොපමණ මුදලක් ගෙවා තිබේද?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினு: (அ) இலங்கையில் கேள்வு பத்திரம், ஒப்பந்தம் ஆகியவை சம்பந்தமாக நிகழ்ந்ததாகச் சார்த்தப்பபட்ட தவறுகளை விசாரணை செய்யும் ஆணைக்குழுவிற்குத் தலைவராக எப்பொழுது திரு. ஈ. ஜி. விக்கிரமநாயக்கா, கியு. சி. நியமனம் பெற்ருர்? (ஆ) இற்றைவரை திரு. விக்கிரமநாயக்காவிற்கு செலுத்திய தொகை என்ன?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) When was Mr. E. G. Wickremanayake, Q.C., appointed commissioner leading an inquiry into alleged abuses of tenders and contracts in Ceylon? (*b*) How much has Mr. Wickremanayake been paid up to date?

ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ තැපැල් හා විදුලි සන්දේශ ඇමති)
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

(අ) 1965 ඔක්තෝබර් මස 22 වැනි දින රාජ්‍ය නීතිඥ, ඊ. ජී. වික්‍රමනායක මහතා කොමසාරිස් වශයෙන් පත් කරන ලදී. (ආ) මෙතෙක් ඔහුට රු. 156,000 ක් ගෙවා ඇත.

(*a*) Mr. E. G. Wickremanayake, Q.C., was appointed commissioner on 22nd October 1965. (*b*) He has been paid Rs. 156,000 up to date.

## විශේෂ බදු ක්‍රමය

விசேட குத்தகைத் திட்டம்

SPECIAL LEASES SCHEME

58/69

ආර්. ජේ. ජී. ද මැල් මයා. (දෙවිනුවර)
(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)
(Mr. R. J. G. de Mel—Devinuwara)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1965 මාර්තු මාසයේ සිට විශේෂ බදු ක්‍රමය යටතේ බදු කීයක් දී තිබේද? (ආ) 1965 මාර්තු මාසයේ සිට විශේෂ බදු ක්‍රමය යටතේ දෙන ලද මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද? (ඉ) තමන්ට දෙන ලද ඉඩම් ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් අඩක්වත් වගා කිරීමෙන් සතුටුදායක ප්‍රගතියක් ලබා ඇති බදුකරුවන් කී දෙනෙක් සිටිත්ද? (ඊ) විශේෂ බදු කීයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුන් අවලංගු කර තිබේද? (උ) එසේ අවලංගු කරන ලද බදුවල මුළු අක්කර ප්‍රමාණය කොපමණද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) விசேட குத்தகைத் திட்டத்தின் கீழ் 1965 மார்ச்சு மாதந்தொட்டு எத்தனை விசேட குத்தகைகள் கொடுக்கப் பட்டுள்ளன? (ஆ) 1965 மார்ச்சு மாதந் தொட்டு விசேட குத்தகைகளில் கொடுக்கப் பட்ட மொத்த ஏக்கர் பரப்பளவு என்ன? (இ) தமக்குக் கிடைத்த காணியில் ஒரு பாதி யளவையேனும் பயிர் செய்து திருப்திகரமான முன்னேற்றத்தைக் கண்ட குத்தகைக்காரர் எத்தனை பேர்? (ஈ) தற்பொழுது இரத்துச் செய்யப்பட்டிருக்கும் விசேட குத்தகைகள் எத்தனை? (உ) அவ்வாறு இரத்துச் செய்யப் பட்டவையின் மொத்த ஏக்கர் பரப்பளவு என்ன?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) How many special leases of land have been granted under the Special Leases Scheme since March 1965? (*b*) What is the total acreage given out as special lease since March 1965? (*c*) How many lessees have made satisfactory progress by at least cultivating half the extent alienated to them? (*d*) How many special leases have now been cancelled? (*e*) What is the total acreage so cancelled?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(අ) අතිරේක ආහාර වගාව සඳහා තෝරා ගන්නා ලද බදුකරුවන් 387 ට විශේෂ බදු ඉඩම් භාරදී තිබෙන අතර සත්ව පාලනය සඳහාද 22 ට ඉඩම් භාරදී තිබේ. (ආ) අක්කර 56,988 ක් බදුකරුවන්ට භාරදී තිබේ. මෙයට සත්ව පාලනය සඳහා දෙන ලද අක්කර 13,200 ක් ඇතුළත් ය. (ඉ) ඉඩම් දෙන ලද්දේ පස් අවුරුදු සංවර්ධන සැලැස්මක් උඩය. වාර්තා අනුව බදුකරුවන් 269ක් සාමාන්‍ය වශයෙන් සතුටුදායක ප්‍රගතියක් පෙන්වා තිබේ. (ඊ) බදුකරුවන් 118 ගේ ඉඩම් අවලංගු කර තිබේ. (උ) අවලංගු කළ මුළු ඉඩම් ප්‍රමාණය 17,933කි.

(*d*) 387 selectees were put in possession of special lease lands for subsidiary food crops and 22 selectees for animal husbandry. (*b*) Allottees were put in possession of 56,988 acres. This includes 13,200 acres of land given for animal husbandry. (*c*) The lands were given on a five-year development programme. As per returns, 269 lessees have on the whole made satisfactory progress. (*d*) 118 leases were cancelled. (*e*) The total acreage cancelled is 17,933 acres.

## රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වී ඇති උපාධිධරයන්

*தொழில் வசதி நிலையங்களில் தம்மைப்பதிந்துள்ள பட்டதாரிகள்*

## GRADUATE REGISTRANTS AT EMPLOYMENT EXCHANGES

**59/69**

**ද මැල් මයා.**

*(திரு. டி மெல்)*

(Mr. de Mel)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උපාධිධාරීන් කී දෙනෙක් රැකීරක්ෂා සඳහා රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වී සිටිත්ද? (ආ) ඔවුන්ට සුදුසු රැකීරක්ෂා ලබාදීම සඳහා කවදා පියවර ගනු ලැබේද? (ඉ) පාර්ලිමේන්තුවේ වර්තමාන සැසි වාරය අවසන් වීමට පෙර ඔවුන්ගෙන් කී දෙනෙකුට රැකීරක්ෂා ලබා දෙනු ලැබේද?

*தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) தொழில் வசதி நிலையங் களில் தொழில்காண் பொருட்டு தொழிலற்ற பட்டதாரிகள் எத்தனை பேர் பதிவு செய்யப் பட்டுள்ளார்கள்? (ஆ) இவர்களுக்கு தொழில் காண்பதற்கு நடவடிக்கை எப்பொழுது எடுக் கப்படும்? (இ) பாராளுமன்றத்து நிகழுந் தொடர் முடிவுறமுன் இவர்களில் எத்தனை பேருக்கு தொழில் கொடுக்கப்படும்?*

asked the Minister of Labour and Employment: (*a*) How many graduates who are unemployed have been registered for employment at employment exchanges? (*b*) When will

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දෑ මැල් මයා.]
steps be taken to find employment for them? (c) How many of them will be found employment before the end of the current Session of Parliament?

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු හා රැකීරක්ෂා ඇමති)**

(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சர்)

(The Hon. M. H. Mohamed—Minister of Labour and Employment)

(අ) 936. (ආ) සුදුසු ඇබෑර්තු ඇතිවූ විට ඔවුන්ට රැකියා ලබාදීමට පියවර ගනු ලැබේ. (ඉ) යෝග්‍ය උපාධිධාරි රැකීරක්ෂා පහසුකම් තිබීම මත මෙය රඳා පවතිනවා ඇත.

(a) 936. (b) Steps are being taken to find employment for them, as and when suitable vacancies occur. (c) This will depend on the availability of suitable graduate employment opportunities.

### ඇපොතිකරිවරු : පෞද්ගලික ප්‍රතිකාර සේවය

அப்போதிக்கரிமார் : தனித்துறை வைத்தியத் தொழில்

### APOTHECARIES : PRIVATE PRACTISE

**69/69**

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)

(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: "අවුරුදු 20 ක සේවා කාලයක් ඇති සුදුසුකම් තිබෙන ඇපොතිකරි වරුන්ට පෞද්ගලික ප්‍රතිකාර සේවයේ යෙදීමට හැකිවන අයුරින් දැනට තිබෙන ව්‍යවස්ථාවන්ට අවශ්‍ය සංශෝධන ඇති කිරීමට පියවර ගන්නවා ඇතැයි" දැනට මාස කීපයකට පෙර වතු මාණ්ඩලික නිලධාරි වෘත්තීය සංගමයට එතුමා විසින් දෙන ලද ප්‍රතිඥාවට අනුකූලව අවශ්‍ය සංශොධන ව්‍යවස්ථා මෙම සභාවට ඉදිරිපත් කරන්නේ කවදා දැයි එතුමා සඳහන් කරනවාද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினு: இலங்கைத் தோட்டப்பணிப்பாளர் சங்கத்திற்கு "இருபது வருட சேவையாற்றிய தகுதிபெற்ற அப்போதிக்கரிமார்கள் தனித்துறை வைத்தியத் தொழிலில் ஈடுபடுவதற்கு அனுமதிக்கும் விதத்தில் தற்போதைய சட்டங்களுக்குத் தேவையான திருத்தங்களைக் கொண்டு வருவதாக" அவர் பல வருடங்களுக்கு முன் உறுதி கூறியுள்ளதால் அவ்வித திருத்தங்களை இச் சபைக்கு எப்பொழுது சமர்ப்பிப்பாரெனக் கூறுவாரா?

asked the Minister of Health: In view of the assurance given by him to the Ceylon Estate Staffs' Union several months ago that "steps will be taken to make the necessary amendments to the existing legislation to entitle qualified apothecaries of 20 years of service to private practice", will he state when the necessary amending legislation will be presented to this House?

**ගරු ඊ. එල්. සේනානායක (සෞඛ්‍ය ඇමති)**

(கௌரவ ஈ. எல். சேனநாயக்க—சுகாதார அமைச்சர்)

(The Hon. E. L. Senanayake—Minister of Health)

අවුරුදු 20ක සේවයක් ඇති, සුදුසුකම් ලත් ඇපෝතිකරිවරුන් වෛද්‍ය කර්මයේ සහ ශල්‍ය කර්මයේ යෙදීමට හිමිකරුවන් සේ ලේඛකාධිකාරි විසින් ලේඛනාරූඪ කරනු ලැබීමට ඉඩ ලැබෙන පරිදි, සංශෝධන පනත මේ සැසි වාරයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ක්‍රියා කරගෙන යනු ලැබේ.

இருபது வருட சேவையாற்றிய தகுதி பெற்ற அப்போதிக்கரிமார்கள் தனித்துறை வைத்திய சத்திரசிகிச்சைத் தொழில்களில் ஈடுபடுவதற்கு அனுமதிக்கும்வகையில் பதிவாளரால் பதிவுசெய்யக்கூடிய திருத்த மசோதாவை, தற்போதைய பாராளுமன்றக் கூட்டத்தொடரில் முற்பகுதியில் சமர்ப்பிப்பதற்கு வேண்டிய நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன.

Action is being taken to present the amending Bill in Parliament early in this Session to entitle qualified apothecaries of 20 years of service to be registered by the registrar as being entitled to practise medicine and surgery.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00) 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. BOX 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org